

මීනා

ප්‍රථම සිංහල නවකථාව

ඒ. සයිමන් ද සිල්වා

මීනා

ප්‍රථම සිංහල නවකථාව

රසවත් කථාන්තරය

කර්තෘ:

ඒ. සයිමන් ද සිල්වා

සංඥාපනය

සිංහල ප්‍රබන්ධ කථාවට මග පෑදීම

දහසය වන සියවස මුල දී ශ්‍රී ලංකාව යුරෝපීය බල පෑම්වලට පාත්‍ර වූ තැන් සිට, විශේෂයෙන් මෙරට ඉංග්‍රීසීනට යටත් වූ තැන් සිට සිංහල සමාජයේත් භාෂා සාහිත්‍යයන්ගේත් විවිධ විපර්යාස සිද්ධ වූයේය. සිංහල මුද්‍රණ ශිල්පය ආරම්භ වීම, පුවත්පත් සඟරා ප්‍රචලිත වීම, වාද විවාද පැවැත්වීම, නව සාහිත්‍යාංග හඳුන්වා දෙනු ලැබීම යන මේවා එකිනෙකට සම්බන්ධ ව්‍යාපාර විය.

පුවත්පත් සඟරා මඟින් වාද විවාද පැවැත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිංහල පාඨකයා තුළ කියවීමේ රුචිය සෑහෙන තරම් වර්ධනය වූ බව ප්‍රකට කරුණකි. ඒ වාද වවාද යුගය ගෙවී යත් ම සිංහල පාඨකයා වෙනුවෙන් කියවීම සඳහා වෙනත් දෑ සැපයීම පුවත්පත් සඟරා කර්තෘන් වෙත පැවරුණ කාර්යයක් වූයේය. පරිවර්තන කෙරෙහි අවධානය යොමු වූයේ මේ අයුරිනි. දහනව වන ශත වර්ෂයේ ද්විතීය භාගය බහුල වශයෙන් පරිවර්තන සඳහා වෙන් වූ බව පෙනේ. රුවන්මල්දම නම් මාසික සංග්‍රහයෙන් උපුටා දක්වෙන මතු දක්වෙන පාඨයෙන් පරිවර්තන වශයෙන් 'කථාන්ත්‍ර පොඩි' පළ කිරීමේ රුචිකත්වය පැහැදිලි වන්නේය .

'මේ පත්‍රයේ ප්‍රසිඩ කෙරීමට කථාන්ත්‍ර පොඩි ඉංග්‍රීසි පොත්වලින් පිටපත් කර එවන්ට පුළුවන්. මේ පත්‍රයෙන් ප්‍රයෝජන ලැබූ බොහෝ දෙනාගෙන් ඒ උපකාරය තව ම නොලැබුණේ අපට ඒ උපකාරය ඕනෑ නැතැයි සිතාගෙන

වෙන්ට ඇත. ඒ උපකාරය මෙපමණ ඕනෑකර තිබුන කාලයක් මීට ඉස්සර රුවන්මල්දම පත්‍රයට නොතිබුණා යයි සිතමු.........'[1].

කථාන්තර පොඩි, කථා සාරාංශ, කෙටි ගද්‍ය ආඛ්‍යාන, චරිත කථා ආදියෙන් ආරබ්ධ මේ පරිවර්තන ව්‍යාපාරය දීර්ඝ පරිවර්තන තෙක් ම දියුණු වූයේය. කුටුම්බ සංරක්‍ෂණී (1867), රාමායණය (1886), පඤ්චතන්ත්‍රය (1889) යනාදී කෘති සිංහලයෙන් පළ කෙරිණ. සම්පූර්ණයෙන් සිංහලයට පරිවර්තනය වූ ඉංග්‍රීසි ප්‍රබන්ධය ලෙස සැලකිය හැකි වනුයේ 1886 දී 'වන්දනාකාරයාගේ ගමන' නමින් පළ වූ The Pilgrim's Progress නම් කෘතියයි. මෙය මීට කලින් ද සංක්ෂිප්තව හෝ කොටස් වශයෙන් හෝ පළ වී තිබිණ. 1888 දී Gulliver's Travels පරිවර්තනය වූ නමුත් ඒ සම්පූර්ණ කෘතිය නොවේ. ඉංග්‍රීසියෙන් සිංහලයට පරිවර්තනය වූ කෘති අතර විශේෂස්ථානයක් හිමි වනුයේ The Arabian Nights නම් කෘතියටය. මෙය 1891 පටන් 'අරාබි යාමිනි විලාසය' නමින් කොටස් වශයෙන් පළ වූ නමුත් ඒ කාර්යය සම්-පූර්ණ වී නැත. ඉනික්බිති එය 'අරාබි නිශොල්ලාසය' නමින් පළ වූ අතර ඉන් වැඩි කොටසක් ඇල්බට් ද සිල්වා විසින් කරන ලද බව පෙනේ.[2] අරාබි නිශොල්ලාසය පරි-වර්තනයට ඇල්බට් ද සිල්වාගේ නම සම්බන්ධ වනුයේ 1892 ජූනි මාසයේ පටන්ය. ඇල්බට් ද සිල්වාගේ විමලා නම් ප්‍රබන්ධය පළ වූයේ ද මේ වකවානුවේ බව සිහිපත් කරනු වටී.

විශේෂයෙන් මෙම සිංහල පරිවර්තන ද, මේ යුගයේ සිදු කෙරුණු අනෙක් භාෂා ශාස්ත්‍රීය කටයුතු ද සිංහලයෙන්

---

1. රුවන්මල්දම, 1887 පෙබරවාරි, ii කාණ්ඩය 14 වන පත්‍රය. සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය, කළුකොඳයාවේ පඤ්ඤාසෙඛර නා හිමි, ඇම්. ඩී. ගුණසේන, 1965, 209 පිටුවේ උපුටා දැක්වේ.
2. විස්තර සඳහා බලන්න: සිංහල නවකතාවට මග පෑදීම, සරත්චන්ද්‍ර වික්‍රමසූරිය, මහනුවර, 1970, 19-20 පිටු.

නව ප්‍රබන්ධ රචනයට යෝග්‍ය බස්වහරක් සකස් වීමට හේතු වූවාට සැක නැත. 'අරාබි නිශොල්ලාසය' වනාහි සිංහල නව කථාවේ පදනම විය. ආදි නව කතා කතෘවරුන් වන ඇම්. සී. ඇෆ්. පෙරේරා, ඒ. සයිමන් ද සිල්වා, පියදාස සිරිසේන යන ආදි ලේඛකයෝ "අරාබි නිශොල්ලාසයෙන්" ප්‍රභවය ලැබුවෝ වූහ.',[3] යනු එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ප්‍රකාශයකි.

ආදි ප්‍රබන්ධ

සද්ධර්මරත්නාවලිය ආදි සම්භාව්‍ය ගද්‍ය කෘති පවා ප්‍රබන්ධ නමින් හඳුන්වන ලද බව අපි දනිමු.' සද්ධර්මරත්නාවලි නම් වූ ප්‍රබන්ධයක් කරම්හ' යන පාඨයක් එම කෘතියෙහි එයි. එහෙත් මෑත යුගයේ සිංහල භාෂාවෙන් මුලින් ම ලියැවුණු ප්‍රබන්ධ කථා වශයෙන් ගැනෙනුයේ ඇල්. අයිසෙක් ද සිල්වා විසින් ලියනු ලැබූ කථා දෙකකි. 'වාසනාවන්ත සහ කාලකන්නි පවුල්' නම් කථාන්තර දෙක 1866 පටන් 17 වසක් මුළුල්ලේ රුවන්මල්දම නම් සඟරාවේ වරින් වර පළ වූ බව පෙනේ. මේ කථාන්තර පසුව 1888 දී පොතක් වශයෙන් පළ කරන ලදී.[4] මෙම කතා දෙක ගොතා ඇත්තේ නාට්‍යයක මෙන් කථකයන්ගේ නම් ද සහිතව හුදු සංවාද ස්වරූපයෙන් ලියැවුණු කොටස් ද, වෘත්තාන්ත මෙන් ම වෘත්තාන්ත හා සංවාද මිශ්‍ර කොටස් ද සහිත ව්‍යවහාර භාෂාවට සමීප, එහෙත් බොහෝ දුරට ව්‍යාකරණානුකූල බස්වහරකිනි.

ග්‍රන්ථ නාමයෙන් පැවසෙන පරිදි ම මේ ප්‍රබන්ධ දෙකේ අරමුණ වනුයේ ක්‍රිස්තියානි ආගම කෙරෙහි භක්තියෙන් වෙසෙන පවුල වාසනාවන්ත වන බවත් එසේ නොමැති

---

3. ඊ. ආර්. සරච්චන්ද්‍ර, සිංහල නව කථා, ඇම්. ඩී. ගුණසේන, 1960, 40 පි.

4. විස්තර සඳහා බලන්න: ආරිය රාජකරුණා, සිංහල නවකථාවේ ආරම්භය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1972, 1-66 පිටු.

පවුල කාලකන්නි වන බවත් පැවසීමය. ඇතැම් සිංහල සමාජ චාරිත්‍ර දැඩි දෝෂදර්ශනයට ලක් කරන කතුවරයා දෑවැද්ද දීම, 'හොනිමොන්' නොගොස් මනාලිය මනාලයාගේ ගෙදරට කැඳවාගෙන ඒම වැනි සිරිත් පහත් බව පෙන්වා දෙයි.

ජෝන් බන්යන් නම් ඉංග්‍රීසි ලේඛකයාගේ The Pilgrim's Progress නම් ප්‍රබන්ධය සිංහලයෙන් පළ වූ බව යට සඳහන් කෙරිණ. පාඨකයා වෙත ආදර්ශයක් දීමේ අරමුණ ඇතිව ලියා ඇති මේ කථාවට වස්තු වී ඇත්තේ ඔවුනොවුන් හා ප්‍රේමයෙන් වෙසෙන අඹු සැමි යුවලක් ක්‍රිස්තියානි ආගමට අනුකූලව කල් ගෙවීමෙන් සාර්ථක ජීවිතයක් ගත කිරීමේ ප්‍රවෘත්තියකි. එසේ ම හුදු සංවාද ස්වරූපය හා කේවල වෘත්තාන්ත ආඛ්‍යාන ද එම කෘතියෙහි භාවිත කෙරේ. වෙස්ලියානු මෙතෝදිස්ත ආගමේ කතිසේරුවකු වූ අයිසෙක් සිල්වා එද ක්‍රිස්තු භක්තිකයන් අතර ජනප්‍රිය කෘතියක් වූ The Pilgrim's Progress නම් ප්‍රබන්ධය ස්වකීය 'වාසනාවන්ත සහ කාලකන්නි පවුල්' නම් කෘතිය ලිවීමේ දී වස්තු විෂය අතින් මෙන් ම ශිල්ප ක්‍රම අතින් ද ආදර්ශයට ගන්නට ඇත.

මෙම කෘතියට සමාන ලක්ෂණ පෙනෙන තවත් ඉංග්‍රීසි ග්‍රන්ථයක් ගැන සඳහන් කරනු වටී. එනම් රොබින්සන් ක්‍රූසෝ නම් ප්‍රබන්ධයේ කර්තෘ ඩැනියල් ඩිෆෝ නම් ලේඛකයා විසින් ලියනු ලැබූ, කාණ්ඩ තුනකින් යුක්ත The Family Instructor (පවුලේ උපදේශකයා - 1715) නම් කෘතියයි. එහි තුන් වන කොටස විශේෂයෙන් විවාහක ස්ත්‍රී පුරුෂයන් වෙනුවෙන් වෙන් කර ඇත.

බෞද්ධයකු වූ බෙන්තොට ඇල්බට ද සිල්වා විසින් විමලා, ආදර හසුන, සිරිබරී, වෙසක් දූතයා යන නම් ඇති කෙටි ප්‍රබන්ධ හතරක් ලියන ලද්දේය. විමලා කථාව ලියා ඇත්තේ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු දවස සිදු වූ පුවතක

ස්වරූපයෙනි. ආදර හසුනට පසුබිම් වී ඇත්තේ දඹදිව එක්තරා නගරයක වෛරයෙන් විසූ සිටු පවුල් දෙකක් අතර සිද්ධියකි. සිරිබරි කවර රටක සිදුවූ පුවතක් දැයි සඳහන් නැතත් සාමා නම් නගරයක විසූ රජ පවුලක් ආශ්‍රිත කථාවකි. වෙසක් දූතයා කථාව ගොඩනැගෙනුයේ ලක්දිව දකුණු පළාතේ මාතර නිල්වලා ගඟට නුදුරු දිළිඳු පවුලක උපත ලැබූ දරුවකු මුල් කර ගෙනය.

මේ අනුව ඇල්බට් ද සිල්වාගේ කථා තුනක් ම අතීත ප්‍රවෘත්ති ආශ්‍රිත වන හෙයින් සිංහල ඓතිහාසික නව කතාවේ ආරම්භය ඒ සා ඈතට දිවෙන බව නිගමනය කළ හැකි වන්නේය.

වෙසක් දූතයා නම් අමුතු කථාව පළ කිරීමේ දී 1894–04–24 දින ලියන ලද මතු දැක්වෙන සංඥපනයෙන් කර්තෘගේ අරමුණු පැහැදිලි වනු ඇත.

'මෙම අමුතු කථා ලියා ප්‍රසිද්ධ කිරීම පෙරදිග වාසීන් අතුරේ වඩා දැනට නොපවතින නමුත් අපරදිග වාසීන් අතුරේ බොහෝ දියුණුව පවතී. මේ අමුතු කථා වලින් බොහෝ දේ ඉගෙණීමට පිළිවන් වේ. යම් යම් රටවල දේශ ගුණය, වැසියන්ගේ සිරිත් විරිත් ආණ්ඩු ක්‍රම, කථා ප්‍රවෘත්ති ආදීය දැනගැණීමටද මේ අමුතු කථා පොත් අත්‍යන්තෝප-කාරී වේ. සිංහල භාෂාවෙන් මෙබඳු පොත් ලිවීමට ලංකා වාසී තවම නුපුරුදුව සිටිති. එබැවින් එය භාෂාවේ දියුණුවට හානියක්ද වෙන්ට පිළිවන් නිසා මෙසේ අමුතු කථා වැසියාට ප්‍රයෝජනවත් වන පරිද්දෙන් ලියා ප්‍රසිද්ධ කිරීම දියුණු කර හැරීමටද ධෛර්‍ය දිය යුතු වේ.

'වෙසක් දූතයා නම් මෙම අමුතු කථාවෙන්ද නොයෙක් දේ ඉගෙණීමට පිළිවන. මෙය කියවීමෙන් ලංකා ද්වීපය ගැන විස්තරද එහි පුරාණ රාජ්‍ය කළ රජ දරුවන්ගේ බල පරාක්‍රම ගැනද යමෙක් තරුණ වයසට පැමිණි කල සිත වසඟ කර ගැනීමට නො හැකි වීමෙන් සිදු වෙන්ට පිළිවන් කරුණුද දියණිවරුන්ට පර සිරිත් උගැන්වීමෙන් පැමිණෙන්ට

පිළිවන් විපත්තිද නීතිඥයන් වෙත පැමිණි පිටිසර වැසියන්ට සිදුවන හානිද ත්‍රිකුණාමලේ වරාය ගැනද පොලොන්නරුව, අනුරාධපුර යන ස්ථානවල තිබෙන විහාර දගැබ් ආදිය ගැන විස්තරද, දුක්පතාට අමාරුකම් පැමිණීම ස්වභාවක් බවද සාමාන්‍යයෙන් මරක්කල මිනිසුන් වෙළඳාමට දක්ෂයන් බවද, මිහින්තලේ, දඹුල්ල ආදී ස්ථාන සම්බන්ධ කරුණුද, මහ-නුවර, පේරාදෙණිය, කැළණිය, කොළඹ ආදී ස්ථානවල නොයෙක් දේ ගැනද, වෛශාඛෝත්සවය ගැනද සිද්ධාර්ථ කුමාරයාණන්ගේ උත්පත්තිය ගැනද තවත් බොහෝ කරුණුද දනගත හැකි වේ.

'මෙබඳු පොත් පත් උගත් නූගත් සියලු දෙනාටම කියවා තේරුම් ගැණීමට පිළිවන් අන්දමට යෙදිය යුතු බැවින් දනට සාමාන්‍ය වශයෙන් ව්‍යවහාර වන භාෂාවෙන් මෙය ලියන ලද බැව් කියමු.........'[5]

ඇල්බට් ද සිල්වාට පමණක් නොව එකල ලේඛක පාඨක විචාරක සියලු දෙනාට ම පොදු වූ මේ ආකල්ප ප්‍රබන්ධ කථාව සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ පැවැත් වූ බව කිව මනා ය.

නාට්‍යයක මෙන් සංවාදවල දී කථකයාගේ නම සඳහන් කොට ඒ ඉදිරියේ කථන පාඨය යෙදීමේ ක්‍රමය නොව ආඛ්‍යාන ක්‍රමය භාවිත කරන ඇල්බට් ද සිල්වාගේ රචනා-යන්හි සද්ධර්මාලංකාරය ආදි චිරන්තන සාහිත්‍යයේ ආභාසය දක්නට ලැබේ. ප්‍රබන්ධ රචනයේ දී මොහු කටවහරේත්, සම්භාව්‍ය සාහිත්‍ය භාෂාවේත් සම්මිශ්‍රණයක් සේ පෙනෙන ව්‍යක්ත ශෛලියක් භාවිත කිරීම විශේෂ කරුණකි. ඒ අතර විශේෂ අවස්ථා, වර්ණනා, උපදේශ ආදිය ඉදිරිපත් කෙරෙන තන්හි එළිසම පද්‍ය භාවිතය ද මොහුගේ කථාවල ලක්ෂණයකි.

---

5. මුල්ලපිටියේ කේ. එච්. ද සිල්වා, සිංහල නවකථාවේ පුරෝගාමියා, ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම, 1966, 381–382 පිටු.

ඇල්බට් ද සිල්වාගේ අමුතු කථාවලට ලැබුණු ප්‍රතිචාර කෙබඳු ද? විමලා පිළිබඳ සඳහනක් 1892.3.19 දිනැති ලක්මිණි පහන සංග්‍රහයේ පළ වූ අතර මාර්තු 22 දින සරසවි සඳරැස තරමක් දීග විවේචනයක් ගෙන එයි. ඉන් කොටසක් මෙසේය:

'......... මෙය ඇල්බට් නමින් ප්‍රසිද්ධ තරුණ කවි විසින් ලියන ලද කියවීමට රිසි උපදින මධුර කථා වස්තුවකි. කුඩා නමුත් චිත්තාකර්ෂණීය වන පරිද්දෙන් යස රුවට පොත තනා තිබේ. .... මේ පොතෙන් කදිම උපදෙශ දෙකක් උගන්වයි. පොත ව්‍යවහාර භාෂාවෙන් නොලීම Novels යන අර්ථයට විරුද්ධයි.........

'නොවල්ස් නම් පොත් කිරීම සිංහලයන්ට නවම පරිචිත නුවූ යුරෝපීය ජාතිකයන්ගේ කර්තව්‍යයකි. සිංහලෙන් නොවල්ස් ලීම ඇල්බට් මහත්මයා විසින් බෝකරන්ට යන අභිනව යත්නයකි. විමලා නම් පොත නොවල්ස් සංඛ්‍යාවට අයත් නොවේ. මෙබඳු කථා "ඩ්‍රාමා" සංඛ්‍යාවට ගැනේ. නොවල්ස්වලට "අද්භූත" යයි කීමත් වැරදියි. ඇල්බට් මහත්මයා සිංහලයන් අතර "අමුතු" ලියන්නෙක් වෙන්ට නම් වෝල්ටර් ස්කොට්, ඩිකන්ස්, වෝල්ටර් බැසන්ට්, ඔවිඩා, කිප්ලින්ග්, ටෝල්ස්ටෝයි ආදි සමතුන්ගේ පොත් පරීක්ෂාවෙන් කියවා ඔවුන්ගේ පිළිවෙළ අනුව යන්ට සිතුවොත් යස ලියුම්කාරයෙක් විය හැකියි.'[6]

මෙම විවේචනයෙහි අප අවධානය යොමු වුව මනා කරුණු කිපයක් ඇත්තේය. 'මේ පොතෙන් කදිම උපදේශ දෙකක් උගන්වයි,' යන කියමන අනුව නවකතාවකින් වුව එද ඍජු උපදේශ අපේක්ෂා කළ බව සිතා ගත හැකිය. 'පොත ව්‍යවහාර භාෂාවෙන් නොලීම Novels යන අර්ථයට විරුද්ධයි,' යන ප්‍රකාශයෙන් නවකතාව ව්‍යවහාර භාෂාවෙන් ලිවිය යුතු වග අපේක්ෂා කළ බව පෙනේ. 'සිංහලෙන්

6. සරසවි සඳරැස, 22.3.1892, සිංහල නවකතාවට මග පෑදීම, 126 පිටුවේ සම්පූර්ණයෙන් උපුටා දක්වා ඇත.

නොවල්ස් ලිම ඇල්බට් මහත්මයා විසින් බෝකරන්ට යන අභිනව යත්නයකි' යන ප්‍රකාශය ද සිහිපත් කළ යුත්තකි. ඊටත් වඩා වැදගත් කරුණ වන්නේ 'විමලා නම් පොත නොවල්ස් සංඛ්‍යාවට අයත් නොවේ', යි පැවසීමය. මෙම නිගමනයට හේතු දක්වා නැතත් එක ම හේතුව ලෙස පෙනෙනුයේ 'ව්‍යවහාර භාෂාවෙන් නොලීම' වේ. අමුතු කථා ලේඛයෙකු වීම සඳහා ස්කොට්, ඩිකන්ස්, ටෝල්ස්-ටෝයි යනාදි ලේඛකයන්ගේ කෘති කියවීමට උපදෙස් දෙනත් 'මෙබඳු කථා ඩ්‍රාමා සංඛ්‍යාවට ගැනේ' යන වාක්‍යයෙන් පෙනෙනුයේ විචාරකයා තුළ ද නවකතා පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොවූ බවය.

මෙරට සිංහල පාඨකයා අතර නොව, ඉංග්‍රීසි උගතුන් අතර නම් දහනව වන ශත වර්ෂයේ මධ්‍ය භාගය පමණ වන විට රොබින්සන් ක්‍රෘසෝ වැනි ඇතැම් ඉංග්‍රීසි ප්‍රබන්ධ රචනා, විශේෂයෙන් වෝල්ටර් ස්කොට්, චාල්ස් ඩිකන්ස් යන ලේඛකයන්ගේ කෘති ප්‍රචලිත වූ බව පෙනේ. මෙම කෘති කෙරෙහි ලාංකික ඉංග්‍රීසි පාඨකයාගේ සිත් ඇදුණේ විනෝදය සමග සදචාරාත්මක ප්‍රයෝජනයක් ද ඉන් ලැබුණු නිසාය.[7]

ඇල්බට් ද සිල්වාගේ මුල් නවකතා තුනට ලැබුණ පාඨක ප්‍රතිචාර සැලකීමට ගැනීමෙන් දෝ වෙසක් දූතයා නම් ඊළඟ කෘතිය ලිවීමේ දී යම් වෙනසක් සිද්ධ කර ඇති බව පෙනේ. එම ලේඛකයාගේ අරමුණු ඉහත උපුටා දක්වන ලද සංඥපනයෙන් ම පැහැදීලි වන්නේය.

1905 දී මීනා පළ වූ පසු ඇල්බට් ද සිල්වා ම ඒ කෘතිය තම කථාවලට වඩා සාර්ථක බව පිළිගත් සේ පෙනේ.

> 'තුටු පඬුරට මා වෙත් එව් මහත්මා විසින් ඒ පොතතට ලැබ "මීනා" නම් කියෙව්වෙම් පසස්මින් හැගෙනට අවියත් වත් වත් දනන් වත් මනා සේ එ පුවත ගැලපූ ලෙස් නම් ඉතාමත් කදීමයි.

7. M. Y. Gooneratne, English Literature in Ceylon, 1885–1876, Tisara Prakasakayo, 1963, ch ii.

කලකට ඉහතින් මින් මා විසින් මේ විලස්නෙන්
සිරිබරි විමලා ආදී කුඩා පොත් තනාලා
පරසිදු කර වූ මුත් ඒ තැතින් මා සිතූ ලෙස්
අනුබල නොලදත් ''මීනා'' නම් එසේ නම් නොවේ මැයි.'[8]

පළමු වන සිංහල නවකතාව

1904 වර්ෂයේ දී පමණ ඒ. ආර්. ප්‍රනාන්දු නමැත්තකු විසින් Singhalese Marriages or What is True Love (සිංහල විවාහ නොහොත් සැබෑ ආදරය යනු කුමක් ද) නමැති ප්‍රබන්ධ කථාවක් ලියා පළ කරන ලද බව ඉංග්‍රීසි පත්‍ර වාර්තාවක සඳහන් වෙතත් එහි සිංහල නම ඇතුළු කිසිදු තොරතුරක් ලැබී නැත. ඒ. සයිමන් ද සිල්වා ගේ මීනා විමර්ශනය කරන විද්‍යාර්ථීන් නඟන මූලික ප්‍රශ්නයක් සේ පෙනෙනුයේ පළමු වන සිංහල නවකතාව කුමක් ද යන්නය.

පරිච්ඡේද 13 ක් වන සේ පිටු 144 කින් යුක්ත වන මීනා 1905 දී පළමු වරට කොළඹ ශ්‍රී ලංකොදය යන්ත්‍රාලයයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලද්දේ මාතර ඩී. ඇම්. ඇස්. ගුණවර්ධන විසිනි. එකල ඉංග්‍රීසි සිංහල පුවත් පත් සඟරාවන්හි මුල් වරට මීනා පිළිබඳ විස්තර විචේචන පළ වී ඇත්තේ 1905 වර්ෂයේ ජූලි අගෝස්තු මාසවල බව පෙනෙන හෙයින් මෙම කෘතිය පළ වූයේ ඊට පෙරාතුව බව අනුමාන කළ හැකිය,

පළමු වන සිංහල නවකතාව කුමක් ද? නැතහොත් මීනා පළමු වන සිංහල නවකතාව ද? යන්න ගැටලුවක් වී තිබීම පුදුමයට හේතුවක් නොවන්නේ ඉංග්‍රීසි ආදි අනෙක් සාහිත්‍යයන් සම්බන්ධයෙන් ද මේ ප්‍රශ්නය අදත් තීරණය වී නොමැති නිසාය.

---

8. සිංහල නවකතාවේ පුරෝගාමියා, 110 යි.

නවකතාව යන සිංහල වචනය පවා එකල භාවිත වූ බවක් නො පෙනේ. සයිමන් ද සිල්වා විසින් මීනා හඳුන්වනු ලැබුයේ 'රසවත් කථාන්තරය' යනුවෙනි. ඊට පෙර ඇල්බට් ද සිල්වා තම ප්‍රබන්ධ කථා හැඳින්වූයේ 'අමුතු කථා' යන සිංහල නමින් සහ Novel යන ඉංග්‍රීසි පදයෙන් බව සිහිපත් කරනු වටී. 1906 දී පියදාස සිරිසේන විසින් තම මුල් කෘතිය වූ ජයතිස්ස සහ රොස්ලින් හඳුන්වනු ලැබුයේ 'ප්‍රබන්ධ කථා' නමිනි. කෙසේ වෙතත් මේ සිංහල නම් භාවිත කෙරෙනුයේ ඉංග්‍රීසි Novel යන පදය බලාගෙන බවට සැකයක් නැත. මීනා පළමු වන මුද්‍රණයේ පිට කොලයේ Meena – A Novel by A. Simon de Silva යන ඉංග්‍රීසි පාඨයක් වෙයි. 1905 ජූලි 17 දින The Times of Ceylon පුවත්පතෙහි පළ වූ විවේචනයක Mr. A. Simon de Silva of the P. W. D. favours us with a copy of a work of fiction in Singhalese, the first of its kind attempted in the Vernacular, යනුවෙන් සඳහන් කෙරේ. ඒබ්‍රහම් මැන්දිස් ගුණසේකර විසින් ද එවැනි ම ප්‍රකාශයක් කරන ලද බව කියැවේ. මේ අනුව 'රසවත් කථාන්තරය' නමින් එහි කතුවරයා විසින් හඳුන්වනු ලැබූ මීනා කෘතිය Novel, Fiction යන වර්ගයට අයත් කොට සිංහලයෙන් ලියැවුණ පළමු වන කෘතිය සේ එකල බොහෝ උගතුන් විසින් සලකනු ලැබූ බව සිතිය හැකිය. මේ අනුව ඇල්බට් ද සිල්වාගේ විමලා ආදි කෘති හෝ ඊට පෙරාතුව ලියනු ලැබූ ප්‍රබන්ධ කථා හෝ Novel යන සාහිත්‍යාංගය සේ සැලකීමට ඇතැම් උගතුන් මැලි වූ බවක් ද පෙනී යයි.

අද්භූතයෙන් යථාර්ථ මාර්ගයට සමීප වීම

දහඅට වන ශත වර්ෂයේ දී පහළ වූ නවකතාව පෙර පැවති අද්භූත කථාවෙන් වෙන් කර හඳුනා ගැනීමේ මූලික නිර්ණායකය වශයෙන් විචාරකයන් විසින් සලකනු

ලබනුයේ යථාර්ථවත් භාවයයි.[9] මේ යථාර්ථවාදී නවකතාව පිළිබඳ පැහැදිලි නිර්වචනයක් ඉදිරිපත් කිරීම අපහසු වුවත් මිනිස් ජීවිතය පිළිබඳ සත්‍යය හෙවත් සැබෑ අර්ථය ඉදිරි-පත් කිරීම ඉන් අපේක්ෂා කෙරෙන බව සාමාන්‍ය පිළිගැනීම වේ. 'සිසල්ලු අතින් ම තාත්වික නැතහොත් කිසිදු අඩු වැඩියක් නොමැතිව ඇති සැටියෙන් ම ජීවිතය පිළිබඳ තතු වාර්තා ගත කිරීමක් යථාර්ථයෙන් අපේක්ෂා නොකෙරේ. කලා කරුවා විසින් ස්වකීය පරිකල්පනය මගින් සැබෑ ජීවිතයේ පිටපතකට වඩා වෙනස් වන කාල්පනික ලෝකයක් ඉදිරි පත් කරනු ලබයි'.[10] කෘතිය සමස්තයක් වශයෙන් සලකන කල ජීවිතය පිළිබඳ යම් සත්‍යයක් හෙවත් අර්ථයක් නව කතාව නම් නව සාහිත්‍යාංගයෙන් අපේක්ෂා කරන බව මෙයින් ගම්‍යමාන වනු ඇත.

මේ අනුව, අද්භූත මාර්ගයෙන් බැහැර වී යථාර්ථ මාර්ගය පිළිපදින නවකතාවේ දී සත්‍යයක් සේ පෙනෙන කල්පිතයක් ඉදිරිපත් කෙරෙන බව නිගමනය කළ හැකිය. යම් ප්‍රබන්ධයක් සත්‍යයක් සේ පෙනී යනුයේ යම් ක්‍රියාකාරී චරිත සමූහයක් ආශ්‍රිතව ගොඩනැගෙන කථා වින්‍යාසය විශ්ව-සනීයත්වය නොබිඳෙන සේ හෙවත් ඇදහිය හැකි අයුරින් ඉදිරිත්පත් වන කල්හිය. චරිත හා සිද්ධි පිළිබඳ විශ්ව-සනීයත්වය ඇති වීමට හේතු වන තවත් වැදගත් කරුණක් ඇත. එනම් ඒ චරිත හා සිද්ධි යම් නිශ්චිත කාල නියම-යක් (time) සහ ඉඩ හසරක් (space) තුළ පිහිටීමේ අවශ්‍යතාවයි. මීනා කථාවෙහි මේ අවශ්‍යතා කෙතෙක් දුර සම්පූර්ණ වී ඇද්ද ?

කථාව ආරම්භයේ දී ම, යොවුන් වියේ පසු වන මීනා සූදුකාරයන්ගෙන් ආරක්ෂා වීම සඳහා, ඔවුනට ආවතේව කිරීමේ දී මැහැල්ලක මෙන් වෙස්වළා ගෙන සිටී. මෙවැනි

---

9. Ian Watt, The Rise of The Novel, University of California Press, 6th printing, p. 10.

10. A Dictionnry of Modern Critical Terms, Ed by Roger Fowler, London, 1973.

වෙස්වළා ගැනීම, බිහිසුණු සතුන් මෙල්ල කිරීම, දෛවෝප-ගත හමු වීම, රහස් උමං හා ගල්ගුහා, අහේතුකව චරිත ලක්ෂණ වෙනස් වීම ආදිය හා ආශ්‍රිතව මේ කථාව ගොඩ නැඟී ඇත්තේය. මීනා සත්‍යයක් සේ පෙනෙන කල්පිත කථාවක් වීමට මේ කරුණු සැබැවින් ම හරස් වනු ඇත. මීනා නවකතා ගණයට අයත් නොවන අද්භූත කථාවක් සේ නිගමනය කළ යුතු ද?

මීනා කථාවේ විශේෂත්වය නම් අතරින් පතර ගළපා ඇති අද්භූත සිද්ධි හා අවස්ථා ආශ්‍රයෙන් කථාව ගොඩනැඟී තිබිය දීත් සැබෑ ජීවිතයේ හමු වන ගැහැනුන් හා පිරිමින් වශයෙන් යම් ප්‍රමාණයකින්වත් සැලකිය හැකි චරිත කීප-යක් පාඨකයා වෙත ගෙන එනු ලැබීමය. ජා හමුදාවේ සේවය කළ අබ්දුල්, ඔහු විවාහ ජීවිතය ගත කරන ලෙන්චි-හාමි, ඔවුන්ගේ දූ මීනා. නාගරයේ ඉපිද සෙල්ලක්කාර ජීවිතයට ඇබ්බැහි වී පසුව මීනාගේ ඇසුරෙන් යහපත් බවට පත්ව ඉනික්බිති පරණ යහළුවකු නිසා යළි දූෂිත පුද්ගල-යකු වන ඩැනී, ඔහුගේ යහළුවා වන දෙස්තර. කැලෑ ජීවිතය ප්‍රිය කරන මහල්ලා සහ ඔහුගේ සමාගම්කාර පවුලස් යන අයගේ චරිත ඉදිරිපත් කර ඇත්තේ ඇතැම් වීට ඇදහිය නොහැකි තත්වයෙන් යුක්ත වුව ද සැබෑ ජීවිතයේ දී හමු වීය හැකි පරිදි ගතිගුණවලින් හා ක්‍රියාකාරිත්වයෙන් යුක්ත පුද්ගලයන්ගේ ස්වරූපයෙකි. පියදාස සිරිසේන ගේ 'ජයතිස්ස සහ රොසලින්' කථාවේ දී ඒ දෙදෙන විවාහ ගිවිස ගත් සැටීත් මීනා කථාවේ වරක් මීනා සහ ඩැනී ද පසුව මීනා සහ පවුලස් ද විවාහ ගිවිසගත් සැටිත් විමසී-මෙන් මෙකරුණ පැහැදිලි වනු ඇත.

සුරා සූදු ආදිය අත හැර මීනා හා විවාහ වීමට පොරොන්දු වී සිටීන ඩැනී නගරයේ විසූ අතීත මිත්‍රයකු වූ දෙස්තරගේ ඇසුර නිසා යළි නරක ජීවිතයකට යොමු වන්නේය. නගරාශ්‍රයෙන් බැහැරව වෙසෙන පවුලස් ඊට වඩා හොඳ ගති පැවතුම් ඇති තරුණයෙකි. පවුලස් මීනා කෙරෙහි එතෙක් සඟවා ගෙන හුන් ආදරය මතු වීමට ඉඩ

දෙනුයේ ඇගේ සිත ඩැනීගෙන් බිඳුන පසුය. මේ චරිතයන්ගේ සිතුම් පැතුම්, ක්‍රියාකාරිත්වය, හැසිරීම සහ පුද්ගල සම්බන්ධතා සැබෑ ජීවිතයට ළං වන සේ ඉදිරිපත් කිරීමට කතුවරයා උත්සාහ ගෙන ඇති බව පෙනේ.

අනෙක් අතට මෙම කථාව ගොඩනැගී ඇත්තේ ප්‍රධාන වශයෙන් ම වෙස්වළා ගැනීම්, වනගත වීම් සහ කැලෑ පෙදෙස්හි ජීවත් වීම් හා සම්බන්ධ චරිත මත යයි කිව හැකි තරමය. ඒ නම් සැබවින් ම කථා වින්‍යාසය දුර්වල වීමට හේතු වන්නකි. මේ සිද්ධිවල රාමායණය, උම්මග්ග ජාතකය වැනි පොත්වල බලපෑමක් පවා දැකීම අපහසු නොවේ. එසේ ම දීර්ඝ නුවූවත්, අට වන පරිච්ඡේදයේ දී, මහල්ලා විසින් ඉදිරිපත් කෙරෙන කෝපි වැවීම් පිළිබඳ විස්තර ද කථාවට කිසි සේත් සම්බන්ධ නුවූවකි. මේ තොරතුරු ඇතුළු කරනු ලැබුයේ ප්‍රබන්ධ කථාවකින් වුව එද පාඨකයා මෙවැනි කරුණු අපේක්ෂා කළ නිසා බව සිතිය හැකිය. පොතෙහි කියා ඇති පරිදි කෝපි වගාව පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් නොවන බවත්, ලංකාවේ අතීත සමෘද්ධිය පිළිබඳ විස්තර ආදිය ඇතුළු කරන ලද නම් කෘතියේ අගය වැඩි වන්නට තුබූ බවත් කෘතියේ අඩුපාඩු වශයෙන් එද, ඇතැම් විචාරකයන් විසින් පෙන්වා දෙනු ලැබීමෙන් එකල පැවති පාඨක රුචිය කෙබඳු දැයි සිතා ගත හැකිය. කෙසේ වෙතත් සමකාලීන අනෙක් කෘති හා සසඳන කල කථාවට සම්බන්ධ නොවන අමතර දෑ මෙහි ඇත්තේ අල්ප වශයෙන් බව පෙනී යයි.

ඩබ්ලිව්. ඇෆ්. ගුණවර්ධන මුදලිගේ ඉංග්‍රීසි විවේචනය යළි සිහිපත් කරනු වටී. "මීනා නම සිංහල නවකතාව ....ලංකාවේ වෙසෙන පහත් පෙළේ ජනයා පිළිබඳ යථාර්ථ චිත්‍රයකි. මැනවින් චිත්‍රණය කරන ලද එය අපේක්ෂිත අරමුණු ඉෂ්ට කර ගැනීමෙ සාඵල්‍යයෙන් යුක්තය.'[11] නවකථාවක් සම්බන්ධයෙන්, එය වස්තු කර

---

11. මීනා, මාතර, 2 වන මුද්‍රණය, 1969. ආරිය රාජකරුණාගේ පෙරවදන, iii පි. ඉංග්‍රීසි උද්ධෘතය.

ගත් සමාජය පිළිබඳ 'යථාර්ථ චිත්‍රයක්' යයි නිගමනය කරනු ලැබීම වූ කලි සැබවින් ම එහි සාර්ථකත්වය කියා පෑමකි. ගුණවර්ධන මුදලි මේ නිගමනයට එළඹෙනුයේ කෘතියෙහි අන්තර්ගත අභව්‍ය දෑ නොසලකා නොවිය හැකිය. විශ්වසනියත්වයෙන් තොර සිද්ධි, අවස්ථා ආදිය අන්තර්ගත වූ පමණින් යම් කෘතියකින් සමාජය පිළිබඳ යථාර්ථ චිත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි බව ඔහු නොඇදහූ සේය. මීනා කෘතියේ එක් විශේෂත්වයක් වනුයේ ඇදහිය නොහැකි යම් යම් සිද්ධි තිබිය දීත් අදාළ සමාජය පිළිබඳව සෑහෙන තරම් ඒත්තු ගත හැකි විවරණයක් ඉදිරිපත් වීමය.

නවකතාව සත්‍යයක් සේ පෙනෙන කල්පිතයක් වුවමනා බව පිළිබඳ තර්කයක් නැත. මීනාහි අන්තර්ගත අභව්‍ය දෑ නිසා මේ තත්වය ඇති වීමට බාධා පැමිණේ. එසේ ද වුව, ඒ කල්පිතය සත්‍යයක් සේ පිටට පෙනුණ තරමින් නම් යථාර්ථ නිර්මාණයක් නොවන්නේය. 'නව-කතාවේ යථාර්ථය රඳා පවත්නේ එය ඉදිරිපත් කරන ජීවිතයේ තත්වය මත නොව එය ඉදිරිපත් කරන ආකාරය මතය.'[12] ඉයන් වොට් නම් විචාරකයාගේ මෙම කියමන මීනා තේරුම් ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වන්නේය. මේ අනුව කතුවරයා ජීවිතය ඉදිරිපත් කරන ආකාරය කෙබඳු දැයි විමසීම අවශ්‍ය වේ. මෙකරුණ විභාග කිරීම චරිත නිරූපණය හා ලැදි පවත්නා හෙයින් මීනා කෘති-යෙන් ජීවිතය ඉදිරිපත් කෙරෙන ආකාරය, කතුවරයා සමාජය වෙත හෙළන දෘෂ්ටිය සහ චරිත නිරූපණය යන කරුණු සංයුක්ත වශයෙන් සාකච්ඡා කිරීම පහසුය.

චරිත නිරූපණය සහ සමාජ ආකල්ප

මීනා කතාව තරුණයන් දෙදෙනකු හා තරුණියක අතර සම්බන්ධය පසුබිම් කර ගොඩනැඟුණ පුවතක් සේ පෙනෙතත් සුලභ ප්‍රේම කථාවක් නම් නොවන්නේය. මෙය

12. The Rise of the Novel, p. 11.

මීනා නම් තරුණියගේ ආදරය දිනා ගැනීම සඳහා පොර කන තරුණයන් දෙදෙනකුගේ කථාවක් ද නොවන්නේය. මීනා වූ කලි මීට වඩා ගැඹුරින් මෙන් ම අර්ථවත් ලෙස ද චරිත දෙස බැලීමට දැරූ ප්‍රයත්නයකි.

සාර්ථක නවකථාවකින් ක්‍රියාකාරී වන්නා වූ ද එසේ ම වෙනස්වීම්වලට පාත්‍ර වන්නා වූ ද පුද්ගලයන්ගේ චරිත නිරූපණය වන බව කියනු ලැබේ. එසේ ම සාර්ථක නවකතාවකින් ඒකාංශ චරිත් නොව පරිපූර්ණ නොහොත් සංකීර්ණ චරිත නිරූපණය කිරීම ද අපේක්ෂිතය. මීනා කෘතියෙහි චරිත තුළ මේ ලක්ෂණ යම් ප්‍රමාණයකින් විද්‍යමාන වෙයි. එමතු නොව ඒ චරිත එකලාව ක්‍රියා කරන පුද්ගලයන් ලෙසීන් නොව කර්තෘ මවන සමාජය තුළ ක්‍රියාත්මක වශයෙන් අන්‍යොන්‍ය සම්බන්ධතා පවත්වන හෙවත් අන්‍යයන්ගේ ක්‍රියාවලිය හා බැඳී හැසිරෙන චරිත වීම ද වැදගත් කරුණකි. මීනා කථාවේ හමු වන පුද්ගලයෝ මෙසේ ක්‍රියා කරන්නෝය.

ග්‍රන්ථ නාමය අනුව ම මෙම කථාව මීනා නම් තරුණියගේ කථාවයි. සෙසු පාත්‍රවර්ගයා ඇයගේ චරිතය හා අඩු වැඩි ප්‍රමාණයෙන් සම්බන්ධ වෙති. මීනා මෙහි නිරූපණය කර ඇත්තේ ගතානුගතික සුලභ චරිත ලක්ෂණයන්ගෙන් යුක්ත තරුණියක ලෙස නොවේ. වැඩි ඉගෙනීමක් නැතත් බුද්ධිමත්, එමෙන් ම ආත්ම ශක්තියෙන් අනූන තරුණියක සේ ඇයගේ චරිතය ගොඩ නගා ඇත්තේය. මේ අනුව කතුවරයා ස්ත්‍රී චරිතය පිළිබඳව, සමාජය පිළිබඳව නව දෘෂ්ටියක්, හෙළන බව කිව හැකිය. මීනා වූ කලි සුචරිතයට ගැති වූ ආදර්ශ චරිත ඇත්තියක නොව, පැමිණෙන දුෂ්කරතා මධ්‍යයේ ක්‍රියා කරමින් ජීවිතයේ අභියෝග ජය ගත හැකි තරුණියක් වෙයි. ඇතැම් අභව්‍ය සිද්ධි ඇතත් පුළුල් වශයෙන් සලකන කල ඇයගේ ක්‍රියාකාරිත්වය හා චරිත ස්වභාවය අතර පරස්පර විරෝධයක් නොපවතී. විවාහ ගිවිස ගෙන සිටින ඩැනී නම් තරුණයා සමග වනගතව එකට විසුව ද ආත්ම ශක්තියෙන් අනූන මීනා ස්වකීය තාරුණ්‍යය පවා ආරක්ෂා කර ගන්නීය.

මෙහි චරිත නිරූපණයේ අනෙක් විශේෂත්වය තම චරිතයන්ගේ චිත්ත ස්වභාවය විවරණය කිරීමට උත්සාහයක් ගෙන තිබීමය. එක් අතකින් තමන් විවාහ ගිවිස ගත් තරුණයාත්; අනෙක් අතින් මනා ගති පැවතුම්වලින්, කඩවසම් පෙනුමෙන් හා නිර්භීතකමෙන් ද යුක්ත වෙනත් තරුණයකුත් අතර මැදි වූ තරුණියකගේ සිතිවිලි ගෙන හැර පෑමට මේ කෘතියෙහි උත්සාහයක් දරා ඇත. විශේෂයෙන් මෙහි හය වන පරිච්ඡේදය මීනාගේත් ඩැනීගේත් අභ්‍යන්තර හැඟීම් විවරණය කිරීම සඳහා උපයෝගි කර ගෙන ඇත්තේය. මීනා හා ඩැනි අතර සම්බන්ධය ක්‍රමයෙන් ගොඩ නැඟී එන මේ කථාව අනෙක් මාර්ගයකට යොමු වීම ආරම්භ වනුයේ ද මේ පරිච්ඡේදයෙහි.

කථාව අවසන් වනුයේ නාගරික ජීවිතය නියෝජනය කරන දෙස්තරගේ බලපෑමට අසු වූ ඩැනී ආත්ම ශක්තියක් නැති, පොරොන්දු කඩ කරන, හොඳ නරක නොසලකන, වංක තරුණයකු බව මීනා විසින් තේරුම් ගනු ලැබීමෙනි. එපමණක් නොව සමාජයේ ස්ත්‍රීන්ටත් පුරුෂයන්ට මෙන් ම උසස් තැනක් හිමි විය යුතු බව පිළිගන්නා පවුලස් නමැත්තාගේ උත්කම් ගතිගුණ තේරුම් ගන්න මීනා ඔහු හා සරණ යාමට එකඟ වන්නීය. කතුවරයා ජීවිතය කෙරෙහිත් සමාජය කෙරෙහිත් හෙළන දෘෂ්ටිය හා සංයෝග වන ඒ ඒ චරිතයන්ගේ ක්‍රියාකාරිත්වය නිසා පාඨකයාට ද ජීවිතාවබෝධයක් ලැබේ. ඍජු උපදේශ දීමක් මෙහි නැතත් සමාජයට අවශ්‍ය ආදර්ශයක් ද කථාවට ගැබ් වී ඇත්තේය.

මීනා අදටත් වඩා එය සම්පාදනය වූ අවධියේ පාඨකයාට බෙහෙවින් අර්ථවත් කෘතියක් වූ බවට සැකයක් නැත.

මීනා වූ කලි කථා ප්‍රවෘත්තියට මුල් තැන ලැබෙන ප්‍රබන්ධ කථාවක් පමණක් නොවන්නේය එය චරිත නිරූපණය මෙන් ම සමාජ විවරණය ද කෙරෙහි සැලකිලි දක්වන නිසා කවර අඩුපාඩු ඇතත් නවකතාවකට ළං වන්නකි.

මීනා

1 වෙනි පරිච්ඡේදය

ගම්පල එක්තරා කුඩා ගෙයක ''මීනා'' නමැති තරුණ කාන්තාවක් වාසය කළා ය. ඇගේ පියා අබ්දුල් නමැති, ජා හමුදාවේ සේවායෙකි. ඔහු කොළඹ වාසය කරන කාලයෙහි ''ලෙන්චිහාමි'' නම් රූපශ්‍රීයෙන් යුත් සිංහල ගැහැණියෙකු වෙත ආලය බැඳ ඈ හා සමග රහසිගතව සරණබන්ධනයට ඇතුළත් විය, ඔවුන්ට ඉපදුණ දරුවන් තුන්දෙනා අතුරෙන් දෙදෙනෙක් බාල කාලයෙහි දීම මරුමුවට පත් වූයෙන්. ඉතිරි වූයේ මීනා නමැති දුවනිය පමණකි. ඈ තරුණ වයසට පැමිණි කාලයෙහි අබ්දුල් යුධ හමුදාවෙන් ඉවත්ව ගම්පල වාසය ගත්තේ ය. අබ්දුල් කඩිසර මිනිහෙකි. තමාගේ පවුල රක්ෂා කිරීමට තිසි ආදායමක් නැත්තෙන්, ඔහු සූදුවෙහි බැඳුනේ ය. ඔහුගේ දක්ෂකමින් මුදල් දිනාගෙන ටික කාලයක් සැපසේ ගත කොට පසුව තවත් මුදල් සැපයීම පිණිස තමා යටතෙහි ගෙදරම සූදුපලක් පිහිටුවා ගත්තේ ය. අසල්වාසීන්ගේ ද මග යන එන්නන්ගේ ද සැකය දුරලන පිණිස ගෙයි ඉස්සරහ කොටස ලුණු කහ මිරිස් ආදී සිල්ලර වෙළඳාම පිණිස පාවිච්චි කෙළේ ය. පසු පාර්ශ්වය සූදුවට යෙදී ය. ඔහුගේ භාර්‍යාව ඒ වෙළඳාමෙහි යෙදී ක්‍රමයෙන් එය දියුණු කරගෙන ආවා ය. සූදුකරුවන්ගේ සැප විහරණය බැලීමට

හා උවමනා දේ සැපයිමටත්, පිට වැඩ කරුවෙක් ගන්ට අකමැති වූ අබ්දුල් තමාගේ දූවනියන් ඊට යෙදූවේ ය. ඇගේ රූපශ්‍රීය නිසාත් තරුණ අවස්ථාව නිසාත් ඒ සුද්ද කරුවන්ගෙන් උපද්‍රව ඇතිවිය හැකි බැවින් ඒ වැලැක්වීම සඳහා ඈ හට මහළු වෙසක් ගන්ට සැලැස්විය. බූරුල්ව එල්ලී වැටෙන වස්ත්‍ර හැඳ, බොරු කොන්ඩයක් ලා පාටක් ගා මුහුන වෙනස් කරගත් විට, ඈ සම්පූර්ණයෙන්ම මැහැලියෙකු ලෙස පෙනෙන්ට විය.

මෙසේ ඔවුන් දවස් ගත කරන කාලයෙහි එක් දිනෙක ලෙන්චිහාමි ඇගේ දියනියන්ට කථා කොට ළඟ හිඳුවා-ගෙන "මීනා, උඹ සමග කථා කරන්ට සතුටු කාරණයක් මට තිබේ. උඹ දැන් ලෝකයේ සිරිත් අන්දමට සවාමියෙකු පාවා ගන්න වයසට පැමිණ සිටින්නෙහි ය, උඹේ උගත්කම ගැන බලනකොට අපේ තරාතිරම්වල උඹට නිසි සවාමි-යෙකු මේ අසලක නැති බව පෙනේ. ඉතින් උඹේ පියාගේ සතුට නම් අපේ මිත්‍ර වූ "කරෝලිස්ට" උඹ පාවා දීමටයි. ඒ ගැන උඹ කියන්නේ මොකොද" යි ආදරවන්ත ලෙස ඇසීය.

මීනා සහ මැනියන් අතරේ එකිනෙකා කෙරෙහි පැවැත්වූ තද ප්‍රෙමයක් ඇති විය. එහෙයින් ඔවුන්ගේ අදහස් උදහස් ඇති සැටියේම ප්‍රකාශ කිරීම සිරිතක්ව තිබුනි. මීනා කථා කරමින් "මැනියෙනි, උඹලා කියන යමකට විරුඬවීම මට යුතු නොවේ. එසේ වුවත් මම ඔය කී අය සමග යාමට කැමැති නොවෙමි. ඊට කියන්ට නිසි කාරණා මට නැතත් මගේ සිතෙහි ඔහු කෙරේ කිසි ප්‍රෙමයක් ඇතිවී නැති බැව් මට හැඟේ. උඹ තාත්තා සමග ආවේ, උඹේ නෑදෑයන්වත්, උඹේ ජාතියවත් සලකා බලා නොවෙයි. නුමුත් උඹ ඒ ගැන අදවන තුරු පසු-තැවිලි වුනා මම නොඇසුවෙමි. ඊට හේතුව උඹලා දෙදෙනාගේ තද ඇල්ම වේ. ඒ නිසා මමත් එසේම සැහෙන කෙනෙකුට ආසාව ඇතිව විවාහ වීමට කැමැත්තෙමැ" යි කීය.

ඇගෙ කීම යුතු බැවි ලෙන්විහාමිට වැටහී ගියේය. ඇගේ බාල අවස්ථාවද එයින් සිහිපත්වී ප්‍රීතියෙන් පිණාගිය මුහුනින් යුතුව ඈ දියනියන්ගේ වචනවලට විරුඬව කිසිවක් නොකියා, පසුව ඒ ගැන කල්පනා කර බලන බව කියමින් කථාව හමාර කළා ය.

මීනාද මැනියන්ගෙන් ඉවත්ව කාමරයව ගොස් තනිව වාඩිගෙන කොට්ට උරයක් මහමින් කල්පනා කරන්ට පටන් ගත්තී ය. කරෝලිස් යයි සඳහන් වූ තැනැත්තා ඒ අසල කඩයක වෙළඳාම කරන පාත රට තරුණයෙකි. ඔහු වයසින් විසිපස් ඇවිරිදි ප්‍රමාණ වූ, ශරීර ශක්තියෙන් ඌන නුවූ, ස්ත්‍රියෙක් සතුටු කරන්ට පුළුවන් වූ අයෙකි. ඔහු කෙරේ ආලය වෙන්ට බැරි මන්දැයි මීනා තමාගෙන්ම ඇසීය.

ස්ත්‍රීන් බලන්නේ පළමුකොට ලක්ෂණයයි. ඔහු ලක්ෂණින් ආඪ්‍ය නුවූවත්, තරමක් දුරට ලක්ෂණයයි කියන්ට පුළුවන් වූ අයෙකි. නුමුත් ඔහුගේ ඇස්වල කාන්තිමත් ගතිය නොමැතියි. මදක් මලානික සවභාවය තිබේ. කාන්තිමත් ඇස් මලානික සවභාවයට යෙදූ විට ඉතා ආසා කරවත්. නුමුත් නිතරම මලානික ඇස්, කාන්තියක් නැතිව, කිසිවෙකුගේ සිත් නොදිනාති. එපමණකුත් නොව ඔහුගේ පෙනීමෙහි ප්‍රිය කරවන ගතිය නොමැතියි. තරුණාවස්ථාවෙහී සිත ඉතා ප්‍රීතිමත් හෙයින් මුහුනෙහි පැතුරුණා වූ ප්‍රියතාවය ඇතිවිය යුතුයි. ඔහුගේ මුහුන වයස්ගත වූ තාපසයෙකුගේ මෙන් ගැඹුරු සවභාවය උසුලයි. එය තරුණ වයස පසුවූ ගැහැණුන්ට සැහෙයි. නුමුත් විසි වයසට ලං වූ, බාල වූ, සෙල්ලම් සහිත වූ මට ප්‍රිය නොවේ. ඔහු දැන් මගේ රූපය නිසා ලොල්ව සිටී. ඔහු අතට මා අසුව සවල්ප දවසක් ගත වන විට ඒ ආසාව නැති වෙයි. ඉන් පසු ඉතිරි වන්නේ ඔහුගේ ගැඹුරු වූ කල්පනා සහිත ලෞකික සවභාවයි. එවට සැහැල්ලු වූ. සැප ආසා වූ මට ඔහුගේ සමාගම දුක් සහිත වේ. එබැවින් මම ඔහුට අකැ-මැති වීම වරද නොවේය යනාදී වශයෙන් සිතා කාරණය

සම්බන්ධව සපිර ලෙස අකමැති වෙමැයිද, ඒ බව නැවතත් මැනියන්ට හඟවමැයිද, සිතට ගත්තී ය.

සවස් කාලය පැමිණී ය. බටහිර අහස්හි සූර්‍ය්‍යයා මඳ රශ්මියෙන් යුතුව බැබළිය. මීනා ද වෙස් මාරු කරගෙන වයස්ගත වූ මැහැළියෙකුගේ ලීලාව දක්වා ඇගේ කටයුතු වලට සැරසුනිය. හිර බසින්ට මත්තෙන් එදින සූදුව පවත්ගෙන රෑ වී හත් අට පැයක් යන විට වෙනද මෙන්ම මිනිසුන්ගෙන් ශාලාව පිරී ගියාය. කෝපි සශ්‍රිකව පැවති කාලය හෙයින් බොහෝ යුරෝපාකාරයෝ ඒ මගින් ගමනාගමනය කරන්ට වූහ. ඔවුන්ට සේවය කිරීම් ආදියෙන්ද, කෝපි සොරකම් කොට විකුණා ගැනීමෙන්ද, රට වාසීන්ට මුදල් ද බොහෝ ඇති විය. එහෙයින් මේ සූදු කරුවෝ බොහෝ මිල මුදල් ගෙන සූදුව කළාහු ය.

මෙකී දිනයෙහි රැස් වූ සූදුකරුවන්ගෙන් මුදල් රාශියක් අබ්දුල් අතට පත් විය. සූදුව ද රෑ මුළුල්ලෙහි පැවතීය. එය අවසාන වූ පසු අබ්දුල් තමා දිනූ මුදල් ගණන් බැලූ විට පවුන් තිස්පහක් තිබුනි. ඔහුගේ භාර්‍ය්‍යාවද ඒ මුදල් සුරක්ෂිත ලෙස තබාගෙන සූදුව ටික දවසකට නවතන්ට කියා සිටියා ය අබ්දුල් තමාගේ හොඳ කාලය පැමිණි බැවින් එසේ කිරීම යුතු නොවේ යයි ද, වැඩිදුරටත් සූදුව ඔහුට ප්‍රයෝජන වේයයි ද කියා පසුවදත් පටන් ගති. නමුත් ඔහුගේ අදහස් ඉෂ්ට නොවී එදින පවුන් දෙළොසක් පැරදින. වැඩිපුර මුදල් නොදෙන බැව් ලෙන්චිහාමි කියා සිටියා ය. එදින සූදුව රෑ මද්දිම යාමයේදී ඉවර කෙලේය. ඉස්සර දවසෙහිත් නිදිමැරූ බැවින් අබ්දුල්ට සහ ලෙන්චිහාමිට තදින් නින්ද ගියේය. මීනා ද කාමරයට ගොස් බොරු කොණ්ඩය අහක තබා මුහුණ සෝදගෙන වෙනින් වස්ත්‍ර හැඳ නිදන්ට වනි.

අබ්දුල්ගේ දිනීම ගැන ආරංචිය දැනගත් සොරු තුන් දෙනෙක් එදින එහි පැමිණ, ඉන් එකෙකු වහලට නැග. මීනා නිද සිටි කාමරයේ සෙවිලි ඉවත් කර බලා සිටියේය.

මීනාගේ වෙස් මාරුවත් රූප ලක්ෂණයත් දකින්ට ලැබූ ඔහු විස්මයට පත් වීය. එතෙක් රූ ඇති කාන්තාවක් ඒ අසල සිටින බැව් කිසිවෙක් හට කිවහොත් එය විශ්වාස කරනු නොලැබෙ. එහෙයින් ඔහු දුටු දේ ගැන අනික් දෙදෙනා හට නොහඟවා බොහෝ වේලාවක් ඇගේ රූපාලංකාරය බල බලා සිට කැළඹුනා වූ සිත් ඇත්තේ, ගෙන ගිය කඹයක ආධාරයෙන් ශබ්දයක් නොනගා ඇගේ කාමරය මැදට බැස ගත්තේය. ඉන් පසු සමීපව ඇගේ රූපය බලනු කැමැත්තේ යහන ලඟට පැමිණියේ ය, දල්වන ලද පහන් ඇති ඒ කාමරයෙහි ඇගේ සිනිඳු වූ වස්ත්‍රයෙන් මදක් වැසුනා වූ ශරීරය ඔහුගේ සිත උමතු කරවීය. එහෙයින් සිහි විකල වූ ඔහුට, තමා ඒ ස්ථානයට පැමිණි සොර අදහස් මතක නැතිවී ගොස් ඇගේ ශරීරය අතින් ස්පර්ශ කෙළේය. නිදිබරව සිටියා වූ ඇට එය නො දැනුනේ ය, එහෙයින් වඩ වඩා ධෛර්‍ය්‍යමත් වූ ඔහු ඇගේ අත රැගෙන සයනයෙහි වාඩි වූයේ ය. එයින් අවදි වූ ඇ සවමීපයෙහි සිටි ඔහු දකිමින් ඒ ස්වප්නයක්දෝ හෝ, නොහොත් අවතාරයක් දෝහොයි සිතා ඇහැ වසා ගත්තීය. සොරු ඇගේ අත නැවතත් ඇල්ලූ කල ඇ ඇස හැර බලා, භයින් තැනිගෙන ශබ්ද නගා කෑගැසුවාය. ඒ ඇසූ මව් පිය දෙදෙන පිබිද ඇගේ කාමරය දෙසට වීත් දෙර හරින්ටය කියන විට ඇ එසේ කිරීමට දිවිය. සොරුද ඇ නවතන්ට උත්සාහ නොකොට තමාගේ ආරක්ෂාව පළමුවෙන් කරගත යුතුයයි සිතාදෝ, වඳුරෙකු මෙන් උඩට නැගගෙන ගොස්, වහ වහා පියසින් බැස, අනිත් දෙදෙන සමග දිවන්ට වනි. ඔවුන් ලුහුබඳවා යාමට අබ්දුල් නොකැමැති වූයෙත් එදින රෑ නිදි වර්ජිතව සිදුවූ දේ ගැන කථා කරමින් සිටියේය.

2 වෙනි පරිච්ඡේදය

කීප දවසක් කිය යුතු කිසිවක් සිදු නොවී ගත වීය. නැවතත් සූදුව පටන් ගන්නා ලදී. අබ්දුල්ට පළමු දිනයක මෙන් වැඩි වාසියක් නොලැබීය, එහෙත් ඔහුගේ භාර්‍ය්‍යාවගෙන්

කරදර කොට මුදල් ඉල්වා නොගෙන සූදු කෙළින්ට පුළුවන්කම තිබීමෙන් ඔහු ස්වල්ප වශයෙන්වත් දිනන්ට ඇති බව පෙනේ.

ක්‍රමයෙන් සූදුවේ ආරංචිය පතළ විය. ඒ මග යන එන්නන්ගෙන් සමහර දෙනෙක් ද එහි ආවාහුය. ඔවුන් අතුරෙහි කදිම පෙනීමක් ඇති එක් තරුණයෙක් විය. ඔහු පැමිණ අනික් අය සමග දදු ලන්ට පටන් ගත්තේය. ඔහු දුටු හැටියේම වෙස් මාරුවෙන් සිටි මීනාගේ සිත ප්‍රිතිමත් විය. එහෙයින් වෙනද මෙන් නොව එදින ඈ සූදුව කෙරෙන අන්දම මදක් ආසාවෙන් බලා සිටියාය. තරුණයාගේ පරාද වැඩි වෙන්ට වෙන්ට ඔටටු ඇල්ලීමද වැඩි විය. එයින් ඔහුට කිසිම වාසියක් නැති විය. ඔහු ගෙනා සියල්ල ඉවර වූ පසු සූදු රවුමෙන් අහක්වී දුක්මුසුව ගෙයි කොණක වාඩි ගත්තේය. මීනා ද ඔහුගේ දුඃඛිත භාවය දැක උණු වූ සිත් ඇතිව කෝපි ටිකක් සාද ගෙන ගොස් දී, අනිත් අයට නොපෙනී සිට කරුණාවන්ත ලීලාවෙන් ඔහුට කථා කළාය.

" ඇයි මේ හොඳට හැදුන ළමයි මෙහෙම තැන්වලට පැමිණ අතමිට නැති කර ගන්නේ? මම බලා සිටිද්දීම පවුම් අටක් පමණ පරාද වුනා නොවෙද? ඉතින් මුදල් ඔහොම නාස්ති කරන්ට ගියාම මත්තට යන කල කොහොමද? ළමයාගේ මව් පියෝ නැද්ද මේවා ගැන දැනමුතුකම් කියන්ට?"

" මගේ මෑනියෝ නැහැ, නමුත් පියා ජීවත්ව සිටී, ඔහුගේ සැරකමින් තමයි මම මේවාට වැටුනේ."

" එහෙම සැර පෙන්වාලත් ළමයා මට්ටු කර ගන්ට බැරිවුන කොට ටිකක් බුරුල්කම පෙන්නුව නම් කොහොමට ඇද්ද. ළමයාගේ පියා සූදු කෙළිනවාද?"

" නැහැ "

" සොරකම් කරනවාද? "

'' නැහැ ''

'' බොරු කියනවාද? ''

'' නැහැ ''

'' ගෙදරදොර ගැන නොසොයා නොබලා ඉන්නවාද? කොටින්ම කිසි විදියක නරක ආදෘශයක් පෙන්වනවාද? ''

'' නැහැ ''

'' එහෙනම් පියාට වරද තබන්නේ කොහොමද? '' මෙසේ කථා කරන කල ඇගේ ඇස්වල කාන්තියද, දත්වල අලංකාරය ද ඔහුට දකින්ට ලැබී, පුදුමව '' වයස්ගත වූ මැහැලියෙකුට මෙබඳු දේ කොයින්ද '' යි සිතා ඇගේ ශරීරය ඉතා පරීක්ෂාවෙන් බැලුයේය. ඈද ඒ ගැන කල්පනාව නැතිව, යහපත් වූ සිහින් ඉහටියෙහි එක් අතක් ගසාගෙන, අනික් අතින් දෙර අල්වාගෙන ඇගේ සම්පූර්ණ වූ ලය මදක් ඍජු කරගෙන සිටියා ය. එයින් තරුණයාගේ සිත වඩ වඩා පුදුමයට පත්ව ඇගේ වේශය ආරූඪ කරගත් එකක් මුත් ස්වභාවික නොවන බව කල්පනා කෙළේය.

'' ළමයා ස්කෝලයකට පිටත් කළේ නැද්ද ''

'' පිටත් කළා ''

'' එහෙනම් පියෙක් විසින් කරන්ට ඕනෑ සියල්ලම කර තිබෙනවා; උගන්වන්ට මහන්සි අරන්' තිබෙනවා. ගෙදරදී හොඳ ආදෘශය පෙන්වා තිබෙනවා, ඉතින් ළමයා නරක් වුනා නම් ඒ පියාගේ වරදින්ය කියා කියන්ට මට නම් බැහැ: අපේ පියා මෙන් සූදු කෙළවනවා නම්, නැත්නම් වෙන නරක රක්ෂාවක් කරනවා නම්, ඒ හේතුවෙන් නරක සිරිත් බෝවුනා යයි කියන්ට පුළුවනි, ළමයාගේ පියා එහෙම රක්ෂාවක් කරනවාද? ''

තරුණයා ඊට උත්තර දෙනවා වෙනුවට ඈ දෙස පුදුමයෙන් බලා සිටියේය. ඈද මදක් ලජ්ජා වූවා මෙන්

බිම දෙසට ඇස් හෙළිය. ඇගේ උනන්දු භාවය ප්‍රස්තාවට වඩා වැඩිවූ බැව් ඇට සිතී ගියේය.

කථා කරන්ට පුළුවන් වූ විගසම තරුණයා කථා කරමින් '' උඹේ පියා යයි කිවේ මේ අබ්දුල්ට නොවේද? පෙනෙන හැටියට නම් උඹ ඔහුගේ මැනියන් තරමට වයස්ගත හැඩයි. නුමුත් උඹේ කථාවෙනුත්, බැලීමෙනුත්, ශරීරයෙනුත් පරීක්ෂාවෙන් බලන තැනැත්තෙකුට පෙනෙන්නේ උඹ තරුණියක් බවයි. මේ උඹ පෙන්වන්නේ බොරු වේශයක්ය '' යී කීය.

ඇගේ වචනවලින් සහ හැසිරීමෙනුත් ඒ රහස එළිදරව් වූ බැව් ඇට හැඟී එය වසන්ට උත්සාහ නොකොට, ඔහුගේ කල්පනාව හරි බවත්, එහි දවස් පතා රැස්වන සූදු කරුවන් නිසා වෙස් වලාගෙන ඉන්ට උවමනා වූ බවත් කියමින් '' මගේ රහස දැන් දැනගත් සෙයින් එය කාටවත් වචනයකින් පැමණ නොහඟවන ලෙස මම ඉල්ලමි '' යි ඇ ඔහු දෙස ඉතා මෘදු බැල්මෙන් බලා කීය.

ඒ ඇසූ තරුණයාගේ සිත ඇගේ රූපය දැකගන්ට තදින් ලොභීව කියනුයේ '' මට මෙපමණ කරුණාවෙන් සංග්‍රහ කොට, පසුව යහපත් අවවාද වචන දුන් කල්‍යාණ මිත්‍ර තැනැත්තියක් වූ උඹ, මින් මතු සම්මුඛවීම දුෂ්කර වේ. මින් පසු මේ ස්ථානයට සූදුව පිණිස මගේ ඊමක් නැත. ඉතින් මින් පිටදී උඹ දකින්ට ලැබුනත් මට හඳුනාගන්ට නොහැකි වේ, මගේ කෙළෙහිගුණය පෙන්වීමටද, මට එයින් අවකාශ නොලැබේ. එහෙයින් මගේ ඉල්ලීම ගැණ සමාවී උඹේ ප්‍රකෘති ස්වභාව පෙන්නාපන්නැ '' යි කීයේය.

ඔහුගේ සිත ඇ කෙරේ ප්‍රසන්න වූ බැව් දැන ඇද සතුටට පැමිණ සූදුපල දෙසට ගොස්, ඔවුන් සියලු දෙන සූදුවෙහි ගැළී සිටින බවත් ඇගෙන් සංග්‍රහ ආදියක් උවමනා නොකරන බවත් දැන, පාර පැත්තෙන් මල් කොටුවට වීත් ඇගේ ජනේලය ළඟ සිටින්ට කියා තරුණයාට පවරා, ඇ කාමරයට ගියා ය. බොරු කොන්ඩය ඉවත ලැම,

මුහුණ සෝද ගැනීම, ඇඳුම් වෙනස් කිරීම, විනෝදියක් ඇතුළත කරන ලදී. තරුණයා ද කී ලෙස එහි පැමිණ ඉදිරියෙහි සිටි කාන්තාව ගැන කිය නොහැකි තරම් පුදුමයට පත්ව ඇසි පිය නොහෙළා බලා සිටියේය.

එවේලෙහි සුදුපල දිසාවෙන් නික්මුණු මහත් ඝෝෂාවක් ඇති වීය. කීප දෙනෙකුගේ ආරාවුල් සහිත වචනද, අබ්දුල් ඒ සන්සිඳවන පිණිස කියන බස්ද ඇසූන, මීනා ක්ෂණයකින් මැහැළි වෙස් දරා ගත්තීය. තරුණයා ද කොලාහලය බලන්ට දිව්වේය.

බසින් බසට රන්ඩුව දික් වීය. සියල්ලෝම එක විට සිහි නැති වූවන් මෙන් අතින් පයින් ඇන කොටාගන්ට වන. ඝෝෂාවද බොහෝ දුර ඇසී, වටින් පිටින් මිනිස්සු දිව එන්ට පටන් ගත්තු. ගසන ලද පහරක් ලැබූ අබ්දුල් "අයියෝ" කියා බිම වැටුණේය. ඒ හඬ ඇසූ මීනා කාමරයෙන් පැනගෙන ඔහු ළඟට යන්ට උත්සාහ කරන විට, එහි සිටි එකෙකු ඈ ඇදගෙන ගෙයින් පිටට පැන කර තබාගෙන දිව්වේ ය. ඇගේ මොරගැසීම නවතන පිණිස කටෙහි ලේන්සුවක් ද ඔබන ලදී. කොලාහලය තදවී කීප දෙනෙකුගේ ඔලු පැලී ලේ වැගිරෙන්ට වීය. තවත් ගැහුම් කෑ අය මළවුන් මෙන් බිම වැතිරී සිටියෝය. ඒ සියල්ල දුටු තරුණයාද, තමා එහි නැවතීම අන්තරා සහිත බැව් සිතා මගට බැස දුවන්ට පටන් ගත්තේය. වැඩි වේලා දුවන්ට පෙර ඔහු ඉදිරියෙන් දුව යන තවත් මිනිසෙක් දුටුයේය. ඌ බරක් උසුලාගෙන අමාරුවෙන් දිව හෙයින් වැඩි දුර යන්ට පළමු තරුණයා ලං වීය. ඒ දුටු ඌ කියන්නේ "යහළුව මම කදිම බරක් ගෙන යමි. උඹ මට උදව්වුනි නම් දෙදෙනා හටම වාසිය" යි කණට කොඳුරමින් කාරණය සැල කෙළේය. ඒ ගැන සතුටු වූ තරුණයා ද ඈ උසුලාගෙන මදක් දුර ගොස් පාරෙන් කැලයට වැද, පැයක් පමණ ගමන් කොට, එක් ගස් කැටියක් සමීපයට පැමිණ නැවතුණේය, භයින් ත්‍රස්තවූ මීනාට පළමුවෙන් සිහි නැතිව තිබුණ නමුත් ක්‍රමයෙන් සිහි

ඉපදුණේ ය. ඈ ලඟ සිටිය මිනිසුන් දෙදෙන කවරුදැයි බලන්නී, සඳපහන් එළියෙන් ඉන් එකෙකු ඇඳින ගත්තීය. අනිකාගේ මුහුන දැක පුරුදුව තිබුන නමුත් ඒ කොතැන්හිද, කවරෙකුගේද, කියා හිතාගන්ට බැරි විය. ඒ ඇඳිනගත් අය කෙරෙහි ඇගේ ප්‍රසන්නතාවය ඇතිවූ හෙයින් ඇගේ අන්තරාය ඉතා දරුණු ලෙස නොවැටහින. තරුණයාද ඈ කවරියක්ද යනු හරියාකාර නොදැන අනිකා කියන කරන ලෙස හැසුරුණේය. දෙදෙනා ඇගෙන් ඉවත්ව ස්වල්ප වේලාවක් රහසිගතව කථාබස් කොට නැවතත් ඈ වෙතට පැමිණියෝය.

එවේලෙහි අහස කළුවර විය. සීත සුලං හමන්ට විය. ගස් අතු ආදිය ඒ ඒ දිශාවට නැමි නැමී එකිනෙකෙහි හැපී නාද පැවැත්වූහ, තද වර්‍ෂාවක් එන ආකාරය ඇති විය මීනාද ඔවුන්ට කථා කොට "උඹලා මා වැනි මැහැළියෙකුට මෙසේ හිරිහැර කරන්නේ ඇයි? මගේ අතෙහි මුදලක්වත් නෑ. මේ වැස්සේ සීතෙන් මට මැරෙන්ට වෙයි. දෙවියන් බුදුන් අදහනවා නම් ආපසු යමල්ලාය" යි කීය.

ඇගේ හඬ ඇසූ තරුණයා "මේ කුමක්ද! මා සමග කථා කර කර සිටිය ඒ ප්‍රිය කාන්තාව නොවේද මේ! මගේ කෙලෙහිගුණ සැළකීම දුන් පුදුම ආකාරයකට පෙරළිච්ච ! මා විසින් මැගේ සිතෙහි භය දුරුකට යුතුය යනාදිය සිතා "උඹ මැහැළියක් බව අපි දනිමු. නමුත් මීට වඩා සීත දවස්වලත් මරණය ගැන නොසලකා උඹ සුදුපලේ මුදල් එකතු කර ගත්තේ නැද්ද? අද පරාදවුන මුදල අපට ලැබෙන තුරු උඹ අපේ අත් අඩංගුවෙන් හරින්නේ නැහැ, මුදල ගෙන්වා ගන්ට මාර්ගයද අපි දනිමු ය" යි කීයේය.

ඒ එන තද කුනාටු සහිත වැස්සට ආවරණයක් සොයන පිණිස ඔවුහු එතැනින් නික්ම වහ වහා වන ගැබට ගියෝ ය. ක්‍රමයෙන් සඳ පහන් ගතිය අහසෙහි ඇති විය. නුමුත් ගස්වල අතු පතරින් ඇතිවූ සෙවනැළි නිසා කිසිවක් හරියාකාර නොපෙනුනේය. වන මෘගයන්ගෙන් අන්තරායද

විෂඝොර සර්පයන්ගෙන් වන්ට හැකි උපද්‍රවද තරුණයාට සිහිපත්ව, ''වැස්සෙන් වන්නේ තෙමීම පමණකි. ජීවිත හානිය නොවන්නේය''යි කියා කිටවුව තිබුන ගසක් යටට වූයේය, අනික් දෙදෙනද එසේ කළාහු ය,

මෙසේ බොහෝ වෙලාවක් සිට වැසි මදක් අඩුව් ගියාට පසු අහස් කුසය හෙළිකරගෙන සඳරැස් ගලා ආහ. ඒ තිදෙනද එතැනින් නික්ම ගමන් කොට රාත්‍රි කාලය ඉක්ම අරුණ නැගෙන වේලාවට එක් ගල්තලාවක් සමීපයට පැමිණියෝ ය. සොරුද එහි පාර්ශ්වයකින් තිබුන ගල් ලෙනක් අනික් දෙදෙනාහට පෙන්වා ස්වල්ප වේලාවක් විඩා හරින පිණිස ඒ ඇතුළට ගමන් කෙළේය, මුළු රාත්‍රියෙහිම නිදි වර්ජිතව සිටි බැවින්ද, ගමනින් වෙහෙස වූ බැවින්ද මීනාට එහිදී නිදිබර විය. එසේ වුවත් වන මධ්‍යයෙහි කිසිවෙකුගේ පිළිසරණක් නොමැතිව, තරුණ පුරුෂයන් දෙදෙනෙක් ළඟ සිටියදී ඇගේ නිදගැන්ම නොවටනේ යයි කල්පනාවී වට පිට බැලූ විට, ඇ හඳුනන තරුණයාට ඒ වැටහී ලඟට විත් අනුකම්පා පෙන්වා ඈට ඉතා වෙහෙස වූවාක් මෙන් පෙණෙන නිසා මදක් නිදගැන්ම යහපතැයි කියා, තවත් කිටවුවී කිසිවකට භය නොවී සිටින්ට කියා, අනිකාට නොඇසෙන ලෙස කනට කොඳුරා, ගුහාවේ එක කොණක් ටිකක් පිරිසිදු කොට දී, ඈට නිදන්ට සලස්වා, ඔහුගේ සමාගම කාරයාත් සමග ගුහාවෙන් පිට වූයේය.

ඔහු දෙදෙන එළියේ වාඩිවී මතු ක්‍රියා කරන අන්දම ගැන සාකච්ඡා කළෝය, දෙදෙනාම නොයෙක් විදිසට කාරණා ගෙන හැර පෑවෝය. තරුණයා ඈ සෞවන ස්ත්‍රියක් බව නොදන්නා ලෙස කථා කළේය. එය සොරුට ඉතා ප්‍රිය දයක කරුණක් විය. ඒ නිසා දෙදෙනගේ කථාව ඈ නිසා මුදල් ලබන ක්‍රමය විය. සොරු තෙමේ ඇගේ පොහොසත්කම ඉතා මහත්කොට දැක්කුවේය. ඈ බොහෝ කාලයක සිට සුදු කෙළවන බවත්, ඈ ළඟ මුදල් රාශියක් තිබෙන බව ඒ පලාත්වාසී කවරුත් දන්නා බවත්, කීයේය. තරුණයාද එය එසේ නම්, ඔහු දෙතුන් දිනක් වුවත් එහි නවතින්ට සූදනම බවත්, එදින පරාද වූ මුදල ලබාගෙක

යන්ට හැකි වුවහොත් එය මහත් හේතුවක් බවත්, කියා ඔහු ඈ රැක බලාගෙන එහි සිටියදී දෙතුන් දිනකට සෑහෙන තරම් කෑම බීමාදියත්, රැගෙන ඈ නිසා මුදල් ලබන උපායක් සොයාගෙන වහාම එන්ට කියා සොරුැව් පැවරුැ වේය. ඔහු ගිය පසු තරුණයා මීනා වෙතට පැමිණ, නිද උන් ඈ පුබුදුවා, එළියට කැඳවාගෙන අවුත් ඇගේ තෙත්වූ ඇඳුම් ගලවා අව්වේ ලන්ට කීය. ඈද උඩින් ලාගෙන තිබුනු බොරු ඇඳුම් ඉවත් කළාය. පෙරදින රාත්‍රියෙහි ඇගේ රූපශ්‍රිය දුක ඔහුගේ විස්මය කෙතරම් වීද, සූර්‍ය්‍යා-ලොකයෙන් ඉතා සම්පව දකින්ට ලැබුනු එවේලෙහි එය දහස් ගුණයෙන් වැඩි විය. එහෙයින් ඈ කෙරෙහි ඔහුගේ සිතෙහි පහළ වූ ඡන්ද රාගය බලවත් විය. ඇගේ රූපශ්‍රී-යෙහි ගැළී එහිම සදකල්ම නැවතී සිටින්ට සිතුවාක් මෙන් ඔහු ඇසිපිය නොහෙලා බලා සිටියේය. පසුව ඔහුගේ සමාගම්කාරයා ගැන කල්පනා වී ඈ ලඟින් වාඩිගෙන කථාවට පටන් ගති.

"උඹ ඉදිරියෙහි මාත් සිටීමෙන් උඹ මෙහි ගෙන ඒමට මාත් පංගුකාරයෙක් වුනා යයි සිතනවා ඇති."

"එසේ සිතීම වරද ද?"

"සත්තකින්ම වරදයි."

"එහෙනම් එය පුදුමෙකි"

ඇගේ මුහුනෙහි ඒ පුදුමය පෙනී ගියේය. ඈ ඔහුගේ සිත හාරා බලන්නාක් මෙන් මුහුනු දෙස බලා සිටියාය. නමුත් එහි කැළඹීමක් හෝ පැකිළීමක් හෝ කිසිවෙත් නැති වීය.

"කොහෙත් පුදුමයක් නැහැ. මගේ පැමිණීම වූයේ හදිසියෙනි. සුදුපලේ කොල්ාහලේට අසුවෙන්ට අකමැතිව මගට බැස දුවන විට උඹ උස්සාගෙන යන මිනිහා මට සම්බවී ඔහුත් සමඟ ආවෙමි."

"ස්ත්‍රියෙක් බලහත්කාරයෙන් ගෙන යන කල සතුටු සිතින් ඊට ආධාර කිරීම හැදිච්ච අයගේ සිරිතකැයි මම නොසිතමි."

"එය වැරදි බව මමත් කියමි: මගේ හැදීම හොඳය කියා මම පාරට්ටු කළ බවක් මතක නැහැ, ඒ කොහොම වුනත් ඒ වැරදි ක්‍රියාවෙන් දැන් උඹට යම් ප්‍රයෝජනයක් වුවහොත් මට එය සන්තොෂයට කාරණා වේ. ඉතින් මේ උඹ ගෙන ආ අශ කව්ද කියා උඹ දන්නෙහිද?"

"මම දන්නේ කොහොමද! නුමුත් ඔහුගේ මූහුන දැක පුරුදුවා වාගේ පෙනෙනවාය" යි ඈ ටික වේලාවක් කල්පනා කොට "ඔහු සොරෙක" "ඔහු සොරෙක" කියා ශබ්ද කළා ය.

"ඔහු උඹ ගැන හරි හැටියට කාරණා දන්නේද? එනම් උඹ පෙන්වන අන්දමට මැහැළියෙක් නොව තරුණියෙක් බව ඔහු දන්නේද" යි තරුණයා ආසාවෙන් ඇසීය.

මීනා ද ඔහු දන්න බවත්, ඒ දැනගත් අන්දමත්, පෙර දිනයෙක ඇගේ කාමරයට වීත් ඔහු සිටිය සැටිත් විස්තර කොට කී කල්හි තරුණයාගේ සිතට භය ඉපදී, සොරෙක් නම් ඔහු තනි නොවේ. ඔහුගේ තවත් පිරිස ඇති, සමහර විට ඔහු අනිත් අයත් කැටුව අද මෙහි පැමිණේ යයි සිතා, "අපි මෙහි නැවතී සිටීම යුතු නොවේ. සමහර විට ඔහු තවත් අය සමග මෙහි පැමිණෙන්ට පිළිවනි. එවිට අපේ ගැලවීම උගහට වේ. ඒ නිසා දැන් මේ මොහොතේදීම මෙයින් පිටව යා යුතු" යි ඔහු කීයේය.

මීනා ද ඒ සැබෑ බවත් දෙතුන් දෙනෙක් අතට අසුව ගැලවෙනවාට වඩා එකෙකුගෙන් ගැලවීම පහසු බවත්. සිතා එයින් පිටත් වෙන්ට ලෑස්ති යයි කියමින් මැහැළි ඇඳුම් ලා ගත්තීය. තරුණයා හාත්පස බලා කවරෙක්වත් දකින්ට නොමැත්තෙන්, ඇට හඬගසා සොරු ගිය දිසාවට ඉදිරි පාර්ශ්වයෙන් පිටත් විය. යම් කෙනෙකු දුටුවහොත් ඇට සැඟවෙන පිණිස සංඥ කරන බවත් කියා. බඹ කීපයක් ඉස්සරව ගමන් කෙළේය.

මෙසේ වන ලැහැබින් ගස් මුල් වලින් පැන පැන පැය තුනක් පමණ වේලා ගමන් කොට ඔව්හු ගංගාවක් සමීපයට පැමිණියෝ ය. එහි තැනින් තැන ලොකු ගල් තලා ද තිබුනි. එතර පාර්ශ්වයෙහි මහා වෘක්ෂ පංක්තියක් ද, ඉන් එහා ඝන කැලයක් ද පෙණුනි. ඒ වෘක්ෂයෝ ද ඒ කැලය ආරක්ෂා කරනු පිණිස තැනින් තැන සිටවන ලද යොධ භට පෙලක් මෙන් වූහ. ග·ගාවද එහි වැඩි ආරක්ෂාව පිණිස කැණූ ගැඹුරු වූ පළල් වූ දිය අගලක් මෙන් විය. ඒ සියල්ලෙහි තේජස් භාවය ඔවුන් සිතෙහි තදින් ඇඳුනේ ය.

ඔවුහු ස්වල්ප වේලාවක් එය බලා සිට ගඟට බැස, දිය බී පිපාසය සන්සිඳුවාගෙන ගල්පොත්තක් උඩට නැග මඳක් ප්‍රමාද වූහ. ගඟෙන් එතර වුවහොත් ඔවුන්ගේ ගමන වැඩි ප්‍රවේසම් බවත් සොරුන්ට අසුවීම වඩා දුෂ්කර බවත් ඔවුන්ට කල්පනා විය. තරුණයාට පිණන්ට පුළුවන්කම තිබුනි. නමුත් මීනාට එසේ කිරීම නොහැකි බැවින් ඇත් රැගෙන පීනීම උවමනා විය. දිය පාරේ සැරකම නිසාත් රාත්‍රි කාලයෙහි ගමන් කෙඩෙත්තු නිසාත් ඔහුගේ ශක්තිය ඊට මදිදෝහෝයි සැක කරන අතර, මීනාට උපායක් පෙණුනි. බඹ තිහක් හතළිහක් ඈතින් එගොඩ ඉවුරෙහි තිබුන ගසෙක අත්තක් පාත්ව ගඟ මැද පිහිටි ගල් පොත්ත-කට ගැවී තිබුනේය. එතනට ගොස් ගල් පොත්තට පිණා අත්ත දිගේ ගොස් එගොඩවීම පහසු බැව් පෙනී, ඔව්හු ගල් උඩින් පැන පැන විත් අන්තිමයේදී දියට බැස්සෝ ය. තරුණයා මීනාත් රැගෙන පීණා අනික් ගල් පොත්තට නැග ගත්තේය. ස්වල්පය නමුත්, ඒ පීනීම ඔහුට ඉතා කෙඩෙත්තු සහිත විය. එසේ වුවත් කල් නොයවාම ඔහු ඈ අත්තට නැංගුවේය. ඈ කඩිසර ශක්තිමත් යෞවනියක් හෙයින් වහාම නැගගෙන අත්ත දිගේ ගියා ය. ඔහුද ඈ පස්සෙන් ගියේ ය.

ඒ ගස ඉතා ඝන ලෙස කුඩා අතුපතරින් ගැවසී තිබුන හෙයින් කිසිවෙක්හට නොපෙණී සිටින්ට එය හොඳ ස්ථානයක් විය. ඔව්හුද ඒ බැව් සිතා වාඩිගෙන එහිදී විඩා හරින්ට සූදානම් වූහ.

වැඩි වේලාවක් යන්ට පළමු ශබ්ද වගයක් ඔවුන්ගේ කණට වැටුණි. ඒ කුමක් දැයි හයින්. ඒ ශබ්ද නික්මුනු දිශාවට ඇස් යොමුකර බැලූ කල ගඟෙහි එගොඩ ඔවුන් සිටි ගල් තලාව උඩ මිනිසුන් තුන්දෙනෙකු සිටිනවා දුටුවෝය. ඔවුන් ඉතා සැලකිල්ලෙන් සෑම දිශාවම බලනවාද දුටුවෝ ය. එයින් එකකු ඔවුන්ට සතුරු වූ සොරා බැව් දැනගත් ඔවුහු, ඒ සියල්ල තේරුම් ගත්තෝ ය. තරුණයාද මීනා දෙස බලා "අපි ඉක්මන් කර මෙහි නාවානම් උන්ට අසුවුනා නොවේද? මම සිතූ අන්දමටම අපේ යහළුවා තවත් අය සමග ඇවිත් සිටී. ඉතින් අසුවුනොත් උඹට පමණක් නොව මටත් ගැලවෙන්ට මාර්ගයක් නොලැබේ. දැන් වැඩියක් උඹ සමග පැන ආ හෙයින් කියන්ට කිසිම කාරණයක් මට නැත්තේ ය" යි කීයේ ය.

ඒ ඇසූ මීනා "අනේ, මා නිසා තවත් කෙනෙකුට විපතක් සිදු වෙනවාට මම කොපමණ කනගාටුද" යි කීවා ය.

"සැබැවටම උඹ කනගාටු වන්නෙහිද?"

ඇ ඊට උත්තර දෙන්ට ප්‍රමාද විය. නුමුත් ඇගේ ඇස්වල දුක් සහිත බැළීමෙන් ඔහුට ඒ උත්තරය හොඳාකාර පෙණී ගියේ ය. එවේලෙහි ඇගේ ලක්‍ෂණයද දහස් වාරයෙන් අධික විය.

"ඇයි මගේ ඇඳුම බොරුවා වගේ වචනත් බොරු යයි සිතන්නෙහිදැ" යි කියා මිනිසුන් ආපසු හැරී යනවා දැක, "අපි දැනට ගැලවෙච්ච. ඔවුන් හැරී යන බැව් පෙණේය" යි කීවා ය.

තරුණයා ද ඒ දෙස බැලීය. සොරු ගං ඉවුරෙහි නැවතී බිමට අත දිගුකොට අනික් දෙදෙනාහට කුමක්දෝ කීයේ ය. ඔහු දෙදෙනාද පාත්ව බලා හීස සොලවා එගොඩට අත දිගු කළෝ ය.

"ඔවුන් අපි පීනා එගොඩ වෙන්ට ඇතැයි කියති" යි තරුණයා කීය.

"අර පාත්ව බලන්නේ අපේ අඩි පාරවල් වෙන්ට ඇති. ගල් උඩින්ම ආවායින් අපි අද ගැලවුනා. නැත්නම් ඔවුන් අඩි පාරෙම ඇවිත් අප දැන් සිටින ස්ථානයට එනවා ඇති, ඉතින් දැන් ඔවුන් අප සොය සොයා ඇවිදින නිසා අප විසින් ප්‍රවේසම් විය යුතුය'' යි ඈ කීවා ය.

3 වෙනි පරිච්ඡේදය

සොරු තිදෙන නොපෙණි යන තෙක් බලා සිට සිතේ කැළඹීම මදක් සහනය වූ පසු මීනා, තරුණයා දෙස බලා ඔහුගේ ශරීර ස්වභාවය පරීක්‍ෂා කළා ය, ඔහු විසි එකක් දෙකක් පමණ වයස් වූ හෙලලු පාටින් යුත්, මදක් උස් වූ කෘශ වූ ශරීරයක් ඇති, දික් වූ අත් පා යුත්, ප්‍රිය වඩන මුහුනක් දැරූ, ශක්තිමත් තරුණයෙක් බැව් දුටී ය. ඔහු කෙරේ ඇගේ සිත මනාප වූ බැව්ද ඈට හැඟුනි. එහෙයින් මව් පියන්ගෙන් වෙන්ව, සොරුන්ගෙන් ද වන මෘගයන්-ගෙන් ද අන්තරා ඇති වන මධ්‍යයෙහි හිඳීම ඈට තද දුකට කාරණා නොවී ය. ඔහු සමීපයෙහි සිටීමෙන් ඈට ප්‍රීතිය ඇති විය. එහෙයින් ප්‍රේමය පැතිරී ගිය ඇගේ විශිෂ්ට රූ ඇති මුහුන දෙස බැලූ තරුණයාගේ ඇසට හමු වූ දර්ශනය ඒකාන්තයෙන්ම ප්‍රියකරු විය. ඔහුට ද මිනිසුන්ගෙන් දුරව, අන්‍ය ප්‍රදෙශයක, සොර සතුරන්ට අසුවෙන්ට නිතරම පුළුවන්කම ඇතිව ඒ සිටින අන්දම ගැන. දුක් සිතිවිලි ඇති නොවී ය. එබඳු ප්‍රිය කාන්තාවක් හා වනයෙහි හුද-කලාව විසීමට වඩා සැපයක් තවත් ඇද්දැයි ඔහුට සිතී ගියේ ය. මෙසේ දෙදෙනාම තම තමන්ගේ කල්පනා කොට සොර භය නැතිව එහිම හිඳ, ඔවුන් එතැන් පටන් කුමක් කටයුතු දැයි කථා කරන්ට පටන් ගත්තු ය.

"උඹ මට ගෙදරදී පෙන්වූ කරුණාවන්ත සැලකිළි ගැන මගේ කෘතඥභාවය පෙන්වන්ට මෙපමණ විගසින්ම මට ප්‍රස්තාව ලැබේ යයි නො සිතුවෙමි. එවැවින් මගේ ජීවිතය පුදලාවත් උඹ ප්‍රවේසම් කර ගන්ට මම උත්සාහ කරමි'' යී තරුණයා කීය.

ඒ වචන ඇසීමෙන් මීනාගේ සතුට වඩ වඩා දියුණු විය. එහෙයින් ඔහු ගැන තොරතුරු දැනගැනීම පිණිස ඈ ප්‍රශ්න කළා ය. ඈට එයින් දැනගන්ට ලැබුණේ ඔහු කොළඹට නුදුරු රත්මලාන යන ගමෙහි ඇති දැඩිවූන බවත්, ඔහුගේ පියා ගාලු පලාතේ සිටැවිත් කසාද බැඳ-ගෙන එහි පදිංචි වූ බවත්, බාල කාලයේ සිට අකුරු ආදිය ඉගෙනීමට ඔහු ස්කෝලයකට යැව් නමුත් සෙල්ලක්කාර කමෙන් වැඩි දුරට ඉගෙන ගන්ට නුපුළුවන් වූ බවත්, ඔහු සහ සහෝදරියෙක් හැර පවුලේ වෙන ළමයින් නැති බවත් පියාගේ ඇවෑමෙන් ඔහුට ලොකු මුදලක් අයිති වන්ට තිබෙන බවත් ය. සෙල්ලමට ඇති ඔහුගේ කැමැත්ත සහ ලැබෙන වස්තුව ද ගැන සිතා බලා ඈ කියන්නී, "පියා සම්බකර තිබෙන වස්තුව පුතාට ලැබුණොත් මාසයක් සූදු කෙළින්ටවත් මදි වේයයි සිතමි" යි කියා සිනාසුනාය,

ඔහුත් ඈ දෙස බලා සිනා පහළ කළ බව දැක, ඈ සාථා කරමින් "චී! ඔය කැත සිරිත පුරුදු කර ගත්තේ මන්ද? සූදුව කියන්නේ සොරකමක් නොවේද? අනුන්ට අයිති යමක් ඔවුන්ගේ කැමැත්ත ඇතිව සොරා ගැනීමට යොදගෙන තිබෙන මාර්ගයක් නොවේද? කල්පනාවක් නැතිව මිනිස්සු මේ මෝඩ ක්‍රියාවෙහි යෙදෙති. ඔවුන් දිනාගෙන සන්තොෂ වන අතරම පැරදි අය ගැනත් කල්-පනා කර බලනවා නම් කොහොමට ඇද්ද? පරාදකාරයන් සමහර විට දරුමල්ලන් ඇති අය විය හැකියි. ඔවුන් සූදුවට ආවේ සමහර විට ස්ත්‍රීන්ට අඳින්ට තිබුන අත කර ආයිත්තම් උගස්තියා, උන්ට දුක් රාශියක් දී වෙන්ට හැකි. සමහර විට ගෙදර දෙරේ කන්ට බොන්ට තිබුන ආදයම පැහැරගෙන, අසරණ ළමෝ ලපටීන් බඩගින්නේ හිඳුවා වෙන්ට හැකි. ඉතින් මේවා ගැන සිතා බලන යමෙක් සූදුවට යන්නේ කොහොමද? පරාද වන බව සත්තක ලෙස දන්නවා නම් කවරෙක්වත් සූදුවට නොයයි. දිනන්ට අදහස් සරගෙනම කව්රුත් යති. ඉතින් දිනන්නේ මොනවාද? දිළිඳු ළමයින්ගේ කඳුලු, ස්ත්‍රීන්ගේ සුසුම්ලීම, මව්පියන්ගේ ශොකය, නෑදෑ මිත්‍රයින්ගේ පිළිකුල් කිරීම, ලොකයාගේ ගර්හාවත් නොවේද" යි ක්‍රමයෙන් වේගවත් වෙමින් කීය.

ඒ ඇසූ ඔහුගේ මුහුණෙහි ලජ්ජාව පැතිරී ගියා ය. ඔහුට නොයෙක් වාරයෙහි මව් පිය නෑදෑ මිත්‍රයන් විසින් අවවාද දෙන ලදී. නමුත් තරුණ ස්ත්‍රියෙකුගේ මුඛයෙන් පිටවුන මේ අවවාද හා සමාන, ඒවා තියුණු නො වූහ.

ඇ ඔහුගේ වෙනස් වූ මුහුණෙහි ස්වභාවය දැක මදක් මෘදු ලීලාවෙන් කථා කරමින්, "දැන් ඔබඳු ක්‍රියාවල යෙදී පුරුදු වුනාම මතු (මෙහිදී ඇගේ දිව පැටලුනාක් මෙන් ඩී ස්වල්ප වේලාවක් නිශ්ශබ්දව සිට) මතු පවුල් වුනාම යන කල කොහොමද" යි ඇසීය.

"පවුල් වුනාම සූදු කෙළින්ට යනවාද තරුණ කාලයේ ඔහොම ටිකක් සෙල්ලම් නො කරන්නේ කව්රුද" යි ඔහු මදක් සිනා සහිතව පිළිතුරු දුන්නේ ය.

"ප්‍රස්තාව පැහැර හැරීම යුතු නොවේ. ඒ නිසා පවුල් වුනාම සූදු කෙළින්නේ නැතැයි කියා දැන් මා සමග පොරොන්දු වෙන්ට ඕනෑ. ඒ පොරොන්දුව මතු පැමිණෙන ස්ත්‍රිය දැනගත් විට මට පින් දේවිය" යි සිනාසෙමින් ඇ කීය.

ඔහුද ඇගේ සිනාවට හවුල් වෙමින් නැවත නැවතත් පොරොන්දු වෙමින්, ඇගේ කොමල වූ හස්තය රැගෙන මුඛය දෙසට එසවූයේ ය. ඇද ඊට අසතුටක් නො පෙන්නුවාය. දෙදෙනාගේම සිත්වල ප්‍රේමය ගමන් කරන්ට විය. එය ඔවුන්ගේ මලානික ඇස්වලින් ද එකිනෙකා කෙරෙහි හෙළාගත් බැල්මෙන් ද පෙනී ගියේ ය. තරුණයා ඇගේ අත නොහැරම අල්වා සිටගෙන, "මීනා, උඹ මේ ස්ථානයෙහි තනිවම කිසි ආරක්ෂාවක් නැතිව සිටින්නෙහිය, නමුත් මොහොතකට කල්පනාවෙන් උඹ ලව් පිය යාළු මිත්‍රාදීන් මැද සිටින්නෙහි යයි සිතාපන්. එවිට මම උඹ වෙතට පැමිණියෙම් නම්, උඹ මට මේ අන්දමට යහළුකම් පෙන්වන්නෙහිද?" යි ඇසීය.

"ඔව් සත්තකින්ම පෙන්වමි. මෙතැන් පටන් මගේ හිත මිත්‍රයෙක් ලෙස ගණන් ගන්නෙමු" යි ඇ කිවාය.

"උඹේ ඔය වචන ස්වල්පයෙන් මගේ සිත කොපමණ ආලෝකවී ද? මීනා, මීනා, ප්‍රිය මැණික, උඹේ හිත මිත්‍රයෙක් නොව ඊටත් වැඩි තරම් කෙනෙක් වෙන්ට මට ඉඩ නො දෙන්නෙහිද? උඹේ සම්පූර්ණ ආදරය මට හිමි නො කරන්නෙහිද? උඹ දුටු තැන් සිට මගේ සිත මට වසඟ කර ගන්ට බැරි විය. එබැවින් උඹේ රූපයට වහල්ව සිටින මට, උඹේ ආලය බැගෑපත්ව ඉල්ලන දුප්පත් දිළින්ද වන මට. උඹ එය නොදෙන්නෙහිද? මීනා, මීනා, එක වචනයකින් මට පිළිතුරු දියන්නැ" යි කාම වේගයෙන් ස්තබ්ධ වූ තරුණයා කීයේ ය.

ඇගේ ඇස් කඳුලෙන් පිරී ගියා ය. ඇට කිසිත් නොපෙනී ය. ඊට නිසි යමක් ගොතා කියන්ටද නොහැකි විය. සිය ප්‍රීති සංවෙගයෙන් ආකුල ව්‍යාකුල විය.

ඇගේ නිශ්ශබ්ද භාවය දුටු තරුණයා කථා කරමින් "මීනා උඹ මට සමාවිය යුතුයි. මෙසේ තනි වූ ස්ථානයෙක අසරණව සිටින උඹෙන් මෙබඳු ඇසීමක් මට නොවටින බව දනිමි, නමුත් උඹ කෙරේ ඇති ආලයෙන් මගේ සිත නැවැත්විය නො හැකි ලෙස දහලයි. එහෙයින් මා එක විටම ප්‍රීතිමත් කරවීමට උඹට නො හැකි නම් පසුව පිළිතුරු දෙන බව කියා මා සනසා ගනින්නැයි" ඉතා මියුරු හඬින් ඇගේ කණට කොඳුරා කීයේ ය.

ඇගේ කැළඹීම මදක් සහනය වූ පසු තරුණයාගේ ඒ බස් සත්‍ය අදහසින් කී බැව් ඔහුගේ මුහුනෙහි ආකාරයෙන් දැන සිත් තුල ප්‍රීති උපදවමින්, ඒ බැව් එළිදරව් නොකොට "අපේ ආලය සොයන අය එය ලැබීමට සුදුස්සන් බව පෙන්විය යුතු යයි" කීවා ය.

එබස් අසා තමාගේ බලාපොරොත්තුව ස්ථිර වේගන යන බැව් දුටු තරුණයා. සතුටින් පුල පුලා, ඔහු ඒ තාක් වන තුරු සුදුස්සෙක් නුවූවත් එතැන් සිට සුදුස්සෙක් වෙන්ට උත්සාහ දරණ බවත්. ඔහු කිසි ස්ත්‍රියෙක් කෙරේ නොඇලී, අවිවාහකව සිටිනා හෙයින්, ඇගේ ආලය ඉල්ලන්ට කිසි භයක් නැති බවත් කියා සිටීයේ ය.

මෙසේ ඔහු දෙදෙන කථාබස් කරන අතර සොරු තිදෙන ගඟ දිගේ මඳක් දුර ගොස් පටු වූ තැනකින් පීණා-ගෙන, එතරව සැඟවී ගිය උන් සොයන්ට පටන් ගත්තු. එක් එක් කෙනා වෙන් වෙන්වම ඉතා පරීක්ෂාවෙන් ගං තීරයෙහි පා සටහන් බැලී ය. පීනුවාය කියා විශ්වාස කළ හැකි තැන් පටන් බලා, දෙපාර්ශ්වයෙහිම කිසි සට-හනක් නො දැක, පුදුමයට පත්ව, තුන්දෙනම එක්ව ගසක් යට වාඩිගෙන සාකච්ඡා කළෝ ය. ඒ ගස උන් සැඟවී සිටි ගසට බඹ හත අටක් දුරින් තිබුන එකකි.

"අපි දැන් දෙගොඩම හොඳින් පරීක්ෂා කර බැලුවෙමු. උන් ඒ ගල් තලාවට එනතුරු ඇවිත් තිබෙන බව පෙණේ. එතැන් පටන් කුමක් වුනාද නො දනිමු. පීනුවා යයි කියා සිතමු. එතකොට උන්ගේ පා සටහන් මෙගොඩ නැත්තේ මන්ද" යි එකෙකු කීය.

මේ ශබ්ද ඇසූ තරුණයා ද මීනා ද ඔවුන්ගේ කථාව ඉතා සෙමින් කණට කර කළ එක කොපමණ හෙතුවක්-දැයි සිතුවෝ ය. ඒ සොරු තුන්දෙනා ඔවුන් සිටි තැන සිට හොඳාකාර බලන්ට හැකි විය. උන් නිසා භයද එහෙයින් අධික විය. හුස්ම ලන පමණටවත් ශබ්ද නො නගා උන් දෙස ඇස් හෙළාගෙන, උන් කියන කරන සියල්ල අසාගෙන, ඔහු දෙදෙන භයින් වෙව්ලමින් සිටියාහ.

"උන් දෙදෙන පීණන්ට උත්සාහ කොට බැරිව මැරෙන්ට ඇතැයි" තවත් එකෙකු කීය.

දෙදෙනාගේම බස් ඇසූ තුන්වෙනියා කථා කොට "සමහර විට උන් පීණන්ට උත්සාහකොට එගොඩ වෙන්ට බැරිව, දිය පාරේ සැරකම නිසා පහළට ගහගෙන යන්ට ඇති, ඒ නිසා අපි මෙහි නොහිඳ ගඟ දිගේ තව දුරට යමුයයි" කියා තුන්දෙනම නැගිට ගියාහු ය,

ඔවුන් ඉපිට ගස්වලට මුවාව නො පෙනී ගිය විට තරුණයා මෙසේ කීය. "අප දැන් මේ ස්ථානයෙහි සිටිය-හොත් සමහර විට උන්ට පෙනෙන්ටත් පිළිවනි. මේ

අත්ත අනිත් අතුවලට වඩා නැමී තිබේ. උන් මේ ගල් තලාවට එන්ට සිතුවොත් මේ අත්ත දිගේ ආ යුතුයි. එවිට අප උන්ට අසුවෙයි. ඒ නිසා අපේ ගැලවීම තිබෙන්නේ මෙයින් බැස කඩිනම් කර හරහට දිවීමෙනි.

මීනා ඒ ගසින් බැස යාම ගැන එකඟ වූ නමුත් තරුණයා දිවීමට සතුටු නුවූවාය. හරහට ඔවුන් යන්නේ කොතැනකිද කියා නො දන්නා හෙයින්, ගඟේ නැමමක් තිබුනහොත් ඔවුන් සොරුන්ට මූනගැසෙන්ට හැකි වෙයි. එබැවින් නාසුවෙන්ට නම් ගිය යුතුව තිබෙන්නේ ගඟේ ඉහත්තාවට යයි ඈ පැහැදිලි කර කිවා ය. ඒ සැබෑ බව දුටු ඔහු ඇගේ කල්පනාව ගැන සතුටු වීය. එහෙයින් දෙදෙනාම ගසින් බැස ගඟ ඔස්සේ ගමන් ගත්තෝ ය.

වනය ඒ දිශාවෙන් වඩා ඝනව තිබුනි. එය මනුෂ්‍ය-යන් විසින් ඇතුල් නොවන ලද පෞරාණික වනයක් මෙන් පෙණුනි. එහි පුෂ්ටිමත්ව වැඩුනා වූ වෘක්ෂයෝ ප්‍රෞඪා-කාරයෙන් සතර දිශාවට අතු පතර විහිද අහස් දෙසට හිස ඔසවා භූමියේ රස ගුණය ප්‍රකාශ කරන්නාවුන් මෙන් පෙනුනෝ ය. ඒ ප්‍රෞඪ භාවය දියුණු කරන්ට පැළඳෙව්වා වූ ආභරණ රාශියක් ලෙසින් අනෙක කුසුම් පලු පල්ලවයෙන් සැදි නොයෙක් වර්ගවල ලතා සමූහය එහි එති තිබුනි. එහි සිටියා වූ පක්ෂි කැලද, ඔව්හු කවර සත්ව වර්ගයෙක් ද, කවර වනයෙක සිට එහි එන්නහුදැයි, අසන්නවුන් මෙන් ඔවුන් ඉදිරියෙහි පියාසර කරමින් සොභා පැවැත්තූහ. ඇතැම් විට තිත් මුවෙක් පුදුමයෙන් මෙන් මොහොතක් කල් ඔවුන් දෙස බලා සිට විදුලියක් ලෙසින් දිවන්ට වනි. ඇතැම් විට සාබාවක සිට හැලිවඬුරෙක් ඔවුන් දැක, ඌ එතෙක් කල් ආණ්ඩු කළ ප්‍රදේශය උදුරාගන්ට ආ අයදෝහෝයි සැක කළාක් මෙන් උගේ තියුණු වූ දත් කැටිය පෙන්වා වීරුඩකම් පෑවේ ය.

ඔහු දෙදෙන බොහෝ වේලාවක් ගමන් කොට වෙහෙ-සට පැමිණ ක්ලාන්ත භාවයෙන් ගසක් මුල සෙවනේ වැද හොත්තාහ. කොපමණ වෙලා ඔහු එහි ඒ ස්වභාවෙන්

සිටියාහුදැයි ඔවුන්ට නො දැනුනේ ය. තරුණයාගේ ඇස හැරී බැලූ විට ඔහු මහ වනයක් මැද සිටිනවා සම්බ විය. ඒ ස්වප්නයක් දෝහෝයි සැක කළා වූ ඔහුට වටපිට බැලූ කල්හි සන්සුන්ව ලඟින් නිදා සිටි කාන්තාව දැක සිදු වූ සියල්ල සිහිපත් විය. ගස් අතුරෙන් ඉරු රැස් කදම්බයක් ගලා ආය. හිර අවරට පත් වෙන්ට ලඟ බැව් එයින් ඔහුට හැඟී රාත්‍රිය ගත කිරීමට තැනක් සොයා ගැන්ම උවමනා බැව් කල්පනා කොට තරුණියගේ ඇඟට අත ගසා කථා කෙළේ ය. ඈ ඇස් හැර පුදුමයෙන් මෙන් බලා නැවතත් ඇස් පියා ගත්තීය. නැවතත් තරුණයා කථා කළ විට, අත මුඛය දෙසට නමා සංඥවක් කළාය. ඈ සාපිපාසයෙන් ක්ලාන්ත භාවය ඇතිව සිටින බැව් දුටු තරුණයා ඉතා දුක් වෙමින්, වහා වහා ගංතෙරට ගොස් වතුර පතක් ගෙනැවිත් බින්දුවෙන් බින්දුව ඇගේ කටෙහි වත් කෙළේය. මෙසේ වතුර පොවමින් වතුරෙන් මුහුන නාවමින් ස්වල්ප වේලාවක් සිටිය විට ක්‍රමයෙන් ඇගේ අත් පාවලට ශක්තිය ලැබ. නැගිට වාඩිවී වට පිට බලා, රෑ වේගන යන බැව් දැක එතැනින් යන්ට ඕනෑ නොවේදැයි ඇසීය.

"මගේ ප්‍රිය රත්නේට ගමන් කරන්ට ශක්තිය නැති කොට කරන්නේ මොකදැයි" යි තරුණයා කීය.

ඒ ඇසූ ඈ එතැනින් නැගිට "නෑ, අපේ අලසකමින් මරුමුවට පත්වීම යුතු නොවේ. අපි ධෛර්‍ය්‍යමත් වෙමු නම් රෑට නිසි ස්ථානයක් සොයා ගැන්ම අපට හැකි වෙතැයි කියා, පළමුවෙන් ගඟට බැස නැවතත් වතුර බී ගමනට පටන් ගත්තා ය. ඇගේ චිත්ත ශක්තිය ගැන ප්‍රීතිමත් වූ තරුණයා ද ඈ පස්සේ ගියේ ය. මෙසේ යන කල ගඟේ තඹුනු ඕලු මල් රාශියක් දැක "ඇයි මේ අපට කෑමක් තිබෙනවා නොවේද" යි කියා ඕලු කඩන්ට පටන් ගෙන වැඩි කල් යන්ට මත්තෙන් රෙදි පටක් පුරවා ගත්තා ය. සැට පැයක් වතුර හැර කිසිවක් නොලැබූවා වූ ඔවුන්ගේ ක්ෂුධාගින්න නිවා ගැනීමට ඒ ලැබුනු ස්වල්පය ස්වර්ගයෙන් ලැබූ දෙයක් මෙන් විය. එහෙයින් ඉතා සතුටුවූ ඔව්හු ඒවා කමින් වැඩිදුර ගියාහු ය.

හිරු රැස් ක්‍රමයෙන් හීනවී සඳ රැස් අහසෙහි පැතිරෙන්ට විය. වලාවන්ගෙන් බාධා නො ලැබුවා වූ තරු රාශිය ද බැබළෙන්ට විය. මෙසේ ප්‍රියකරු වූ රාත්‍රියෙක ගං තෙරෙක්හි සීතලාශ්‍රිත පවන් ලබමින් යෞවනාභයෙන් සැදි රූපවත් කාන්තාවක් පාර්ශ්වයෙහි ඇතිව කිසිවෙක් නො මැත්තා වූ වනයෙක ගමන් කරන්ට සිඩවූ අය තවත් ඇද්දැයි තරුණයාට සිතුනි. ඒ කාරණයෙන් ඔහු අනිත් තරුණයන්ට වඩා වාසනාවන්ත යයි කල්පනා වී නැවත නැවතත් සතුටු වූයේ ය. රෑ වීත් දෙතුන් පැයක් ගමන් කොට සුදුසු ස්ථානයක් දකින්ට නොලැබ නැවතී වට පිට බැලුවෝ ය. එක් පාර්ශ්වයකින් ඝන වූ කැලයද අනික් පාර්ශ්වයෙන් ගංගාව ද තිබුනි. කැලයෙහි තිබුනු වෘක්ෂයෝ වනාහි පහසුවෙන් නැග ගත නො හැකි වූ කාලාන්තරයෙහි වැඩුනා වූ විසාල ඒවා වූහ. එහෙයින් වන මෘගයන්ගෙන් පැමිණිය හැකි අන්තරා ගැන ප්‍රවේසම්වීම සඳහා ගංගාවෙහි ගල් තලාවෙක නිදන්ට තරුණයා ප්‍රියවී, ඒ බැව් කී කල්හි ගංගාවෙන් හමන සුලඟේ අධික සීත ගුණය නිසා නිදන්ට එහි නුපුළුවන් බව සහ වනයෙහි මෙන්ම ගංගාවෙහිත් අන්තරා තිබෙන බැව් ඈ ඔහුට සිහිපත් කොට ගසක් මුල වාඩි ගත්තා ය. ඔහුද එවන උපායක් නොදැක අසලින් සවි ඇති පොලු දෙකක් කඩාගෙන ළඟින් තබා ගත්තේය. ඒ දුටු මිනා ඒවා උල්කර ගතහොත් හෙල්ල මෙන් පාවිච්චි කරන්ට හැකි බැව් කීය. තරුණයාගේ සාක්කුවෙහි නිතරම තිබී පිහියේ අගය හරියාකාර ඔහුට හැඟුනේ ඒ ප්‍රස්තාවෙහිදී විය. ඒ බැව් ඔහු ඈට කියමින් නරක සිරිත් වලින් සමහර විට මහත් ප්‍රයෝජන ලැබෙන බැව් දකින්ට ලැබුන දෙවෙනි ප්‍රස්තාව ඒ යයි දැන්නුවේය. ඈ ඔහු දෙස ගැඹුරු ස්වභාවයෙන් යුක්තව බලා, පිහියක් අතේ තබා ගැනීම, හෝ ස්ත්‍රියක් ගෙන යන කල ඊට සමීපවී බැලීම හෝ නරක සිරිත් යයි ඈ නො කියන බවත්, සිරිත් හොඳ අතට හෝ නරක අතට පෙරළා ගන්නේ මනුෂ්‍යයන්ගේ තේරුම් කමේ හැටියට බවත්, කියා ඒ උල් කරන ලද පොල්ලක් අතට ගෙන බැලුවා ය. එයින් සතෙකුට තුවාල කිරීම ඉතා පහසුවෙන් පුළුවන් බවත් ශක්තිමත් අයෙකු

අත එබඳු ආවුධයක් ඇති වූ කල විරුඬව එන මනුෂ්‍යයෙකුට හෝ මෘගයෙකුට ජයගැන්ම දුෂ්කර බවත් සිතා, තරුණයාගේ දෙහය දෙසට ඇස් හෙළීය. ඔහු ද සිනාසෙමින් ඈ හා තර්ක කරන්ට ඔහුට නුපුළුවන් බව කියා වන මෘගයන් ගැන කථාවට පටන් ගත්තේ ය. අන්තිමේදී ඔවුන්ගෙන් එකෙකු අවදිව සිටියදී අනිකා නිදන ලෙස තීන්දු කරගෙන, තරුණියට පළමුකොට නිදන්ට සැලැස්වීය. ඈ නිදන්ට පෙර ඔහු දෙසට අති පෙම්බර ඇල්මක් හෙළා ඇස් පියා ගත්තීය. ඒ බැල්ම ඔහුගේ සිතට තදින් වැදුනේය. ඔහු ඈ ආරක්ෂා කිරීමට ගන්නා වූ ඒ උත්සාහය ගැන ඇගේ ස්තුතිය කටින් ප්‍රකාශ නොකොට ඒ බැල්මෙන් හැඟවූ බැව් ඔහුට පෙණුනි. එබැවින් ඔහු ඈ ගැන වඩ වඩා ආදර සහිතව මුර කිරීමට පටන් ගත්තේ ය.

පැයක් හෝ දෙකක් යනතුරු කැලයෙහි ඇතිවූ රැහැයි ශබ්දය හැර කිසිවක් නො ඇසූනේ ය. ඉන්පසු වෙනත් ශබ්දයක් ඇති විය. එය කිට්ටුවෙන් නික්මෙන බැව්ද ඔහුට දැනුනි. එහෙයින් ඒ උල අතට ගෙන සූදානම්ව සිටියේ ය. ටික වේලාවක් ඒ ශබ්දය තිබී ක්‍රමයෙන් නැති විය, මීනා හදිසියෙන්ම වාගේ පිබිද ඒ නැතිවී යන ශබ්දය අසා ක්ෂණයකින් නැගිට අතට ගත් හුලක් ඇතිව, 'ඒ කොටියාගේ හඬ යයි තරුණයාට රහස් කොට කීය. ඒ ඇසූ තරුණයා තැති ගෙන, ''අපි කුමක් කරමුදැයි'' ඇසූයේ ය.

ඈ වට පිට බලා සමීපයෙහි තිබුනු වෘක්ෂවලට නැග ගැන්ම නුපුළුවන් බැව් දැක ''අපි සිටින තැනට නුදුරෙහි, ගංගාවෙහි ගල්පතක් තිබුනා නොවේදැ'' යි අසා, එසේ යයි කී කල ''එහෙනම් අපි එහි පැමිණෙන්ට වෑයම් කරමුය'' යි කියා ඉතා ඉක්මනින් ගඟ දෙසට ගමන් කළා ය. වතුර ද මදක් අඩුවී ගල් තලාව හොඳාකාර පෙනෙන්ට තිබුනි. එහි යාමට ද ගොඩ සිටම වැඩි පළල් වූ ගල් වැටියක් තිබුනි. එහි ඈ නගිනවා සමගම කැලය දෙසින් සතෙකු ගමන් කරන ශබ්දයක් ද ඇසුනි. එහෙයින් ඈ ගල් පෙළ දිගේ දුව ගොස් ගල් තලාවට පැන ගත්තීය. තරුණයා

මදක් ප්‍රමාද වීය. ඔහු ඉවුර අද්දරම වූ ගලට නැග කැලය දෙසට හැරෙනවාත් සමගම කොටියෙක් ඔහු පිටට එක පිම්මෙන් පැන්නේ ය. ඕහුගේ ඔසවන ලද වාම හස්තය මෘගයාගේ මුඛය ඇතුල්ට ගොස් හෙතුවට මෙන් ඊට උගේ දිව අසු විය· ගල පළලක් නොමැති හෙයිනුත්, පිම්මේ සැරකම්නුත් ඌට නැවතීගන්ට බැරිව මිනිසාත් සමගම දියට පෙරළුනේය. අතට අසුවූ දිව ඔහු තදින් අල්වාගෙන සිටියේ ය. ඒ අන්තරාය දුටු මීනා ක්ෂණයකින් ඔහු වෙත පැමිණ ඇගේ අතේ තිබුන හුලින් එල්ලේ බලා ඇසට ඇන්නා ය. දියපාර සැර බැවින් මිනිසා සහ මෘගයාත් ගලටම හැපි හැපී සිටියෝ ය. ඇස අන්තරාය වූ කොටියා ගල දිගේ පීණන්ට උත්සාහ කෙළේ ය. මීනාත් ගල දිගේ යමින් උගේ හිසටම ඇන දෙතුන් පලක් සිදුරු කළා ය. එයින් ගැලූ ලේ ධාරාවෙන් වතුරද රත් පැහැය විය, ස්ත්‍රියෙකුගේ ඒ නිර්භීත ක්‍රියාව විස්මයෙන් බලා සිටියාක් මෙන් චන්ද්‍ර තෙම කාන්තියෙන් බැබළී ය.

තරුණයාගේ හස්තය මුඛයෙන් ඉවත් නො කොට සිටීයදීම මෘගයාගේ ගාත්‍ර පණ නැතිව නිදන්ට පටන් ගත්තේය. මීනා නැවතත් පහරක් දුන් පසු උගේ දූහලිලි සම්පූර්ණයෙන්ම නිශ්චල වූහ. ඇගේ පළමුවෙනි නිර්භීත ක්‍රියාව ඔහුට කිසි කලකත් මතක නැති නොවන බව කියමින් ඇට ප්‍රසංසා කෙළේ ය. ඇද ඒ ප්‍රසංසාව අයිති ඔහුට යයි කීය. ඔහු අතට අසුවූ දිව නොහැර සිටීයායින් ඇගේ ක්‍රියාව කරන්ට පහසු වූ සැටි පෙන්විය. මෙසේ කියන අතරම ඔහුගේ අත දෙස ඈ බලා එය තදින් තුවාලවී තිබුනා දැක, වහාම වතුරෙන් සෝද ලේ නවත්වා, ඇගේ වස්ත්‍රයෙන් කැබැල්ලක් ඉරා තුවාල බැන්ද ය. ඉන් පසු දෙදෙනම වෙහෙසව සිටි බැවින් මදක් පහසු ගැනීම උවමනා විය. මීනාගේ තද ඉල්ලීම පිට තරුණයා ඒ ගල් පොත්ත උඩ නින්දට වනි. ඇගේ අතට ඔහුගේ ඇහෙහි රස්නය ඝොදාකාර දැනුනි. හදිසියෙන් පැමිණියාවූ භය නිසා ඒ එසේ වූ බව දැන ඔහුට වඩ වඩා පහසු දෙන පිණිස ඔහුගේ හිස ඇගේ උකුලෙහි තබාගෙන නළල ඇගේ

කොමල හස්තයෙන් පිරිමැද්ද ය. ස්වල්ප වේලාවකින් ඔහු සැපසේ නිදන්ට වනි. චන්ද්‍ර රශ්මියෙන් තෙමීගිය ඔහුගේ මුහුන ඇගේ සිතට ආසා ජනක වීය, ඔහු තද නින්දෙන් සිටියේය. ගංගාවෙන් නික්මුනු සුලඟ ද ඉවසිය නොහැකි ලෙස සීත විය. එයින් ඔහු පෙළෙන බැව් සිතී, ඔහුගේ ශරීරය උණුසුම්ව තබන පිණිස ඈ ඔහුට ලංවී හාන්සි වූවා ය, ඔහු කීප වාරයක්ම ගැස්සී අත් පා දිගුකොට ශබ්ද කරන්ට උත්සාහ කෙළේය. ස්වප්නයෙන් ඔහු දිවියා සමග නැවතත් පොර අල්ලන බැව් ඈට එයින් පෙණුනි.

රාත්‍රිය ඉකුත් වෙගන යන වේලාවට දෙදෙනාම නිද්‍ර සැපයෙහි සිටියෝ ය. පූර්ව දිග අහස් තලයෙහි අරුණාලෝකය ඇති විය. අන්ධකාරය සොරෙකු මෙන් ගස් සෙවනැලි වල රඳ රඳා සිටියේය. පක්ෂීන්ගේ මියුරු නාදය ඇති විය. ගහෙහි වූ මල්වල සුවඳ පැතිරෙන්ට විය. සීත සුළඟද තදින් හැමී ය.

තරුණයගේ දුර්වල වූ ශරීරය තියුණු වූ ඒ ගංගා සුලඟින් මදක් සීත කළ විට ඔහු පිබිද ඇස හැර බැලුයේ ය. ලමයෙක් මවෙකු විසින් උණුසුම් කරගෙන සිටින්නාක් මෙන් ඔහු ලඟින් නිද සිටි ඈ දකිමින් ඔහුගේ ජීවිතය තිබෙන තුරු නොනැගිට එසේම නිදන්ට ඇත්නම් යහපතැයි සිතීය. එබැවින් ඔහු නිසොල්මන්ව නැවතත් ඇස් පියාගෙන සිටීයේ ය. අතෙහි ද ශරීරයෙහි කීප පලක ද, තුවාල වලින් ඔහුට වෙදනා ඇති බැව් දැනුනි, නමුත් ඒ සියලුම් වෙදනා දස අවුරුද්දක් විඳීම, එහෙම එක මොහොතක සැපයට සමාන කළ නොහැකි යයි ඔහු නැවත නැවතත් කීයා ගත්තේය.

4 වෙනි පරිච්ඡේදය

පක්ෂීන්ගේ නාදය වඩ වඩා සතර දිගින් නික්මෙන්ට විය. මීනා ඇස හැර නැගෙණහිර දෙසින් සූර්යයා අහස් කුසය ආලෝක කරගෙන එන බැව් දැක, තරුණයා ඒ

වන තුරුත් නිදියයි සිතා සෙමින් ඔහුගේ ඇඟට අත ගැසීය. ඔහු ද ඇස හැරි විට "ඉතින් අපට නැගිට මෙතැනින් නික්ම යන්ට කාල යයි" කීය. ඔහු දුර්වලව සිටී නමුත් නැගිට වාඩිවී රාත්‍රියෙහි මැරූ දිවියා දෙය බලා උඹේ වික්‍රම-යේ ලකුණ තවමත් තිබෙන්නේ යයි කියා ඇ කෙරේ ප්‍රියංකර බැල්ම හෙළා කීයේ ය. ඉන් පසු දෙදෙනම නැගිට ගල් තලායෙන් බැස පළමුවෙනි රැයෙහි සිදුවූ හදිසියෙන් ජය ගත්තාක් මෙන් මතුත් ඔවුන්ට ජයම අත් වේවායි ප්‍රාර්ථනා කොට එතැනින් නික්ම ගං තීරයෙහිම ගමන් කළෝ ය.

ඔවුන්ගේ පාර එතැන් සිට කඳු වැටියක පාර්ශ්වයෙන් විය. ක්‍රමයෙන් භූමිය උස්ව තිබුන හෙයින් බොහෝ දුරට දෘෂ්ටිය හෙළන්ට බැරි විය. ස්වල්ප වේලාවක් එහි නැග නැග යන විට ගංගාව නැම්මක් ගෙන තිබෙන බවත් කඳු පර්වත සහිත වූ බවත් සම්භ විය. ගං ඉවුරද ක්‍රමයෙන් උස්ව මදක් ඈතෙහි ප්‍රපාතයක් මෙන් පෙණුනි. එහෙයින් ඔව්හු පහසු තැනකින් වතුර බී සෙමින් සෙමින් කඳු නගින්ට පටන් ගත්තෝය. උදය කාලයේ හිරු රැස් දුර්වල වූ ඔවුන්ගේ ශරීර වලට තද උෂ්ණය දුන්හ. උතුරු දෙසින් කඳු මුදුන ලොකු ගල් වලින් යුක්තව තිබුනි. ඒ පැත්තේ ඝන වූ කැලෑවද එක් තැනකින් ගල් මැදින් ගලා බසින ජල ධාරා-වක්ද විය. එහි අලංකාරයද බියකරු තේජස් භාවය ද ඇති විය. ඒ දෙසට ඇස් හෙළ හෙළා ගං ඉවුරටම වී යන්නාහු, ජලයට ආසන්නව එක් පඳුරක රැඳී තිබුන කූඩුවක් දැක මීනා වහාම තරුණයාට එය පෙන්වා, එහි බිත්තර ඇත-හොත් ඔවුන්ට එය ප්‍රයෝජනවත් වේයයි කී විට තරුණයා එහි බසින්ට සැදුවේ ය. අතෙහි තුවාලය නිසා ඔහුට ඒ බැස්ම අමාරු බැවින් නවතින්ට කියා ඈ සෙමින් සෙමින් පඳුර අල්ල අල්ලා ඒ කූඩුව ළඟට පැමිණ එහි තිබුන දේ ඇගේ රෙදි පටක දගෙන නැවතත් තරුණයා දෙසට විත් ඒ උදෑසන ඔවුන්ට වූයේ මහත් ජයක් යයි කිය. බිත්තර සතරක් ඔවුන්ට අත්පත් වීය. තවත් ප්‍රවේසමෙන් යන විට ඔවුන්ට වෙනත් කුඩු සම්භවී උදය කාලයට සෑහෙන තරම්

බිත්තර සපයා ගත්තෝ ය. එබැවින් වැටී තිබුනු ගසක් උඩ වාඩිගෙන ඒ බිත්තර බීවෝ ය. ක්ෂුධාගින්නෙන් පෙළෙමින් සිටි ඔවුන්ට ඒ ඉතා සැපදයක විය. මදක් ප්‍රාණවත් වූ ඔව්හු එහිම හිඳ සොරුන්ගෙන් වූ භයින් මදක් මිදී සිටින නමුත්. වන මෘගයන්ගෙන් අන්තරා වීමට භාජනව සිටින බවත් කෑම නොලැබීමෙන් ඔවුන්ට මදක් දුක් ඇතිවන බවත් කථාබස් කොට, මිනිස් වාසයකට ඉක්මන්කර යා යුතු බැව් තීන්දු කරගෙන, සිතට ධෛර්‍ය්‍ය ගෙන නැවතත් ගමනට පටන් ගත්තු ය. හිර මුදුනට එන්ට පළමු කන්දේ අනික් පැත්තට පැමිණියෝ ය. එහිත් ඇස් ප්‍රමාණය දක්වා ඝන වූ කැලෑව විය. ගල් පර්වත වලින්ද ගැවසිය. ඒ දුටු ඔවුන්ගේ සිත් බොහෝ අධෛර්‍ය්‍යයෙන් පිරුණ, එබැවින් ඔව්හු එහි සෙවන ඇති තැනක වාඩිගෙන මදක් විඩා හරින්ට ලැස්ති වූහ. එහි තිබුනු දිරාගිය ගෝනි කැබෙල්ලක් දුටු මීනා, එය තරුණයාට පෙන්නා කියන්නී, "මෙ කැලයට අපට පළමු මිනිස්සු පැමිණ තිබෙ. නමුත් මෙය අද ඊයේ වැටුන එකක් නොව ටික කාලයක් මෙහිම තිබී දිරාගිය එකක් බැව් පෙනේ යයි" කීවා ය.

ඇගේ ඇසෙහි තීක්ෂණ භාවය ද කල්පනාවෙ විශිෂ්ටතාවයද පැයින් පැය ඔහුට ප්‍රත්‍යක්ෂ විය. එබඳු කාන්තාවක් ඔහුගේ සමාගමට ලැබීම මහත් වාසනාවකැයි සිතී ගොස් ඇට කථා කොට කියන්නේ "ඇයි, මීනා, උඹ කල්පනාවෙහි කොපමණ දක්ෂියෙක්ද? පිරිමියෙක් වූවා නම් උඹ පොලිස් හමුදවට ආභරණයක් වෙනවා නොවේද" යි කීය.

"මගේ පියා යුධ හමුදවේ සිටියදී ප්‍රසිධ ක්‍රියා කළ කෙනෙක් නොවේද? මටත් පිය උරුමය මදක්වත් ඇති විය හැකි නොවේද" යි කියමින් මදක් සිනාසී, "ඒ වුනත් ඒ ගෝනි කැබෙල්ල දුටු කොයි කෙනෙක් වුවත් ඔස මම කිව් වචන කීයනවාමයි. එහි විශෙෂ දක්ෂ කමක් මට නො පෙණේ යයි" කියා ඔහු දෙසට ලා තිබුනු ඇස් කඳු පංක්තිය දෙසට හෙළුවාය. එහි ගල් ප්‍රපාත සහිත එක් කැනකින් ස්වල්ප වශයෙන් නැඟුන දුමක් ඇට පෙණෙන්ට

විය. ඉර පායා ඒ වන තුරු මීදුම රඳා සිටින්නේ නැති බව සහ දුම් නැගීම බොහෝ විට වන්නේ මිනිසුන් ඇති තැනකින් බව ඈ සිතා, පරීක්ෂාවෙන් බලා සිටියා ය. ඒ ගින්නකින් නික්මෙන එකක් බව හොඳාකාර දැන, තරුණයාට එය විස්තර කොට එය බැලීමට යා යුතු බව කීය.

එහි වාසය කරන්නෝ කවරහු දැයි නොදන්නා බැවින් ඈ එහි නවතා, ඔහු යන්ට සැරසීය, නමුත් ඈ ඊට එකඟ නොවී ඇගේ ඇඳුමෙන් ඇගේ ස්වභාවය වසා ගන්ට ඇට පිළිවන් බවත් ඒ කැලෙහිදී ඔවුන්ට හදිසි පැමිණිය හැකි බැවින් දෙදෙනම එක්ව සිටීම යුතු බවත් කියා, ඇත් සූදනම් වූවා ය. මෙසේ දෙදෙනම කඳු නැග නැග ඉතා අමාරුවෙන් ඒ දුම් නික්මෙන ස්ථානයේ පහතට පැමිණි-යෝය. එහි කෙලින් තිබුනා වූ නොනැගිය හැකි ගල් පර්වතයක් විය, ඒ පාර්ශ්වයකින් දුම් ටික ටික පිට විය. ඒ ස්ථානයට පැමිණීමට බොහෝ ඈත සිට කඳු වැටිය දිගේ වින් මිස නැතිව බැරි බව පෙණුනි, ඔවුන්ගේ දුර්වල වූ ගාත්‍ර වලට එය ඉතා දුෂ්කර බැව් හැඟි. "මෙහි යමෙක් සිටී නම් ඔහුට ඇසෙන පිණිස අපි කෑගසමු යයි කියා දෙදෙනම එක්ව ශබ්ද කළෝ ය. අවට කඳු හෙල්ද ඔවුන්-ගේ උත්සාහයට කවටකම් කරන්නාක් මෙන් ඒ ශබ්දයම නික්ම වූවාහු ය. ඔවුන් දෙතුන් විටත් එසේම ශබ්ද කළ විට පර්වත මුදුනෙන් මිනිසෙක් දර්ශණය විය. හෙතෙම ඉතා මහළු වූ දුර්වල වූ යකෙකු බව ඔවුන්ට ඒ දුරටත් පෙණුනි. ඔහු සතර දිශාව බලමින් හඬය නික්මුනේ කොතැනින්දැයි විමසන්නාක් මෙන් සිටියේ ය. එබැවින් ඔව්හු නැවතත් ශබ්ද කළෝය. ශබ්දය අනුව ඔහු සොයන්නේ පාත සිටි ඔවුන් දෙදෙන දැක පර්වත අද්දරට ආය. එසේ ශබ්ද කරන්නේ මන්දැයි ඔහු ඇසූ විට ඔවුන්ගේ අසරණ භාවයද නිරාහාරව සිටින බැව්ද කීවෝ ය. මහල්ලා ස්වල්ප වේලාවක් කල්පනා කරන්නාක් මෙන් සිටියේ ය. ඔහුගේ සිතෙහි තර්කයක් ඇතිවූ බැව් ඔවුන්ට හැඟී, ක්ෂුධාව ඉවසා ගන්ට බැරි බැවින් කෑම ස්වල්පයක්වත් දී පිහිටවන ලෙස ඉල්ලා සිටියෝ ය. මැහැළි වෙසින් සිටි මීනාගේ

ස්වභාවය ඔහුගේ සිතෙහි අනුකම්පාව ඉපදවීය. ඒ බැව් ඔහු කී වචන වලින් හැඟුනි. මනුෂ්‍යයෙක් නොඑන මේ කැලෑ මධ්‍යයට මේ මැහැලිත් සමග උඹත් පැමිණුනේ මන්ද? උඹලා කවරෙක් සොයාගෙන ආවාහුද?''

මහල්ලාගේ ප්‍රශ්නය ඔවුන්ගේ පැමිණීමට හේතුව කියාදී ඇහුවාක් මෙන් විය, එහෙයින් මීනා මහළු වයසට සුදුසු ලීලාව පෙන්වා ඇසේ කඳුලු ඇතිව, දුකින් කථා කර ගත නො හැකි සේ නවත නවතා, ඇගේ බාල පුතා ඉංග්‍රීසි මහතුන් වගයක් සමග වෙඩි තිබීමට වත්, නැවතත් ගෙදර නොගිය බැවින් කැලේ වල් වැදිලාවත්දෝයි බලන පිණිස ශබ්ද කර කර, ඇවිදිනවාය'' යි කීය.

ඒ ප්‍රවෘත්තිය ඇසූ මහල්ලාගේ සිත උණුවී ඔහුගේ වාසස්ථානයට එන ලකුණු කියන්නේ, ඔවුන් සිටී තැනින් වමතට බඹ සියයක් පමණ ගිය විට ගොරක ගස් හත අටක් සම්හ වෙන්ට තිබෙන බවත්, එතැන් සිට දකුණට ගමන් කොට නාගස් පෙළක් තිබෙන තැනට අවුත්, එහි පිහිය-කින් තුන් පලක් කපා තිබෙන නාගස දූක, ඒ ගසට නැග බස්නාහිර දෙසට තිබෙන අත්ත දිගේ ගිය විට ඔවුන් බසින්නේ ගල් පොත්තක් උඩට බවත් කියා ඔහු නොපෙණී ගියේ ය.

මීනා තරුණයාගේ මුහුන දෙස බැලීය. තරුණයා මීනාගේ මුහුන දෙස බැලී ය. ඉන් පසු දෙදෙනම එක විට මහල්ලා සිටි ඉහළ දිශාව බැලුවෝ ය. සියලු දිශාවෝම සියලු ආකාරයෙන් නිශ්ශබ්දය ඉසිලූ ය.

මීනා කථා කොට, ''අපි මේ කැලේ කොයි යන්-නෙමු දැයි නොදන බඩගිනි, හය, දුක් උසුලනවාට වඩා මහල්ලා සිටින තැනට ගොස් කෑම බීම ලබාගෙන, නැත්නම් මග තොරතුරුවත් අසාගෙන යන්නෙමු නම් යහපතැයි'' කීය.

ඊට තරුණයා මදක් කම්මැලි වීය. මහල්ලා තනියම ඒ කැලේ වාසය කරන්නේ යයි ඔහුට කල්පනා කරගත

නොහැකි විය. එහෙයින් තවත් අය සිටිත් යයිද, එසේ සිටියහොත් ඈ සමග එහි යාම රුචි නොවන බැවිද සිතා, ඇට ඒ දැනුම් දුන් කල්හි, ඈ කියන්නී, '' මගේ කල්පනාව නම් මහල්ලා තනියම සිටියි, වෙන වෙලාවලට කොහොම උනත් දැන් ඔහු තනිව සිටින බව පෙනේය'' යි කීය. ඊට කාරණා කවරේ දැයි ඇසූ විට මෙබඳු කැලයෙක අපි හදිසියෙන් කෑගසන කල තවත් මනුෂ්‍යයන්ට ඒ ඇසුනි නම්, වහ වහාම ඒ කුමක්ද කියා බලන්ට ඊම ස්වභාව සිරිතකි. මොහු හැර කිසිවෙක් නා බැවින් වෙන කිසිවෙක් මේ අසලක නැති බැව් පෙනේ'' යි කීවාය.

ඇගේ වචන සත්‍ය බැව් පෙනී තරුණයා ද ඈ හා එකී සලකුණු බල බලා ගොස් නා ගස් සමීපයට පැමිණියෝ ය. මීනාගේ තීක්ෂණ ඇසට ලකුණු කරන ලද නා ගස වහාම පෙණුනි. එය නැගීමට ද පහසු ආකාරයට අතු පතර විහිදීමෙන් යුතුව තිබුනු හෙයින් පළමුකොට ඈ නැගීමට පටන් ගති. තරුණයා ද ඈ පස්සේ ආවේ ය. ස්වල්ප වේලාවකින් අත්ත දිගේ ගොස් ගල් පොත්ත උඹට නැග ඔවුන් දෙදෙනම වට පිට බැලූ විට මහල්ලා පඳුරක් ලඟ සිටිමින් ඔවුන්ට සංඥා කරනවා දුටුවෝ ය. කන්ද පැත්තේ නැග නැග ගොස් ඔව්හු මහල්ලා සිටි තැනට පැමිණියෝ ය. පඳුරට මුවාවී තිබුනේ කුමක් දැයි පළමුවෙන් නොපෙනුන නමුත් පඳුර පසු කළ විට ගුහාවක් තිබෙනවා ඔවුන්ට දකින්ට ලැබුනේ ය. මහල්ලා සිටින්නේ එහි බැව් කියා ඔවුන්ට ඇතුල් වෙන්ට කීවේය, මීනා කිසි බියක් නොමැතිව ඉස්සර වූවා ය. මහල්ලා ඈ අනුව ගියේය, තරුණයා පිටිපසින් ගමන් කෙළේ ය.

පළමුවෙන් ඔවුන්ට පෙනෙන තරම එළිය තිබුන නමුත් අන්ධකාරයට නුපුරුදු වූ දෙදෙනාගේ ඇස්වලට එහි ඇතුල් වෙන්ට වෙන්ට වඩ වඩා කළුවරවී අන්තිමයේදී කිසිවක් නො පෙනෙන්ට විය. උමග මිනිසෙකුට හොඳාකාර කෙලින් සිටගෙන ගමන් කරන්ට උස්වූ, මිනිසුන් කීප දෙනෙකුට සරස්ව යන්ට හැකි තරම් පළල් වූ, ගල් මුල් උස් මිටිකම්

නැති ඉදුලක් මෙන් සමවූ, පයට පහසු වූ බිමෙන් යුත් බැව් ඔවුන්ට හැඟුනි. ක්‍රමයෙන් එළිය ටික ටික ඇතිවී ඔවුන්ගේ ගමන ද වඩ වඩා පහසු විය. අන්තිමයේදී ඔවුන් හොඳාකාර එළිය ඇති ගුහා මුඛයට පැමිණ එයින් ඉවත්ව ගලකට බැස පාත බැලුවෝ ය. ඔවුන් දෙදෙන පළමුවෙන් සිටගෙන කෑගැසූ තැන ඔවුන්ට පෙණුනි. ඉන් ඉපිට ගස් අතුරෙන් තැනින් තැන නැමී නැමී, සර්පයෙකුගේ ගමන මෙන් කඳු අතරෙන් ගලා බසින ගංගාවද පෙණුනි.

මේ සිත් ප්‍රිය කරන ස්වාභාවික දේ බල බලා ඔවුන් සිටින අතර මහල්ලා ගොස් කෑම පිළියෙල කෙළේ ය. ඔවුන් නැවතත් උමගට ඇතුල් වූ විට මහල්ලා එහි කළුවර කොණක සිට ඉදිරියට විත් ඔහුගේ ආහාර ටික වුවත් කා, ඔවුන්ගේ බඩගිනි නිවාගන්ට කීයේ ය. ඒ කළුවර වූ ස්ථානයෙහි සිට කනවාට වඩා එළිමහනේ කෑමට ප්‍රිය බව ඔවුන් කී විට, මහල්ලා මදක් සිනාසෙමින් ඔවුන් ගුහාව ගැන කිසිත් නොදන්නා බැවින් ඔහුගේ කීම අදහාගෙන ක්‍රියා කරන්ට ඕනෑය කියා දෙදෙනා අඬගසාගෙන ගියේ ය. ඔවුන්ට එද්දී නොපෙණුන නමුත් දෙපැත්ත ප්‍රවේසමෙන් බල බලා ගිය බැවින් එක් පැත්තක ගලේ දෙරක් භාන්සි කර තිබුනා සම්භවිය. මහල්ලා එය ඉවත් කළ විට ඔවුන්ගේ පුදුමයට කාරණා වූ දේ දර්ශනය විය. ස්වභාව යෙන් සෑදුනාක් මෙන් වූ ශෛලමය වූ පියසින් ද, ශෛල-මය වූ භිත්ති වලින් ද යුත් සාලාවක් ඉදිරියෙහි තිබුනි. එහි එක් භිත්තියක් කීප පලකින්ම සිදුරු කොට හොඳාකාර එළිය ද වාතය ද දෙන ලෙස සාද තිබුනි. ඒ භිත්තියෙහිද අනිත් භිත්තිවල ද මුව අං, ගෝන අං, කොටි සම් ආදී අඩයමේ ලකුණු පෙනෙන්ට තිබුනි- එක් මුල්ලක කොට්ට සහ පැදුරු එකට අකුලා ගොඩ ගසාද, තවත් මුල්ලක එක උඩ එක නංගා තිබුනු හාල් මලු කීපයක් ද වේලාපු කරවල, ගෝන මස්, ලුණු, කහ මිරිස් ආදිය දපූ භාජන කීපයක් ද තිබුනි. ඒ සියල්ල දුටු මීනා ඇ පළමු කළ කල්පනාව වැරදි බවත්, එහි කීප දෙනෙක්ම වාසය කරන බවත් දැන තරුණයාගේ මුහුන බැලීය. ඔහු ද එබඳු කල්පනා-වෙන්ම යුක්ත වූ බැව් මුහුනේ ආකාරයෙන් ඇට හැඟුනි.

විපත සිදු වන්ට පළමු ඒ ගැන තැවීම නුනුවණ කමකි. විපතෙහිදී ධෛර්‍යයගෙන ක්‍රියා කිරීම උතුම් මනුෂ්‍ය ගුණයකි. භය පෙන්වීම සතුරාට දෙන මහත් අනුබලයෙකි, යනාදිය කල්පනා කළ මීනා ඇගේ, මහළු වෙස් පා, '' අනේ මගේ පුතා මේ උඹටවත්, උඹ සමග ඉන්න අනිත් අයටවත් සම්බ වුනේ නැද්දැයි ඇසීය.

'' අනේ මට සම්බවෙන්නේ කොහොමද? මම මෙයින් පිටවී කොයි යනවාද ? '' යි මහල්ලා සුසුම්ලා තද දුක් වේදනාවෙන් මෙන් කීය.

'' උඹටත් මට වාගේ ලොකු දුකක් පැමිණී තිබේ. ඔය හිංලූවේ ඒ සිහිවී නොවේ දැයි මීනා කී කල මහල්-ලාගේ ඇස්වල කඳුළු පිරිණ. මුහුන ඉතා දුක්මුසු ලීලාව දක්විය. ඒ දුටු ඇ ඔහුගේ දුක සැබෑ එකක් බව විශ්වාස කළා ය. ඔහුගේ සිත උණුවන සැටිද දැකීමෙන් ඇ හට වඩ වඩා ධෛර්‍යය ඇති වීය. එහෙයින් ඇ මෘදු ලෙස කියන්නී, '' දුක් නම් කාටත් පැමිණෙත්. ඒ ගැන කණගාටුවී කරන්නේ මොකද ? අපි ජීවත් වනතුරු කරන්ට තිබෙන දේ නොකර පුළුවන්ද ? ඉතින් උඹ සමග සිටින අනික් උදවිය කොතැන්හිද '' යි කියා පැදුරු කොට්ටා දෙසට ඇස් යොමා ඇසී ය.

නැවතත් මහල්ලාගේ මුහුන දුකින් පිරි ගියේ ස. ඒ දුටු තරුණයා කථා කොට, '' මේ අම්මාගේ කථාවෙන් උන්දෑට දුකමයි දෙන්නේ ඉතින් කථාව නවත්වා උන්දෑ අපට දෙන්ට හදන කෑම ටිකවත් කෑවොත් හොඳය '' යි කීයේ ය.

මහල්ලා ඔහු දෙස බලා හිස සොලවමින් ලිප ළඟට ගොස් පිහං තුනක ඇර තිබූ බත් ගෙනැවිත් දෙදෙනාට දෙකක් දී ඔහුත් එකක් ගෙන කොණකට වී වාඩිගෙන කන්ට පටන් ගත්තේ ය.

මීනා සහ තරුණයාත් අමෘතයක් ලැබ සතුටුව එය භුක්ති විඳින්නේ කෙසේද, එපරිද්දෙන් ඒ ආහාර ටික

කැවාහු ය. බත් එපමණ රස බවක් ඔවුන්ට ඊට පෙරදී කිසි කලකත් දැනගන්ට නො ලැබී තිබුනේ ය. කා ඉවරවූ පසු තැටි දෙකෙකට ඔවුන්ට වතුරද ලැබුනි. ඒ සියලු උපකරණ ද, ආහාර රාශිය ද ඇතිව ඒ වනයේ ඔහුගේ වාසය කිරීම ඉතා පුදුම සහිත කාරණයක් විය. ඒ ගැන දැනගන්ට ආසා වූ මීනා කා ඉවර වූ පසු පිඟන් කෝප්ප ගෙන සෝද සකස්කොට තවා, කොස්සකින් බිම අතුගා පිරිසිදු කොට පැත්තකට වී වාඩිගෙන, ඔහු ඒ මහලු වයස මනුෂ්‍යයන් මැද ගත නොකොට ඒ භය උපදවන මහා වන සටයක කල් යවන්නේ ඇයි දැයි ඉතා මෘදු ලෙස ඇසුවාය. මහල්ලා ඇගේ වැඩපල කිරීම ගැනත්, කථාවේ, බැල්මේ ඇති සික්මුම් ලීලාව ගැනත් ඉතා සතුටට පැමිණ ඇසීමට පිළිතුරු වශයෙන් ඔහුට ඒ වනයේ වාසය කරන්නට වූ ප්‍රකාරයය විස්තර කර තමාගේ පසුගිය ජීවිත කථාව කීයේය.

5 වෙනි පරිච්ඡේදය

මහල්ලාගේ කථාව

මගේ උත්පත්තිය, මව් පිය පරම්පරාව ගම රට ආදී තොරතුරු කීමෙන් පලක් නොමැතියි. එහෙයින් ඒවා ගැන කියන්ට ගොස් කාලය මිඩන්ගු නො කරමි

විසි අවුරුද්ද වන විට මට විස්වාසීවූ ස්ත්‍රියෙක් ඇති විය, ඒ බැව් මගේ නෑදෑයෝවත් මිත්‍රයෝවත් නො දැන සිටි හෙයින් ටික කාලයක් මගේ ජීවිතය ඉතා සැපදයක ලෙස ගත විය. මගේ පියාගේ මරණය ද මේ අතරතුරෙදී සිඩවී මට මුදල් රාශියක් අත්පත් විය. ඒ බැව් රට හැම තැනම පතළවී, නොයෙක් තැන්වලින් මට හිර කථාවල් ඇති වූහ. මගේ රහස මම ප්‍රවේසම කරගෙන සිටියෙමි. මගේ විස්වාසියගේ ගෙට ඉඳ හිටලා සොරෙන් ගොස් සොරෙන් පිටවී ආවෙමි. මෙසේ වූ රහසි ගමන් වලදී මට කිසිවෙක් සම්බ නුවූ නමුත් කීප දවසක් යන්ට මත්තෙන්

සියලුම තොරතුරු මැන්යන් හට දැනගන්ට ලැබී තිබෙ. ඈ උදෑසනෙක මා ගෙන්වාලා මගේ වයසෙහි ලමයි හොඳින් හැසිරිය යුතු බවත්, මා ගැන දුක් උපදවන ආරංචි ඈගේ කණට වැටුන නමුත් ඒවා ඒ තරමට විශ්වාස නො කරන බවත් කියා මට හොඳින් ඉන්න ලෙස බොහෝ කාරණා ගෙන හැර දක්වමින් අවවාද කළා ය. මම ද සියල්ලටම ඇහුන්කන් දී, මගේ වැරදි ඇතත් මතුවට නොකර අත්හරින බැව් කියා පොරොන්දු වූයෙමි, ඒ පොරොන්දු පරිද්දෙන් ස්වල්ප කාලයක් කිසි තැනක නොගොස් සිටීයෙමි. නමුත් මගේ සිතෙහි ආසාව නවතාගන්ට බැරි විය. දිනෙන් දින එය මෙරුවේ ය, අන්තිමයේදී මගේ පොරොන්දු කඩකර මම ඇගේ ස්ථානයට ගියෙමි. එදින ඈ මා පිළි ගත් අන්දමින් ඈගේ සිත මා කෙරෙහිම රැඳී නැති බව පෙණුනේ ය. මගේ නො සැලකීමෙන් එසේ වී යයි ද මට සිතුනි. එගැන මගේ මිත්‍රයෙක් වෙත ගොස් රහස් කොට සියලු තොරතුරු කියා ඔහුගේ කල්පනාව ඇසුවෙමි. ඔහු ඒ විභාගකර බලන්නාක් මෙන් හිඳ පසුව මෙසේ කීය. ''ස්ත්‍රීහු දුර්වල වූ ලාමක වර්ගයකි. ඔව්හු සුළු දෙයින් සතුටු වෙති, සුළු දෙයින් දුක් වෙති, සුළු දෙයින් කිපෙති, සුළු දෙයින් සැනසෙති. එහෙයින් උඹේ නොසැලකිලි කමින් ඈ සිත වෙනස් වූ යයි සිතන්ට හැකි. නමුත් තව කාරණ-යකුත් කියන්ට තිබේ. උඹ කෙරෙහි අසතුටු වූවාක් මෙන් ඈ වෙන අයෙකු කෙරෙහි සතුටු වෙන්ටත් හැකි. උඹ මගේ මිත්‍රයෙක් බැවින් මම කියන දැනමුතුකම අහපන්. උඹ ඈ සොයාගෙන තවත් නොගොස්, උඹ නම්බුව ගොත්‍රය ප්‍රවේසම් කරගෙන, උඹට සුදුසු වූ ස්ත්‍රියෙක් සරණ පාවා ගනින්. තරුණ වයසේදී මිනිසුන්ට ඔබඳු ආසාවල් උපදිති. නමුත් වයස් ගතවන විට ඒවා මැකී යති; ඒවායේ නිශ්ඵල තාවය දැක බොහෝ දෙන පසුතැවිළි වෙති. උඹත් මේ අයුතු ක්‍රියාවෙහි බැඳී සමහර විට ඊට අසුව ඒ ස්ත්‍රිය සරණ පාවා ගන්ට කාරණා වුවහොත් උඹේ නෑදෑයන් විසින් අතහැර දමනවා ඇති. එයින් උඹට සැපයක් ලැබෙ යයි සිතිය නො හැකියි. ඒ නිසා දැන්, අද සිට, උඹේ දියුණුව සලකා ක්‍රියා කරපන්.'' මම ඔහු ලඟින් පිටත්ව යද්දි

ඒ අවවාද වලට හික්මී, එසේ ක්‍රියා කරන්ට අදහස් කර-ගෙන ගියාද, එසේ නැතිව, ඒවා එක් කණකින් අසා අනික් කණින් පිටකර දමා ගියාද යනු කීම දුෂ්කර වේ. මගේ මොලය පිළිවෙලක් නැති කල්පනා රාශියකින් අවුල්ව තිබුනි.

මම ගෙදර ගොස් දවල් කාලය ගත කොට රාත්‍රියෙහි සැහවී ඈ වෙතට ගියෙමි. ඈ පෙර සේ මට ආදරය මනා දක්වන්නේ මන්දැයි ඇසූ විට ඒ මගේ ඇසට පෙනෙන සැටි බවත් ඇගේ ගතිය වෙනස් වූ බව ඈට දැනගන්ට නැති බවත් කීය. වැඩි දුරවත් කථා කළ නමුත් ඇගෙන් මගේ සිත සතුටු වන අන්දමේ පිළිතුරු ලබා ගන්ට බැරි විය. මම ඈට කරුණාවෙන් කථා කළ පළමුවෙනි ප්‍රස්තාව එදින වේ. නමුත් මගේ රළු බස්වලට ඈ රළු ලෙස පිළිතුරු නොදී මට අනුකම්පා කරන්නියක් මෙන් මා දෙස බල බලා සිටියා ය. ඒ දුටු මට ඈ කෙරේ වඩ වඩා කෝප ඇති විය. ඇගේ මව් එවේලෙහි එහි පැමිණ මගේ රෞද්‍ර වූ ඇස් දැක මා කොණකට අඩගාගෙන ගොස් සැනසිලි බස් කියා මා පිටත් කර හැරියා ය.

රාත්‍රිය ඉතා කළුවර විය. වැසි පොද ද මද මදව තිබුණේ ය. පළමුවෙන් මට එය නො දැනුන නමුත් පසුව ගමන් කරන විට දැනෙන්ට විය. නැවතීමට තැනක් සොයා වට පිට බැලූ කල මා අඳුනන යහලු ස්ත්‍රීමෙක් සිටින ස්ථානයට කිට්ටු බව දැක ශීඝ්‍රව ගොස් එහි පැමිණියෙමි. ඈ මා කැඳවාගෙන ගොස් මැනියන් දක්වා . එපමණ කාලයක් එහි නාවා ගැන ඔවුන් බොහෝ දුක් වූ බවත්, මගේ පියාගේ මරණය ආදී විපත්ති නිසා නාවා වෙන්ට ඇති බව ඔවුන් විශ්වාස කරන බවත් කියා නොයෙක් සැනසිලි බස් වලින් මා නලවන්ට උත්සාහ කළා ය. මම ද ස්වල්ප වෙලාවක් එහි සිට වැසි පොද නැති වූ විට නික්ම ආවෙමි. ඉන් පසු මම එහි නිතර පාහේ ගියෙමි. දුක්මුසුව තිබුනු මගේ සිතද ඔවුන් ක්‍රමයෙන් ප්‍රිතිමත් කළාහ.

මෙසේ සිටින කල එක් දිනෙක මගේ පෙර කී මිත්‍රයා සම්මුඛව මම යහපත් ජීවිතයක් ගත කරන බව අසන්ට ලැබීමෙන් ඔහු ඉතා වාසනාවන්ත වූ බව කීයේ ය. මම ද බොහෝ කාලයකින් එහි නොගිය බව කී විට ඔහු මට තව තව ධෛර්‍ය දෙන්ට මෙන් ඒ ස්ත්‍රියගේ සිත අන් කෙනෙකු කෙරේ රැඳී තිබෙන බවත්, ඔහු ඈ සරණ පාවා ගන්ට සූදානම් වන බවත් කීය. ඒ කවරෙක් දැයි ඇසූ විට ඒ මගේම මිත්‍රයෙක් බවත් ඔහුගේ නම නො කියන බවත් කීයේ ය. මම නොයෙක් උත්සාහ කොටත් වැඩිදුර යමක් දැනගන්ට නො ලැබ සිතෙහි ඇති වූ තද වේගයෙන් ගෙදර ආවෙමි,

එදින රාත්‍රිය මට නින්දක් නැති විය. මතක නැතිව සිටිය ස්ත්‍රිය කෙරේ නැවතත් ආසාව ඉපද, ඇගේ මුහුන ඉදිරියෙහි සිට එදින මා ඇසූ කරුණු සැබෑ දැයි අසා දැන-ගන්ට බලවත් කැමැත්තක් උපන. එබැවින් සොරෙන් ගෙයින් පිටවී ඇගේ වාසස්ථානයට පැමිණ ඔවනද මෙන් දෙරට තට්ටු කෙළෙමි. නමුත් ඊට පිළිතුරක් ඇතුළෙන් නො ලැබී, නැවත නැවතත් වඩ වඩා ගබ්දකර දෙරට ගැසුවෙමි, එවිට මැහැළි ස්ත්‍රිය දෙර ලඟට විත් දෙර කඩන්ට සදන්නේ කවුරුදැයි අසා ඇගේ දියනිය නැන්ද කෙනෙකුගේ ලෙඩක් ආරංචිවී ගිය බව කියා දෙර ලඟින් ගියා ය. නැවත නැවතත් මම ඇට කථා කළ නමුත් කිසි පිළිතුරක් නො ලැබ, දුඃඛ වේගයෙන් ගෙදර ආවෙමි.

පසුවද ගිය ගමනත් එසේම නිෂ්ඵල විය. ඉන් පසු කීප දවසක් නොගොසින් හිඳ දිනෙක අඳුරු වූ විගසින්ම එහි ගොස් පසු පැත්තේ හැර තිබුනු දෙරින් ගේ ඇතුළට පැමිණියෙමි. මැහැළි ස්ත්‍රිය ගෙදරින් යම් කටයුත්තක් පිණිස පිටත ගොස් දුවනිය සහ ඇගේ කුඩා සහෝදර-යෙකුත් එහි සිටියා මට සම්බ විය. මා දුටු සැටියේම ඈ හයින් මෙන් නැගිට ඇගේ කාමරය දෙසට ගමන් කර එළිපත උඩ සිටගෙන මා දෙස බලා සිටියා ය. මම වාඩි ගෙන ඇට ලඟට එන්ට යයි කී නමුත් ඈ ඊට කීකරු නුවූවා ය. මගේ බලය සම්පූර්ණයෙන්ම බිඳී ගොස් තිබෙන බව මට එයි පෙණුනි.

මීනා සහ තරුණයා මේ කථාව ඉතා ආසාවෙන් අසාගන සිටියාහ. මහල්ලාගේ උගුර මදක් වේලී ගිය බව දුටු මීනා වහාම වතුර ටිකක් තවාගෙන ගොස් ඔහුට දුනි. ඒ බී උගුර පාදගෙන කථාව කියන්ට පටන් ගත්තේ ය,

ඉතින් ඇ මා ළඟට නො එන බැව් දැන, ටික වෙලාවක් කල්පනා කරමින් සිට මට පෙර මෙන් සැලකිලි නැති වෙන්ට කාරණා කවරේ දැයි ඇසූ විට ඇ මා දෙස දෙතුන් විටක් බලා ''අප ගැන සිහි නැති අය අපේ සැලකිලි බලාපොරොත්තුවීම යුතු නොවේ යයි කීවා ය. ඇගේ සියලුම වචන වලිනුත් හැසුරුම් වලිනුත් අමුතු බලයක් ලැබ සිටින්නියක් බැව් ප්‍රකාශ වීය. ඒ හරියාකාර දැනගන්ට ආසා වූ මම පසුගිය සවල්ප කාලයෙහි මට එහි පැමිණෙන්ට නුපුළුවන් වූයේ ගෙදර ඇතිවූ කරදර වගයක් නිසා බවත්, ඇ කෙරේ ඇති ආසාව හීන වීමෙන් නොවන බවත්, ඇගේ ප්‍රිය මුහුන දැකීමට වඩා ලොකයේ වැඩි සැපතක් මට නොමැති බවත් කීවෙමි. මගේ දීඝ කථාවට ඇ සන්සුන්ව සිටියා ය. මම නැවතත් කථා කරමින් මගේ පළමු පොරොන්දුව මෙන් මැනියන්ගේ ඇවෑමෙන් පසු ඇ නිසියේ කාර බැඳගන්න බවත් මා කෙරේ මුලදී විශ්වාස කළාක් මෙන් මත්තටත් විශ්වාස කටයුතු බවත් කීවෙමි. ඒ වචන කී වෙගවත් ලීලාව දුටු කවරේකුට මුත් මා කෙරේ විශ්වාසය ඇති වේයයි සිතමි. නමුත් ඇගේ මුහුනෙහි කිසිම වෙනස් ආකාරයක් නොවී ය, ඇ කිසිවක් නොකියා පලිඟු රූපයක් මෙන් දෙරට හාන්සිව සිටියා ය. එවේලෙහි ඇගේ මව් ද ගෙදර වීත් එහි සිටි මා දැක නොසතුටු වූවාක් මෙන් වී, දියනියන් සමඟ කථා කළා ය. මම ද මැහැළි ස්ත්‍රියවත් හරවාගෙන ඇගේ සහායයෙන් නැවතත් මගේ බලය පිහිටුවා ගනිමියි සිතා, ඇ සමග කොණකට වී බොහෝ වෙලා කථා කෙළෙමි. මගේ පියාගේ මරණය, මට එයින් අත්පත් වූ බූදලය, මගේ මැනියන්ට මා ගැන ලැබුනු ආරංචි, මව්ගේ අසනීප ගති, මගේ පොරොන්දුව ලෙස ඇගේ දියනියන් විවාහ කර ගැනීමට මගේ ඇති ආසාව යන සියල්ලම කීවෙමි. ඇ ඊට ඇහුන්කන් දී

මගේ නො සැලකීමෙන් ඇගේ දුවගේ සිත තැලී තිබෙන බවත් ඇ සමග ඒ ගැන කථා කර පෙර සේම හොඳින් සිටීමට කාරණා සලස්සන බවත් කියා මගේ සිත සතුටු කළා ය. මම ඇට ඒ ගැන නොයෙක් වාරයක් ස්තුතිකොට ගෙදර ආවෙමි.

පසුවද සවස මට පනිවුඩයක් ලැබුනි. එයින් මට දැනගන්ට හැකි වූයේ දෙතුන් දිනකට මට ඒ පලාතට එන්ට එපා කර තිබෙන බවත් දුවනියන්ගේ සිත හරවා ගන්ට ඇ උත්සාහ කරන බවත් ය. මෙසේ දවසින් දවස ඇ ගැන කල්පනා කරමින් මම කාලය ගත කෙළෙමි. කිප දවසක් ගත වූ පසු වැඩි දුරටත් පනිවුඩයක් නොලැබු හෙයින් මම ඇ බලන්ට ගියෙමි. ගෙයි දෙර වසා තිබුනා දැක දෙරට තට්ටු කෙළෙමි. ඊට කිසි පිළිතුරක් නොලැබ නැවත නැවතත් ශබ්ද නගා තට්ටු කරන කල ඒ අසල සිටී මිනි-සෙක් පැමිණ, එහි සිටි උදවිය ගෙය හැර ගොස් කිප දවසක් වෙන බව දැනුම් දුන්නේ ය. ඒ ඇසූ මගේ දුක දරාගත නො හැකි විය. ඔවුන් ගිය දිශාව වත් කවරුවත් නොදන්නා බව ඒ මිනිහාගෙන් දැනගන්ට ලැබී සෝකයෙන් මම ගෙදර ආවෙමි,

ඊට පසු සත් අවුරුද්දක් ගත විය. නමුත් මගේ සිතෙහි ඇති වූ දුක කිසිසේත් අඩු නොවී ය. මගේ මැනියන්ගේ මරණයත් ඒ අතර තුරේම සිදු විය. එයින් මගේ දුක වඩ වඩා ඉවසිය නො හැකිව මම ඒ පලාතෙන් පිටව කොළඹ, නුවර, ගාල්ල, බදුල්ල, කුරුණෑගල යනාදී රටවල ඇවිද ගමන් වලින් වෙහෙසව ගෙදර එන විට කැළණියෙහි දී පෙර කී මගේ මිත්‍රයා මට සම්බ විය. ඔහු මා දැක සැඟවී යන්ට උත්සාහ කළා දැක, පුදුමව මගේ සිතෙහි සැකයක් උපන. ස්ත්‍රියගේ සැඟවීයාම සහ ඔහුගේ නො පෙනී යාමත් එක විටම සිදු වූ බව මට කල්පනා වුනේ ය. එහෙයින් මම ඔහුට නො පෙනී ඔහු පස්සේම ගියෙමි. මහ මාවතින් හැරී පටු පාරකට වැද ගමන්කොට ඔහු ගෙදරකට ඇතුල් වූයේ ය. ස්වල්ප වෙලාවකින් මමත් ඒ ගෙයි දෙරකඩ

සිටීයෙමි. ඒ දුටු කුඩා ළමයෙක් ගෙට දුව ගොස් ඒ බැව් කී විට ගෙ ඇතුළේ සිට ස්ත්‍රියෙක් එළියට ආවාය.' ඈ දුටු ක්ෂණයෙහි ම මගේ පුදුමය මුහුනින් ප්‍රකාශ විය. සත් අවුරුද්දක් මුලුල්ලේ සොයා ඇවිද නොදැක දුක් වූ ස්ත්‍රිය මා ඉදිරියෙහි සිටියා ය. ඇටද කිසිවක් කියාගත නො හැකි විය. මෙසේ දෙපැත්තෙන්ම නිශ්ශබ්ද භාවය පවතිනා අතර මගේ මිත්‍රයා ද එළියට වීත් මා දැක ලැජ්ජාවෙන් මිරිකුණා වූ මුහුන ඇතිව ගල් රූපයක් මෙන් සිටියේ ය. මම ද ගෙට ඇතුල්ව සන්සුන් ලීලාවෙන් වාඩි ගත්තෙමි. ඒ දුටු පුරුෂයා ද වාඩිගෙන තුෂ්ණිම්භූත වූයේ ය. ස්ත්‍රිය ද ගෙට ඇතුල්ව මට නොපෙනී සිටියා ය. ටික වෙලාවක් කථා නො කොට සිට මම මිත්‍රයා දෙස බලා, "මට උඹ අවවාද කෙළේ මේ සතුරුකම කරන්ට සිතාගෙනද" යි ඇසීමි.

මගේ මුහුනෙහි කනගාටු ලීලාව ඔහු දැක, ඔහුගේ සිතෙහි ඈ කෙරේ ආලය ඇතිවූ නියාවත්, මගේ දෙමව්-පිය නෑදෑයන් නිසා ඈ කසාද නොබැඳීමෙන් ඈට වන විපත ගැන ඔහු දුක් වෙමින් ඈ සරණ පාවාගත් බවත්, ඔහුගේ ක්‍රියාව ගැන මගේ සමාවු ඉල්ලන බවත් කියා, මගේ සිත උණුවන ලෙස කථාවක් කෙළේ ය. අන්තිමයේදී ස්ත්‍රිය ද ඉදිරියට වීත් කඳුලු සහිත ඇස්වලින් යුතුව මගේ සමාව ඉල්ලා සිටියා ය. මම ඔවුන් සමග තව ටික වෙලාවක් කථාබස් කොට එයින් පිටව ආවෙමි. මගේ ජීවිතයේ හිස්කම මට එයින් පෙණුනි. ස්ත්‍රීන් ද මිත්‍රයන් ද ගැන විශ්වාසය තැබීම අකටයුතු බව මට හොඳාකාර හැඟී ගියේ ය. එතැන් පටන් මම කිසිවෙක් හා සමාගම නො පැවැත්තුවෙමි.

අවුරුද්දක් ගත වෙන්ට මත්තෙන් දිනෙක මගේ මිත්‍රයාගෙන් ඔහු බලන්ට එන්ට කියා පනිවුඩයක් ලදීමි. පළමුවෙන් මම එහි නොයන්ට සිතූ නමුත් මගේ ආදරය උසුලන ස්ත්‍රියගේ මුහුන නැවතත් බැලීමට ආසා ඉපද එහි ගිය විට මගේ පුදුමයට සහ කනගාටුවට මිත්‍රයා මරණා-සන්නව සිටිනවා දුටුවෙමි. ඔහු මා දැක වහාම ළඟට

කැඳවා, මගේ අත අල්ලාගෙන ඔළුව ටිකක් කෙලින් කරන්වය කියා ස්ත්‍රියට කීයේ ය. එසේ කොට ස්ත්‍රිය ඉවත් වෙන්ට හදනවා ඔහු දැක ඈ නවතා, මා දෙස බලා "මගේ ප්‍රිය මිත්‍රය, උඹට කළ වැරැද්දට උඹ මට සමාව දුන් හෙයින් මගේ පතිවුඩවට මෙහි පැමිණුනා යයි මම විශ්වාස කරමි. මම දැන් මරණාසන්නව සිටිමි. තව දෙතුන් පැය-කට වඩා මගේ පණ අල්ලා සිටී යයි මට නො සිතේ. මම දිළිඳු මිනිහෙක් නිසා මගේ පවුල යන්තම් රක්‍ෂා කර ගෙන ආවෙමි. මගේ ඇවෑමෙන් ඔවුන්ට කිසි පිළිසරණක් නැති වේ. ඒ නිසා ඔවුන්ට යම් පිහිටක් වන ලෙස උඹෙන් ඉල්ලා සිටින්ට මෙහි ගෙන්වූයෙමි. මා හතුරුකම් කළ උඹෙන්ම මෙබඳු පිහිටක් ඉල්ලන්ට වීම මගේ හිතට කර ගන්නා වූ දරුණු වූ දඬුවමක්ය" යි කීයේ ය. මම ද ඔහුගේ බැගෑපත් කම ද, ස්ත්‍රියගේ සහ ළමයින්ගේ දිළිඳු තාවය ද දැක, කම්පා වූ සිතින් යුක්ත වෙමින් ඔවුන් ආරක්‍ෂා කර ගන්න බැව් කී විට, ඔහු මගේ අත ගෙන සීඹ "උඹට සියලු දෙවියෝ ආශිර්වාද කෙරෙත්වා. මගේ සිත දැන් සැහැල්ලු වූයේ" ය කියා කථාවෙන් වෙහෙස වූවාක් මෙන් හාන්සි විය. මම ඔහු සෙමින් බාවා ඔහුගේ ලෙඩ ගැන ස්ත්‍රිය-ගෙන් විමසූයෙමි. එවෙලේම වෙදරාලත් එහි පැමිණියේ ය. ඔහුගෙන් ලෙඩේ අසන්ට හදන විටම ඔහු ලේඩා දෙසට අත දිගු කෙළේ ය. දෙපාරක් සෙමින් කට අරිනවා මමත් දුටිමි. ඉන් පසු සියලු දෙනම නිශ්ශබ්දව ඇඳ ළඟට කිට්ටු වුනෝ ය. වෙදරාල ළයෙහි අත තබා බලා "ප්‍රාණය ගොහින්" යයි සෙමින් කීය.

භූමදානය ආදී සියලු කටයුතු ළඟම සිටගෙන කරවා ඉවර වූ පසු, ඈට ස්වල්ප දවසක් එහිම සිටින්ටය කියා මම කොළඹට ගොස් ගෙයක් සූදනම් කර, පසුව ඈ වෙතට ගියෙමි. ඈගේ අසරණ භාවය ඈට හොඳාකාර වැටහී ය. මා හැර ඈට සලකන කිසිවෙක් නැති විය. මම ඒ ගෙයි තිබුන බඩු ස්වල්පය විකුණා මුදල් කර ඈ සමග විත් කොළඹ පිළියෙළ කර තුබූ ගෙට පැමිණියෙමි. එහි ඈගේ ප්‍රවේසමට වැඩි මහලු ස්ත්‍රියෙක් සිටවා මම ගෙදර ආවෙමි.

මාසයක් පමණ ගත වූ පසු ඇගේ වෙනස් වූ සවභාවයෙන් ඇගේ සිතෙහි දුක් මග හැරීගන යන බැව් දුටුවෙමි. ලක්‍ෂණ වූ රූප සොභාවෙන් සිටි ඇ හට දිළිඳු කමින් සිටින්ට වීමෙන් ශරීර ප්‍රභාවද නැතිවී මා දකින විට ඇ දුර්වර්‍ණ ව සිටියා ය. ඒ මාසය තුළදී ඇගේ අලංකාරය මදක් ඇති විය. මගේ ප්‍රේමය සෑම කල්හිම ඇ වෙත රැඳී තිබුනේ ය. ඇගේ අසරණකම ගැන වඩා දුක් වූ මම ඇ කෙරේ වඩා ඇල්මෙන් සිටිමි යයි සිතුයෙමි. එබැවින් ඇ ලඟින් හිඳුවා ගෙන මා සමග විවාහයට සූදනම් වෙන්ට යයි කීවෙමි.

ඒ ඇසූ ඇ ඉතා වේදනා වූ තැනැත්තියක් මෙන් කියන්නී, ''මට මෙතරම් උපකාර කරගෙන එන තැනැත්තාට ද්‍රොහිකම් කිරීම යුතු වන්නේද? මා වැනි අප්‍රසිඩව වාසය කළ දිළිඳු ස්ත්‍රියක් පාවාගත් විට ලොකයා නින්ද අපහාස නො කරාද? ඒ නිසා කළ උපකාර සම්පූර්‍ණ කරන්ට නම් සුදුසු වූ ස්ත්‍රියක් සරණකොට ගෙන, ගෙයක් දෙරක් ඇතිව, මගෙන් සහ දරුවන්ගෙන් වැඩ ගෙන සිටින්ටය'' කියා යටහත් ලීලාවෙන් පැවසුවා ය. නොයෙක් අන්දමින් කරුණු ගෙන හැර මගේ අදහස් ලෙස සිදුවෙන්ට ඉඩ දෙන්ටය කියා ඇට කී නමුත් ඒ සියල්ල නිෂ්ඵල විය. එබැවින් එදින මම ඇගෙන් ඉවත්ව ඇවිත් ඇගේ පුදුම ස්වභාව ගැන කල්පනා කරමින් සිටියෙමි. ඊට පසු දෙතුන් වතාවකත් එසේම කථා කළ නමුත් ඇ ඒ ගැන එකඟ නොවී ය. මගේ ජීවිතය ඇ නැතිව ප්‍රයොජන නැතැයි සිතා දිනෙක ඇ වෙතට ගොස් කථා කරමින් ''මෙපමණ කාලයක් උඹ නිසා මම බලා සිටියෙමි. උඹ මගේ මිත්‍රයා සමග ගිය තැන් පටන් මම උඹ ගැන මිස අනික් කෙනෙක් ගැන නො සිතුවෙමි. දැන් අන්තිමයේදී උඹ ඔය අන්දමට මට බස් කියනවා නම් මගේ ජීවිතය තබාගෙන සිටීමෙන් පලක් නො පෙනේ. මම මේ උඹ දකින අන්තිම වතාව වේ, ඒ නිසා උඹ මා සමග විවාහ වී මා වාසනාවන්ත කරන්ට සූදනම් ද නැද්ද?'' යි ඇසීමි.

ඇ මගේ මුහුනෙහි තදකම දැක හයවී. කඳුලු සහිතව ''මගේ විරුඩකම මගේ අසතුටෙන් වූ එකක් නොවේ.

මගේම සැපතව, මගේම වාසනාවන්ත කමට බාධා කරගෙන සිටින්ට මම සිතුවෙ මතු මට දෙස් නැගේය යන තල්පනාවෙනි. ඔය තරමට තද අදහස් තබාගෙන සිටිනවා නම් මගේ විරුඩකම් ඉවත් කරමි'' යි කීවා ය.

මින් පසු නොබෝ කලකින් ඇ මගේ විවාහ ස්ත්‍රිය වූවා ය. ඇගේ කැමැත්ත පරිද්දෙන් මම කොළඹ අතහැර නුවරට වීත් එහි වාසය ගත්තෙමි. මගේ ජීවිතය එතැන් පටන් අවුරුදු විස්සක් එකාකාරවම එකම සැප රාශීය විය, මා සතුටු කිරීම පිණිස ඇ දවසින් දවස අමුතු අමුතු දේ යෙදුවා ය. එකම පැයක්වත් මට දුකින් ඉන්ට ඇ ඉඩ නුදුන්නී ය. යම් කරදරයක් සිතෙහි ඇති වූ විට ඇගේ සැනසිලි වචන වලින් ඒ පිස දමමාක් මෙන් නැති කළා ය. ඉතා සුළු ගමනක් වත් පිටට ගොස් ආ විට බොහෝ දුර කතරක ගොස් කිය නොහැකි අන්තරාවලින් මිදී ආවෙකුට මෙන් සිතා මුහුන පෙන්නා ආදර සත්කාර කළා ය. ඇ ඇගේ දරුවන් තුන්දෙනා කෙරෙහි ද ප්‍රෙමය අඩු නො කර, ඔවුන්ගේ දුක් සැප දෙකෙහිම ඉතා සැලකිල්ලෙන් සොයා බලා ක්‍රියා කළා ය. මා දකින්ට ගෙදරට ආ කිසිවෙක් ඇගේ ගුණ වර්ණනාව මිස දෙෂාරොපණයක් කිසි කලකත් නො කෙළේ ය.

පසුගිය ජීවිතය ගැන මම ඇගෙන් ප්‍රශ්න කළ විට ඇ කී ප්‍රවෘත්තිය ඉතා දුක් උපදවන එකක් විය. පළමුවෙන් ඇ මා වෙත තද ඇල්මෙන් සිටියා ය. මා එන යන කල ඇගේ ඇල්ම පිරිසිදුව තිබුනේ ය. පියාගේ මරණින් පසු මම ඇ බලන්ට නො ගොසින් සිටි කාලයේ ඇගේ සවාමියා වූ මගේ මිත්‍රයා ඇ සමීපයට එළඹ මගේ වැරදි නොයෙක් අන්දමින් දක්වා ඔහුගේ ප්‍රේමය පිළිගෙන ඔහුට නියම භාය්‍යාව වෙන්ට කීයේ ය. ඇ මා ගැන බලාපොරොත්තු වීමෙන් ඇට වන්නේ දුක බවත්, මා ඇ නිසා නැදෑ මිත්‍රයන් සියලු දෙන අතහැර නො දමන බවත් ඔහු විස්තර කර කීයේ ය. ඒ සියල්ල අසාලාත් ඇගේ සිත මා වෙතම බැඳී තිබුනේ ය. අන්තිමයේදී ඔහු දවසක් පැමිණ මා ඇ ගැන කිසිත් නො සලකන බවත් මගේ සිත වෙන ස්ත්‍රියක්

වෙත බැඳී තිබෙන බවත් කීය. එයත් විශ්වාස නො කොට ඈ බොහෝ කාලයක් සිටි නමුත් ඔහු නැවත නැවතත් දිවුරමින් කියන විට, ඒ සැබෑදැයි දැනගැනීමට ඇගේ සිතෙහි කැමැත්ත ඇති විය. මම ඈ බලන්ට ගොස් අමනාප වූ දවස්වලම ඇගේ ඇස් දෙකින්ම මගේ අකටයුතුකම් බැලිය හැකි යයි කියා, මගේ මිත්‍රයා ඇගේ මෑනියන් සමග ගොස් මගේ යහලු ස්ත්‍රිය වාසය කළ ගෙයි අසල සැඟවී සිටියේ ය. මාද එදින එහි පැමිණ තිබේ. ඔවුන් එතැන් පටන් ඔහු කී වචන අදහාගෙන ඔහුගේ අදහස් ලෙස ක්‍රියා කරන්ට පටන් ගත්තු ය. ඉන් පසු ඔහු ඇගේ සිත් දිනා-ගෙන විවාහයෙහි යෙදී තැනින් තැන ගොස් ඉතා දුඃඛිත ලෙස කාලය ගත කෙළේ ය. අන්තිමයේදී අත මිට නැතිව, කැළණියට පැමිණ කුඩා ගෙයක් ගෙන ගිටියේ ය. එහිදී ඇගේ ස්වාමි පුරුෂයාට අන්තරා වන තුරු ඇගේ ජීවිතය දුක් රාශිය විය.

මෙසේ සියලු දුකින් මිදී ඇගේ දවස් ඉතා සතුටු සොම්නසින් ගත කරන කාලයෙහි, මගේ ගෙදරට පැමිණියා වූ එක්තරා මහල්ලෙක් විය. පළමු වතාවට මම ඔහු දුටුවේ වීථියෙහි දී ය. එහිදී ඔහු මා දැක බොහෝ කාලයක් වෙලේ පටන් අඳුනන හිත මිත්‍රයෙක් මෙන් මා ළඟට විත් මගේ සුව දුක් විමසා, මම ඔහු නාඳුනන නමුත් මගේ පියා ඔහුගේ තද මිත්‍රයෙක් බවත්, මගේ ස්වරූපය පියාගේ සටහණ බවත් කීය. එතැන් පටන් කලින් කල ඔහු පැමිණ දවස හමාර මගේ නිවසෙහි නවාතැන් ගත්තේ ය. ඔහුගේ කථාව ඉතා රසවත් වූ ය. ලොකයේ නොයෙක් දේ ගැන දන්නා හොඳ ඥානයක් ඔහුට තිබුණේ ය. එහෙයින් ඔහුගේ සමාගම මට ඉතා ප්‍රිය ජනක විය, මගේ සතුට දැනගත් භාර්‍යාවද ඔහුගේ සැප විහරණයට සියල්ල සැලැස්සුවා ය.

මෙපරිද්දෙන් කාලය ගත කරන විට නුවර කොලරා රොගය භයානක ලෙස පැතිරෙන්නට විය. දහස් ගණන් ජනයා එයින් මරුමුවට පැමිණියේ ය. මා සිටි ගෙය අසල පවුල් කීපයකට ම ඒ භයානක රෝගය සෑදී කීප දෙනෙකු

මළාහු ය. ඒ ඇසූ මා ද හයින් ත්‍රස්තව සිටින විට මගේ මිත්‍ර වූ මහල්ලා ආයේ ය. ඔහුගේ ඊම වෙනද ඉතා සතුටු දයක වූ නමුත් එදින හය දීමට හෙතු විය. එසේද වුවත් ඔහු ආදරයෙන් පිළිගෙන පැවැත්විය යුතු ආදර සංග්‍රහ නිමවා, පැතිරී යන ඒ හයානක රෝගය ගැන කථා කරන්ට පටන් ගතිමු. මගේ සිතේ තිබ් හය දුක දුටු ඔහු මා හට සැනසිලි බස් කියා එබඳු හයානක ප්‍රස්තාවක් පැමිණි විට කටයුතු උපාය නම් පලායාම බව කීයේ ය. ඊට මගේ විරුඩකමක් නැති බැව් දැනගත් ඔහු එදින එලිවෙන්ට මත්තෙන් පිටත්ව යාමට සූදනම් විය හැකි නම්, අපේ ප්‍රවේ-සමට නිසි වූ සියලු දෙයින් ප්‍රිය වූ, යහපත් ස්ථානයකට අප ගෙන යන්ට ලැස්ති බව කීවේ ය. එබඳු ආධාරයක් ඔහුගෙන් බලාපොරොත්තු නූනා වූ මට පහළ වූ සතුට අප්‍රමාණ විය. එහෙයින් මගේ භාර්‍යාවට ඒ බැව් දැනුම් දී, ඇගේ දරුවන් තුන්දෙනා ද, අපේ වටිනා කියන බඩු බාහිරාද රැගෙන මධ්‍යම රැය පසු වූ විගසම ගෙයින් නික්-මුනෙමු. ඉර පායා එන්ට මත්තෙන් අපේ ගමන නුවර සීමාව ඉක්මවා මහ කැලයක් මැදින් විය. තැනින් තැන නැවති නැවතී එදින රෑ වී ටික වේලාවක් ගිය තැන අපි මේ සිටින ස්ථානයට ලඟා වූයෙමු.

ස්වල්ප දවසක් අපි සියලු දෙනම සැපසේ කාලය යැවූවෙමු. වනයෙහි නොයෙක් දේ අපට පුදුම වෙන්ටත් ප්‍රීති වෙන්ටත් තිබුනි. අපි නොයෙක් දිශාවල ඇවිද්දෙමු. පෙර නුදුටු ගස් හා වැල් ද, මල් හා ගෙඩි ද, මෘගයන් හා පක්ෂීන් ද, පනුවන් හා සමනලයන් ද. සර්පයන් හා මැඩියන් ද දුටුවෙමු. පෙර නො ඇසූ මිහිරි වූ පක්ෂීන් ද, හයංකාර වූ මෘග නාද ද, ප්‍රපාතවලට වැටෙන ජල ධාරාවන්ගේ ඝොෂා ද, පර්වත අතුරෙන් නික්මුනු මෙඝ ගර්ජනාවද ඇසූ-වෙමු. රාත්‍රි කාලයෙහි අප මිත්‍රයාගේ පුදුම වූ කථාන්තර වලින් අපට සතුට ඇති විය. කීප දවසක් යන්ට පෙර ඔහු මාගම් පත්තුවෙ වලසුන් හා පොර අල්ලා ගැලවී ආ සැටිද. සබරගමුවේ ඇතුන් බඳින්ට ගොස් කළ කී දේද, දුඹුරු ඔය ඔස්සේ යන විට දිවියන් සම්මුඛව උන්ගෙන්

බෙරුණු අන්දම ද, මාගල්කන්දේ සොරුන්ට අසුව ඉන් පැන ගිය ආකාරය ද, මුතු හලාවත මුතු කිමිදීමෙන් ලැබූ සඵලය ද යනාදී ඔහුගේ ජීවිතයේ සිදුවූ පුදුම දේ අපි දැන ගත්තෙමු. ඔහුගේ කථාන්තර වලට ඇහුන්කන් දුන් මගේ ස්ත්‍රියගේ ළමයි තුන්දෙනා හට ද නිර්භීත ක්‍රියාවල යෙදෙන්ට මහත් ආසා ඇති විය. එහෙයින් ඔහු තුන්දෙන වනයේ ඇවිදැවිද ගෝනුන් මුවන් දඩයම් කිරීමට ද, දිවියන් පසුපස්සේ යාමට ද, සාවුන් ඌරන් මැරීමට ද පටන් ගත්තෝ ය. මෙසේ මරණ ලද සතුන්ගේ සම්වලින් හා අං වලින් අපේ ගුහාව පිරී ගියේ ය. අපේ මිත්‍රයා ද නොයෙක් විට අපෙන් වෙන්ව ගොස් දෙතුන් දින නැවතී සිට පසුව ආයේ ය. ඔහු ආ විට තරුණයන් කර තිබුන සමර්ථකම් ගැන ප්‍රශංසා කෙළේ ය. ඔහුගේ කරුණාවන්තකමින් අපට කෑම බීමාදියෙන් කිසිම හිඟයක් නැති විය. ඒවා කොතැනින් කොයි ආකාරයෙන් ගෙන දුන්නේ දැයි අපි නො දැන සිටියෙමු.

වෙනද මෙන් ඔහු ගොස් සතර පස් දිනකින් නා බැවින් අපේ සිත්වලට භය උපන. එබැවින් ඔහු ගැන සොයන්ට පටන්ගෙන වනයේ කීප දිශාවකින් තරුණයෝ ගමන් කළෝ ය. පළමු දෙදවසෙහිම කිසි සඵලයක් නැතිව ගෙදර ආ නමුත් තුන්වෙනි දිනයෙහි ඔහු ගෙදරට නුදුරු තැනෙක ගසක් යට සිටිනවා දකින්ට ලැබුනි. එවෙලෙහි ඔහු නිදාගෙන සිටියේ ය. එහෙයින් ළඟට පැමිණියාවූ තරුණයෝ ඔහු නින්දෙන් පුබුදුවා ගෙදර කිට්ටුව තිබියදී එතැන නිදන්නේ මන්දැයි ඇසූ විට, ඔහු නුවරට ගොස් එන බවත් ඇඟට මදක් අසනීපවා වාගේ තිබෙන හෙයින් ගෙදරට නො ආ බවත්, නුවර විනාශ කරන ඒ භයංකාර රෝගය නිසා ඔහුගේ අසනීපය හොඳාකාර කුමක්දැයි දැන ගන්නා තුරු එහි සිටින බවත් කීයේ ය. ඔහු ගෙදර නො එන ලෙස ස්ථිරව සිත සදගෙන සිටින බව දැනගත් ඕවුහු වහාම අසලින් අතුපත් කපා මැස්සක් ඉදිකොට, අව් සුළං නොවදින ලෙස සෙවිලිකර, වටේ අහුරා, ඔහු උස්සාගෙන විත් එහි බාවා සිටියාහු ය. පසුව ඉන් එකෙකු වහාම ගෙදරට දුව ගොස් ඒ ප්‍රවෘත්තිය දන්වා, කොට්ට පැදුරු

රැගෙන විත් මැස්සට එලා, ඔහුට සුව පහස් ගෙන දුන්නේය. ස්වල්ප වෙලාවකින් මමත් මගේ භාර්‍යාවත් ලුනුකැඳ ටිකක් පිසගෙන ඔහු සිටි තැනට ගියෙමු. අප දුටු සැටියේම ඔහුගේ ඇසට කඳුලු නැගුන. අන්තරාය ගැන නො සලකා අප සියලු දෙනාම පෙන්නූ කරුණාව ඔහු සිතට තදින් වැදුනේ ය. ඔහු ආහාර නොලැබ ක්ලාන්ත ස්වභාවයෙන් සිටී නිසා ඒ ගෙන ගිය කැඳටික ඉතා ප්‍රයොජනවත් විය. එය බී ඉවරව අප දෙදෙන දෙසත් ළමයි තුන්දෙනා දෙසත් ඇස් හෙලා බලා "උඹලා වැනි කරුණාවන්ත අය මගේ අන්තිම කාලයට ලැබීම ලොකු වාසනාවකි. නමුත් මගේ ජීවිතය දුන් ගෙවියන්ට ලංව තිබෙන බැව් මට පෙනේ. මටත් ඒ දරුණු ලෙඩේ සැදෙන්ට එනවා වගේ තිබේ. උඹලයි නුවර තිබෙන ගෙදර දිශාවට බලන්ට ගියෙමී. ගෙවල්වල මිනිස්සු කිසිවෙක් නොමැතියි. සියල්ලෝම බඩුමුට්ටු ඉඩම් කඩම් අත්හැර දමා වසංගතයෙන් ගැලවෙන පිණිස ඒ ඒ අත දුවලා තිබේ. අයියෝ මගේ රුදුව ඉවසාගන්ට බැහැ" කියමින් අපට මදක් ඉවත් වෙන්ට කීය. අපද එසේ කළ කල්හි, ඔහුට සැරයක් විරේක විය, ඔහුගේ බඩේ රුදුවද වැඩි විය. සැරයක් වමනය ද ගියේය. ඒ අසනීපය කුමක්දැයි හරියාකාර තේරුම් ගත් ඔහු අපට නැවතත් කිට්ටුවට එන්ට නුදුන්නේය. අපි මදක් දුරින් බලා සිට පසුව ගෙදර ආවෙමු. නමුත් මගේ භාර්‍යාවගේ කීමට කොහෙත් එකඟ නොවූ ඇගේ බාල පුත්‍රයා එහි නැවතීයේ ය. ඔහු මහල්ලා ළඟට ගොස් ඇඟට අත තබා බැලූ කල ඔහුට ඉතා සැරෙන් උණ ගෙන තිබුනු බව දුටී. මහල්ලාද ඔහු දෙස කිය නොහැක්කා වූ ප්‍රෙමයෙන් බැලුම් ලා, "මගේ බාල පුතනුවෝ මා තනියම මැරෙන්ට නොහැර මා බලාගෙන සිටින්නේ යයි කියා නැවතත් හිස මදක් සොලව සොලවා "නෑ, පුතේ" මම ඉතුරු වෙන්නේ නැහැ. මේ රෝගය සැදුන කෙනෙක් ඉතුරු වුනේ නැහැ. ඉතින් මට ඇත්තේ ස්වල්ප වෙලාවකි. ඊට පළමුවෙන් උඹට රහසක් කියන්ට තිබේ. වනයෙහිදී වුවත් එය හයියෙන් කීම නුසුදුසුය" යි ඔහුට කිට්ටු වෙන්ට කියා එය කණට කර කීවේ ය.

ඉන්පසු ඔහු තරුණයාගේ අත ගෙන සිප. "ඉතින් මම සුදනම් වෙන්ට ඕනෑය" යි කියා ඇස් පියාගෙන තෘෂ්ණීම්භූත වූයේ ය. ඔහුගේ මුහුණෙහි කිසි දුක් ගතියක් නො පෙණී ය. ස්වල්ප වෙලාවක් නිදිගෙන නැගිටීම් යන කල්පනාවෙන් ඇස් පියාගත් තැනැත්තෙකු මෙන් නිශ්චලව සංසුන්ව සිටියේ ය. ඒ දුටු තරුණයා පුදුමයට පත් විය. මරණය යන වචන මාත්‍රය පවා ඇසීමට සියලු සත්ත්වයෝ භය වෙති. මරණය දූන් ඒය කියමින් ඒ ගැන කිසි බියක් තැවුල්ලක් නැතිව. ප්‍රසන්න වූ නිසල් වූ මුහුනින් යුතුව සිටී! ඔහුගේ සිතෙහි ධෛර්‍ය්‍යය ද, පැහැදිලි වූ සපීර වූ ඥාන ශක්තිය ද ඉතා විසාල බැව් ඔහුට පෙනී ගියේ ය.

සවස් වෙගන යන විට අසනීප වැඩිවී සිහියක් නැතිව නොයෙක් දේ කියන්ට පටන්ගති. ලඟ සිටියවුන් හඳුනන බවක් වත් නො දැක්වීය. ඉර බසින්ට ස්වල්ප වේලාවකට පෙර ඔහු කාලක්‍රියා කෙළේ ය.

එදින රාත්‍රියෙහි තරුණයෝ තුන්දෙන ඒ අසලින් ගිනි ගොඩක් ගසාගෙන මෘත ශරීරය රැක බලාගෙන සිටියෝය. පසුවද උදය අපි සියලු දෙනාම එක්ව එය භූමදන කෙළෙමු. එදින සහ පසුවදත් අපේ වාසස්ථානයෙහි අඳුරු කනස්සලු ගතිය ඇති විය. මළගිය තැනැත්තාගේ ධෛර්‍ය්‍යය ද, කරුණාවන්ත කම ද, ත්‍යාගිවන්ත කම ද යනාදි ගුණ රාශිය ගැන කථා කරමින් බොහෝ වේලා ගත කෙළෙමු. බාල වූ තරුණයාගේ සිත ඉතා දුකින් පෙළුනි. ඔහු කිසිවක් නො කියා සිහි මඳ වූවෙකු මෙන් වනයෙහි ඇවිද ඇවිද සිටියේ ය.

තුන්වෙනි දිනයෙහි අපේ මහත් අවාසනාවට මෙන් වැඩි මහලු ලමයාට අසනීපයක් විය. වමනය සහ පාචනය ඇති වූ හැටියේ ම ඔහුටත් විසංගතය බෝවූ බව දනගතිමු. දෙවෙනි ලමයාටත් ඊට පැය කීපයකට පසු එසේම අසනීප විය. ඒ දුටු මගේ භාර්‍ය්‍යාවගේ දුක වචනයෙන් කීම නො හැකි වේ. සියලු දෙයම අත්හැර ගැලවෙන්ට ආ ඔවුන්ට

වනසෙහිදී එය වැලඳීම වඩ වඩා දුක් වෙන්ට කාරණා විය. මම නොයෙක් ලෙසින් සැනසිලි බස් කීවෙමි. "මරණයෙන් සැඟවෙන්ට අපට කිසි කලකත් නො හැකියි. උත්පත්තියෙහිදී ම අපට මරණයක් නියමය. ඒ දිනයත් නියම ය. එහෙයින් මරණය ගැන අප භය වුනායින් ඵලය කුමක්ද. එය අපට පමණක් සිදුවන විපතක් නම් දරුණුය කියා සිතන්ට ඉඩ තිබේ. අපට දහස් වාරයෙන් උතුම් වූ, ලක්‍ෂ වාරයෙන් ධනවත් වූ, සත සහශ්‍ර වාරයෙන් ඥානවන්ත වූ, රාජ රාජ මහාමාත්‍යාදීන්ටත් එකාකාරවම පැමිණේ" යනාදි මගේ සියළුම අවවාද ඈ අසා සිටි නමුත් ඇගේ දුක සිතෙන් තුරන් නොවී ය. ඒ වී දෙතුන් පැයකින් වැඩි මහලු පුත්‍රයාගේ මරණය සිදුවිය. එළිවෙන්ට පෙර දෙවෙනියාටත් එසේම විය,

ඔවුන් ළඟම වැටී ඔවුන්ට සාත්තු කරමින් සිටි මගේ භාර්‍යාවට කුමක් වේදෝ යයි මම භයෙන් සිටියෙමි. පසුව්ද දෙදෙනාගේම මෘත ශරීර තැන්පත් කොට ගෙදර ආ විට මගේ භාර්‍යාවට තද හිස රුජාව් සහ ඇඟෙහි උණත් ඇතිව වැටී සිටියා දැක මම තොරතුරු විභාග කෙළෙමි. ඇගේ කණගාටුව නිසත් දුර්වලකම නිසත් එසේ වෙන්ට ඇතැයි ඈ මා සමග කීවා ය, නුමුත් මගේ සැකය එයින් දුරු නොවී ය. පැය කීපයක් මම ඉවසිය නො හැකි තරම් දුකින් සිටියෙමි. එදින සවස් වන්නට මත්තෙන් මගේ භාර්‍යාවටත් වසංගතය බව මම දැනගතිමි. ඇගේ නැති වීමෙන් පසු මගේ පැවැත්මෙන් ප්‍රයොජන නැතැයි සිතූ මම ඇගේ ළඟම හිඳ, මටත් එය බෝවෙන්ටය කියා සිතින් ඉල්ල ඉල්ලා සිටියෙමි. නමුත් මගේ අභිප්‍රාය ඉෂ්ට නොවී ය. ඇගේ මරණය ළං වූ බැව් දැන, ඈ මගේ අත ගෙන සිප, ඇගේ ඉතිරිව සිටින ළමයා මට භාරය කියා ඒ මධ්‍යම යාමයේ දී මිය ගියා ය.

මෙහිදී මහල්ලාගේ සිතට නැවතත් දුක් ඉපදි බැව් බිම වැටුනු කඳුලු රාශියෙන් පෙණුනි. කථාව අසා සිටි දෙදෙන ද කිසිවක් නො කියා ඔහුගේ දුකට ඔවුනුත් පංගු

කාරයෝ වූ බැව් මුහුනුවලින් පෙන්වූහ. මහල්ලා ද ටික ලෙලාවක් කථා නො කොට හිඳ, වෙගය මදක් සංසිඳුනු පසු කථාව හමාර වන්ට ළඟ බව කියමින් මෙසේ කීය.

වසංගතයෙන් බේරී ඉතිරි වූයේ මා සහ මගේ භාර්‍යා-වගේ බාල ළමයා පමණකි, මරණය ඉතා අප්සාවෙන් සෙව් නිසා මම ඉතිරි වූනා යයි මගේ කල්පනාවයි. නමුත් ඇගේ ළමයා එයින් මිදුනේ කෙසේ දැයි මට කිය නො හැකියි. පළමු සිටම කිසි භයක් නැතිව ලෙඩුන් සියලු දෙනාටම ඔහු සාත්තු කෙළේ ය. බෝවෙනවා නම් පළමු-වෙන් බෝවෙන්ට ඕනෑ ඔහුට ය. ඒ සාත්තු කරණ අතර තුරෙම වෙනද මෙන් වනයෙහි දුව ඇවිද වෙහෙසව ගෙදර ඊම ඔහුගේ සිරිතක්ව තිබුනි. ඒ ව්‍යායාම වලින් ද, පිරිසිදු වාතය ආශ්‍රය කිරීමෙන් ද, සිතෙහි බිය නොමැති බැවින් ද ඔහු එයින් මිදුනේ යයි සිතන්ට ඉඩ තිබේ.

මෙසේ අපි දෙදෙන මළගිය අය සම්බන්ධව කළමනා සියල්ල කොට දෙදෙනාගේ ම අදහස් ප්‍රකාශ නො කළ නමුත්, ඔහු මැනියන්ගේ මරණය ගැන තදින් දුක්වෙන බවත්, මම ප්‍රිය භාර්‍යාවකගේ මරණය ගැන දුක්වන බවත්, දෙදෙනාම දැනගෙන සිටියෝ ය. කීප දවසකට පසු මම ඔහුට කථා කොට අපේ මතු කාලය ගැන ඇසුවෙමි. ඔහු මං මෙහි සිටින තුරු නවතින බවත්, ඔහුට කිසි නෑදෑ මිත්‍රයෙක් නැති බැවින් වෙන යා යුතු තැනක් නො මැති බවත්, වනයේ ඔහුගේ සිත් සතුටු කරන සියල්ල තිබෙන බවත් කීයේ ය, මම ද මේ ජීවිතයේ ඉතිරි හරිය ගත කරන්ට එතැන මෙතැන යන්නේ කුමට දැයි කියා ද, මගේ ප්‍රිය වූ භාර්‍යාව මැරුණ ස්ථානය ද, ඇගේ මෘත ශරීරය තැන්පත් කළ ස්ථානය ද යන මගේ සිතට ආදරණීය ස්ථාන හැර යාම යුතු නොවේ යයි කීයා ද මෙහිම නැවතී සිටින්ට තීන්දු කර ගත්තෙමි. මෙසේ පස් අවුරුද්දක් දැන් ගත විය. මේ කාලය තුළ මම මේ ගුහාවෙන් පිටව බඹ සියයක්වත් දුරට නො ගියෙමි. මගේ පුත්‍රස්ථානයෙහි වැඩෙන ඒ ළමයා මාගේ උවමනා සියල්ල සපයා දෙන්නේ ය. මේ පසුගිය දේ ගැන දුක් වෙමින් මෙහි හිඳ කාලය ගත කෙරෙමි '' යි කියා කථාව හමාර කෙළේ ය.

6 වෙනි පරිච්ඡේදය

මහල්ලාගේ ප්‍රවෘත්තිය ඉතා දුක් සහිත විය. එබැවින් මීනා ඔහු කෙරේ ලය කම්පා වූ තැනැත්තියක් මෙන් දුක් පැමිණෙන විට පිට පිට ම කැටී කැටීවම පැමිණීම සිරිතක් බව මැහැලි හඩින් කියා සුසුම්ලා තුෂ්ණිම්භූත වූවා ය. තරුණයා ද කථාව අවසානයෙහි මදක් කැලඹුනාක් මෙන් සිටියේ ය. තවත් තරුණයෙක් ඔවුන් සිටින ස්ථානයෙහි සිටින බව ඇසූ තැන් පටන් ඔහුගේ සිතෙහි නො සතුට ඇති විය, කථාවෙහි විස්තර කළ ප්‍රකාරයට ඔහු තමාට වඩා ධෛර්‍ය්‍යමත් උත්තම ස්වභාව ඇති අයෙක් බව ඔහුට සිතුනි. මීනාගේ මැහැලි ස්වභාවය සහවා ගැනීම පහසු වැඩක් නොවේ. එබැවින් ඔවුන් එතැන වැඩි ප්‍රමාද වුව-හොත් ඔහුට වන්නේ අන්තරා යයි සිතා ඇත් කැටුව වහාම යම්යි සිතට ගෙන ඒ ස්ථානය බලන්ට සත්ට ඇති නියාව පෙන්වා ඇත් සමග පිටත් වූයේ ය. පසුගිය කාලය සිහි පත් වීමෙන් දුක් සිතිවිලි ඇවිසුනායින්දෝ, නැතහොත් දහවල් කාලයේ සූර්‍ය්‍යතාපය නිසා මලානික වූ ශරීර ඇතුවා-යින්දෝ, මහල්ලාගේ ඇස් පියවී නිද්‍රාවට පැමිණියේ ය.

තරුණාවස්ථිකයන් දෙදෙන පළමුවෙන් තමන් ආ දිහා-වෙන් ගමන් කරන්ට වූහ. උමගේ දෙපාර්ශ්වය ගලින්ම සෑදී තිබුන ලෙස ඔවුන්ට පෙණුනි. පසුව වඩා පරීක්ෂාවෙන් අතගා බැලූ විට ඇතැම් තැන්වල ගල් හා සමාන ස්තබ්ද මැටියක් තිබෙනවාද ඔවුන්ට සම්බ විය. එහෙයින් එය තනිකර ස්වාභාවික ගුහාවක් නොවන බවත් මනුෂ්‍ය උත්-සාහය යොදා එය ඒ ස්වභාවයට ගෙන තිබෙන බවත් ඔවුන්ට දැනගන්ට ලැබුනි. මෙසේ ඔව්හු ආ ලෙසම අඳුරු වූ මාර්ගයෙන් ගමන් කොට අන්තිමේදී ගුහා මුඛයට පැමිණ, එයින් පිටවී ගස් අස්සෙහි සෙමින් සෙමින් ගොස් එක් සෙවනැති තැනකට එළඹ එහි වාඩිගත්තාහු ය.

තරුණයාගේ සිතෙහි ආසාව ඒ ස්ථානයෙන් පලා යන්ට විය. නුමුත් යන දිශාව කොයිදැයි නො දන්නා බව ඔහුගේ ආසාව මුදුන්පත් කර ගැනීමට ඇති වූ බාධාව බව

පෙණුනේ ය. එසේ වුවත් ඇට ඔහුගේ අදහස් දන්වන්ට සිතා "මීනා, ඉතින් අපි ආපසු නොගොස් මෙතැනම මඳ වෙලාවක් හිඳ අපේ ගමන නැවතත් පටන් ගනිමු, මේ වනය මැද ඒ මහල්ලා සහ ඔහුගේ සමාගම්කාරයා මෙන් ඉන්ව අපටත් පුළුවන්ද" යි කීය.

මීනාට සමාගම්කාරයා ය යන වචනය ඇසීමෙන් ඒ තරුණයා සිහිපත් වී ඔහු දැකීමට ආසාව ද ඇති විය. ඒ බැව් නො හඟවා "ඇයි, මේ ස්ථානග ඉතා තදිම නො වේද? අපි මෙහි දෙතුන් දිනක් නැවතී හිඳ කා බී, වීඩා හැර, මග හසර දැනගෙන පසුව යනවා හොඳ නොවේද? ඒ හැරත් මහල්ලා අපට කළ උපකාරාදිය ගැන ඔහුට වචනයකින්වත් ස්තුති නො කොට, අප යන බවක් වත් නො කියා, සොරුන් මෙන් සැඟවී යාම ධර්මතාවක් නොවේ. දැන් අපට සොරුන් ගෙන් වත් හතුරන්ගෙන්වත් භයක් නැතිව ඉන්ට පුළුවනි. සමහර වීට ඒ මහල්ලා සමග සිටින අය අපට මෙයින් පිටව ගම්මානයකට යන්ට පාර පෙන්නාව නොවේද" යි කීය.

ඒ අනික් අයට මූන ගැසෙන්ට පළමු පිටවීම අදහස් කළ ඔහු ඇට ඒ බැව් කියන්ට මැලි වූයේ ඇගේ වචන වලට විරුඬ නො විය. නුමුත් ළඟදී පැමිණෙන්ට තිබෙන විපතක සංඥව ඔහුගේ සිතෙහි ඇති විය. එය කුමක්දැයි විස්තර වශයෙන් ඔහුට සිතා ගන්ට බැරි වූවත්, බරවූ, චලිත වූ ස්වභාවක් ඔහු තුළ තිබෙන බැව් හැගුනි. එහෙයින් ඇගේ සිත එවෙලේම බැඳගෙන, ස්ථිර ලෙස වචන ඇගේ කටින් ලබා ගතහොත් ඔහුගේ සිතට මදක් සහනය වන්ට කාරණා බැව් සිතා, "මීනා මගේ ප්‍රෙමිය, සොරු තුන් දෙන අප පස්සේ ආ දවසැ ගස උඩ සැඟවී සිට අප දෙදෙන කළ කථාව උඹට මතක නොවේද" යි ඇසීය.

එදින ඔහුගේ ආදරය ප්‍රකාශ කළ බව ඈට සිහිපත්ව ඔහු දෙස බලා නැවතත් ඔහු එයම කියන්ට හදන බව මුහුනින් දැනගත්තීය. නමුත් පෙර දවසෙහි මෙන් ඈ ඒ ගැන ප්‍රිය නොවී ය. ඇගේ සිතෙහි ගැස්ම ද නොමැති විය.

ඊට හේතුව කවරේදැයි ඇට සිතාගත නො හැකි විය. එදින ඇසූ අනිත් ධෛර්‍ය්‍යමත් තරුණයාගේ ඡායාව ඇගේ සිතට පෙනෙන්නාක් මෙන් හැඟුනි. ඔහු ඈ ඉදිරියෙහි සිටි අයට වඩා කීප වාරයක් හොඳ වූ තැනැත්තෙකු මෙන්ද ඇට වැටහුනි. මෙසේ කිසි කලකත් නුදුටු කෙනෙක් ගැන ඈ ප්‍රිය වූ නියාව සිතී ඇගේ ඒ මූලා වූ සිතිවිලි ගැන සිනාවක් පහළ කළා ය.

ඒ දුටු තරුණයා ඉතා ප්‍රසන්නව කියන්නේ "උඹේ වචනයෙන් මට උත්තර නොලැබුනත් උඹට එය සිහි වූ බව මුහුනෙන් හැඟේ. මීනා මගේ ආදරවන්තිය, මගේ ප්‍රිය භාර්‍ය්‍යාව වෙන්ට උඹ සතුටු වන්නෙහිද" යි ඇසීය.

ඒ වචන ඔහුගේ මුඛයෙන් පිටවූ වහාම ඊට සතුටු දයක පිළිතුරු ලැබේ යයි ඒකාන්ත කරගෙන සිටි තරුණයාට මීනාගේ නිශ්ශබ්දවීම සහ මුහුනේ පෙණුනු නිශ්කලංක භාවය මදක් බාධා වීමට කරුණු විය. ඇගේ පිළිතුරු ප්‍රමාද වූ නිසා දුක්මුසු මුහුනින් යුතු වූ තරුණයා දැක, අනුකම්පාවෙන් මෙන් ඈ කියන්නී, අප දෙදෙනගේ ප්‍රවේසම හෙවත් අන්තරායෙන් මිදීම සැප ඇතිවීම, සිත් විවේකය යන කිසිවක් නැතිව මෙබඳු කථාවල් කිරීම දැනට යෝග්‍ය නොවේ. අන්තරාවෙන් මිදී, සිත ප්‍රසන්නව, ශක්තිමත්ව සිටින විට විවාහ සැප සම්බන්ධ යමක් කථා කරමුද එය ප්‍රස්තාවෝචිත වේ. ඒ නිසා මේ කථාව දැනට හැර දමා මීලඟට අප විසින් කුමක් කටයුතුද කියා බලමු" යයි ඉතා මිහිරි හඬින් මෘදු ලෙස කීය.

පළමු දිනයෙහි ඇගේ මුහුනෙහි තුබුනු ලජ්ජා සහිත වූ ආකුල භාවයද, වචනවල පැකිළීමද, ශබ්දයෙහි කිදීමද, ශරීරයෙහි මලානිකවීමද යන කිසිවක් නොදුටු තරුණයා ඒ වචන ගැන මවිත විය. එහෙත් ඇගේ ඒ වෙනස වෙන කෙනෙකු නිසා ඇති වී යයි ඔහුට කිසි හේතුවක් නැතිවිය, පළමු දිනයෙහි පටන් ඒ වනතුරු මහල්ලා හැර කිසි මිනිස් රුවක් ඔවුන්ට මුන නො ගැසුනේය. එබැවින් ඇගේ සිහි බුද්ධිය නිසා ඒ වචන ප්‍රකාශ කළා යයි සිතා ඔහු එයින් පසු නොබැස මෙසේ කීය.

"මීනා, උඹේ වචන ප්‍රඥාගෝචර වෙත්. බඩගිනි අය ඒ ගිනි නිවාගන්ට සොයනු මිස රථ වාහන ගැන සෙවීම නුවන නොවෙයි. අන්තරා මධ්‍යයෙහි සිටිනා අය එයින් මිදෙන්ට උපා යොදනු මිස කෑදර කමින් කෑම බීම සෙවීම නුවන නොවෙයි. නමුත් දැන් අපිට ආහාර ලැබී ක්ෂුධාව නැති විය. මේ ගුහාවට පැමිණ අන්තරායෙන් මිදීම ලැබු- යෙමු. එහෙයින් මදක් විවේක වූ සැප ඇත්තා වූ අප මේ ගැන කථා කළාට ඇති වරද කිම."

ඈ ඊට උත්තර දෙමින් "මම මුලදී කීවාක් මෙන් අපගේ සුරක්ෂිත භාවය සහ සැපය අපට තවමත් නො මැතියි. මෙහි අපගේ වාසය ඇතිවිය නොහැකියි. මනුෂ්‍ය පථයකට යාම උවමනා වේ. එහි යනතුරු අපි අන්තරා- යෙන් මිදී සිටිමු යයි කියන්නේ කෙසේද? එහෙයින් ඒ භයින් සිටින අපට සිත විවේකයක් නැතිමයි. තනි වූ මේ වනයේ ගමන් කරන අප විසින් පවත්වාගත යුතුව තිබෙන්- නේ ඉතා හිතෛසි වූ මිත්‍රයන් දෙදෙනෙකු අතර පවත්නා විශ්වාසය සහ සම්බන්ධ කමත් ය. ඉන් වැඩිදුර යමක් ඇතිවුව හෙ.ත් අපේ ගමනට බාධා ඇති වේ. එහෙයින් මනුෂ්‍ය වාසයකට යන තුරු මම කිසිවක් නො කියමි" යි කීය.

ඇගේ වචනයෙන් ස්ථිරත්වය පෙන්විය. එසේම මෘදු භාවය ද සෞම්‍ය ලීලාව ද මුහුනෙන් දැක්විය. අදහස් කළ කරුණු දෙකින් ම සඵලයක් ලබාගන්ට බැරි වූ ඔහුගේ සිතෙහි දෙමනස ඇති වීය. එයින් ඔහු හිස නමාගෙන භූමිය දෙස ඇස් යොමා මලානික භාවයෙන් සිටියේ ය. ඒ දුටු මීනාගේ සිතට මදක් දුක් ඇතිව ඇගේ වචනවලින් ඈ විරුඩ කමක් ප්‍රකාශ නොකළ බවත්, ඔහුට අධෛර්‍ය්‍ය වෙන්ට කිසිම කරුණක් නොමැති බවත් කී කල කිඳා බසින මිනිසෙකුට දික් කළ දණ්ඩක් සේ ඒ වචන වලින් බලාපොරොත්තුව ලැබ, "මීනා, මගේ ප්‍රිය මැණික, උඹේ ආලය ඇත්නම් මම කිසිවකට භය නොව ඉදිරියට යමි; මම සියලු දෙයින්ම ජය ගනිමි; උඹ ඒ වස්තුව දැන්

දෙන්ට ලොභ වූ බැවින් මම කණගාටු වෙමි; එහෙත් මනුෂ්‍ය වාසයකට යන තුරු ඒ දුක ඉවසමි: එහිදී උඹේ සතුට මට ලැබෙන්නේ යයි මම විශ්වාස කරගෙන සිටිමි'' යි කීය.

එතැන් පටන් ඔවුන් දෙදෙනාගේ කථාව ගස්කොළං හා වල් සතුන් ගැන විය. අන්තිමේදී එහි සිටින මහල්ලාගේ සහ තරුණයාගේත් උපකාරයෙන් ඔවුන් එයින් පිටවී යාමට තීන්දු කරගෙන නැවතත් ගුහාවට ඇතුල්ව මහල්ලාගේ කාමරයට පැමිණියෝ ය. එහි ඔවුන්ගේ පුදුමයට මෙන් මහල්ලාට නුදුරෙන් පැදුරක් හෙළා, ඒ උඩ කොට් සමක් අතුරා නිද උන් තරුණයා දකින්ට ලැබී ය. ඔහුගේ ශරීරය කඩවසම් වූ ශක්ති සම්පන්න භාවය උසුලන එකක් බව දුටු සැටියේම ඔවුන්ට වැටහින, මීනා ඇගේ ඇස් වලින් ඔහුගේ මුහුණෙහි ඇති විශිෂ්ට තාවය උරා ගත්තී ය. අලංකාර චිත්‍ර කර්මයක් දෙස ආශාවෙන් බලා ඉන්නාක් මෙන් ඈ ඔහුගේ මුළු ශරීරයම මුදුනෙහි සිට පාමුල දක්වා අංගයක් පාසාම බල බලා සිටියා ය. පුදුම වූ කාන්තිමත් වූ ප්‍රසන්න තාවයක් ඇගේ මුහුනෙහි විද්‍යමාන විය. සිත් උපුලවන්නා වූ, ප්‍රිය ශීලි, මද සිනාවෙන් ඇගේ මුඛ කෙළවරෙහි රැල්ලක් ඇති විය. ඈ ලඟ, ඇගේ මුහුන දෙස සංවෙගයෙන් බලා සිටි තරුණයා ගැන සංඥවක් ඇව නැති විය. ඔහු ඒ සියල්ල දැක දැරිය නොහැකි වූ දුක් සහගත ශංකා චිත්තයෙන් ඇගේ අත සොලවා එළියට යන්ට සංඥ කෙළේ ය. ස්වප්නයකින් පිබිදියකු මෙන් ඈ වට පිට බලා නැවතත් තරුණයා දෙස ඇස් හෙළා එළියට ගියා ය. එහිදීත් ඇගේ මුහුනෙහි කල්පනා සහිත ලීලාවක් ඇති වී ඔහුට එකම වචන මාත්‍රයක්වත් නොකියා සිටියා ය, ඒ දැක දුක් වෙගයෙන් යුතුව ''මීනා, මේ මොන පුදුමයක්ද! උඹට මා ලඟ සිටින බව වත් සිහි නැත්දැ'' යි ඇසූ විට ඈ ඔහු දෙස බලා ඔහුගේ දුකින් මිරිකී තුබූන මුහුන දැක මදක් දයා උපදවා ඔහුගේත් ඒ තරුණයාගේත් අංග ලක්ෂණ බොහෝ සේම එක සමාන යයි කීය.

ඒ පිළිතුරෙන් ඔහුගේ සංවේගය මදක් සන්සිඳුන නමුත් ඇගේ ඇස්වල දුටු දීප්තිය නිසා ඈ කී වචන වලින් ප්‍රකාශ වූ දේට වඩා, ඇගේ සිතෙහි ඉතිරි කරගෙන යමක් තිබෙන බව ඔහු සිතා ගත්තේ ය. එහෙයින් ඇගේ සිත ඔහු කෙරේ බඳවා ගැනීම ඒ වාරයෙහි ම කටයුත්තකැයි සිතා කියනුයේ, 'මීනා මගේ ප්‍රේමිය, මගේ ප්‍රිය රත්නය, මගේ දුක උඹට නොපෙණේද? උඹේ සුරතල්වූ මුඛය හැර උඹ මා හට ඇළුම්ව සිටින බවද, මතු මගේ ප්‍රිය භාර්‍ය්‍යාව වන බවද නො කියන්නෙහිදැ'' යි කීය.

ඔහුගේ මුහුණෙහි රැඳී තිබුන ආශාවද, ශබ්දයෙහි පැකිළීම ද මුළු ශරීරයෙහිම පැතිරී ගිය චලිත භාවයද, දුටු ඈ ඍජුව පිළිතුරු දීමෙන් මිස නැතිව ඔහු නලවන්ට බැරි බව දැන මෙසේ කීය. ''මේ තනි වූ ස්ථානවල සමාගම් පැවැත්වීමෙන් ස්ත්‍රීන්ට පුරුෂයින් ආලයවීම සවභාව ගුණයකි. ඒ ආලය ස්ථිරද කියා දැනගන්ට හැකි වන්නේ මිනිසුන් මැදට ගිය විටයි. ඒ ගැන සිතා පළමුවෙන් මම ගම්මානයකට යන්ට ඕනෑ යයි කීවෙමි. ඒත් නො සලකා දැන් මේ වචන කියන නිසා මා සමග දිවුරුම් පිට කාරණා දෙකක් ගැන පොරොන්දු වෙනවා නම් මගේ සිත් අභිප්‍රායත් කියමි''

ඒ අසා තරුණයා ප්‍රීතියෙන් පිණා ගොස් ඈ කියන සියලු දේට දිවුරුම් දෙන්ට ඒ මොහොතෙහිදීම ලෑස්ති බව කීයේ ය. එබැවින් ඈ මෙහි පහත සඳහන් වන කරුණු වලට ඔහු ගිවිස්වා ගත්තී ය.

(1) කිසි කලෙකත් සුදුවට හා බීමත්කමටත් නො බැඳෙන ලෙසද,

(2) කිසි කල්කත් ඈ අතහැර නො යන ලෙස සහ අන්‍ය කිසිම ස්ත්‍රියෙකු සමග අයුතු විශ්වාසයකට නො බැඳෙන ලෙසද,

ඔහු මේ සියල්ලටම ඉතා එකහව ගිවිසුම් දී, ඇට ඔහුගේ භාර්‍ය්‍යාව වන ලෙස පොරොන්දු වෙන්ට කියමින්

මෙසේ කථා කෙළේ ය. "මීනා උඹේ පොරොන්දුව දීමෙන් උඹේ නිදහස මට පාවා දුන්නා වේ. නමුත් ඊට වැඩි විශ්වාස වූ, කීකරු වූ, ආදරවන්ත වූ කෙනෙකුට එය හාර දෙන්ට බැරි වූවා ය යන පසුතැවිලි සිත උඹට නූපදින ලෙස ක්‍රියා කිරීමට මගේ මුළු උත්සාහය යොදමි. මගේ පියා ලඟ වැඩුන කාලයෙහි මම චණ්ඩ පරුෂ හිතුවක්කාරයෙක්ව සිටීයෙමි. නුමුත් උඹ දුටු තැන් පටන් මගේ සිත මෘදු වූයේ ය. මගේ සික්මීම ඇති විය. එබැවින් උඹට සැප දෙන මාර්ගය සෙවීම මගේ ජීවිතයේ ප්‍රධාන වැඩේ ලෙස සලකමි. මීනා මගේ ආදරවන්තිය, උඹ මගේ ප්‍රිය හාර්‍ය්‍යාව වන්නෙහිද ?"

ඒ තෙපුල් අසා මීනාගේ සිත එක විටම ඔහු කෙරේ නැමී ඉතා සිහින් වූ හඬින් "හාර්‍ය්‍යා වන්නෙමි" යි කීය.

සතුරන් දහසක් සමග තනිවම සටන් කොට ජය ගත් තැනැත්තෙකු මෙන් ප්‍රෞඪ වූ සිත් ඇති ඔහු ඇගේ කොමල වූ, ලා පත්‍ර මෙන් සිනිඳු වූ හස්තය රැගෙන සිඹ, 'මීනා, උඹ මගේ සිතෙහි ඉපදී තිබුන මේ දුක් රාශිය දුර දැමූ කරුණෙන් කිසි කලකත් උඹේ දිවිහිමි කොට දුක් බැවක් උඹට පත් නො වේවා. උඹේ පා තුබූ ස්ථානයෙහි ප්‍රීතියත් නිරවුලත් වේවා' යි ආශිංසනය කොට ප්‍රීතිය ඉවසාගත නොහී එතැනින් නැගිට ඔබ්මොබ සක්මන් කරන්ට පටන්ගත්තේය. ඔහුගේ සතුට තමන්ගේත් සතුට යයි හඟවන්ට මෙන් වෘක්ෂලතාවෝද සුලඟින් සෙලවෙන්ට වන.

ස්ත්‍රියෙකුට ඇගේ මුළු නිදහසය නැතිවන විවා බස්දීම ඉතා බරපතල කරුණකි. එය දුන් හැටියේම මහත් චඤ්චල භාවයක් ඇතිවෙයි. එය ස්වකීය අදහස පරිද්දෙන් ආලය ඇති තැනැත්තෙකුට දුන්නේද, ඒත් ඒ කැළඹීම පැවතියි. එහෙයින් මීනාටත් එය ඇතිවීය. ඈ කථාවෙහි නොඇලී විඩාපත්වූවාක් මෙන් හාන්සිව ඇස්වසා ගත්තීය. ඇගේ තෙහි මව පිය දෙදනගේ කැමැත්ත නොගෙන එබඳු බස්දීමයි

සාධාරණද නැද්ද යන තර්කය ඉපද එකිනෙකට කරුණු ගෙන ඇ මෙසේ සිතා බැලීය.

මගේ දෙමව පියන්ගෙන් වෙන්වූ තැන් පටන් මොහු මට ඉතා කරුණාවන්තකමින් සහ සැලකිල්ලෙන්ද හැසුරුණේය. සාමාන්‍යවශයෙන් බලනකල, වෙන තරුණයෙකුට අසුව ඔහු හා වන මධ්‍යයෙක රාත්‍රිකාලය ගතකරන්ට වුනානම් මගේ සිතට දුක්වන දේ සිදුවෙනවා නියතයි. සඳ පහනින් සහ හඩගා සුලඟින් ඇවිසුනාවූ ඔහු මගේ ආරක්‍ෂාව මිස වෙන දෙයක් නොසෙව්වේය. එයින් ඔහුගේ මනා ගතියත් මා කෙරේ ඇති සැලකිල්ලත් හොඳකාර ඔප්පුවේ. ඔහුගේ වචන වලිනුත් මුහුනෙනුත් මාකෙරෙහි ඇති තද ඇල්ම එලිදරව් වේ. ඔහුගේ උත්සාහය, නොමැලිභාවය පසුගිය දවස් කීපය තුළ මට දකින්ට ලැබුනි. එබැවින් ඔහුට මගේ කැමැත්ත දීම සෑහේයයි සිතේ. එසේවුවත් මගේ සිතෙහි මේ අතික් තරුණයා කෙරෙහි නොකියහැකි ප්‍රේමාධ්‍යාසයක් පැණනැග තිබේ. පළමුවෙන් මහල්ලාගේ කථාව ඇසීමේදී ඔහුගේ නිර්භීත භාවය ප්‍රේමවන්තකම ගැන ඔහුකෙරේ සතුටුවීමි. දෙවනුව ඔහුගේ රූපය දැක ආශාවීමි. එය පවතින ස්ථිර ආශාවක්ද, නැතහොත් දියබුබුලක් මෙන් වියකී යන එකක්ද. කියා මට විනිශ්චය කර ගත නොහැකියි. ඒ කෙසේ වෙතත් අද පටන් මගේ ආශාව මැඩපවත්වාගෙන, විවාහ, බස් දුන් අයටම විශ්වාසව සිටීම යුතුය.

මෙසේ සිතා ඇගේ සිත නිශ්චල කර ගත්තාය. නමුත් අනිත් මෙහොතේදී ඇ ඇසහැර බැලුවිට ඒ උපදවාගත් නිශ්චලතාවය අතුරුදහන් විය. ඇගේ කල්පනාවෙහි බැඳී සිටි දෙවෙනි තරුණයා ඔවුන් දෙදෙනාහට නුදුරෙන් සිටියේය. ඔහු එහි පැමිණ බොහෝ වේලා දැයි ඔවුන්ට කල්පනාවක් නැතිවිය. දෙදෙනාම තම තමන්ගේ කල්පනාවල යෙදී සිටි බැවින් ඔවුන් අවට සිදුවනදේ ගැන සංඥවක් නැතිව සිටියෝය.

ඇ ඇස හැරියා ඔහු ඔවුන් අභිමුඛයට එමින් "මම උඹලා

නාඳුනමි. නමුත් තනිව වනයෙහි සිටින්නාවූ අපට මනුෂ්‍යයන්ගේ දැක්ම ඉතා ප්‍රියවේ. එහෙයින් මට සහ මගේ සුළුපියානන්ටත් උඹලාගේ සමාගම ඉතා සතුට ගෙන දේ'' යයි කීය.

ඔහුගේ කථාවට මීනා පිළිතුරු නොදුන්නීය. ඇගේ පුත්‍රයා ලෙස හැහවූ තරුණයා කථාකරමින් ''මගේ මැණියෝ සහ මමත් උඹලාට අපමණ වාරයක් ස්තූති කරමු. අපි වනයෙහි නිරාහාරව ඇවිද ඉතා දුර්වලව මෙහි පැමිණ උඹලාගේ සත්කාර විඳ මඳක් සනීපෙන් දැන් සිටිමහ. ඒ ගැන අපේ ස්තූතිය නැවත නැවතත් උඹලාට පුදමු'' යයි උත්තර දුන්නේය.

මීනාගේ ඇස් කාන්තියෙන් දිලිසෙන්ට වනී. මුහුනෙහි අමුතු පෙම්බර භාවයක් පැතිරෙන්ට විය, එතැන ඇගේ ප්‍රමාදවීම ප්‍රවේශම් නොවන්නේය සිතා ඈ නැගිට මහල්ලා බලන්ට යන බව කියා නොපෙණී ගියාය.

තරුණයෝ දෙදෙන වහාම මිත්‍රව් වැඩී වේලා යන්ට පෙර සහෝදරයන් දෙදෙනෙකු මෙන් ආදරයෙන් කථා කරන්ට වූහ. දෙදෙනාම එක තරම් වයස්වූහ. එකාකාර මුහුනුවර වීය.

''උඹ මෙපමණ වේලා කථා කළ නමුත් උඹේ නම ගම කීවේ නැතැ''යි එකෙකු කීය.

අනිකා උත්තර දෙමින් මගේ නම ඩැනියෙල් පෙරේරාය. ඉතින් උඹේ සහ සුළු පියාගේත් නම ගම මටත් දැන ගන්ට කියා පන්නැයි'' කීය.

''සුළුපියාට කියන්නේ කොහොමද කියා මට දැන ගන්ට ලැබුනේ නෑ මගේ නම පවුලස්ය. අපේ වරිගේ', වීරතුංග අප්පුහාමිලාගේ'' ය. ඉතින් උඹලාගේ ඔය මල්ලි නැතිවී දැන් කී දවසක් වෙනවාද?

''හඳවසක් පමණ වෙන්ට ආවා''

මේ කැලේට ආවා නම් මට සම්බන්ධනොවන්නේ නැහැ. මම හැම දිහාවේම දුව පැන ඇවිදින මිනිහෙකි. උඹලා මෙහේ ටික දවසක් නව තිනවානම් තව යෝදියි කරන්ට පුළුවනි.

''හා! අපි මේ අද යන්නයි ඉන්නෙ''

''අද, මේ සවස් අතට පිටවෙලා කොහේ යන්ටද? පිස්සු නැතිව අද මෙහේ ඉඳලා යන්ට ඕනැ.''

''අම්මා කියනවා දූන් පිටත් වෙන්ට ඕනැය කියා''

'' හා ඒ කිව්වාට ඉඩදෙන්නේ කොහොමද? රාත්‍රිය කැලේ ගතකරනවාට වඩා මෙහේ සිටීම නරකද?

''හොඳයි අම්මත් එක්ක කථාකර බලන්නෙඳා.''

මෙසේ කථාබස් කොට දෙදෙන ගුහාවට ඇතුල්ව මීනා සහ මහල්ලාත් තර්ක කරනවා දුටුවෝය. නැතිවූ ලමයා ගැන ආරංචියක් ලැබෙනතුරු හෝ සොයාගන්නාතුරු ඔවුන් එහි නැවතීම යුතුබව මහල්ලා කීයේය. එකම දවසක්වත් එක තැනක සිටියොත් ඒ දවස නිරර්තක වූනාක් මෙන් ඈ සලකන බවත්, ඇගේ සිතට සැනසිල්ල ලැබෙන්නේ ගමනින් සහ සෙවීල්ලෙන් බවත් මීනා කීය.

ඇගෙ ආදරවන්තයාට මේ බස් මහත් පුදුමයට හේතු විය. ඈ එතැනින් ගෙනයාමට මදක් අමාරු වෙතැයි බලා පොරොත්තුවූ ඔහුට ඇගෙ යාමට පළිගැනීම විශෙෂයෙන් සතුටුවන්ට කාරණා විය ඈ අනිත් තරුණයා දෙස ඇස් නොහෙළිමෙන් ඔහු එතැන සිටීන බවවත් සිතට නොගත් ලෙස පෙන්වීය. තීක්‍ෂණවූ ඔහුගේ ඇසට එය මනාසේ පෙණී, ඒ ගැන කිසිත් නොතකා, මෙසේ කීය. ''නුපුරුදු අයට කැලවල යමක් සොයාගැනීම නොහැකිවේ, එක් ස්ථානයක නැවතී ඒ අසල ගව් කීපයක් දුරට හොඳට

සෝදිසිකොට එයින් සඵල නොවිනම් එතැනින් නික්ම තවත් තවාතැනක් බලාගෙන ඒ අසලත් සෙවිය යුතුයි. මෙසේ ක්‍රියාකළොත් උඹලාගේ සෙවීල්ල නිෂ්ඵල නොවෙයයි සිතමි. දැන් මෙහි සිට ගව් තුණ හතරක අයම මට සහ මේ මිත්‍රයාට සොයන්ට පුළුවනී. වයස්ගතවූ උඹ මෙහි නැවතී සිටියොත් අපේ සෙවීල්ල වඩා පහසුවේ.''

ඒ වචන යහපත් බැව් වැටහී ගිය මහල්ලා එසේ ක්‍රියා කිරීම නුවනට හුරු බවත් ඔහු දෙදෙන එවේලේම සෝදිසියට යායුතු බවත් කීයේය.

මීනාට ඊට විරුඩවෙන්ට අවකාශ නැතිවිය. එතැනින් යාමට ඈ වැඩිදුරටත් උත්සාහ කිරීමෙන් ඇගේ ප්‍රවෘත්තිය බොරු වනබව හෝ ඇගේ සිහිය මුළාවූ බව හෝ ප්‍රකාශ වන්නේය සිතා නිශ්ශබ්දවී ඇගේ මතු ස්වාමියා දෙස බැලු-වාය. ඔහුද එහි නැවතීමට වැඩි අමනාපයක් නොපෙන්නුවේය. එහෙයින් ඈ සහ මහල්ලාත් එහි සිටියදී තරුණයෝ දෙදෙන එයින් නික්මුනාහ.

---

7 වෙනි පරිච්ඡේදය

එදින ඇඳිරිවේගනඑන වේලාව පැමිණ නොයෙක් දෙ-සින් ගිරා මලිති වවුලු ආදීහු රංචු ගැසී පියාසර කරන්ට වන්හ. වාතය නිශචලව ගස්වැල් ආදිය සිතුයම් කරණ ලද දේ මෙන් නොසෙල්වෙමින් තිබුනි. සියලු දිශාවෙන්ම මළ ගෙදරක මෙන් නිස්ශබ්ද භාවය ඇතිවිය. ඉඳ හිට කෙනෙක් වැලපෙන්නාක් මෙන් මහ වනසටයෙන් නික්මුණු පක්ෂින්ගේ හා මෘගයන්ගේද ශබ්දද ඇතිවිය. අහස්හි දහස් ගණන් තාරකා දිලිසෙන්ටවන.

රෑ අන්ධකාරය වැඩිවෙන්ට වෙන්ට මීනා දෙර දෙසටවිටින් විට ඇස් හෙළිය. ඔවුන්ගේ පැමිණීම ඈ සිතුවාට වඩා

ප්‍රමාදවූ බැවින් ඇගේ ඉවසිල්ල තබාගනු බැරිව' මහල්ලාට කථාකරමින් තරුණයන් ගැන, ඇගේ සිතෙහි ඇතිවූ භය ප්‍රකාශ කළාය. මහල්ලා ඈ සනසමින් ඇගේ පුත්‍රයා ගැන කිසි කණගාටු සිනිවිල්ලක් නොගෙන සිටින්ට යයි කීයේය.

මීනා කෑම ටික උයා සකස් කොට තබා, ඔවුන්ගේ ප්‍රමාදයට හෙතුව වන මෘගයන්ගේ අන්තරායක්දෝ හෝයි විමසූ විට මහල්ලා උත්තර දෙමින් ''උඹ එසේ සිතන්නේ ඇයි? මගේ පුත්‍රයා තනිව කොටියෙකු හා සටන්කොට ඌට ඇන මරාගෙන ආයේය. තවත් නොයෙක් විට උදරතර ක්‍රියාවල්කොට ප්‍රවේසමෙන් ගෙදර ඇවිත් තිබේ. වනයෙහි සෑම දිශාවලම ඔහු නොදන්නා පාරක්, ඔහු නොදන්නා ගලක්, මුලක් දියපාරක් උල්පතක් නොමැතියි. ඔහු සමග ගිය උබේ පුත්‍රයා මෙහි සිටින අප මෙන් නිරුපද්‍රව සිටියයි මම විශ්වාස කරමි''යි කීය.

ඉන්පසු මීනා නිශ්ශබ්ද වූවාය. නමුත් ඇගේ සිතෙහි නොයෙක් භය සහිත සිතිවිලි ඇදී ගියාහ. ඇගේ භය ඒ දෙදෙනා ගැනම විය. පළමු දෙදවසෙහිම වන මධ්‍යයෙහිදී නිදන්ටවූ නමුත්, වැස්සෙන් හා පින්නෙන් මිරිකුනු නමුත් ඒ සියල්ල ඇට දුක්මෙන් නොවැටහීය. ඈ ප්‍රියවූ තැනැත්තා ඇගේ සමීපයෙහි සිටිහෙයින් ඒ දුක් සැපවිය.

මෙසේ ඈ දුක්මුසු භාවයෙහි වෙලී සිටින අතර තරුණයෝ දෙදෙන පැමිණියෝය. මීනාගේ ඇස් ප්‍රීතියෙන් උද්දීපන විය. ඈ ඔහු දෙදෙන දෙසම බල බලා දෙදෙනාගේම ඇස්වල කාන්තියද, මුහුනුවල පෙම්බරතාවයද, දූක ඔවුන් එකපියෙකුට දවූ සහෝදරයෝ දෙදෙනෙකු නොවෙත් යයිවිශ්වාස කිරීම අමාරු බැව සිතීය.

මහල්ලා පළමුකොට කථාකොට, ''පවුලිස්, උඹලා ගැන මේ,

–මොකද ඔයාගේ නම?

" ඩැනී "

දනී, දනී ! කදිම නම ! " මේ දිනීලයි අම්මා බොහොම බයෙන් සිටියා, උඹ එක්ක ගිය නිසා බය වෙන්ට එපාය, ප්‍රවේසමෙන් ගෙදර ඒයයි මම කිව් නමුත් තැවී තැවී සිටියා. ඉතින් මොකද උඹලා මේ හැටි ප්‍රමාදවුණේ, කියා ඇසුවේය.

" දනී දනී කදිම නමකි! " මීනාත් එසේම සිතුවාය. ඈ ඒ වනතුරු ඔහුගේ නම නොඇසුවාය. එහෙයින් එය පාඩම් කරන්ට මෙන් ඈ සිතින්කීප විටක්ම කිවාය. ඒ සමගම පවුලිස්, පවුලිස් යන ශබ්දද ඇගේ කණෙහි ඇති වූහ.

ඩැනීයයි කිව් අය මීනාදෙස බලා, ඇගේ සිතෙහි ප්‍රීතිය ඇතිවූ බැව් දැක මහල්ලාගේ ප්‍රශ්නයට උත්තර දෙමින් "මගේ පාශර්වයෙහි සිටින මේ මිත්‍රයා සත්තකින්ම මගේ ජීවිතය අද ගැලෙව්වේය මොහු මෙතැන් සිට මගේ සහෝදරයෙක් ලෙස සලකමි. අපේ නැතිවූ සහෝදරයා වෙනුවට අමුතුවෙන් මේ සහොදරයා ලද්දෙමැයි " කීයේය.

මීනා සහ මහල්ලාද ඒ සිදුවූ දේ අසන්ට ඉතා අශාවෙන් සිටින බැව් කීකල ඔහු දීර්ඝ ලෙස කථාන්තරයක් කියන්ට සූදනම් වෙනවා දුටු පවුලිස් කී අය ආ! මේ සුළු කාරණයක් ලොකුකර කියන්ට හදන හැටි! මෙයාට පාතින් එන්ට කියා මම කඳු ගැටයක් උඩට නැග යන අතර පාත සිට ශබ්දයක් ඇසී මම එය බැලීමට දුව ආ විට වල් ඌරෙකු මෙයා බිම හෙලනවා දැක, උගෙන් මෙයා බේරා ගතිමි. මට එබඳු දෙයක් වුනානම් සත්තකින්ම මෙයාත් එසේම මා බේරා ගනීවියයි කීය.

ඔහු අන්තරාය සමග නිතර ආශ්‍රයකර පුරුදු බවත් ඔහුගේ සිතෙහි අවංක භාවය සහ නිර්භීත ගතිය ඇති බවත්, ඒ වචන ස්වල්පයෙන් මීනාට සහ තරුණයාට දැන

ගන්ට හැකිවිය. එබැවින් තරුණයා ඒ ප්‍රවෘත්තිය නැවතත් විස්තර කොට කියන්ට හදනවා දැක, ඔහු කථා කොට ඊට පළමු කටයුතු වැඩක් තිබෙන බවත්, ඔවුන් සියලු දෙනාට එකාකාර බඩ ගිනි ඇති බැවින් බත් කෑම සියල්ලටම වඩා ප්‍රධාන බවත් කියා එය නැවැත්තුවේය. මීනා සකස් කොට තුබුනු ආහාර භාජනවලට ලා ඔවුන් ඉදිරියෙහි තැබුවාය. ඒ භාජනවල ආහාර වීගසින්ම නොපෙණී යාමෙන් ඔවුන්ගේ ක්ෂුධාගින්නේ බලවත්කම ප්‍රකාශවිය. එය අවසාන වූ පසු ඒ දෛර්‍ය්‍යයමත් තරුණයා භාජන රැගෙන ගොස් තැන්පත්කොට එයින් පිටවිය.

මීනාගෙ ඉල්ලීම පිට අනිත් තරුණයා ඒ ප්‍රවෘත්තිය කීවේය. ''අපි දෙදෙන මෙයින් පිටව ගංතිරය දිගෙම ගියෙමු. වතුර උවමනා නිසාත් ඝන කැලෑවෙන් සෙවී නැති නිසාත් මනුෂ්‍යයෙකු වුවහොත් ඒ තීරයෙන්ම ගමන් කිරීම කටයුතු වෙයි එහෙයින් එහිදී අපේ සෙවීම සඵලවෙන්ට පුළුවන්කම තිබෙයයි සිතා පළමුකොට ගඟ දිගේ අපි බොහෝදුර ගොස් කිසි ලකුණකින් හෝ ශබ්දයකින් මනුෂ්‍යයෙකුගේ පැවැත්මක් නැති බැව් දැන ගස් අතුරට වැද මහ වන මධ්‍යයෙන් ගමන් ගතිමු. ඒ ගමනෙහිදී කියයුතු කිසිවක් සිදු නොවී බොහෝ වේලා ගතවූහ. මගේ මිත්‍රයාගේ දැනගැන්ම ඉතා ආශ්වර්‍ය්‍යමත්ය. යම් ශබ්දයක් ඇසෙන ලදද ඒ අසවල් පක්ෂියාගේය, අසවල් මෘගයාගේය, අසවල් සර්පයාගේය' යි මට තේරුම් කර දෙන ලදී. යම් ගසක් පැලයක් දුටුවහොත් ඒ අසවල් වගර්ගය, එයින් අසවල් ප්‍රයෝජන ඇතිය, එහි මල් මේ ආකාරය, ගෙඩි මේ ආකාරය මල් හටගන්නේ අසවල් කාලයෙහිය,යි විස්තර කර දුන්නේය. බිමෙහිවූ පාසටහනක් බලා, ඒ අසවල් සතාගේය, යනු නිශ්වය කොට කියා දෙන ලද්දේය. මෙසේ හාත්පසින් තිබුන නොයෙක් දේගැන ඉතා වැදගත්, ප්‍රයෝජනවත්. කාරණා ඉගෙන ගනිමින් ඔහු පාශ්වයෙන් මම ගමන් කළෙමි. එක් ගල්සහිත කඳු ගැටයක් ලඟදී මට එය වටේ බැවුමේ එන්ට පනවා ඔහු ගල උඩට නැග්ගේය. වැඩිදුර යන්ට ප්‍රථමඋඍරෙකු උකුතලන හඬ ඇසෙන්ට විය එයින් භය ඉපදී වහාම දණ්ඩක් ගෙන යන්නෙම්, මා

වහාම දණ්ඩක් ගෙන යන්නෙමි, මා ඉදිරියෙහි කැලයේ සිට බිමට ඔබන ලද තොම්බ ඇතිව මට විරුඩව ගමන් ගත් ඌරෙකු දුටුවෙමි. උගේ භයඩකාර ස්වභාවයෙන් තැති ගැන්මවූ මම මහත් හඩින් කෑ ගසා, අතේ තුබුනු දණ්ඩ එසවූවෙමි. මගේ සොෂාවට දෝ නැතහොත් ඔසවනලද දණ්ඩට භයින්දෝ, ඌ මොහොතක් කල් නැවති සිටියේය අනික් මොහොතේදී ඌ මා ඉදිරියට පැන ආයේය. මම මුළු ශක්තිය යොදා දණ්ඩෙන් ගැසුවෙමි. ඒ පහරත් කා ගෙන ඌ එනවා දුටු මම පස්සෙන් පස්සට දුවන්ට උත්සාහ කෙළෙමි. මගෙ අවාසනාවට පය මුලක හැපී මා බිම වැටී ඉන් නැගිටින්ට පෙර ඒ කෘෘර සතා මා ළඟට ආවේය. උගේ තියුණුවූ දත්ද, භයඩකාර ස්වභාවද දැක මට විපත පැමිණියයි සිතා ඇස පියා ගතිමි. ඒක්‍ෂණ යෙහි උගේ පිටට ගසන ලද පහරවල් ශබ්දය අසා මම ඇසහැර බැලූයෙමි. මගේ මිත්‍රයා හති දමමින් මෘගයාට පහර දුන්නේය. ඌ ඒ දිශාවට හැරී ඔහුට විරුඩව ගිය කළ ඔහුගේ මහත්වූ ශක්තියෙන් ඌගේ හිසට සෙන පහරක් මෙන් පහර දුන්නේය. ඌ එයින් කලාන්ත භාවයට ගියාක්මෙන් වැනෙනා විට තවක් පහරක් දී බිම හෙලා අතේ තිබුනුලොකු පිහියෙන් දෙතුන් විටක් ඇන ඌමරා බොහෝ වෙහෙසව බිම වැටුනේය. මේ සියල්ල සිදු වෙන්ට වැඩිවෙලා නොගියේය. මම වහාම නැගිට ඔහු ළඟට ගොස් ඔහුගේ වික්‍රමවන්ත ශරීරය දෙස බලා මා අන්තරායෙන් මිදුවා ගැන මගේ ස්තුතිය දුනිමි. එවිට ඔහු මට කීවේ මගේ ශබ්දය ඇසූ ක්‍ෂණයෙහිම ගල් උඩින් පැන ගෙන ආ බව සහ එයින් ඔහුගේ බෙල්ල නොකැඩුන ගැන ඔහු සතුටුවන බවත්, මගේ දණ්ඩ නොතිබුනා නම් ඒ තරම් ලෙහෙසියෙන් ඌ මරාගන්ට බැරිබවත් එබඳු හදිසිවලදී තුවක්කුව පාවිච්චිකළ නොහැකි බවත්ය. පසුව පැනගෙන ආ දිශාව මට පෙන්නුවේය. ඔහුගේ පුරුදුවූ කකුල් වලට ඒ ගල් මුදුන් වලින් පැනගෙන ඊම පුළුවන් වුනා මිස වෙන අයෙකුට නම් ඉතා සෙමින් ප්‍රවේගමෙන්වත් එහි ගමන් කරන්ට බැරිවෙයි. මගේ මිත්‍රයා

ස්වල්පවේලාවක් හිඳ, විඩා හැර උගේ මස් අහකයන්ට හරින්ට බැරිබව කියමින් කැලයෙන් සවි ඇති ලීයක්ගෙන මටත් අඩගසා දෙදෙනම එක්ව ඌ තඩලා ගෙන ආවෙමු. මේ ප්‍රවෘත්තිය අසන්නාවූ උඹලාට හරියාකාර රූපය නො-වැටහේ නමුත් මගේ සිතෙහි එය ඇඳී තිබේ.

මෙසේ ඔහු ඒ ප්‍රවෘත්තිය කියා අවසානවූ පසු ඔවුන් දෙදෙනාම ඒ ඌරා දකින්ට සතුටු බැව් කීවිට, ඔහු ඔවුනුත් සමග ගුහාවේ පැත්තක ඌ දමා තිබුන ස්ථානයට ගියේය. ඌ හොඳ තරමක සතෙකු බවත්, ඌ හෙලා ගැනීම එතරම් පහසුවූ වැඩක් නොවන බවත් ඔවුන්ට කල්පනාවිය. මීනා කිසිවක් නොකියා සියල්ල බලා ඔවුනුත් සමග ආවාය. ඒ ධෛර්‍ය්‍යමත් තරුණයාද එවෙලෙහි එහි ඇතුල්වූයෙන් මහල්ලා කථාකොට 'පවුලිස්. උඹ ඉතා සැහැල්ලු කොට කී ප්‍රවෘත්තිය බැලුවාම ඒ හැටිම අල්ප නොවේ උඹේ වික්‍රමයට නිසි ප්‍රශංසා අප විසින් දිය යුතු මයි කීය.

මීනාද පළමුවරට කථාකරමින් ''මගේ පුත්‍රයාට සිදුවූ අන්තරායෙන් ඔහු මුදවා දූන් ඔබට කටවචනයෙන් පම ණක් කරණ ස්තූතිය හිස්ව පෙණේ. එසේ වුවත් අපේ කෙළෙහි ගුණතාවය ජීවිතාන්තය දක්වාමවෙයි. ඔබ අපේ මිත්‍රයන් අතුරෙන් අති මිත්‍රයෙක් ලෙස සලකමියි'' කීය.

ඒ සියල්ල ඇසූ තරුණයා තමා කෙළේ ඉතා සුළු වැඩක් බවත් ඒ ගැන ප්‍රමාණ නොවන ප්‍රශංසා ලැබීමට ඔහු සුදුනම් නොවන බවත් ඒගැන දෙවැනිව වචනයක්වත් සඳහන් නොකිරීමෙන් ඔහුගේ කෘතඥභාවය පෙන්නුව වන බවත් කීය.

ඒ ප්‍රඥසාර තෙපුල් ඇසූ මීනාගේ සිත ඔහු කෙරේ අධික ලෙස ඇලුම් ගත්තේය. නමුත් ඇ එය සඟවාගෙන නිශ්ශබ්ද වූවාය. අනිත් අයද ඔහුගේ සතුටු ප්‍රකාර ඒ ගැන

තවත් කිසිවක් නොකියා වෙන නොයෙක් දේගැන කථා කළාහුය. මීනා විඩා පත්වූ බැවි හඟවා නින්දට ගියාය. නමුත් ඇගේ ඇස පියාගෙන සිටින්ට පුළුවන්වුනා මිස බොහෝවේලා යනතුරු නිදන්ට නොහැකිවීය. එදින සිදුවූ සියල්ල එකිනෙකට ඇගේ සිතෙහි පහළවිය. ඇ වීවාබස් දුන් හෙයින් ඉන්පසු ඒ අනුව ක්‍රියාකරණ්ට යුතුබැවි සපිර ලෙස සිතට ගත්තිය. එහෙත් ඒ ධෛර්යමත් තරුණයාට ඇගේ සිත තදින් බැඳුනු බව ඇට හැඟී ගියේය. එහෙයින් වැඩිදුරටත් ඒ ස්ථානයෙහි නැවතීමෙන් ඇගේ සිත වඩ වඩා අවුල්විය හැකි බැවි සිතා පසුවද උදෑසන එයින් නික්ම යන්ට සිතටගෙන නිදන්ටවනි.

කීප දවසක්ම හරියාකාර නින්දක් නොලැබ සිටි ඇ මුළු රාත්‍රියෙහිම නිදි සහිතව පසුවද පිබීද බැලූ විට ඉර පායා බොහෝ වේලා ගොස් තිබුනු බව දුටීය. වහාම නැගිට වටපිට බලා එහි කිසිවෙක් නැති බැවි දැක ඔවුහු කොහි ගියාහුදැයි බලන පිණිස ගුහාවේ මුඛයට ආවාය. එහිත් කිසිවෙක් දකින්ට නොලැබ ඇට නොකියා සියලු දෙනාම පිටවුවා ගැන පුදුමයට පත්ව ඒ අසල ඔවුන් කිසිවෙක් ඇතැයි යන කල්පනාවෙන් "දනී, දනී" කියා හඬ ගැවාය. නමුත් දනීගෙන් හෝ අනිත් තරුණයාගෙන් උත්තරයක් නොලැබිය. නැවතත් වඩ වඩා ශබ්දනගා කථා කළවිට ගුහාවේ කොණක සිටි මහල්ලාගෙන් ලැබුනු පිළි-තුරු අසා ඇ එහි වහ වහා ගියාය. ඇගේ ඇස ඉකා ආශාවෙන් සොයන තරුණයන්ගේ දර්ශනය එහිදීත් ඇට නොලැබීය. මහල්ලා තනිව හිඳ ඌරා මස්කරමින් සිටි-නවා දුටු ඇ තරුණයන් ගැන විභාග කළාය. ඔහු දෙදෙන එළිය වැටෙන්ට පෙර පිටත්ව ගිය බවත් දවල් බතට එහි එන බවත් කියා, ඒ සතා මස් කිරීමට උදව්වෙන ලෙස ඇගෙන් ඔහු ඉල්ලා සිටියේය. ඇට බාලකාලයේ පටන් ඌරුමස් ගැන පිළිකුලක් ඇතිවිය. ඇගේ මැණියන් කිසි කලකත් ඒ ගෙදරට නොගත්තායින් අබ්දුල්ගේ අප්‍රසන්න

නාවය ඊට ඇතිව තිබෙන්ට ඇති බව පෙණේ. මහල්ලාට උදව් වීමට ඇ සතුටු නමුත් පිළිකුල් මාංශ අත ගෑමට නොකැමැතිව ඇ තරුණයන්ට සහ ඔවුන්ටත් කෑම පිළියෙල කරන්ට යන බව කියා ඔහුගෙන් අවසර ඉල්වාගෙන ගොස් එහි තිබුනු හොඳ හොඳ දේගෙන රසවත් ලෙස ආහාර පිස තුබුවාය.

ඉර මුදුන් වෙන්ට පළමු තරුණයෝ එහි පැමිණියෝය. මහල්ලාද ඒ කෘත්‍යය අවසාන කොට ආයේය. ඔවුන් සියලු දෙනාම සූදානම්කර තිබුන ආහාර බුදින්ට පටන් ගත්තුය. මහල්ලා එහි රසය යහපත් බැව් බලා බොහෝ කාලයකින් ඔහුට රසවත් ආහාර කන්ට ලැබුනේ එදින යයි කියා ඇට ස්තුති කෙළේය. අනිත් දෙදෙනාද කෑම රසබැව් කීවාහුය. මීනා ඒ ලැබූ ස්තුති ඇගේ මව් පියන්ට සිතින් භාරකළාය. ඇගේ පියානෝද මැනියන්මෙන් ආහාර පිසීමෙහි ඉතා දක්‍ෂ යෙකි, එහෙයින් එවැනි දෙදෙනෙකු හට ශිෂ්‍යාවූ ඇට ඒ ගැන මහා දැනගැන්මක් ඇතිවිය.

කෑම කා ඉවරවූ පසු තරුණයා දෙස බලා ඔහු එහි නැවතීමට මදකුත් අසතුටු නොමැතිව සිටින බැව් දැක එසේ සිටීමෙන් මතු අමාරුවට පත්විය හැකි බැව් සලකා එදින ඒ තරුණයන් දෙදනගේ ගමන් බිමන් ගැන විමසුවාය. කිසිම අමුත්තක් නැති බැව් ඔවුන් කීකල ඇ එතැනින් නික්ම අන්‍ය ස්ථානයකට යන්ට කාලය පැමිණි බැව කීය. තරුණයාද ඇ එසේ කියන්නේ සැබෑ ලෙසින් දැයි බලන්නාක් මෙන් ඇගේ මුහුන බැලුවේය. ඇ එය ස්ථිර ලෙසම සිතාගෙන කීයන බැව් හැඟී ඔහුගේ සිතෙහි යම් භයක් ඊර්ෂ්‍යාවක් පෙර දවසෙහි තිබියේද, ඒ දුර දමා ඔහු එහි නැවතීමට සිතට ගත්තේය. එහෙයින් ඔහු ‘ආදර කොට මැනියෙනි, අපි මෙහි සතියක් නැවතුන හොත් මේ සහෝදරයාගේ උපකාරයෙන් නැතිවූ මලනුවන් සොයා ගැන්ම අපහසු නොවේය’යි කීයේය.

ඇද ඊට බොහෝ නොසතුටුවී උඹ මෙහි නැවතුනේ උඹේ මිත්‍රයා සමග සෙල්ලමින් කාලය ගත කිරීමටයි. මම මෙහි නැවතී සිටීන එක එක පැය නාස්තිවුනායයි සලකමි මගේ සිත ඇවිදීමෙහි සෙවීමෙහි යෙදී සිටින විට දුකින් මිදක් සහනයව තිබේ. එහෙයින් උඹලා සමග මාත් ගමන් කරන්ට ඕනෑයයි කීය.

මහල්ලා ඒ අසා ඇගේ ගමනින් තරුණයන්ගේ සෙවීල්ලට බාධාවක් මිස ආධාරයක් නොවන බව දන්වා ඇ එහි නැවතිය යුතුබව කීවිට තරුණයෝද එය ස්ථිර කළෝය. එහෙයින් ඇට ගෙදර නවතින්ට වීය. එදින සවස් භාගයෙහි ඇ තරුණයා සමග හුදකලාව හිඳ එතැනින් පිටවී යාමට ඇගේ සිතෙහි ඇතිවූ ආශාව හැඟෙව්වාය. ඔහුද ඒ ධෛර්‍යමත් තරුණයාගෙන් ඒ අසල රට ගම තොරතුරු දැනගන්න බව සහ පසුව ප්‍රස්තාව පැමිණි විට එයින් පිටවී යන බවත් කියමින් ඇ සැනසුවේය.

මෙසේ දවස්පතා තරුණයෝ දෙදෙන උදැසන පිටත්වී ගොස් සවස් අතට ගෙදර එති. මීනා ආහාර සකස්කොට දීමෙන් හා ඒ ස්ථානය ශුද්ධපවිත්‍රව තැබීමෙන් ඔවුන්ගේ සිත් දිනාගත්තීය. මහල්ලාද පළමුවෙන් සිටි දුඃඛිත භාවය හැරදමා මදක් සීනා සහිත වූයේය. ඇගේ සුවිනීත ලීලාව ඔහුගේ සිතට තදින් වැටහිය. ඔහුට පෙර ජීවිතයේ කාණ්ඩයක් නැවතත් පැමිණියාක් මෙන්විය. ඇගේ වස්ත්‍ර කිලිටුව තිබුනා දුටු ඔහු ඇට අළුත් වස්ත්‍ර ඕනෑ බව කියා ඔහුගේ භාර්‍යාවගේ රෙදිපිළි ගෙන ඇට දුන්නේය. ඇගේ මැහැළි වේසය ඔවුන් හැඳින ගතහොත් නපුරැයි සිතා ඇ කිසිවෙක් නැති ඉඩ ඇති කාලයක් බලා ඒ රෙදිපිළි වලින් ඇඳුම් සාද ඇඳගත්තීය. නමුත් ඒ මැහැලි වේසයෙන් ධෛර්‍ය මත් තරුණයාගේ ඇස් රවටන්ට බැරිවිය. ඔහු ඇ ගැන පරීක්ෂාකොට ඒ සතිය අවසානවෙන්ට මත්තෙන් ඇ තරුණියක් බව දැනගත්තේය. එහෙත් ආහාර බුදීන කාලය

නිදන කාලය හැර අවිශෙෂ කාලය ඔහු පිටත ගත කළ හෙයින් ඇගේ රූපශ්‍රිය දකගන්ට ඉඩ නොලැබුයේය. ඈද හැකි තරමින් ඔහුගේ සිත අසුතුටු නොකරවා ඔහුගේ සමාගමෙන් තොරව සිටියාය.

සතිය අවසානවූ පසු නැවතත් ඈ එයින් පිටවී යාම ගැන කථාකළාය. මහල්ලාද ඊට විරුඩව සිට ''අපේ වාසය අත්හැර උඹලා යන්ට ඉක්මන්කරන්නේ අපේ සංග්‍රහය මදිවායින් වෙන්ට ඇති. නමුත් මහලුවූ මගේ ජීවිතයට නැවතත් සතුට එලවා නැවතත් මා දුකෙහි ගිලවන්ට සිතීම උඹලාට දුක් නුපදවන්නේදැයි ඇසෙන් නික්මුන කඳුලු බින්දු ඇතිව කීය.

ඒ දුටු මීනාගේ සිතට මහත් දුක් උපන. ඈත් මදක් මදක් කඳුලු සහිත වෙමින් කියන්නී ''අසරණව, ආහාර නැතිව, කලාන්තට ආ අපට උඹලා කළ සංග්‍රහය ඉතා ප්‍රණීත වෙති. අපේ ජිවිතය පවත්නේ යම්තාක්ද ඒ තාක්ම උඹලාගේ කරුණාවන්තකම ලැබ ලැබ මෙහිම සිටීම හැකි නම් එය මහත් වාසනාවකි. නමුත් එයින් අපේ ලමයා සොයාගැන්ම නොහැකි වන්නේය. අපට මහත් දුක්වීමට කාරණය වුවත් මෙයින් යාම ඕනෑයයි කීය.

ඒ සියල්ල අසාසිටී ධෛර්‍යමත් තරුණයා පළමුවරට කථාකරමින් ''ඇයි උඹලා මේ බොරුවෙන් අප රවටන්ට උත්සාහ කරන්නේ ? මේ නැතිවූ තරුණයෙකු ගැන සොයවා සතියක්ම අප මහන්සි කෙරෙව් නමුත් එබඳු තරුණයෙක්වත් ඔහුගේ නැතිවීමක්වත් නොමැතිබැව මම හොඳාකාර දනිමි''යි කීය.

සියලු දෙනාම පුදුමයෙන් ඔහු දෙස බැලුවෝය. පසුව මහල්ලා සහ අනික් තරුණයාත් මීනා දෙස බැලූහ. ඇගේ රහස ඔහුට තරුණයා විසින් කියන ලදැයි සිතා ඈ බිම

බලා ලජ්ජාවෙන් මෙන් සිටියාය. ඇගේ පුත්‍ර ලීලාව දූරු තරුණයා ඒ දැන, මැනියෙනි, මොහුගේ කීම විස්මයට කරුණකි. අපේ කරණා අපට වැඩිය දන්නවුන් ඇතැයි කෙසේ විශ්වාස කරමුද" යිකියා ඔහු රහස එළිදරව් නොකල බව හැඟෙව්වේය.

මීනාගේ පුදුමය තවත් වැඩිවීහ. මහල්ලා තරුණයාට කථාකොට "උඹ කුමක් කියන්නෙහිද, මොවුන්ගේ ප්‍රවෘත්තිය බොරුයයි කියන්ට උඹට කාරණා කවරේද"යි ඇසීය.

ඔහු මිනා දෙස බලා, ඈත් ඔහු දෙස බලා සිටින බැව් දැක, ඔහුගේ කියමන සපිරකරන්ට වැඩිදුර සාක්ෂි ඕනෑ නොකරණ බවත් මීනාට එවැනි පුත්‍රයෙක් සිටින්ට බැරි බවත් කීයේය. විදුලි සැරයක සීග්‍රතාවයමෙන් ඇගේ සිතට සියල්ල හැඟී ගියේය. ඇගේ තරුණ වයස ඔහු දැන ගත්බව ඇට ප්‍රත්‍යක්ෂවිය.

මහල්ලා වඩ වඩා විස්මපත්ව කවර . කාරණයකින් ඇට එබඳු පුත්‍රයෙක් සිටින්ට බැරිදැයි අසූසඳ, ඈ තරුණියෙක් බැව්නැයි කියා, ඔහු අහක බැලූයේය,

මීනාගේ ඇස්වලින් කඳුලු නික්මුනාහ. ඇගේ මුහුනෙහි ලජ්ජාව පැතිරී ගියේය. ඇගේ තොල් සුදු පැහැව වෙව්ලන්ට විය. ශරීරයද ශක්තියෙන් විරහිතවීය. ඇට කිසිවක් නොපෙනී ගියේය, ඒ දුටු මහල්ලා සත්‍ය මෙයයි හොඳාකාර දැන, ඇට ලජ්ජාවන්ට කිසි කාරණයක් නැති බවත් වනයෙහි හසර නොදැන ඇවිදගෙන ආ ඔවුන්ට සොර සතුරන්ගෙන් බේරෙන්ට අන්‍ය වේසයක් සහ එබඳු ප්‍රවෘත්තිය කුත් ඉතා ඕනැකරන බවත්, එතැන් පටන් ඔවුන් පෙර සේම එහි සතුටින් සිටිය යුතු බවත් පියෙකුගේ ලීලාවෙන් කරුණාවන්ත ලෙස කීයේය.

ඒ ධෛර්යමත් තරුණයාද ඈ දෙස නොබලා ඇගේ සමාගම්කාරයා දෙසට හැරී "සහෝදරය, උඹ සහ මම මේ සතිය තුළ අප එකිනෙකාගේ ස්වභාවය දැන ගනිමු. එසේ හෙයින් උඹ සහ මේ කාන්තාවන් මෙහි වසන්ට කැමතිවන් නාහුනම් අපේ ශක්තිතරම්න් උඹලාට ආධාර කරන්නෙමු. මගේ සුළු පියානෝ උඹලාගේ පියාමෙන්ද මා සහෝදරයෙකු මෙන්ද සලකන්නහු නම අපි දෙදෙනාම ඉතා සතුටු සිත් ඇති වෙමුයයි කීය.

ඒ කරුණාවන්ත වචනවලින් පහවූ ලජ්ජා ඇති මීනා ඔහුගේ ප්‍රිය උපදවන මුහුන දෙස බලා සිටියාය. ඇගේ සමාගම්කාර තරුණයාද මතු ඔවුන්ගේ ගමන් බිමන් ආදිය ගැන කරුණු සලස්වා ගන්නාතුරු එහි ස්වල්ප කාලයක් ප්‍රමාද වෙන්ට සූදානම් බව කීයේය. ඒ ගැන මහල්ලාගේ සතුට වචන වලින්ද කඩිසර ලෙස ඔබ මොබ ගොස් වැඩ පල කිරීමෙන්ද ප්‍රකාශවිය. ඔහු ඇගේ මැහැළි වේසය හැර දමා ඈට සුදුසුවූ වස්ත්‍ර හැඳීම පිණිස තවත් හොඳ හොඳ රෙදි පිළි ගෙන "මේ සියල්ල දිරාගියායින් ඇති එලය කිම. උඹ මෙයින් සැරසී ප්‍රීතියෙන් සිටපන්නැයි" කියා ඒවා ඈට පාවාදුන්නේය.

එදින රාත්‍රියෙහි ඔවුන්ගේ සැබෑ ප්‍රවෘත්තිය තරුණයා විසින් කියන ලදී. රහස නිසා තිබුනු බර නැතිවීයාමෙන් මීනාගේ සිත සැහැල්ලුවිය. වෙනදට වඩා නිදහසේ ක්‍රියා කරන්ටද ඈට ඉඩලැබුණේය. එබැවින් එතැන්සිට අනික් තරුණයාගේ සමාගමෙන් සිරිත් ලෙස ඈ ඉවත්නොවී ඔහු කියන කරන දේට ඇහුන්කන් දුනි. ඇගෙන් ඇසූ ප්‍රශ්න වලටත් ඈ නිසිලෙස පිළිතුරු දීමෙන් ඇගේ හැසිරීම මෙන්ම සිහියත් යහපත් බැව් ඔහුට හැඟෙව්වාය. මහල්ලා ඔවුන්ගේ කථාව අවසානවූ පසු සිතෙහි වැඩුනාවූ ප්‍රීතිය ඇතුව මෙසේ කීය. "උඹලාගේ රහස එළිදරව්වූ මොහොතෙහිදී උඹලා සැබවී ආවුන්ය යන සැකයෙන් මම උඹලා කෙරෙහි මඳක් අමනාප වූයෙමි. ලදරු කාලයේ පටන්

නිදිමරමින්, ලෙඩට දුකට සොයා බලමින්, විය පැහැදම් කර කවා පොවා ඇතිදැඩි කරගත් දෙමව්පියන්ගේ දුක නොබලා පැනයන දූවරුන්වත්, ඔවුන්ට එසේ කිරීමට සිත් දෙන පාපිෂ්ට තරුණයන්ටත් මම සැම කල්හිම සාපකරමි නමුත් උඹලාගේ මෙහි පැමිණීමට හෙතුව උඹලා අතෙහි නොවන බව මට හොඳාකාර පෙණේ. එහෙයින් උඹලාට දෙස් තබන්ට නොහැකියි. ඉතින් උඹලා මෙහි සිටිනවා නම් එය අපේ මහත් සතුටවේ. උඹලාගේ කැමත්ත ලෙස ක්‍රියාකරන්ට ඉඩ තිබේ.''

ඒ ඇසූ තරුණයා ඔවුන්ට නැවත නැවතත් ස්තුති කොට ඇ සහ ඔහු අතරේවූ පොරොන්දුව නම ගම්පලට ගොස් එහිදී ඇගේ මටපියන්ගේ සතුට ලබාගෙන සිරිත් ප්‍රකාර විවාහයට ඇතුළත්ව අඹු සැමි දෙදෙන ලෙස වාසය කරන්ට බවත්, ඒ ඉෂ්ට කරගන්ව හැකිවනතුරු ඔවුන් එහි වාසය කරන්ට සතුවු බවත් කීයේය. එදින සියලු දෙනාම ඉතා ප්‍රීතියෙන් නින්දට ගියෝය.

---

8 වෙනි පරිච්ඡේදය

පසුවද උදෑසන මීනා නැගිට ගුහාවෙන් පිටවී පායා එන සූය‍ර්‍යයාදෙස බැලීය. ඇගේ සිතෙහි ඇති ප්‍රීතියට සහභාගි වෙමින් සතුට ප්‍රකාශ කරන්නාක්මෙන් සූය‍ර්‍යතෙමේද රශ්මි ධාරාවන් පතුරුවන්ට වීය. ඒ දෙස ඇ ස්වල්ප වෙලාවක් බලාහිඳ, උදය වාතයෙන් සිහිල්වූ ශරීර ඇතිව ගුහාවට යන්ට නික්මුනිය. එවේලෙහි ඉන් පිටවූ ධෛය‍්‍යමත් තරුණයා දැක පය ඔසවන්ට මදක් ප්‍රමාදවූවාය. ඔහු සිනා සහිත මුහුනින් යුතුව ඇ සමීපයට එමින් කදිම උදෑසනක් බවකියා, ඔහු පෙර දිනයෙහි කළ කථාවෙන් ඇගේ සිත රිදෙන්ට ඇතිබවත් ඒ ගැන ඔහු කනගාටුවන බවත් කීයේය.

ඇද, ඒ සිදුවූ සියල්ල ගැන ඇගේ සිත එවේලෙහි තැළුන නමුත් ඉසුලුවාවූ බරෙන් සැහැල්ලුවූ බැවින් ඔහුට ස්තුතිවන්ත වියයුතු බව ප්‍රිය සිනාවෙන් යුතුව කීවාය.

ඒ අසා ප්‍රීතියටපත් ඔහු කියන්නේ, " ඒ ලජ්ජාවට පත්කළ මොහොතෙහිදී මා කොපමණ නපුරෙක් දැයි කියා උඹ සිතන්ට ඇද්ද? වනයෙහි සිටීමෙන්, මෘගයන්ගේ ආශ්‍රය ඇතිවීමෙන් තිරශ්චීන ගතියම පුරුදුවී දුවීලවූ ස්ත්‍රියක් කෙරෙහිවත් දයාව නොපෙන්නුවා නොවේදැයි කියා සිතන්ට ඇතැයි කීය.

මීනා ඔහුට වැඩිදුර කථාකරන්ට නොදී නවතමින් ඇගේ සිතෙහි එබඳු කිසි සිතිවිල්ලක් නොසැදුනු බවත් ලජ්ජාවෙන් පිරී එවේලෙහි ගල්ගැහුනාක් මෙන් වී තුබුන බවත් කීවාය.

"ඔව්, එසේ කීම උඹේ කරුණාවන්තකම නිසාවෙන්ට ඇති උඹ එවෙලෙහි එසේ නොසිතුවත්, මේ දක්වාම නො-සිතුවත්, මතු ඒ ගැන සිහිවුනාම එසේ සිතන්ට හැකියි. අපි වනයෙහි සිටින්නේ මනුෂ්‍යයන් කෙරෙහි ඇති ක්‍රෝධ යෙන් නොවේ. මනුෂ්‍ය සමාගමට ඇති පිළිකුලෙන් නොවේ. අපේ සිත විවේකය, ශරීර සනීපය, පරලොව බලාපොරො ත්තුව යන සියල්ලම අපට මෙහිදී ලබාගැනීම වඩා පහසු වේ. එහෙයින් උඹලාගේ සමාගමට කැමතිව උඹලා නවතා ගන්ට සිතූ නිසා මම එබඳු වචන කීවෙමි. ඒ ගැන උඹ මට සමාවෙයන්නැ"යි ඔහු කීයේය.

ඇගෙන් සමාව ඉල්ලන්ට ඔහුට කාරණා නැති බවත් ඔවුන්ගේ කරුණාවන්තකම දැකීමෙන් ඇට ලැබී තිබෙන ප්‍රීතිය අප්‍රමාණ බවත් කියා ඔහු ඒ වන වාසය අත්හැර යන්ට අකමැතිදැයි ඈ ඇසුවාය.

ඊට උත්තර දෙමින් ඔහු කියන්නේ "මෙහි කීප දව සක් සිටින විට මනුෂ්‍යයන්ගේ දැකීමට, මනුෂ්‍යයන්ගේ කට හඬව මට ආසාව ඇතිවෙයි. එවිට මම මනුෂ්‍යවාසවලට යමි. එහිදී මනුෂ්‍යයන් එකිනෙකා කෙරෙහි පවත්වන ඊෂ්‍යා ක්‍රොධමාන්‍ය, එකිනෙකාගේ රැකීරක්ෂාවල් කඩාවඩා ගන්ට කරණ උත්සාහ, එකිනෙකාගේ අයිතිකම්වලට කරණ බලහත් කාරකම්, එකිනෙකාගේ උත්තම මනුෂ්‍යගති වලට ප්‍රසිද්ධයේ සහ අප්‍රසිඩියේ කරණ නින්ද අපහාසයන මේවාද, හොඳට කවා පොවාසාත්තුකර දිලිසෙන ඇඳුම්ලා සැරසූ අශ්වයන් බැඳගක්ති සම්පන්න තරුණයන් රථ යානාවල යන සැටිද, ගෙයක් දෙරක් නැතිව උපකාරයක් නොලැබ වැරහැලි හැඳ බඩ ගින්නේ වැනෙමින් වීථිවල පණ නැතිවූ ගාත්‍රා අද්දවමින් දුර්වලවූ මහල්ලන් යන සැටිද, කාන්තිය විහිදෙන සේද වස්ත්‍ර පට වස්ත්‍ර ආදී අගනා වස්ත්‍රා හැඳ මුතු මැණික් ආභරණ පැළඳ උඩඟුවූ, අහන්කාර වූ ලීලාවෙන් සිටින පොහොසත් ස්ත්‍රීන්ගේ සැටිද ඔවුන්ගේ ස්වරූපය දරණ ඔවුන්ගේ අනු-කම්පාව නුසුලන ලජ්ජාව වසාගන්ට තරම් සෑහෙන රෙදි පිලි නැතිව කාශවූ දුඃඛිතවූ, රොගීවූ, ස්ත්‍රීන් තැන් තැන්වල වැටී සිටින සැටිද, කෑම් බීම් දී නහවා පිරිසිඳුකොට උකුල් උඩ තබාගෙන යන බල්ලන්ගේ සැටීද කබ පෙරී කඳුලුබෙරී දුර්වණවූ මුහුනීන් ශුතුව හිසකේ වැඩී වැගිරී ප්‍රේත පැටවූන් මෙන් සිටින මනුෂ්‍ය දරුවන්ගේ සැටිද, මේවාදකින විට මගේ සිත දුකින් තැවේ. එහෙයින් මම නැවතත් වහ වහාම ඉන් පිටවී එමි. මෙහිදී මගේ සිත ප්‍රීතියට පැමිණේ. මෙහිදී ශරීරය වෙහෙසව අව්වෙන් මිරිකී කලාන්තවන විට, මේ ගස් මට සිසිල් සුලඟද, සිසිල් සෙවණද දෙති, බඩගින්නෙන් දැවෙන විට, මේ ගස් සහ වැල්, මේ පඳුරු සහ පැලෑටි රස රස පලරස දෙමින් මා සනසති, පිපාසවූ විට මේ ගලායන පිරිසිඳු, දියකඩවල්, උල්පත්, පැන් දී මා සනසති. සිතෙහි කනස්සලු ඇතිවූ විට, මේ පක්ෂිහු නොයෙක් මිහිරිනාද පවත්වා ගායනාකරමින්, මා පිනවති, මේ සියල්ලෝම මගේ හිත මිත්‍රයෝ මෙන්, මට සංග්‍රහ කරති. එබැවින් මෙයින් පිටවී යන්ට මගේ කල්පනාවක් නොමැතියයි කීය.

මේ කථාව කරන කල් ඔහුගේ මුහුනෙහි පැතිරී ගිය පෙම්බර තාවයද දුක්මුසු භාවයද දුටු මීනා ඔහු කෙරේ අප්‍රමාණ කරුණාව ඇතිවී, අහෝ මෙබඳු උත්තම ගුණ රඳන මනුෂ්‍යය රත්නයක් මේ වනයෙහි කාලය ගත කරන සැටි! මොහුත් වනයෙහි පිපී සුවඳ විහිදු, අලංකාරය පතුරුවා, මනුෂ්‍යයන්හට නොපෙණී, නැතිවී යන මලක් හා සමාන වෙයි සිතා කණගාටු ලීලාවෙන් සිට, ඔහුගේ සිත ස්ත්‍රීන්ගේ ආලයට වසඟනුවූ හෙයින් එහිම සිටිනවයයි නැවතත් සිතා, ''ඇයි, මේ තනිවූ ස්ථානයෙහී, කථාකරන්ට ලෙඩට දුකට සලකන්ට, කෑම බීම හරිගස්සා දෙන්ට, මතු දරු සුරතල් දැකගන්ට, සමාගම්කාරියෙක් ලබාගන්නවා නම් යහපත් නොවේදැයි සිතා සහිතව ඔහු දෙස බලා කීය. ඔහු වඩා කල්පනා සහිත වෙමින් ඇට මෙසේ පිළිතුරු දුන්නේය.

''එබඳු සමාගම්කාරියෙක් ඇත්නම් යහපතැයි කියා මමත් සමහර විට සිතුවෙමි. නමුත් ස්ත්‍රීන්ගේ අදහස් සැම වෙලෙහිම සැපවිඳීමට වේත්. ඒ සැප අලංකාර වටිනා වස්ත්‍රාභරණවලත් දිලිසෙන රථ යනාවලත් විසාල ගෙවල්දොරවල්වලත්, රඳා තිබෙත්යයි ඔවුන්ගේ කල්පනාව වේ. එහෙයින් මනුෂ්‍යයන් මැද වාසයකරමින්, ඔවුනොවුන් ඉසුරුමත්කම්පෙන්වමින් සිටීමට ඔව්හු ප්‍රියවෙත්. මෙබඳු වනයක සිටීම ඔවුන්ට කාන්සිවේ, පාලුවේ, මෙහිදී ලැබෙන විවේකය ශරීර සනීපය ප්‍රිය සමාගම යනාදියෙහි වටිනාකමත් ඔවුන්ට නොමැතියි. එහෙයින් එබඳු සමාගම් කාරියෙක් ලැබීමට මා බලාපොරොත්තු නොවෙමි.''

ඔහුගේ අදහස් වෙන අයගේ මෙන් ස්ත්‍රී පක්ෂයට පිළිකුල් කරන, ගර්හා කරන ඒවා නොවන බව මීනාට සිතී ගියේය. ඇට නම් එහි වාසය සදකල්හිම හැකිබැව්ද, එබඳු ප්‍රඥවන්ත කරුණාවන්ත පුරුෂයෙකු ලැබ, එහි සිටීම රාජ්‍යයෙක අග මෙහෙසි පදවිය ලැබ, කෲර ගති ඇති අවංකකම නැති රජෙකුට භාර්‍ය්‍යාව සිටිනවාට වඩා යහපත්

බැව්ද, ඇගේ පක්ෂයේ අය ඔහු විස්තර කලාක් මෙන් හිස් අදහස් ඇත්තියක් බවද සිතුණේය.

ඔහු වැඩිදුරටත් කථාකරමින්, එබඳු සමාගම්කාරියක් ලැබුණොත් මට මේ තිබෙන විවේකය නැතිවේ. ඇගේ ලෙඩෙහි දුකෙහි මට දුක් උසුලන්ට සිදුවේ. ඇගේ නෑදෑයින් බැලීමට කලින් කල යෑමට ඕනෑවෙ. ඇගේ ප්‍රසූත කාලවල ඇත් කැටිව නගරයක වාසයකරන්ට වේ. ලමයි ඇති දැඩි කිරීමේදී නගරවල පදිංචිය උවමනාවේ. එහෙයින් මගේ මේ විවේක සැපය අතුරුදහන් වේ. මම කිසිකලක විවාහක පුරුෂයෙක් වෙමියයි නොසිතමි''යි දුක්මුසු ලීලාවෙන් කීයේය.

ඔහුගේ පුදුමවූ අදහස ගැන මීනාට දුක් ඇතිවිය. එහෙත් ඔහුකෙරේ වඩ වඩා ආශාවද ඇතිවීය. ඇගේ අත වෙන අයෙකුට දී නැත්නම් ඔහුගේ අදහස් හරවා, ඔහු විවාහක පුරුෂයෙක් කර, ස්ත්‍රීන් අතුරෙන් ඔහු සේම අදහස් ඇති අය සිටින බව පෙන්වන්ට පුළුවන් බව ඈට සිතී ගියේය. නමුත් ඈ වැඩිදුර යමක් කියන්ට පළමු ඇගේ මතු ස්වාමියාද මහල්ලාද එහි පැමිණියෝය. සතර දෙනාම ස්වල්ප වේලාවක් ඒ වනය ගැන කථාකරන්ට වී, එහි අවට කඳු පංතිය කෝපි ගසෙන් වැසී යන සැටිත්, ඒ රෝපාකාරයන් දරණ උත්සාහයත්, එයින් ලංකාවට ඇතිවන්නාවූ මහත් ඉසුරුමත් කමත් ගැන කථා කළෝය.

මහල්ලාද ඔවුන්ගේ දැනගැන්ම පිණිස කෝපි වැවීම සම්බන්ධව ඔහු අයා තිබුන ප්‍රවෘත්තියක් කීයේය.

කෝපි ගස ලන්කාවේ පුරාතනයෙහි පටන් තිබූන එකක්. එය කවර කාලයක කවරෙකු විසින් බෝකරන ලද්දේදැයි කිය නොහැකියි. වෙනත් ගස් මෙන් එය වැවුනා බව සිතන්ට ඉඩ තිබේ. සිංහල රජ දරුවන්ගේ උයන්වතු වල පවා එය අලංකාරය පිණිය වවන ලද්දේය. එවකට

සිටි වැදගත් ධනවත් උදවියද එය තම තමන්ගේ වතුවල වැව්වෝය, ඔව්හූ එයින් ලැබූ ප්‍රයෝජනය නම් මල් ගෙන පුද පූජාවලට පාවිච්චි කිරීම විය. තවත් දුප්පත් අය එහි කොළවලින් මාලුවක් සාද කෑවාහුය. ලිය ඉතා ශක්තිමත් බැවින් එයින් කෝටු කපාගෙන සුද්දකර සායම් පොවා සැරයටි මෙන් පාවිච්චියට ගත්තෝය. එහි ප්‍රධාන ප්‍රයෝජනය වන ඇට ගෙන බැද, කුඩුකර, බීමට පාවිච්-චිය මෑත කාලය වනතුරු පටන් නොගත්තා ලදී. අනෙක වර්ගවල පැලෑටිවලින් සශ්‍රීකවූ මේ රටෙහි එයින් එබඳු ප්‍රයෝජන නොලැබූ එක ආශ්වර්‍යයක් නොවේ. නමුත් ඒ බීම සාදන බැව් ඇතැම් අය ඒ කාලවලදීත් දැනගෙන සිටි යෝය. ඒ ගැන මුඛ පරම්පරාවෙන් පැවත එන කථාන්තර කීපයක්ද තිබෙ – එනම්,

එක්තරා පණ්ඩිතවූ ශාස්ත්‍රධාරී සංඝයා වහන්සේ නමක් එක් ගමෙක සිට තවත් ගමකට වඩිනා අතර මගදී ආබාධයක් පැමිණ අම්බලමක වාඩිගන්ට සිදුවිය දවල් කාලයෙහි ආහාරයක් නොලැබ ආබාධය වැඩිවී බඩද බොහොසේ පිපී තිබුනු බැව්දුටු ඇබිත්තයා 'ස්වාමීන්වහන්ස, කුමක් කරමුද, අතරමංවූ අපට බෙහෙතක්වත් සොයාගන්ට නැතිනොවෙද''යි කීය. එවෙලෙහි ඒ අසල ගසෙක සිටි කුරුල්ලන් දෙදෙනෙකු කරන ශබ්ද ඇසෙන්ට විය. කුරුලු බාසය දත් සංඝයා වහන්සේද ඊට ඇහුන්කන් දෙමින් සිනා සෙමින් පුදුමයෙක් නොවෙද? කුරුල්ලන් පවා දන්නාවූ සුළු ඒවා අප නොදන්නවා නොවෙද? කිරිල්ලිගේ බඩේගෑය අමු ගෙඩිකා හොඳ වුනානම් මගේ ගායත් හොඳවෙන්ට බැරි මන්ද? අපට අමුගෙඩි කෑම බැරි බැවින් පෙර තපස්වර යන් කළාය,යි කියන නියායෙන් බැදගෙන කුඩුකර වතු-රෙහි ලා බොන්ට හැකිවෙයයි සෙමින් සෙමින් කියමින් ඇබිත්තයාට කථාකොට ''ඇයි බොල බෙහෙත් කුමටද? ඔය ළඟ තිබෙන ගස තට නොපෙණේද? එයින් ගෙඩි ටිකක් කඩා ඇට ඇරගෙන බැද කුඩුකර වතුර ටිකක්

උණුකොට එහිලා බීම පිණිස ගෙණෙව''යි කීකල කොලුවාද එසේකොට, ඒ පානය පිළිගන්වා ඌද ටිකක් බීවෙය. එයින් ආබාධයද සහනයවී, ශරීර ශ්‍රාන්තයද මදක් මග ඇරී සවස් වර ඔව්හු එතැනින් නැගිට පිටත්ව ගියාහුය. ඉන්පසු පන්සලට ආකල කොලුවාද, ඒ පානය සාද අනික් ශ්‍රමණයන්වහන්සේලාට දුන්නේය. උන්වහන්සේලාද බී ඒ ගැන ප්‍රියවිත්නාහු සවස රාත්‍රිය අළුයම දවාල යන සියලු වෙලාවලම එය පාවිච්චියට ගත්හ. ඒ බැව්දුටු ඒ ප්‍රධාන සංඝ සාමීහු එසේ බිම අකැප බැව් දැන එය සම්පූර්ණයෙන්ම එපා කළාහුය, අද දක්වාම ඉර අවරවූ පසු ඇතැම් නිකායික සංඝයා අතර කෝපි බීම නොකෙරේ. - තවත් කථාවක්නම්

එක් පුරුෂයෙකු වෙත ඉතා ආලයකොට විසුවාවූ භාර්‍යාවක්විය. ඈ ඔහුගේ සියලු අග හිඟ පිරිමසාගෙන සියලු සැප විහරණය බලාගෙන සිටින අතර පුරුෂයා අන්‍ය ස්ත්‍රී යෙකු කෙරෙහි විශ්වාසයයි අසන්ට ලැබී, දිවි තබාගෙන ඉදීමෙ ඵලක් නැත කියා මැරෙණ අදහසින් වසයයි සිතාගන සිටීන් ඒ රතු ගෙඩි කෑවාය. එයින් ඇට මරණය පත්වෙනවා වෙනුවට නිදිමැරීමට ශක්තිය අත්වී කීප දවසන්ම රෑ මුළුල්ලේ පුරුෂයා ගැන රැකවල් තබාගෙන සිටි නමුත් ශඩකාවට හෙතු කිසිවක් සිදුනොවූ හෙයින් පසුව පුරුෂයා සමග සාමාදනව ඒ ගෙඩි ගැන තොරතුරු කීවාය. ඉන්පසු ඔවුන් නොයෙක් ලෙසින් ඒවා තැමට පිළියෙල කොට සඵල නොවී අන්තිමේදී කුඩුකර බැද බීමට පාවිච්චි කළෝය පළමුවෙන් කෝපවී ඒ ගෙඩි කෑ හෙයින් ''කෝපි'' යයි ඈ ලැබූ නාමය ඒ ගසටද එතැන් පටන් ව්‍යවහාර වූයයිද කියති. මෙ කථා මුඛ පරම්පරාවෙන් එන ඒවා මිස පොත පතක නොපෙණෙන නිසා විශ්වාසකිරීමට සෑහෙන සාක්ෂි නොමැතියි. එසේ පෙර කාලවලදී එයින් ප්‍රයෝජන ලැබුවා සැබෑවුවත් එය ඉතා ස්වල්ප දෙනෙක් අතරේ විය හැකියි නුමුත් සාමාන්‍ය ජනයාගේ ප්‍රයෝජනය පිණිස භාවිතා කරන්ට වූයේ මෑත කාලයෙහිදීය.

ලන්දේසි මිනිසුන් මුහුදුබඩ ප්‍රදේශය අත්පත් කර–ගෙන සිටි කාලයෙහිදී කෝපි වෙළඳාම පළමුවෙන් පටන් ගන්නා ලදැයි විශ්වාසකර තිබේ. ඒ වෙළඳාම දුප්පත් ගම් වැසියන් විසින් තම තමන් පදිංචි වතුවල වවන ලද ගෙඩි ස්වල්පය සම්බන්ධව පැවැති බැවින් ඉතා සුළුවිය යුතුයි. ඔවුහු එකවරට සේරු තුන හතරත් සාදගෙන නගරවලට විත් ඒවා දී ඒ වෙනුවට රෙදි පිලි යකඩ ලුණු ආදිය ලැබුවෝය.

ඉන්ග්‍රීසි ආණ්ඩුවට මුළු ලංකාව අත්පත්වන විට නුවර පලාතේ කෝපි ගස සශ්‍රීකව වැවී තිබුනු බැව් පෙනේ. මහවැලි ගඟ අසල වතු බොහෝ ගණනකද, හඟුරන්-කෙත රාජමාලිගයෙහිද තිබුන කෝපි සිංහල රජතුමා විසින්ම වවන ලද්දේයයි විශ්වාස කරති. පසුව ඒ වතුපෙත් කැලෑ වෙන් වැසී ගියේය. කෝපි ප්‍රධාන වැවීමක් ලෙස ඒරෝපාකාරයන් විසින් සලකනු ලබන්ට වූ පසු ඒ කෙත් වත් සමූහය සොයිසා පවුලට අයිතිවිය. එහි කෝපි වැවී තිබුන හෙයින් කැලෑ සුද්ධකිරීම කළ පසු එයින් මහත් ආදායමක් ලැබුනේය. ඒ ලැබූ ආදායම පවුලේ ධනවත් බවට මුල් හෙතුවීයයි කියති.

පළමුකොට කෝපි වැවීමට ධෛර්යදුන්නේ "බාර්න්ස් ආණ්ඩුකාර තුමානෝය. පේරාදෙණිය අසල එතුමාම වත්තක් වැවුවේය. තවත් වවන්ට සතුටු අයට ආණ්ඩුව ගණ-නේ වතු නොමිල්යේ දුන්නේය. මෙසේ ස්වල්ප කාලයක් යන්ට පෙර නුවර, ගම්පල, මේ අසල කුඹෙන කඳු පන්තිය කෝපි ගසෙන් වැසී ගියේය. පසුව වැවීමට ආශාවෙන් බොහෝ දෙන පැමිණ ඉඩම් ඉල්ලන්ට සිටි බැවින් අක්කරයක් සිලිං පහ ගණනේ විකුණන ලදී. දැන් මේ අවුරුදු ස්වල්පය තුළ කෝපි ගස දිවුණු සැටි බලනකොට ඉතා පුදුමය. ආණ්ඩුවද ඊට බොහෝ ධෛර්යදෙන්ට මෙන් ලොකු ඉඩම් විකුණති. නොයෙක් දිශාවලින් පාරවල් කපති. බොහෝ වියදම් කොට පාලම් ආදිය තනති. තව ස්වල්පකාලයක්

යන්ට පෙර මේ තිබෙන කැලෑ එකක්වත් දකින්ට නොලැබෙ.

මේ ප්‍රවෘත්තියට ඇහුන් කන්දී කැලෑව දෙස බලාගෙන සිටි මීනා එකවිටම ශබ්දනගා "අන්න! අන්න!! කියා ඇඟිල්ල දික්කර දුර ගමන් කරන මිනිසෙක් පෙන්නුවාය. සියලු දෙනාම ඒ දිශාව බැලුවෝය. බොහෝ ඈත ගමන් කරන ඒ මිනිහා ඔවුන්ටද පෙනුනේය. ඒ කවරෙක්ද, ඔහුගේ පැමිණීමට හෙතුව කුමක්ද කියා දැනගන්ට ආශාවූ තරුණයෝ වහාම ඔහු සම්මුඛවෙන්ට පිටත්වූහ. එයින් ඵලක් නැත කියා මහල්ලා ඔවුන් නවතා, පසුව ඔවුන්ගේ ආශාව තද බැව් දැන යන්ට ඉඩ හැරියේය. පැය කීපයකට පසු ඔවුන් හැරී අවුත් ඒ අමුත්තා ඔවුන්ට මුන නොගැසුන බව කීවෝය.

---

9 වෙනි පරිච්ඡේදය

එදින මීනා නින්දට සූදනම්ව ඇස් වසාගත් නමුත් ස්වල්පදිනකදී සිදුවුන ඇගේ ජීවිතයේ වෙනස ගැන උපන් නොයෙක් සිතිවිලි වලින් කැලඹී අවදිව සිටියාය. රාත්‍රියද ඉතා කළුවර විය. පිටත සියල්ලම මහ අඳුරෙහි තිබුනි, ලිපේ ගින්දරද ක්‍රමයෙන් අඩුවී ගෙයිද මදක් ඇඳිරි ගතිය ඇතිවිය.

හදිසියෙන්ම වාගේ ඇගේ කණට අඩි ශබ්දයක් වැටී ඇස හැර කන්දී බලා සිටියාය, ක්‍රමයෙන් ශබ්දද වැඩිවිය. කිට්ටුවෙන්ම ඒ නික්මෙන්නාක් මෙන් දැනී අනිත් තුන් දෙනා නිදවුන් දෙස ඈ එබී බැලුවාය. අඳුර වැඩිනිසා ටික වේලාවක් කිසිවක් නොපෙනී තිබී පසුව එක විටම මිනිසුන් තුන් දෙනෙකුගේ ඡායා පෙනෙන්නට විය. එසින් බියපත් ඈ ශබ්දනගන්ට පෙර හදිසියෙන් ඈ වෙතට පැමිණි එකෙකු ඇගේ බෙල්ලෙහි පිහියක්තබා කට සෙලෙව්වොත්

මරණවායයි කීය. සීතලවූ ඒ ආවුධයේ තියුණු මුවහත ඈට දැනුනි .නලලෙහි ඩහදිය පැන නැග්ගාහ. සකල ශරීරය භයෙන් කම්පිතවිය. එහෙත් සිහියෙන් විරහිතනුවූ ඈ ඇස් හැරගෙන ඒ ඒ අත බලමින් කල්පනා සහිතව සිටියාය. තවත් එකෙකු ලිප ලඟට පැන එළිය මදක් පත්තු කෙළේය අනිකා නිදවුන් අඟ ලඟට ගොස් ඔවුන්ගේ මුහුනුවලට එබී බලා අතෙහි තුබුනු පිහිය එසෙව්වෙය, මිනා ලඟ සිටි අයද ඒ දෙස බැලුයේය. ඒ ක්‍ෂණයෙහිදී ඈ ඔහුගේ අතට ගසා නැගිට කොටිදෙනෙකු මෙන් මිනි මරුවා දෙසට පනිමින් මොරගැවාය. හදිසියෙන් පැවැත්වූ ඒ මහත් ශබ්-දය නිසා ඔහුගේ පහරේ එල්ලය මදක් අඩුවිය. එහෙත් ඔහුගේ අත පහත හෙලුවා සමගම තියුණු වේදනාවකින් මෙන් ශබ්දයක් ඇතිවිය. එයින් ඈගේ මතු සවාමියා මිනි මරුවාගේ පහරට අසුවූ බව ඈට හැඟුනි.

ඈගේ පළමු හඬින් අවදිවූ අනික් තරුණයා ඇසිල්ල කින් සියල්ල තේරුම්ගෙන එක පහරින්ම ඒ කෲර මිනිමරු වා බිම හෙළුයේය. අනික් දෙදෙන පැනගෙනවිත් ඔහුට පහර දුන් නමුත් එයින් වැළකි සවල්ප වේලාවකින් දෙදෙ නාම යටහත් කෙළේය. ඔහුගේ ශක්තිමත්වූ බාහුවෙන් ගැසූ පහර යකඩයකින් ගසනලද පහර මෙන් දරුණු විය. ඔහු දැනගෙන සිටි සරඹද ඒ ප්‍රස්තාවෙහිදී ප්‍රයෝජනවත් විය. ඒ හෙතුවෙන් දෙවෙනි මිනිමරුවාගේ පිහිය පාරෙන් බේරී පිහිය සහිත උගේ අත අල්ලා මැනික් කටුව ලඟින් බිඳ, ඌ සම්පූර්ණයෙන් දුර්වල කරන්ට හැකිවිය. මෙසේ පරාජයවූ ඔහු තුන්දෙන එකවිටම දුවන්ට පටන්ගත්තෝය. එකෙකුගේ පය පැටලැවී බිම වැටුනේය. අනික් දෙදෙනා අවාසනාවට මෙන් කිට්ටුව තිබුන ගුහා මුඛය දෙසට දිව්වාහුය. තරුණයාද උන් ලුහුබඳවාගෙන ගොස් දෙදෙනාම අන්ධකාරයේ ප්‍රපාතයෙන් වැටෙනවා දැක හැරී එනවිට තුන්වෙනියාත් දුව එනවා දුටුයේය. ඔහුගේ සමාගම්කාරය

න් හට සිදුවූ දේ සෲෂණයෙකින් දන්වා ඌ මරණයට යන්ට නොදී නවතා නැවතත් ගුහාවට එක්ක ගියේය.

ඉන්පසු තුවාලවූ තරුණයා කෙරෙහි ඔවුන්ගේ කල්පනාව ඇතිවිය. තුවාලය පපුවට පහල දකුණු පැත්තේ ඉර නම් ලහවිය. එයින් ගලා තිබුනු ලේ දුටු ඔවුන් සියලු දෙනාම භය වූවෝය. ඔහුද සිහියෙන් තොරව සිටියේය. තුවාලය පරීක්ෂාකර බලා එය මරණීය නොවන බැව් දැන ගත් ඒ ධෛර්යයමත් තරුණයා අනිත් අයව හැඩුම් දෙඩුම් වලට ඉඩ නොදී වහාම කැලයට ගොස් ඖෂධ වර්ගයක් ගෙනැවිත් තුවාලයේ තබා ලේ වැගිරීම නැවැත්තුවේය. ඔහු ගේ ඇඟද පිසදමා වෙන රෙද්දක් පොරවා මීනාගේ සාත්තුවට භාරකොට එයින් ඉවත්වී සොරුගෙන් කාරණ විමසන්ට පටන් ගත්තේය.

ඌ මුල පටන් සිදුවූ සියල්ල කීවෙය. තරුණයාට තුවාල කළ උගේ මිත්‍රයා එහි සිටින ඒ තරුණියගේ රූප ලක්ෂණය දැක ඈ ගෙදරින් උස්සාගෙන ආ සැටිත්, ඈ නැතිවූ පසු උන් දෙදෙනාත් කැට්ව වනයේ සෑම තැනම බල බලා ඇවිද්ද සැටිත්, දිනක් උන්ට ඒ ස්ථානය අසලා මනුෂ්‍ය කටහඬ ඇසී එහි නැවතී පරීක්ෂාකර පසුව ඒ තරුණයන් දෙදෙනා ගමන් කරනවා දැක ඒ මාර්ගයෙන්ම ගමන් කොට ගුහාව බලාගත් සැටිත් විස්තරකොට කීයේය

ඒ සියල්ල අසා සිටි තරුණයා කියන්නේ 'දැන්, ඉතින් තොගේ යහළුවන් දෙදෙනාටම උන්ගේ කෲර ගතිවලට විපාක වශයෙන් කෲරවූ, භයානකවූ, දුක් සහිතවූ, මරණයක් පත්විය. ඒ පාතාලයට වැටුනාවූ උන් ජීවත් වුවහොත් එය ආශ්චර්යයකි. එයින් උන් මැරුණායයි මම කල්පනා කරමි. තොටත් අත්වෙන්ට තිබුනේ ඒ මරණයමයි නමුත් තොගේ හෙතුවකින් එයින් මිදුනා. දැන් ඉතින් තොට කළ යුතු අච්චුව කුමක්ද''යි ඇසීය.

මහල්ලා එතැනට පැමිණ "මුට දැන් මෙයින් පිටත් වෙන්ට දීම යුතු නෑ වූ අප ඉන්න තැන ගැන අනික් අයට කියා අපට විපත්ති පමුණුවනවාට ශංකා නැහැ ඒ නිසා මුත් එ ප්‍රපාතයෙන්ම පෙරළා උගේ මිත්‍රයන් සම්බ වෙන්ට අරින්ට ඕනෑයයි" කීය,

එ ගැන භය ඉපද වෙව්ලන්ට පටන්ගත් සොරුද "අනේ පින්වත් තමුන්නාන්සේලාට පින් අයිති වේවි, මා නොමරා ඉතුරු කළොත් මගේ ජීවිතය තිබෙනතුරු ඔබ වහන්සේලාට වැඩ කරගෙන සිටිමි" යයි බැගෑපත් හඩින් කියේය.

මීනාද ඒ කථාව අසා සිට අසරණවන්තයා කෙරෙහි දයාව උපදවා "අනේ මේ අසරණවන්තයා මරණයට පත් කළායින් අපට ඇති ප්‍රයෝජනය මොකද? මු සමහර විට හොඳ විශ්වාස එකෙක් වෙන්ට හැකි, මුගේ සමාහම නරක් වුනායින් මූ නරක අතට හැරී තිබේ. මුට ජීවිතදානය දී මෙහි නවත්වාගෙන ටිකක් පරීක්ෂාකර බලා පසුව යමක් කරණවානම් සෑහේය"යි කීවාය.

තරුණයාද ඇගේ කීමට එකඟව මෙසේ කීයේය. බලා පිය, තොගේ ප්‍රාණය දැන් හරියට නූල් පටකින් එල්ලෙ-මින් තිබෙන එකක් සමානය. මොහොතකදී පරලොව රසය බලන්ට තා පිටත්කර යවන්ට පුළුවන්වෙයි. නමුත් එහි දීත් තට තික්තම ලැබෙන බව තෝම දන්නවා ඇති. ඒ නිසා තෝ තව ටික කලක් ජීවත්වී කළ නපුරු දේ ගැන කණ ගාටුවී හොඳ ධර්මිෂ්ඨ ජීවිතයක් ගතකරන්ට මීටපසු උත්සාහ කරපිය, දැන්ඉතින් තෝ පොරොන්දුවෙව, තගේ ජීවිතය තිබෙන තුරු අපට වැඩකරගෙන, අපේ මේ ස්ථානය ගැන කිසි වෙකුට නොදන්වා, අපට හිත ඇතිව, අපේම කෙනෙක් වාගේ ඉන්නවාය කියා. ඌ ඊට පොරොන්දු වෙමින් ජීවි-තය තිබෙන තුරුම දසකම් කරගෙන සිටින බව කියා දෙහොත් මුදුනේ තබා වැන්දේය.

එ සොරු සමග කථා කරන කළ මීනා ඒ තරුණයාගේ ලීලාව බලා සිටියාය. ඔහු තේජස් සහිත වූ බල පරාක්‍රමය ඇතිවූ සේනාපතියෙක් මෙන් නිර්භීත භාවය පෙන්නුවේය. ඔහුගේ දිලීසෙන ඇස්වල මිනිසුන් සටහන් කරන බලය පිහිටා තිබෙන බව ඇට පෙණුනි. ඔහුගේ වචනද ස්ථිරවූ, පැහැදිලි හඬකින් කියන ලදී. එ ඇසූ සොරු වෙව්ලමින් තැතිගනිමින් ඊට යටහත් පිළිතුරු දුන් එකද ඇට පුදුමයක් නොවීය.

රාත්‍රිය ඉක්මයන්ට ප්‍රථම තුවාලකාරයාට උණගත් බව මීනාට පෙණුනි. විටින්විට ඔහු මවපියන් ගැනද කථා කරන්ට විය. ඔහුගේ බාලකාලයේ සෙල්ලම් ගැනද ඇතැම්විට කථා කෙළේය. පසුවද දවල් කාලය මුළුල්លේම ඔහුට හරි සිහියක් නායේය. සවස් වෙන්ට වෙන්ට උණ වඩ වඩා සැරවීය. ඒ දුටු මීනාගේ සිත දුක් වේදනාවෙන් පිරුණ. එහෙත් එය ඉවසාගෙන කටයුතු සාත්තු සමත්තු සියල්ලම ඉතා සැලකිලි සහිතව කළාය.

එදින රාත්‍රියෙහි මහල්ලා ඔවුන්ට කථාකොට ඒතුවාල කාරයා එහි නවත්වා ගැනීම යුතු නොවන නිසා ඔහු එතැනින් නුවරට ගෙන යාමට උපායක් යොදගත යුතුබව කීයේය. මීනා සහ තරුණයාද යාම ගැන සතුටුවූ හෙයින් එ ගැන වැඩී දුරටත් කථාකොට ඒ අළුත ලැබූ වැඩකාරයාගේත් උදව් ඇතිව ඔහු උස්සාගන යාමටත් පසුවද උදේ පිටත්වීමටත් තින්දුකර ගත්තෝය.

එළිවන යාමයේදී ඔහුගේ උණද මදක් සහනය විය. ඔහු වටපිට බලා ඔවුන් සමග කථාකරන්ටද විය. නමුත් ස්වල්ප වේලාවකින් ඉතා වෙහෙස වූවාක් මෙන් ඔහු නැවතත් ඇස් පියාගෙන නිශ්සබ්ද වූයේය. තීන්දු කරගත් ලෙස ඔහුත් රැගෙන ඔවුන් සියලු දෙනම එයින් පිටත්වූහ.

ක්‍රමයෙන් මගගෙවා ගෙන ගොස් පසුවද ඇඳිරිවී ටික වේලාවක් යනවිට නුවරට පැමිණ පවුලස්ගේ හිතමිත්‍රයෙකු

ගේ ගෙදරකට ලඟාවූහ. ඒ මිත්‍රයාද - ඔහුගේ භාර්‍යාවද ආදරයෙන් ඔවුන් පිළිගෙන කටයුතු සංග්‍රහ සියල්ල කලාහ. මීනා ගේ ප්‍රසන්න උපදවන හැසිරීම කරණකොට ඔවුන් සිතට මහත් ප්‍රීතිය ඇතිවී, ඇ වෙනුවෙන් සියල්ලක් කරන්ට ඔවුන්ට සතුට උපන. තුවාල කාරයාටද වෙනදට වඩා අසනීප ඇතිවීය. ඔහුට ප්‍රතිකාර කිරීම අප්‍රමාදව කළයුතු බව මහල්ලා කී විට, ගෙයි හිමියා ඒ ගැන ඔවුන්ට භයගන්ට එපා යයිද ඒ අසල සිටින දෙස්තර ඔහුගේ මිත්‍රයෙකැයිද කියා ඔහු එක්ක ඒමට පිටත්ව ගියේය.

ස්වල්ප වේලාවකින් උස්වූ මදක් කෙට්ටුවූ තරුණයෙක් සමග ඔහු ආවේය. තුවාලකාරයා සිහිමදව නින්දෙන් මෙන් සිටියේය.

දෙස්තරද ඔහු ලගට පැමිණ අත අල්ලා බැලීය. ඔහු ඇසහැර බලා එ කවුරුදැයි ඇසුවේය. ''දෙස්තරමහත්මයා' යයි ලඟසිටි කෙනෙක් කීවිට එහෙනම් ''මට ඕගහට සනීප කරන්ට කියාපන්නැ''යි කියා නැවතත් කලාන්තයෙන් මෙන් ඇස්පියා ගත්තේය.

දෙස්තරද ඔහු ඇස් හැරී විට මුහුනු බලා පුදුමයෙන් පස්සට පැන, ඔහු කී වචන අසා, ''ඩැනි, ඩැනී, මේ උඹද කියා අත ගෙන සෙලෙව්වේය. ඔහු නැවතත් ඇස් හැර '' කව්ද මගේ නම කියා කථාකළේ'' කියා ඇසුවේය.

''ඩැනි, මම කථාකළේ - බලාපන්, මා අඳුනන්නේ නැද්ද - මම හැරී වික්ක - උඹේ යාළුවා'' යයි උත්තර දෙනලදී.

ඔහු නැවතත් ඇස හැර, ටික වේලාවක් බලාහිද, යුසුම්ලමින් අඳුනන බව කියා ඇස් පියාගත්තේය. එවෙ-

ලෙහි ඇසින් ගැලූ කඳුලු බින්දු කොට්ටයට වැටුනා ඔවුන්ට දකින්ට ලැබුනි.

ඔහුගේ සිත කැලඹුන බව දුටු දෙස්තරද, බෙහෙත් වතුරක්දී රෑ කීප වීටක් එය පොවන්ටද, ලෙඩාට නිශ්චලව රෑ ගතකරන්ට හරින්ටද කියා ඔහු පසුවද එහි පැමිණෙන බව දන්වමින් එයින් පිටවී ගියේ.

එදින රාත්‍රියෙහි බොහෝ වේලා යනතුරු ගෙයි හිමියා සහ ඒ ධෛර්‍යමත් තරුණයා අතර කථාවක් පැවතිය. ඔවුන් මැද එ සොරුගේ සිටීම සුදුසු නොවන හෙයින් ඌ පිටකර හැරීම ගැන කල්පනා කරන අතර මහල්ලා පැමිණ එ තුවාලකාරයාව සනිපවීමට කීප දවසක් යන්ට ඕනෑ බවත් ඔහු කැළෑ වාසයට යන්ට සතුටු බවත් කීයේය. එ අසා සොරුත් එහි යැව්මෙන් ඔවුන්ට නිදහස ඇතිවෙයි කියා එසේ කිරීමට තීන්දුකරගෙන ඌ ඉදිරියට ගෙන්වා' ඌට නිදහස දුනහොත් කුමක් කරන්නේ දැයි ඇසුවෝය. ඌ මව් පිය නෑදෑ මිත්‍රයෙක් නැති තනි එකෙක් බැවින් යන්ට තැනක් නැති බවත් ඌ කරන්නේ කුමක්දකියා කිය නොහැකි බවත් දන්වා ‘‘ මා පිටකර යවන්ට සිතට ගත්තේ මම සොරුන් සමග ආශ්‍රයකළ නිසා වෙන්ට හැකි නමුත් මම එක් කලකදී හොඳින් සිටිය කොල්ලෙකි. තමුන්නාන්සේලා මා නවතා ගන්නවානම් මට නැවතත් නපුරට නොගොස් ඉන්ට හැකිවෙය’’යී කීය. එ ඇසූ තරුණයා උගේ මුහුන දෙස ඉතා පරීක්ෂාවෙන් බලා තගේ කීම මම විශ්වාස කරමි. ලෝකයේ වැඩිදෙනා නරක්වෙන්නේ උන්ට කරන්ට සෑහෙන යමක් පල් නොවීමෙනුත්, දුෂ්ඨයන්ගේ ආශ්‍රයට පත්වීමෙනුත්ය. තෝ හේතුවන්ත විශ්වාස ඇති කොල්ලෙක් බව තොගේ මුහුනෙන් පෙණෙන්ට තිබේ. තෝ මා එනතුරු මගේ සුළුපියාණනුත් බලා ගෙන හොඳින් සිටපිය’’යි අවවාද කොට යන්ට හැරියේය.

ඒ කාරණය එසේ තීන්දුකොට තුවාලකාරයා ගැන කථාවී ඔහුට ඒ මිත්‍රවූ දෙස්තරලවා පහසුවෙන් ප්‍රති-කාර කරවා ගැනීම හැකිබවත්, ඔහු ස්ප්‍රිතාලයට ගෙන නොගොස් එහිම නවත්වාගන්ට පුළුවන් බවත්තීරණය කර ගත්තෝය.

පසුවද උදය මහල්ලා සහ හොරුද පිටත්වගියෝය ලෙඩාද රාත්‍රියෙහි සුවසේ නිදිලබා උදෑසන මදක් සති පෙන් නැගිටවේය. ස්වල්පවේලාවකට පසු දෙස්තරද පැමිණියේය. ඔහුගේ පුරුදු මුහුන දුටු ලෙඩාගේ ඇස් කඳුලෙන් පිරිණ. ඔහු සෙමින් සෙමින් කථාකරමින් ''හැරී, ඊසේ රෑ තිස්සෙම මම උඹ ගැනමයි කල්ප නා කළේ. උඹ මෙහේ හිටියඑක මගේ හෙතුව නො වේද? ඉතින් බලාපන් මගේ තුවාල හයවෙන්ට ඕනෑ ඒවාද'' කියා ඇසුවේය.

දෙස්තර ස්වල්පවේලාවක් පරීක්‍ෂාකොට බලා හය ගන්ට කාරණා නැති බවත් තුවාලවලට මුලදී පිළිය ම නොලැබුන බැවින් සුවවීමට ටික දවසක් අල්ලන් ට හැකි බවත් කීයේය.

ඒ ඇසූ ඔහුගෙන් තදවී තිබුන හුස්මක් පිටවිය. තුවාලය ගැන ලොකු බරක් ඔහුගේ සිතේ තිබෙන්ට ඇති බවත් එයින් පෙනි ගියේය. දෙස්තරද තුවාල සෝද පිරිසිඳු කොට බෙහෙත් ලා බැඳ අනික් අය ඉදිරියෙන් පිටවූ පසු, ඒ තුවාල ලැබුසැටි සහ ස් කෝලයෙන් අහක්වුනාට පසු ඔහු කාලය ගතකළ සැටිත් ඇසුවෙය. ඒ සියල්ලම ඇති සැටියේම කීවපසු දෙස්තර කථාකරමින් ''ඩැනී, උඹ වගේ මෝඩයෙක්

මට දකින්ට ලැබුනේ නැහැ. උඹ ඉස්කෝලෙ යද්දි-ත් ඉගෙන ගැනීම ගැන කිසිත් නොසලකා චණ්ඩිකම කරමින් සිටියා මට මතකයි. ඉන්පසු උඹ සෑහෙන රක්‍ෂාවකට නොබැඳී වල්කම් කරලා තිබෙන බව පෙණේ. උඹේ පියණුවන්දට සල්ලි බාගෙ තියෙන නිසා හොඳයි. ඉතින් දැන් උඹ කරගත් මෝඩකම සේරටම වැඩියි. උඹේ තරාතිරමට සෑහෙන වැදගත් තැනකින් හොඳ කසාදයක් බැඳගන්නේ නැතුව මේ කවලන් කෙල්ලෙකට ආලයවීම උඹට කොහෙත්ම නොසෑහෙයි උඹ තරහ වුනත් මට කියන්ට තියෙන ඒවා නොකියා බැහැ. දැන් මේ විහිළුව දුර යන්ට නොදී නවතා ගනින්නැ''යි කීයේය. හා උඹට ඔහොම කියන්ට ලේසියි. නමුත් ඇගේ ලක්‍ෂණ දුටුවොත්, උඹට දැනමුතුකම් කියන්ට මට සිද්ධවේවි. ඇරත් ඈ මට සැලකු අන්දම සිහිවෙන කොටඈමට අත් හරින්ට මට සිත්එන්නේ නැතැයි ඔහු උත්තර දෙමින් කීය.

''චී! මොන පිස්සුද! ලක්‍ෂණ ගැන මිනිස්සු ඔය තරමට රැවටෙනවාද? ඇගේ අලන්කාර හම ගලවාඇතුලත බැලුවොත් කදිම ලක්‍ෂණයක් උඹ දකිවි. සමහර විට තුඃ, තුඃ කියා උඹේ පුදුමය ප්‍රකාශ කරාවි. ඔය අලන්කාර සම හැමදම පවතිනවාද? වයසට යනකොට එය රැළි වැටි දුර්වර්ණවී පිළිකුල් භාවයට යන්නේ නැද්ද? වසූරිය ආදී රෝගයක් සෑදුන හොත් තරුණ කාල යේදීම අලන්කාරය නැති වෙනවා නොවේද? චි! චි! මේ තරමට උඹ හමට වහලව සිටිනවාද? ඔය මෝඩකම කරන්ට යන්ට එපා ඈ උඹට සැලකු එක විශ්මයක් නොවේ උඹ වගේ තරුණයෙක් ලබා ගැනිමට කොයිම ස්ත්‍රියෙක් වුවත් අසුතුටු වේයයි නොසිතමි. දැන් හොඳට කල්පනා කර බලාපන්. උඹ ඈ කසාද බැඳගත්තාම උඹටවෙන්නේ

මොකද? පළමුකොට උඹේ පියාට එය අසන්ට ලැබුනු හැටියේම සියලුම දේපල උඹේ සහෝදරිට ලියාදේවි. උඹ තඹ කාසියක් නැති හිඟන්නෙක් වෙනවා උඹට සෑහෙන රක්ෂාවක් ඇත්තේ නැහැ. එතකොට මේ ලක්ෂණ ස්ත්‍රිය අරගෙන උඹ තැනින් තැන යමින් ජීවිකාව කරගන්ට බලාවි අන්තිමේදී ඈත් හිඟමනට පත්කර උඹත් හිඟමනට පත්ව දෙන්නාටම දුක් විඳින්ඩ වෙනවා. ඈගේ ලක්ෂණ ක්‍රමයෙන් නැතිවී යනවා. උඹේ සිත ක්‍රමයෙන් අඩුවෙනවා. පසුව ඈගේ පැවැත්ම පවා උඹට බරක් වෙනවා. එතකොට උඹේ ක්‍රියාව ගැන උඹට සිතෙන්නේ මොනවාද? උඹේ සිත භය කිරීමට මේ භයානක සිතියමක් උඹට පෙන්නුව යයි සිතන්ට එපා. ලෝකයේ දවස්පතාම වගේ අපට දකින්ට ලැබෙන රූප මේවා තමයි. මමත් ලෝකය පුරුදුවූ ගෑනු ගැන දන්නා මිනිහෙකි. ඒ නිසා මගේ කීම අහපන් කෑම බීම ඇඳුම් පැලඳුම් ආදී සැප සුවන්දී හිරිහැර නැතිව ලැබෙනතුරු ගැහුණු සතුටින් හිමියා කෙරෙහි ඇලුම්ව සිටිති. හිඟ පාඩු වෙන්ට වෙන්ට සිතේ ඇල්මත් පාතබයි. හිමියා නැතිව සිටින්ට පුළුවන් වුවත්, ඒ ලෙහෙසි පහසු නැතිව සිටින්ට උන්ට නොහැකිවේ. එහෙයින් ඒ ලැබිම පිණිස ස්වාමියා නොතකා පරපුරුෂයන්ගේ ආශ්‍රයටද පවා යති. ඕනෑ නම් තව විස්තර කොට නම ගම වශයෙන් මම අහපු දැකපු කාරණා කියන්ට පුළුවනි. ඒ නිසා උඹ ඔය මෝඩකමට නොබැදී සිහි ඇතිව ක්‍රියා කරපන්නෑ"යි කියා දෙස්තර ඔහුගේ මුහුණ දෙස ඇසිපිය නොහෙලා බලා සිටියේය.

ඔහුගේ මුහුනෙහි කැළඹුන ස්වභාව ඇතිවිය. ඔහු වට පිට බලමින් නලල අතින් පිරිමැද මිත්‍රයා දෙසට හැරී ඔහු

ගේ කරුණාවන්ත වචන ගැන තරහ වීම යුදු නොවන බවත් පියාගෙන්වත් නෑදෑ මිත්‍රයෙක්ගෙන්වත් යමක් නො ලැබුනාට ඒ වනයේ වාසයකරන්ට හැකි බවත් සෙම්නා කීයේය.

ආ හා! එහෙනම් උඹ පටන්ගත්තේ ඉන්ට හිටින්ට තැනුත් බලාගනයි'' කියා දෙස්තර හිස සොලව සොලවා කල්පනා කරමින් සිට ''උඹේ මිත්‍රයින්ට විරුද්ධව යමක් කිරීම හරිනැහැ, නමුත් අපේ මිත්‍රකම ඊටත් පරණ බැවින් මට කියන්ට තිබෙන ඒවා කියමි''යි කීය. උඹ තනියම සිටිනවා නම් වනය අපහසු ස්ථානයකැයි මම නොකියමි. නමුත් ස්ත්‍රියෙක් සමග සිටිනවිට සත්තකින්ම එය දුෂ්කර ස්ථානයක් වෙයි. ලෙඩ දුක් ආදියෙහිදී, දරුවන් ඇතිවීමෙ හිදී, වනයෙහි වාසය නොහැකිවෙ. ඇරත් උඹ සිටින්ට අදහස් කරගෙන සිටින ස්ථානයෙහි තවත් තරුණයෙක් සිටිනවා නොවේද? ඔහු උඹටවඩා ලක්ෂණින්වත් සිහිනුවනින්වත් අඩුයයිමම නොකියමි. නමුත් ධෛර්‍යයෙන් නිර්භීතකමින් උඹට වැඩිබව සත්තකින්ම කියමි. ස්ත්‍රීන් කැමතිවන්නේ එහෙම අයටයි. උන් දුර්වල වර්ගයක් බැවින් ධෛර්‍යවත් අයට ආශාවීම සිරිතකි. උඹේ මීනාත් ස්ත්‍රියෙක්යයි සිතමි. එහෙයින් උඹ එහි වාසය කළහොත් උඹට ලැබෙන දුක අප්‍රමාණ වෙයි. මව්පිය, නෑදෑ මිත්‍ර මනුෂ්‍ය සමාගම සියල්ලම අත්හැර ඈ උඹේ මුළු ලෝකය කරගෙන කැලයට විත්, ඈගේ ආලය උඹට තනිකර නොලැබෙන්ට සිටියොත් උඹට කුමක් සිතේවිද? උඹ ඊර්ෂ්‍යා වන්තයෙකි. නිතරම සැක ඇති කෙනෙකි. උඹේ ස්වභාව මම හොඳාකාර දනිමි. ඒ නිසා උඹ මගේ කීම ගනින්. ඔය වගේ නැන් නම් ඔයිට වඩා දෙතුන් ගුණයක් ලක්ෂණ ඇති අපේ නගරාතිරමවල ගැහැණු සිටිති උඹට සනීපවූ හැටියේම මම [illegible]ම පෙන්වා දෙමි. ඉතින් සැබෑවටම උඹු ඔය

ගැණිට ආදරේද?'' ඒ ප්‍රශ්නය ඔහු ඔහුගේ සිතින් මීට පෙර විමසා නොතිබුන බැවින් එකවිටම පිළිතුරු දීමට නොහැකිවීය. ඈ සම්මුඛවූ තැන් පටන් ඈ ගැන ඔහු ප්‍රස න්නවූ බවත්, ඉන්පසු ඇගේ සමාගමෙහිම සිටී බැවීන් ඒ ප්‍රසන්නතාවය වැඩි දියුනුවූ බවත් එවක් පටන් ඕහුට වෙන ස්ත්‍රියෙක් මුහුන නොගැසුනු බවත් සිතී ගියේය.

මෙසේ පිළිතුරු ප්‍රමාදවනු දුටු අනීත් අය කියන්නේ හා, හා, මම සිතුවේත් ඔය ටික තමයි උඹට ඈ පුදුම විදියකින් සම්බවුනේය. ඇගේ ආශ්‍රයත් පුදුම විදියට ඇති වුනේය. උඹේ සිතෙහි ඇතිවී තිබෙන්නේ ඈ කෙරේ මිත්‍ර කම පමණයි. ආලය කියන වේගවත් ගැඹුරු ගුණය නොවේ. ආලය හරියාකාර' ඇතිව සපීරලෙස පවතින්ට පුළුවන් වන්නේ සමානවූ අදහස් ඇති, සමානවූ ගෝත්‍ර ඇති අය අතරෙහිය. මේ උඹේ සිතෙහි පවතින සතුට ක්‍රමයෙන් නැතිවේ. ආශාව ක්‍රමයෙන් මැකේ. ඉන්පසු උඹට ඇති වෙන්නේ දුකයි. සැප නොවේ – ඒ නිසා මම දැන් කීව ඒවා හොඳට කල්පනාකර බලාපන්, වැඩිදුර කථා කිරීම අපට පසුව පුළුවනී. දැන් උඹ කිසිම කණගාටු කල්ප නාවක් නොගෙන හිත ප්‍රසන්න කරගෙන සිටින්න ඕනෑ– සවස් අතට මම එන්නම්, ආයුබෝවන්'' මෙසේ කියා ඕහුගෙන් අවසර ගෙන දෙස්තර පිටව ගියේය.

තුවාල්කාර තරුණයාද ඒ කථාව සිහිකරමින් නො යෙක් අතට පෙරළ පෙරළා කල්පනාකර බලන්ට පට න් ගත්තේය. ඈ කෙරේ ඔහු ආලයෙන් සිටීනේද යන ප්‍රශ්නය පළමුවෙන් සිතට ආය. ඊට ඍජු ලෙස 'ඕව්'' කියා පිළිතුරුදීම ඔහුට නොහැකිවීය. ඈ දැකීමෙන්,

මගේ සිත ප්‍රීතිවෙයි. ඇගේ හඬ ඇසීමෙන් සතුටුවේ. ඇගේ සමාගමෙන් සැනසේ. ඒ ආලයේ ලකුණු නොවේද ? සත්තකින්ම "ඔව්".

"ඇගේ ලෙඩෙහි දුකෙහිදී අව් වැසී නොබලා රක්‍ෂාව කරගෙන, දුක වෙහෙස නොබලා දර දීය ඇදගෙන බඩගිනි නොබලා අවදිව, දරුවන් නලවාගෙන සිටින්නට ලැස්තිද?" නැහැ. ඒ ආලයේ ලකුණුද, – සත්තකින්ම නැහැ."

"හා, මගේ මිත්‍රයාගේ කීම බොරු නොවේ. මුලාවී සිටින මිනිස්සු කල්පනා කරන්නේ සැප අතමයි. එවිට පෙනෙන්නේ ලක්‍ෂණත්, සුකුමාර ගතියත්, මිහිරි හඬත් සෞම්‍ය බැල්මත්, අලන්කාර ගමනත් පමණකි. දුක අතට හැරුණාම ඒ කිසිත් නැතිවේ.

"ඇගේ ජීවිතය පහසු කරන පිණිස මගේ ජීවිතය බරකරගන්නේ කුමටද? එහෙත් වනයෙහිදී ඇ නිසා මරණයට වුවත් යන්ට මම ලැස්තිව සිටියෙමි. ඒ ආලය නිසා නොව කැලෙහි නිසා වෙන්ට ඇති. මෙ මනුෂ්‍ය සමාගම් දකිනවිට මට නැවතත් සිහිය ඇතිවිඟ. ඇ මේ දහස් ගනන් ජනයාගෙන් එකියකි. සාමාන්‍ය අයට වඩා ඇති වෙනස, සමේ අලන්කාරයත් සිතේ ධෛර්‍ය්‍යත්ය ඒ ගැන සියල්ල අත්හැර දැමීම මට නොහැකිවේ· එත කොට සියල්ල නිසා ඇ අත්හැර දමන්ට ලැස්තිද?

"හා, ඒකත් අමාරු ප්‍රශ්නයක්! දැන් ඒකට උත්තර දෙන්ට මම මහන්සි නොගනිමි. මට බොහොම වෙහෙසයි'

මෙසේ ඔහු නොයෙක් ලෙස කල්පනා කරමින් තිර

ණයකට පැමිණිය නොහැකිවූ කැලඹුනා වූ සිතින් දුක්ගෙන සිටියේය. ඒ කාලය අතරතුරෙහිදී මීනා අනිත් තරුණයා සමග කථාබහෙහි යෙදී සිටියාය.

''දෙස්තරගේ කල්පතාව නම්, තුවාලය බරපතළ නූනත් සුවවෙන්ට කල් අල්ලාවියකියාය, ඒ නිසා මමත් ගෙදර දුවලා එන්ට කල්පනාකරගෙන සිටිනවාය''යි ඒ තරුණයා ඈට කීවේය.

''අද හෙටම යන්ටද?''

''හෙට උදයේ පිටත් වෙන්ටයි මගේ කල්පනාව''

ඇගේ ඇස්වල කඳුළු නැගී ආහ. මුහුනෙහි ඉතා දුක්මුසු ලීලාව පැතිරී ගියේය. ''අප නාඳුනන ස්ථානවල නාඳුනන අය අතරේ දමා යාම සරිද'' යන වචන ඇගේ කටින් පිටවිය.

ඒ වචනද, ඒ පැවසූ ස්වභාවද, ඇසූ දුවූ කාගේ උවත් ලය මොලොක් වන්නේය. එහෙයින් උණුවුනාවූ සිත් ඇති තරුණයා ඈ දෙස නොබලාම සිට ''නැඳුනුවත් මගේ මිත්‍ර යන් මා ඉදිරියෙහි සිටින විට මෙන්ම, මා නැති වුවත් කරන්ට තිබෙන සියල්ලම කරණ බව මම දනිමි. එසේ වුවත්, මගේ නැවතීම ඔය හැටි සැලකිල්ලට කරුණක් නොවනබව මම දැනගෙන සිටියානම් මම යන්ට අදහස් කරන්නේ නැතැ''යි කීය.

ඉන් පසු ස්වල්පවේලාවක් නිශ්ශබ්ද භාවය ඇතිවිය. ඔහු ඇස් ඔසවා ඈ දෙස බැලුයේය. ඇගේ ඇස්ද ඔහු වෙත වැටුන. එහි ඔහුට සලකන ප්‍රමාණය මෙතෙකැයි

කියා ලියවී තිබුනාක් මෙන් ඔහුට පෙනී ගියේය. ඊට හේතුව ඔහු කළාවූ උපකාර වෙන්ට ඇතැයි ඔහු සිතුවේය. ඔහු කෙරෙහි ඇගේ සිතෙහි තද ආශාවක් ඉපදී එසේවී යයි ඔහු සිතන්ට නොකැමැතිවීයැ

ඇද ඔහුගේ මිත්‍රයන් ගැන ඒ ආශ්‍රය කළ පමණින් හොඳ කල්පනාවක් ඇතිව සිටින බවත්, ඔහු ටික දවසක් එහි නවතිනවානම් යහපත් බවත් කියා හදිසියකින් මෙන් ඔහු ඉදිරියෙන් නික්ම ගියාය.

ස්වල්ප වේලාවක් යනතුරු ඇගේ සිත තද කුණාටුවක් ගත් මුහුදක් මෙන් විය. සිතිවිලි එකිනෙකට පටලැවී රළමෙන් ආකූල ව්‍යාකූල විය. බොහෝදුර සිට නික්මෙන් නාවූ හඬක් ඈට ඇසෙන්නාක් මෙන්විය. එය වාතය පිටින් ඈ දෙසට ගමන්කරන්නාක් මෙන් වී ක්‍රමයෙන් වඩ වඩා ඇසෙන්ට විය. ඇගේ සිත ප්‍රීතියෙන්ද සංවේගයෙන්ද ගැහෙන්ට විය. මිහිරිවූ, ශාන්තවූ, නිද්‍රාව ඈට සමීපවූවාක් මෙන් ඒ සුඛ වේදනාවෙහි ගැලී සංඥා විරහිත වූවාය.

එදින සවස් වාරයෙහි දෙස්තර පැමිණ ලෙඩාට පහසු ලැබී තිබෙන බැව්දක කතා කරන්ට පටන් ගත්තේය. "ඩැනී මමත් මෙහේ ඉන්දෙද්දී මේ අනුන්ගේ ගෙදරක උඹට ඉන්ටදීම හරිනැ උඹ මේඋදවියට හොඳින් ක්‍රියාකර කැමැත්ත අරගෙන මාලඟ සිටින්ට වරෙන්, එතකොට උඹට ලෙහෙසියෙන් සනීප කරන්ට මට පුළුවන් වෙයි. ඉතින් මම උදේ කිව් කාරණා උඹ කල්පනාවට ගත්තාද?"

"ඔවු හැරි, නමුත් උඹ කියන හැටියට මගේ සිත නමා ගැනිම අමාරුයි. ඈ අතහැරලා ඉදීමට වඩා, වැඩි

දුකක් මට පැමිණෙන්ම නොහැකියයි කල්පනාවේ උඹ සමග ඉන්ට මම ඉතා සතුටුයි. නුමුත් ඇගෙන් වෙන්වීම ඉවසිය නොහැකියි.

"මිනිසුන්ට ඉවසිය නොහැකි දෙයක් කොයින්ද?යමක් වෙන්ට පළමු ඒ ගැන මහත් බරක්, හයක්, අමාරුවක් තිබෙ. නමුත් වුනාම ඒවා ක්‍රමයෙන් සැහැල්ලුවී යති අපේ රක්ෂාවල් නැතිවී උන් හිටි තැන් නැතිවී, හිඟමනට යන්ට වුවහොත් කොපමණ දුඃඛිතද? කොපමණ භයානකද කියා දූන් කල්පනා වේ. නමුත් එසේ වූ අප සමානඅය සන්සූන් කමින් සමහරවිට සෙල්ලමින් කාලය ගතකරනවා දකින්ට ලැබේ උඹ මේ කාලය තුළ දවස් පතාම ඇ සමග ආශ්‍රය කළ හෙයින් ඇගෙන් දවසකටවත් වෙන්වීම ඉවසිය නොහැකි දුකෙකැයි කල්පනාකරන බව පෙණේ. නමුත් වෙන්වී දවසක් දෙකක් යන විට උඹේ කල්පනාව වෙනස් වේයයි මම සිතමි. කොහොම උනත් උඹේ ආලය ගැන පරීක්ෂා කිරීමටත් එය හොඳ මාර්ගයකි. ඇගෙන් වෙන්වී, දුකක් නැතුව සැපෙන් කල් යවන්ට උඹට පුළුවන් උනොත් සැහෙන කසාදයක් බැඳගන්ට ඕනෑ. නැත්නම් ඉතින් කරන්නේ මොකද?"

ලෙඩීටද ඔහුගේ කල්පනාව හරි බැව් වැටහී ඇගෙන් වෙන්වී ටික දවසක් වාසය කරන්ට කැමැත්ත ඇතිවිය. තුවාලය පිට දමා තමාගේ සිතෙහි අදහසද ඉෂ්ටකර ගැන්ම පහසු බැව් දැක "හොඳයි, උඹේ කීම පිට මම ටික දව දවසක් උඹ ළඟ නවතින්ට බලඤඤ යයි කියේය.

එදින රාත්‍රියෙහි ඔහු සහ මීනා අතරේ ඒ ගැන කථාවක් ඇතිවිය. දෙස්තර ඔහු බාලකාලයේ සිට අඳුනන, එක ස්කෝලයට ගිය, දුරස්තර නෑකමකුත් ඇති කෙනෙකි.

තුවාලය සුවවෙන තුරු ඔහු ළඟ මට නවතින්ට කියනවා මේ නාඳුනන මිනිසුන්ගේ ගෙදරක, විය සියදම පිණිස කිසි වක් නොදී ටික කාලයක් අපේ නැවතීම යුතුයයි මට නොසි තේ. ඒ නිසා මම මෙතනින් යන්ට කැමතියි. නුමුත් උඹ ගැන කල්පනා කරමින් මම මේ ලත වෙමින් ඉදිමි'' යි කීය.

ඇගේ සිතට ඒ දවසෙහිම ලැබුනු ඒ දෙවෙනි පහර විය. ඊට පැය කීපයකට පෙර ඇගේ සිත බැඳී තිබුනු එක් කෙනෙක් ඇ හැර යන්ට සිතාගෙන සිටින බැව් දැනුම දුන්නේය. ඇගේ පැවැත්ම ඔවුන්ට දැන්මම කරදරයක් වී යයි ඇ සිතුවාය. එහෙයින් සිත මදක් දැඩිව කියන්නී ''මා ගැන කිසි කණගාටුවක්, ලතවීමක්, උපදවාගන්ට ඕනෑ නොකරයි. මේ ගෙයි ඇත්තෝ මගේ මවපියන් සෙයින් මට කරුණාව ඇතිව සිටිති. ඒ නිසා මට මෙහි සිටීන්ට අපහසුවක් නෑ. තම තමන්ගේ පහසුවත් සුතුකමත් බැලීම සෑහෙන බවත් මට සිතේ''යි කීය.

''මිනා උඹෙන් වෙන්ව සිටීම මට අමාරුවෙ.''

''අමාරුවුනත් ප්‍රස්තාව බලාගෙන ක්‍රියා කිරීම ඕනෑ නොවේදැ''යි ඇ අහක බලාගෙන කීවාය. ඇගේ හඬෙහි හෝ වචනයෙහි සැල්මක්වත් දුක් ඇති බවක්වත් නැතිවිය ඔහුගේ යාම ගැන ඇ තදින් විරුඩවෙය, හඩාය දෙඩාය, කියා ඔහු වුන බලාපොරොත්තු ඉෂ්ඨ නූනා ගැන මදක් පුදුම වෙමින් ''මිනා, මගේ වෙන්වීම උඹට දුක් ගෙන නොදේදැ''යි ඇසීය.

ඇ ඔහු දෙස නැවතත් බලමින් ''ආදරය ඇති අය

තමන් ගැනම සිතීම හැරදමා, අනුන්ගේ සුභ සිද්ධියම ප්‍රාර්ථනා කරති''යි කීය.

මේ පිළිතුරු ඔහු දෙසට යොමු කළ සැරයක් මෙන් විය. එයින් ඔහුගේ සිත පහසුව සහ ශරීර සුඛය ගැන, ඇගේ ඇති ප්‍රසන්නතාවය ප්‍රකාශකළාක් මෙන්ම, ඇට දුක් ඇති බවත් ඒ දුක් ගැන ඈ නොසලකන බවත් එළි දරව් විය. ඒ අතරම ඔහුගේ සැපය බලාගෙන, ඈ දුකෙහි දමා යන හෙයින් ඔහුගේ ආදරයේ අල්පභාවයද ඔප්පුවී යයි ඔහුට සිතී ගියේය. ඒ ගැන ලජ්ජාවූ ඔහු ''මීනා, මම කොපමණ සිත් පිත් නැති කෙනෙක්ද? මගේ සැපයම බලා උඹ හැරලා යන්ට යෝජනා කිරීම කොපමණ කෲර කමක්දැ''යි කීය.

ඔහුට වැඩිදුර කථාකරන්ට ඉඩ නොදී මීනා කාරණා කියන්ට පටන්ගෙන ඔහුගේ වෙත්වීමෙහි කිසිම කෲර කමක්වත් වැරැද්දක්වත් නැති බවත්, ලෙඩ ඉක්මනට සුව කර ගැනීම දෙදෙනාගේම සැපතට ප්‍රධාන කාරණය බවත් පැහැදිලි කර, ඔහුගේ සිත යාමටම පෙලඹවූවාය.

ඊට දවසකට පසු ඔහු දෙස්තර සමග විසීමට ගියේය එදිනම අනික් තරුණයාද වන වාසයට පිටත්ව ගියේය.

---

10 වෙනි පරිච්ඡේදය

සති තුනක් යන්ට පළමු දෙස්තරගේ සමර්තකමින් සහ සැලකිල්ලෙන් තරුණයාට සම්පූර්ණයෙන්ම සුවවිය.

දිනක් ඔහු මිත්‍රයාත් සමග කෑමකට ගොස් ගෙදර අවුත් නිදන්ට උත්සාහකොට බැරිව බොහෝ වෙලා ඇඳෙහි පෙරලෙමින් කල්පනාකරන්ට පටන් ගත්තේය. ඔහු සුවවූ වහාම මීනා දකින්ට එන හැටියට ඈ සමග පොරොන්දුවී ආ නමුත්, සුවවී දවස් කීපයක් ගොසිනුත් තවම ඈ බලන්ට නොගියේය. ඔහුගේ ඒ නොසැලකීම හරිද? "හා, ස්ත්‍රීන් ගැන මම දැන් හොඳට දනිමි. උන් අතරේ ස්ථිර කමක් ඇති ඒ ඒ අතට නොනැමෙන එකියෙක්වත් ඇතැයි මම විශ්වාය නොකරමි. පළමුවෙන් මදක් වීරුඩකම ඇති වුවත් පසුව උන් ඕනෑ තුච්ඡකමකට කැමැත්තෙන්ම හැරෙන ඇයින් බව මම ඇස් දැක තිබේ. පළමුද රැයෙහි මගේ මිත්‍රයාගේ කාමරයෙන් පිටවූ මොරහඬ ඇසූ මගේ පවා සිත උණුවුනා නොවේද? නමුත් දැන් කොහොමද? අද සවස ඈ ඔහු සමග සිනාසෙමින් සුරතල් කරමින් සිටිනවා දුටුවෙමි. චී! ස්ත්‍රීන් ගැන මෝඩයෝ හැර සිහි ඇති කෙනෙක් මුළු විශ්වාසය තබා ගනීද? නමුත් මීනා!!! ඈ ඉතා හොඳ ධෛර්‍යමත් කෙල්ලෙකි. හදිසියෙහි පැහැදීලි කල්පනාව ඇති ක්‍රියාවෙහි දක්‍ෂ තීක්‍ෂණ ඇසක් ඇති එකියෙකි. නමුත් ඈත් ස්ත්‍රීයෙකි, ඇගේ සියළු දක්‍ෂ කම, සිහිය, නුවන පවතින්නේ පිරිමියෙකුගේ අත නමැති ජප යටිය වැදෙන තුරුයි. ඉන්පසු ඈත් දුර්වලවූ අසරණප්‍රාණියකි. මගේ මිත්‍රයාගේ ඉස්කෝලයෙහිදී මම මේ සියල්ල ඇස් දැක ගතිමි. මීනා නොව මීනලා දහසක් නිසා වුවත් මම මින්මතු මගේ ජීවිතයෙහිදී ස්ත්‍රී භාවයට වසඟ නොවෙමි. ඈ මා අදහාගෙන මා පුරුෂයාකොට ගැනීමට බලාපොරොත්තුවෙමින් මෙහි සිටී. ඇගේ අදහස් නිරර්ථක නොකොට ඈ මගේ අනියම් භාර්‍යාවක් ලෙස තබා ගනිමි. ඈ ඊට විරුද්ධව කොඳුරන්ට වුවහොත් ඇගේ පියාගේ

ආගමෙහි පුරුෂයෙකුට ස්ත්‍රීන් කීපදෙනෙකු පාවාගන්ට එපා කර තිබෙනවා දැයි අසමි.

මම ස්ත්‍රීන් කෙරෙහි ආලය නොකරමි. නුමුත් ස්ත්‍රියෙක් නිසා පහසුවෙන් මගේ ජීවිකාව කර ගැන්ම හැකිනම් ඒ ස්ත්‍රිය භාර්‍ය්‍යාව කරගැනිමට අකමැති නොවෙමි. ජුලියා මීනා වගේම ලක්‍ෂණයි. නමුත් මීනාට වඩා සිය ගුණයක් ශීලාචාරයි. ඈ මා ගැන කැමති වෙනවායයි මට කියන්ට බැහැ. නුමුත් මගේ මිත්‍රයා මට ඈ අරන්දෙන්ට පොරොන්දුව සිටිනවා, හා! ජුලියා, මීනා, කොපමණ හොඳද?'' මේ කල්පනා වලින් ඔහුගේ සිත කොපමණ වෙනස් වෙලා තිබෙදැයි පහසුවෙන් පෙණේ.

නුමුත් මීනාගේ සිත ඔහු කෙරෙහිම පැවතිය. දිනෙන් දින ඔහු ගැන තොරතුරු ඈ ගෙයිහිමියා අතින් විමසාදැන ගත්තාය. අන්තිමේදී ඔහුට සම්පූර්ණයෙන් සුවය යන ප්‍රවෘත්තියද ප්‍රීතියෙන් අසන ලදී. ඉන්පසු දවස් කීපයක් ගතවූ නමුත් ඔහු එහි නාවේය. ඈ ගැන ඔහුට මතක නැතිවී සිටීම ඈට පුදුමයක්විය. ඈ නැතිව ජීවිතය අඳුරුය කීයා නැවත නැවතත් ප්‍රකාශ කළ තැනැත්තා, නගරයට විත් මනුෂ්‍යයන් මැද වාසය කරන්ට පටන් ගෙන මාසයක් යන්ට පළමු ඇගේ දුක්ම ඔහුට එතරම් කාරණයක් බව හැඟවීම විශ්වාස කරන්ට බැරි තරම් දෙයක් විය. ඔහුගේ නොපැමිණීම සැක ඉපදීමට කරුණක් බව ඈ සැලකුවාය.

මෙසේ සිටිනවිට එක් දිනෙක ඇගේ සිත වඩ වඩා කැලඹෙන්ට කාරණයෙක් විය. ගෙයි ස්ත්‍රිය සමග ඈ යම්

කටයුත්තක් පිණිස වීථියට ගොස් එන්නී, පෙරමුනෙහි එන රථයක් දුටුවාය. එහි අලන්කාර ලෙස ඇඳුම් පැළඳුම් කළ තරුණ නෝනාවරු දෙදෙනෙක් සහ මහත්වරු දෙදෙනෙක්ද සිටියෝය. ඔව්හු සෙල්ලම් සහිතව ගමන් කරන බව කවට සිනාවෙන් හා සතුටු වචනයෙන් ප්‍රකාශිවිය. රථය ලඟින් යනවිට ''ලූසී, බලාපන් බලාපන්'' කියා එක් කාන්තාවක් කී වචන ඇට ඇසුනි. ඔවුන් සියලු දෙනාගේ ඇස් ඇ දෙසට යොමුකළ බවද පෙණුනි. ඉන් පැකුළුනාවූ ඇ බිම බලාගෙන ගමන් කොට රථය ඈත්වූ පසු හිස ඔසවා, සමාගම්කාරිය දෙස බලා ඒ කවුරුදැයි ඇසුවාය.

''උඹ ඇඳුනුවේ නැද්ද? ඒ අර දෙස්තර සහ උඹේ .....අරයා නොවේද?

ඒ ඇසූ මීනාගේ ඇස් පුදුම ආකාරයෙන් දිලිසෙන්ට විය. ඇගේ සැකය ස්පිර වෙන්ට යන බවද කල්පනාවිය. එහෙත් ඒ ගැන මොකුත් නොහඟවා ඇ ඔවුන් දෙස වඩා නොබැලූ හෙයින් අඳුනාගන්ට බැරිබව කියා ඒ තරුණ ස්ත්‍රීන් දෙදෙනා ගැන විභාග කළාය.

ඔවුන් එහි සනීප ගැනීම පිණිස නැවතී සිටීන මීගමු පලාතේ පොහොසත් ඉඩම් කාරයෙකුගේ දුවනියෙක් සහ ලේලි කෙණෙකුත් බව ඒ ස්ත්‍රිය දැනුම් දුන්නීය.

එදින සහ පසුවදත් ඇගේ ජීවිතයේ කාලකන්නි කොටසයයි මීනා සිතුවාය. ඇගේ දුක්මුසු මුහුනද, අලස ගමනද පැකිලෙන වචනද, ඇසූ දුටු ගෙයී ස්ත්‍රිය, සිතෙහි අනුකම්පා උපදවා නොයෙක් ලෙස සැනසිලි බස් කියා ඇ සනසන්ට උත්සාහ කළාය.

"මීනා උඹේ කණගාටුව මට හැඟෙනවා. උඹට ලෝකය ගැන වැඩි දැනගැම්මක් නැති බැවින් මේ සිදුවීම පුදුමයක් ලෙසත්, දුක් වියයුතු එකක් ලෙසත් පෙනෙනවා පිරිමින්ගේ විදිය, සැම රටවලම ඔහොම තමයි. දහස් ගණන් ගෑනු උන්ගේ වචන විශ්වාසකර, පසුව දුකට පැමිණ තිබේ. දහස් ගණන් ගෑනු උන්ගේ නපුරු දුෂ්ටගති දැන දැනත් උන් සමග වාසය කරති. චපල භාවය තිබෙන්නේ අප අතරෙහියයි උන් අපට දෙස් පවරණ නුමුත්, හරියට බලන කොට එය එසේ නොවන බවත්, උන් තරම් හිතු හිතු අතට හැරෙණ සපීර ගුනයක් නැති ඇයෝ තවත් නොමැති බවත් පෙණේ. උන් අදහාගෙන ඉන්න අප සමාන මෝඩයින් තවත් නැතැයි සමහර විට මට කල්පනාවේ· නමුත් අපි කුමක් කරමුද? සියල්ල ඉවසා දරාගෙන සිටින්ටයි අපට වෙලාතිබෙන්නේ. එක අතකට බලනකොට උඹ මේ ගැන කොහෙත් දුක් ගන්න ඕනෑ නැහැ. ඔය තරම් සිහිමදි අකරුණාවන්ත අයෙකුට උඹ අසුවෙනවාට වඩා මෙහි නිකන් නිදහස්ව ඉඳීම සැපයි. මේ උඹ සිටිය ටික· දවස තුළ උඹ අපේ හිතට කොපමණ අල්ලා තිබෙනවාද කිවොත් මගේ එක් කුස උපන් සහෝදරියෙක් ගැනවත් උඹට වඩා කරුණාවක් මා නොදරණ බව කියන්ට හැකි ඒ නිසා උඹ මෙහි මනාප කාලයක් නැවතී සිටීමට කොහෙත් මැලිවෙන්ට එපා"

මේ අවවාද මීනාට ඇසුන නුමුත් ඇගේ සිතෙහි ඉපදී දුක අතහැර ගන්ට බැරිවිය. ඈ ගැන කී කරුණාවන්ත වචන වලට ස්තුතිකරමින්, ඔවුන්ගේ නිවාසයෙහිදී ඈ ලැබූ සැලකිලි සංග්‍රහ ගැන ඇගේ ජීවිතය තිබෙනතුරු සිහිපත් කරන බව කීවාය.

පසුවද ඇඳිරිවන වෙලාවෙහි ඒ පවුලිස් නම් ධෛර්‍ය්‍ය මත් තරුණයාගේ පැමිණීම මීනාගේ සිත දුක් මදක් සහ නය වීමට කරුණක් විය. එහෙත් ඔහුගේ කනස්සල්ලුවූ, දික්ව ඇකිලී ගියාවූ මුහුනද, කෘෂවී ඇදී පැදී තිබුන ශරී රයද, මලානිකව සුදුපැහැව තිබුන ඇස්ද, දුටුවාවූ ඇ ඔහු වෙතට වහ වහා පැමිණ, ''මේ කුමක්ද, ලෙඩින් හිටලා තිබෙනවා නොවේදැ''යි කීයමින් ඔහු දෙස ඉතා ඕනෑකමි න් බලමින් සිටියාය.

ඇගේ ඇස්වල කඳුලු නැගුන ඇගේ හඬ දුක් වෙග සහිත විය. ඔහු ගැන ඈ තදින් කම්පාවුන බැව් හොඳකාර ඔහුට පෙණුනි.

ඔහු ලෙඩින් නොසිටිය බව ඇට දුක්මුසු භාවයෙන් දැනුන් දුන්නේය. එවෙලෙහි සියල්ල කියා ඔහුගේ සිත සැහැල්ලුකර ගැනිමට කැමැත්තක් ඇතිවිය. නුමුත් ඔහු කල්පනා කරන්ට පටන්ගෙන ''මැ මගේ මිත්‍රයාගේ භාර්‍ය්‍යා ව වෙන්ට නියමවී සිටින ස්ත්‍රිය වේ'' මගේ දුක මමම ඉවසාගෙන සිටිනවා මිස එය දැන් මැට එලිදරව් කිරීම යුතු නොවේ. පසුගිය කාලයෙහි මම කොපමණ බලවත් තරුණයෙක්ව සිටියෙමද? කොපමණ ලක්‍ෂණ ස්ත්‍රියෙකුට නුමුත් මම යටහත් වූයෙමද? ස්ත්‍රින් කෙරෙහි ආශාවෙන් සිටින අනික් තරුණයෝ කොපමණ මෝඩද කියා මම සිත සිතා සිටියා නොවේද? නුමුත් දැන් මේ දුර්වලවූ, එහෙත් නිර්මලවූ, සන්සුන්වූ, මැ මගේ කල්පනා සියල්ල වෙනස් කළා නොවේද? මගේ බලය බිඳ හැරියා නොවේද? වනය හා ප්‍රිතිය උපදවන ස්ථානයක් මට තවත් තිබුනාද? නුමුත් දැන් මා එහි ගියාම සියල්ලම හිස්ව. අඳුරුව, සනාව ආකුලව තිබේ. මගේ ශෞර්‍ය්‍ය ගැන පසුගිය කාලයෙහි මම ප්‍රශංසා ලැබුවා නොවේද? නුමුත් දැන් ඒ ශෞර්‍ය්‍ය

තිබේද? පසුගිය දවසේ මෙයින් පිටත්ව යනවිට, මෑ මගේ ජීවිතයෙන් සහ කල්පනාවෙන් තුරන් කරමියි සිතට ධෛර්‍ය ගත්තෙමි. නුමුත් ශෝභිත් එක දවසක්, එක පැයක් මෑ ගැන නොසිතා මට ඉන්ට පුළුවන්කම තිබුනාද? අනේ! ආලයෙහි ඇති බලවත්කම! කොපමණ ලක්‍ෂණ වුවත්, කොපමණ උගත්කම ඇතිවුවත්, කොපමණ ස්ත්‍රී අංගයෙන් පූර්ණව සිටියත්, සියලුම ස්ත්‍රීන්ට සියලුම පුරුෂයෝ ආලය නොකරති. කාන්දමට යකඩය ඇදෙන්නාක් මෙන් ඒ ඒ ස්වභාවල ස්ත්‍රීන්ට ඒ ඒ ස්වභාවල පුරුෂයෝ ආලයකරති මගේ ආලයත් එසේමයි. නුමුත් එය අයුතු ආලයක් ලෙස ලෝකයා සලකති. එය නැති කර දමන්ට මා ගත් උත්සාහය මා හැර කිසිවෙක් නොදනිති. මගේ ශරීරය නිතරම එයින් දවයි. මගේ සිහිය වීකල කරවයි. එසේ වුවත් ඒ ඒ දුක් උසුලාගෙන ක්‍රමයෙන් කාලය ගතකොට මිය යමි. මගේ මරණය වැඩිකල් යන්ඩ මත්තෙන් පැමිණෙන බව මම දනිමී, නුමුත් මම මිත්‍රධර්මයට කැලලක් නොකරමි. ඇගේ සිත කළඹන්ට කිසිත් නොකරමී.'' යනාදීය සිත සිතා නිශ්ශබ්ද වූයේය.

ඈ ඔහුගේ උත්තරයටත්, ස්වභාවටත්, හෙතුව කුමක් දැයි සිතාගත නොහැකිව පුදුමයට පැමිණ, ''මේ මට සහවන්ට උත්සාහ කරන්නේ මන්ද? මුහුණෙන් සහ ඇහපතෙනුත් ලෙඩින් සිටලා තිබෙන බව මට නොපෙණේද''යි කීය

ඒ ගැන වැඩි දුරටත් යමක් කියනවා වෙනුවට ඔහු මිත්‍රයාගේ කුවාලය සුවදැයි වීචාළේය. ඒ ප්‍රශ්නය හේතු කොට ගෙන ඇගේ ඇසෙහි කඳුළු වඩ වඩා නැගුන. මුහුන කළු පැහැ විය. ඒ දුටු ඔහු තම මිත්‍රයාට තවමත් සුව නැතැයි සිතුවේය. එහෙයින් ඈ ඔහුට සම්පූර්ණයෙන්ම

සුවයයි කී විට ඔහුගේ පුදුමය මහත්විය. ''මිත්‍රයාගේ සුව ය සත්තකින්ම මෑ හට ප්‍රීතිවන්ට කාරණාවෙ. එහෙත් මැගේ මුහුනෙහි අඳුරු ගතිය පැහැදිලි ලෙසම මම දුටු වෙමි. මීට හෙතුව කුමක් විය හැකිදැයි කල්පනා කරන අතර ගෙයි හිමියා ''පවුලිස් උඹ කොයිවෙලාවෙද ආවෙ'' කියා අහගෙන ආයේය.

මීනා ඔවුන්ට කථා කරන්ට හැර එතැනින් සෙමින් නැගිට ගියාය. එහෙයින් ඒ ගෙයි හිමියාගේ පුදුමයත්, දුක් ප්‍රකාශිත මුහුනවත් ඈ හට දකින්ට නොලැබුනේය. ඈ මෙන්ම ඔහුත් තම මිත්‍රයාගේ වෙනස දැක ඔහු ලෙඩින් සිටියේදැයි ඇසුවේය. ඊට පිළිතුරු වශයෙන් අනිකා හිස නමමින් මද සිනාවෙන් යුතුව තුවාලකාරයාගේ, සුව දුක් විචාළේය.

''පවුලිස් ඒ දුෂ්ටයා මතක් කරන්ටවත් වටින්නේ නැහැ. උගෙට ලෙඩ සුවවී කීප දවසක් වන නමුත් තවමත් මෙහි එන්ට බැරිවුනා. අර අනිත් දුෂ්ටයාත් සමග එකතුවී බොමින්, අසරණ ස්ත්‍රීන්ට කෲරකම් කරමින් ඇවිද ඇවිද සිටී. අපේ මේ සහෝදරිය ගැන මට කනගාටුයි. උඹ කොයිවෙලේ ඒදැයි සිත සිතා මම සිටියෙමි.''

මේ ප්‍රවෘත්තිය ඇසූ පවුලිස් කිසි දුකක් නැතිව වැඩි දුරටත් විස්තර වශයෙන් කාරණා දනගෙන හදිසියෙන් අමුතු ප්‍රාණයක් ලද්දෙකු මෙන් තීක්ෂණ බැල්මෙන් හා කඩිසර වචනයෙන් යුතුව, 'මීනා මේ ගැන කිසිත් දන්වා දැයි'' අසා ''නැතැයි'' කීවිට ''එහෙනම් ඈට කිසිවක් කියන්ට එපා'' යයි කියා, ස්වල්පවේලාවක් කල්පනා සහිත ව සිටියේය.

එදින රාත්‍රිය සඳ පහනින් සිත්කලුවිය. මීනා සහ

පවුලිස් මිදුලේ තිබුන විශාල ''නත්නත්'' ගසක සෙවනේ වාඩිගෙන කථාකරමින් සිටියෝය. ගෙයි හිමියා සහ ස්ත්‍රියද නුදුරින් වාඩිගෙන ළමයි දෙදෙනෙක් සමග සෙල්ලමෙහි යෙදී සිටියෝය.

''මීනා, මගේ අසනීපය ගැන මම කිසිවෙකුට කියන්ට හිතාගෙන නොසිටියෙමි. නමුත් උඹ ඔපමණ ඕනෑකමින් අසන නිසා දැන් කියමි. ඒ ඇසූ පසු උඹේ මට යම් කරුණාවක් දැනට තිබෙනම් එය නැතිවී යායයි මට සිතේ. එසේ වුවත් උඹේ කල්පනාව සහ දැනමුතුකම් අසාගන්ට ඕනෑ බැවින් නොකියා බැහැ. පසුගිය කාලයෙහි, හදිසියෙන් මෙන් මම ස්ත්‍රියෙකුට තදින් ආලය කෙළෙමි. ඈට වඩා රූඇති ස්ත්‍රීන් තවත් සිටින බව මම දැනගෙන සිටි නමුත් මගේ ඇසට ඈ සියල්ලටම වඩා උතුම් ලෙස පෙණුනි. ඈ සමග ආශ්‍රයට එළඹ ස්වල්ප දිනකින් මම ඇගේ සිත දිනා ගතිමි. මගේ මුළු වාසනාව ඈ පිට රඳා තිබේයයි මම සිතාගෙන සිටියෙමි. වැඩි කාලයක් යන්ට මත්තෙන් ඈ මගේ භාර්‍ය්‍යාව කරගන්ට සියල්ලම සූදනම් කර ගතිමි. මගේ අවාසනාවට පාපිෂ්ට මිත්‍රයෙකුගේ ආශ්‍රය ඇතිවී මම පාපයට වැටුනෙමි. මම සුරාවෙහි බැඳුනෙමි. අන්‍ය ස්ත්‍රීන් සෙවනය කෙළෙමි.

''මීනා, උඹේ මුහුනෙහි දුක මට පෙණෙනවා. නුමුත් ඇත්ත නොසඟවා කියන්ට මම උත්සාහ කරමි. මගේ ස්වභාව ඉතා යහපත්ය, උතුම්ය කියා උඹ සිතාගෙන සිටින බව මට පෙණේ. නමුත් රහසිගතව පැවති ස්වභාව මේ ආකාරයි'' මෙසේ කාලයක් යන අතර මේ තොරතුරු මගේ ප්‍රිය ස්ත්‍රියගේ කණට වැටී තිබේ. ඈ බැලීමට මම පසු

ගිය දවසේ ගියවිට ඈ මට පෙණෙන්ට පමණවත් නොඇවිත් අප අතරේ ඇතිවූ සියළුම සම්බන්ධකම් ඉවරය කියා පනිවුඩයක් එව්වාය. ඒ ඇසූ මම කණ ගාටුවට පත්ව සිටින විට ඇගේ මව් පැමිණ, කාර ණා විස්තර කරමින් මා ගැන තොරතුරු සියල්ලක්ම ඔවුන්ට ආරංචි බැව් කියා ඉන් පසු එහි නැවතත් නොඑන ලෙස අවවාද කළාය. එතැන් පටන් මගේ දුක ඉවසිය නොහැකි විය. මගේ ලෙඩේ බරපතලකම දැන් උඹටත් පෙනෙනවා ඇති. ඉතින් ඒ ස්ත්‍රිය මා නෙරපූ එක යුතුයයි උඹට කියන්ට පුළුවන්ද?''

ඒ සියල්ල අසා සිටි මීනාගේ කැළඹීම ඉතා මහත්විය. ඔහු එලෙස ක්‍රියා කළේයයි ඈ කවදාවත් විශ්වාස නොකරන බව නැවත නැවතත් සිතින් සිතා ගත්තිය. එහෙත් ඔහුගේ ශරීරය දෙස බැලුවාම ඔහු ගේ ප්‍රවෘත්තිය සැබෑවිය හැකි බැව් සිතුනි. ඔහු කෙ රෙහි කොතෙක් අනුකම්පාව ඇට තිබුනත්, ඔහුගේ අයුතු කම් ගැන සුළුකොට කථා කරන්ට ඈ නො කැමතිවී ඔහුගේ ප්‍රශ්නයට උත්තර දෙමින් ''සත්තකි න්ම ඒ ස්ත්‍රියගේ ක්‍රියාව සාධාරණ බව මමත් කියමි. යම් ස්ත්‍රියෙකු කෙරෙහි යමෙකුගේ සැබෑ ආලය ඇති වූවහොත් ඔහුගේ සිත අනික් ස්ත්‍රීන් කෙරෙහි මොහො තක් කල්වත් නොරඳයි, ඒ ස්ත්‍රියගේ රූපය ඔහුගේ ඇස් ඉදිරියෙහි නිතරම තිබේ. එහෙයින් අනික් ස්ත්‍රීන් ඔහුට නොපෙණිය යුතුයි. පෙණුනත් ඔවුන් කෙරේ ලොල්ව ඇස් හෙලන්ට ලජ්ජාවිය යුතුයි. අනිත් ස්ත්‍රීන් සමග ආශ්‍රය කළ කරුණෙන් ඔප්පුවන්නේ ඔහුගේ ආලය සැබෑ නොවන බවයි. සැබෑ ආලය නැතිව විවාහයකට බැඳෙනවාට වඩා අවිවාහකව සිටීම සැපවේ. එහෙයින් ඒ ස්ත්‍රිය සත්තකින්ම

උතුම් ස්වභාවය ඇති. නිර්මල කල්පනා ඇති පිරිසිදු චරිත යක් ඇති කෙනෙක් විය යුතුයි. එබඳු තැනැත්තියෙකුගේ නොලැබීම මහත් අවාසනාවකි. මහත් දුකට කාරණයක්ය'' යි ඈ ක්‍රමයෙන් ශබ්ද නගමින් කීය.

ඔහුගේ ඇස් ඈ දෙසට නොහෙලාම හිඳ, ''මිනා,මම කළ වැරැද්දට මම දූන් සැබවින්ම කනගාටුවෙමි. මින්මතු මම එබන්දක් නොකරමි. එබඳු පොරොන්දුවක් වුනහොත් ඒ ස්ත්‍රිය මට සමාව දිය යුතු නොවේදැයි දුක්මුසු හඬින් කියේය.

එසේ සමාව දීමෙන් ඒ ස්ත්‍රියගේ අල්ප බුද්ධිය ප්‍රකාශ වේ. පුරුෂයෝ ස්ත්‍රින්ගේ නොකිලිටි භාවය පතන්නාක් මෙන් ස්ත්‍රීහුත් පුරුෂයන්ගේ පිරිසිදු භාවය පැතිය යුතුවෙත් තරුණ ස්ත්‍රියකුගේ අකටයුත්ත ගැන තම ස්වාමියා සමාව නොදෙන්නාක් මෙන්ම පුරුෂයෙකුගේ වැරැද්ද ගැන ස්ත්‍රියද සමාව නොදිය යුතුයි. එසේ දෙපක්ෂයම ක්‍රියා කරන්නම් මේ තරම් දුඃඛිත ප්‍රවෘත්ති අපට අසන්ට නොලැබෙත්. සාමාන්‍ය වශයෙන් ස්ත්‍රියෙක් නියම වනතුරු පුරුෂයෝ වැරදි කරති. නුමුත් නියම වූවායින් පසුත් ඔහු වැරදි කළේ නම් ඔහුට සමාවක් දීම අයුතු වේ. ස්ත්‍රියෙකු සමග විවාහබස් ගිවිස ගැනීම නම් පුරුෂයෙකු විසින් තමාත් සෙසු පුරුෂ කොට්ඨාසයෙන් වෙන්ම, ඈත් සෙසු ස්ත්‍රීන් කොට්ඨාශයෙන් වෙන්කර ගෙන, දෙදෙනම එකිනෙකා හැර අන්‍යයන් සේවනය නොකරන ලෙස තින්දුකරගෙන වෙන්නාවූ ඉතා බැරුරුම් පොරොන්දුවයි. ඉතින් ඒ පොරොන්දුව කඩකළ තැනැත්තාට පසුවන පොරොන්දුත් කඩකිරීම අප

හසු නොවේ. එහෙයින් නිදහස තිබෙන කාලයෙහි ඔහුගෙන් වෙන්වීම සිහි ඇති ස්ත්‍රියෙකුගේ ක්‍රියාවයයි ඈ විස්තර කළාය.

ඇගේ වචන අන්තිම වන්ට මත්තෙන් ඔහු ඇගේ අත ගෙන 'මීනා, මීන්මතු මම, උඹ ජීවත්ව සිටියදී ස්ත්‍රීන්හට අල්ප බුඩීන්ය, ලාමක සත්වයන්ය, කියා අපහාස නොකරමි. දෙස් නොතගමි. අද පටන් මගේ දුක නිවාරණවේ'' කියා ප්‍රීතිමත් සවභාවෙන් සිටියේය.

ඔව්හු එවෙලෙහි සවමීපව එන ගෙයි හිමියා සහ ස්ත්‍රියද දැක එතැනින් නැගිට ඉදිරියට ගමන් කළෝය. එදින ඔවුන් පෙරහැර බලන්ට යාමට තීන්දු කරගෙන තිබුන බැවින් ගෙයි හිමියා කථා කරමින් ඔවුන්ගේ ගමනට කල ය පැමිණි බැව් කීය. තරුණයාගේ දුර්වලකම නිසා ගෙදර නවතින බැව් පළමුවෙන් කියා තිබුණ නමුත් ඔවුන් සමග යාමට ඔහුත් සූදනම් බැව් කී විට ඔවුන්ගේ සතුට දියුණු විය. ගෙයි ස්ත්‍රිය මීනා දෙස යටැසින් බලා මදක් සිනාහ පහළ කළාය. මෙසේ ඔවුන් සතර දෙන සහ ලමයි දෙදෙනත් පිටත්ව නුවර දෙසට ගමන් කළෝය.

පාරෙහි සෙනග ගහනය ක්‍රමයෙන් වැඩිවිය. පත්තිරිප්පුව අසලට වන විට ඉදිරියට ගමන් කිරීම ඉතා අපහසු විය. ගැහැණු, පිරිමි, කුඩාලමයි සියලු දෙනම එක ගොඩෙහි වැදී පනුවන් රැලක් මෙන් එකි නෙකාගේ ඇඟෙහි සැපෙමින්, තල්ලුකරමින්, මිරිකමින්, කොලාහල කරමින් අඩියෙන් අඩිය ඉස්සරහට සෙලවූනාහ.

තරුණයාගේ සහ ගෙයි හිමියාගේ ආධාරයෙන් මීනා සහ අනිත් ස්ත්‍රියද ලමයින්ද, සෙනගින් මදක් බෙරී පෙර

හැර යන පාරේ එක් ගසක් මුලකට පැමිණ, ඒ අවට සිදු වන දේ බලමින් ඉවසිලි වත්තව සිටියෝය.

සියලු දිශාවන් ශබ්දවලින් පිරි තිබුනි. සියලු දිශාවන් ආලෝකයෙන් දිලෙමින් තිබුනි. සියලු ජනයන්ගේ සිත් ප්‍රීතියෙන් පුල පුලා තිබුනි. සියලු ජනයන්ගේ නෙත් එන්නාවූ පෙරහැර දෙසට යොමුවී තිබුනි.

පළමුවෙන් පන්දම් එළිය ගෙන මිනිස්සු සතරදෙනෙකු ආහ. ඔවුන්ට පසු දවුල් නම්මැට්ට ගසමින්, හොරණෑ පිඹිමින් කාණ්ඩයක් ගමන් කෙළේය. ඒ අනුව දෙපාර්ශවයෙහි මිනිසුන් ඇතිව, සියලු හස්ත්‍යාභරණයෙන් සරසන ලද ලොකු ඇත්තු දෙදෙනෙක් වූහ. නැවතත් පන්දම් එළි ගත් මිනිස්සුද, උඩැක්කි ගසමින් නැටුම් ගත් මිනිස්සුද, පිරිවර සෙනඟින් යුත් රදලවරුද, ඇතුන් පෙලක්ද ගමන්කළෝය. මෙසේ කාණ්ඩයෙන් කාණ්ඩය, නා නා සෙල්ලම් වලින්ද නා නා ඇඳුම් පැලඳුමෙන්ද නා නා අලංකාරයෙන්ද පෙළහැර ගමන් කළේය. මිනිසුන්ගේ සිත් ඒ සියල්ලෙහි ඇලී තිබුන හෙයින් අහසෙහි සඳරැස් මැකී, ක්‍රමයෙන් කළු වලාවන් පිරී යනවා නුදුටුවෝය. මුහුදක් ගලන්නාක් මෙන් පෙළහැර සමග සෙනගද ගමන් කළෝය. එහෙයින් හදිසියෙන්ම වාගේ ආවාවූ වැසි කුණාටුවට භයපත්වූ සියලු දෙනාමද ඒ අත ආවරණ සොයමින් දුවන්ට විය. එකිනෙකා තල්ලු කරමින්, පස්සට දමමින්, බනිමින්, සැරකරමින්, කෑ ගසමින්, දුවන්නාවූ ඔවුන්ගේ කොලාහලය ඉතා තදවිය. වැටුනාවූ උන්ගේ කෑ ගැසීමෙන්ද, ලමයින් අත ඇරුණ මවුන්ගේ විලාපයෙන්ද, මවුන් වෙන්වූ ලමයින්ගේ හැඬීමෙන්ද, මහල්ලන්ගේ ඝොෂාවෙන්ද, ස්ත්‍රීන්ගේ මොර දීමෙන්ද අහස් කුසය පිරී ගියේය.

මීනා මිරිකීමෙන් මදක් නිදහස්ව වට පිට බැලූ විට

ඇගේ යමාගමකාරයන් එක්කෙනෙක්වත් එහි නොසිටි බව දැක, භයපත්ව ඒ ඒ අත බලන්නී, ළඟ සිටි මධ්‍යම වයස් ස්ත්‍රියෙකු දැක ඇගේ තුරුල්ලට වූවාය. ඒ ස්ත්‍රිය ඈ කෙරෙහි අනුකම්පාවෙන් මෙන් බලා "උඹේ තාණ්ඩය මග ඇරිලා දූයි" අසා අත අල්වාගෙන ගමන් කළාය. වැඩිදුර යන්ට මත්තෙන් මිනුසුන් අතුරෙන් තද වෙවී විත් ඈ අඳුනන දෙස්තර ඉදිරියට පැමිණ වචන ස්වල්පයකින් සියලු තොර තුරු අසා දැන ඇගේ භය දුරුකර, ඇගේ මිත්‍රයන් වෙතට ඇරලන්ට පොරොන්දු වූයේය. ඉන්පසු ඈ සමග ස්වල්ප වේලාවක් ගමන්කොට සෙනඟින් තුරන්ව, අසල තිබී රථ යකට කථාකොට නැන්ගේය.

එවේලෙහි වර්ෂාව වසින්ටවිය, අහසද වඩ වඩා කළුවර විය. ටික වේලාවකට පසු මිනිසුන් ගෙන් ගහනව තිබී ස්ථාන සිස්ව නිශ්ශබ්දව තිබුනි. විටින් විට ගැසූ විදුලි හෙ ළියෙන් ගස්යට, කඩපිල්වල, වැසිකඩෙන් මිරිකෙමින් සිටි යාවූ මිනිසුන් දකින්ට ලැබුනි. වීථි සමූහය පසු කරමින් යන්නේ අන්ධකාරය සහ වැසිද වැඩිවෙන්ට වෙන්ට රථ යේ ගමනද වැඩිවිය.

මීනා ස්වල්ප වේලාවක් සිට, රථය යන සීඝ්‍ර ගමනේ හැටියට ගෙදරට පැමිණෙන්ට කාලයයි සිතා ඇගේ සමාග මකාරයාට ඒ බැව කී කළ, ඔහු අන්ධකාරය දෙසට එබෙ මින්, තව ටිකක් දුර බවත්, තුෂ්ණිම්භූතව ඔවුන් ආ හෙ යින් ගමන බොහෝ දුර ලෙස පෙණෙන බවත් කියාකථා වට පටන් ගත්තේය "මගේ මිත්‍රයාගේ කණටන් උඹලා ගේ පසුගිය කැල්ල ඇසුවෙමි. ඒ වනයේදී උඹලාගේ ජීවි තය කොපමණ සතුටු දයකව තිබෙන්ට ඇද්ද? නොයෙක් දෙසින් ගලා බසින ගංගා ඇලි දෙලවල වතුර බොමින්

නොයෙක් මිහිරි නාදයෙන් සින්දු කියන පක්ෂීන්ගේ හඬ අසමින්, අඹ රස් ආදියෙන් නොමිරිකී ගස් සෙවනේ සැත පෙමින්, අඹ දඹ හෝ පළු ආදී ගස් අතුරෙන් එන සීත සුලං ආශ්‍රය කරමින්. අඃ! උඹලාගේ කාලය කොපමණ ප්‍රිතියෙන් තිබෙන්ට ඇද්ද?

මෙසේ පසුගිය කැල්ල සිහිවූ ඇට දුන් පැමිණි දුක් ඉතා දරුණු ලෙස වැටහිය. නගරවල වාසයෙහි ඇති කර දරය ඇගේ සිතට හොඳාකාරම පැහැදිලි විය. ඇ නැවතත් වනයට යන්නේ කවදද්දැයි සිතා සුසුම්ලා, ඔහුට උත්තර වශයෙන් ඔවුන්ගේ ඒ කාලය එතරම් ප්‍රිතිමත් නුවූ බවත් කෑම හානියෙන් මිරිකෙනවිට සහ වන මෘගයන්ට භයෙන් ගුළි ගැසෙන විට එකී සැප සියල්ලම ගැන නොසිතෙන බවත් කීය.

"සැබෑ තමයි, නමුත් කෑමත් ඇතිව, සතුන්ගෙන් භය නැතිවෙන්ට ආංපන්නත් ඇතිව, සිටින විට වනය හා ප්‍රිතිය දෙන ස්ථානයක් නැතිමයි. උඹලා නැවතත් වනයේ පදිංචි වුනාම, මමත් එහි ටික දවසක් නැවතිමට එන්ට මගේ මිත්‍රයා සමග පොරොන්දු වුනෙමි.

ඔහුගේ ඒ වචන ඇසූ සැටියේ ඒ ගැන ඇගේ සතුට ප්‍රකාශ කරාවියයි ඔහු බලාපොරොත්තු වුනේය. නමුත් ඇ තුෂ්නිම්භූතව සිටිනවා දැක, ඔහු තරහෙන් මෙන් තොල විකා ගත්තේය. ඔහු ආශ්‍රය කරන සීලාචාරයයි පෙන්වන ස්ත්‍රියෙක් නම් ඔහුගේ අහන්කාරය දීසුනු කරන බොරු බස් කියනවා සත්තකයි. නමුත් ඇට එක විදියක් සිතා

එක විදියක් ප්‍රකාශ කරන සිලාචාර කපටි කම් පුරුදුව නොතිබුනේය. එහෙයින් ඔහුට ලැබුන පහර ඉවසාගන මිත්‍රයාගැන කථා කරන්ට වූයේය. තුමුත් ඒවෙලෙහි රථය නවතනවා දැක ඔහු වට පිට බැලුයේය. හාත්පසින්ම අන්ධකාරය බැවින් ඒ කොතැන්හිදැයි ඇට දැන ගන්ට බැරිවිය. ගෙදරට පැමිණියායයි සිතා ඇ වැස්සේම ඔහු සමග රථයෙන් බැස ගොස් ගෙට ගොඩ නැග්ගාය. එහි දෙර හරින්වත් පළමු රථය ගමන් කරන ශබ්දය කණට වැටී ආ පසු ඔහු යන්නේ නැද්දැයි ඇසූ විට, වැසි පැවුවායින් පසු ඔහුට යන්ට හැකි බව කිය. දෙර හැරිය විට ඇගේ පුදුමයට එය ඇ සිටින ගෙදර නොවන බව පෙණුනි. එහි මේසයක්, පුටු තුණ හතරක් සහ සෝපාවක්ද හැර වෙන කිසි බඩුවක් නැතිබව එක බැල්මෙන් ඇට පෙණුනි. මේසයෙහි සූදනම් කරන ලද කෑම පිඟන් කීපයක්ද තිබුනි. එහි ඇතුල් වූ දෙස්තර ගේවත්, දෙර හැරි වැඩකරුගේවත් මුහුනෙහි පුදුමයක්වත්, නොහැදුනුම් කමක්වත් නොපෙණීම ඇගේ සිතට භය උපදවීමට කරුණක් විය.

එහෙත් ඇ කිසි චකිතයක් නැතිව කථා කරමින් "මහත්මයා මේ අප ඇවිත් සිටින්නේ කාගෙදෝ ගෙදරකට නොවේදැයි" කිය. ඔහු ඒ අසා සිනාසෙමින් වැඩකරුවාට දෙර වසා යන්ටයයි නියෝගකොට, පුටුවක් ඇද ඇට වාඩිගන්ට කීයේය. ඇ එසේ කොට, ඔහුගේ අදහස කුමක් දෝහෝයි පරීක්ෂාකරන පිණිස තුෂ්ණිම්භූත වූවාය. ඔහු කථාකරමින් "ඉතින් මේ ගෙදර මගේ බව පළමුවෙන් මම කියමි. උඹ ගෙනාවේ මක්නිසා දැයි කියා ඊළඟට උඹ ප්‍රශ්න කරනවා ඇති. ඒකටත් උත්තර දීමට මම ලෑස්තියි" කියා අනික් පුටුව ඇද ඇ ඉදිරියෙන් වාඩිවුයේය.

ඔහුගේ කට කෙළවරෙහි සිනාව තිබුනි. ඇස්හි කපටි භාවයද ඇඳී තිබුනි. එහෙත් පිටස්තර වශයෙන් බලන කළ කෲර ගතිය ඔහු තුළ පිහිටි අංගයක් නොවන ලෙස පෙණුනි. මේසයෙහි ලෑස්තිව තිබූ කෑම දෙස බැලීමෙන් ඇගේ සිතට අමුතු කල්පනාවක් ඇති වූ බව ඇ කී වචන වලින් පෙණේ.

''මහත්මයාගෙනි ඒ දෙවෙනි ප්‍රශ්නය අසන්ට ඕනෑ නොකරයි. මට එය හෙඳාකාර තේරුම්ගන්ට කාරණා තිබේ. මහත්මයා පෙළහැර බලන්ට යද්දී කෑම නොකා ගොස් තිබේ. මගේ මිත්‍රයන් වැසී නවතින තුරු මුවාවකට වී ඇති බවත්, මා ඇරලන්ට මෙහි නොඇවිත් එහි ගියත් ඔවුන් එනතුරු බොහෝ වෙලා මහත්මයාට නවතින්ට වන බවත් කල්පනාකර, ඒ අතරතුර කාලය මහත්මයාගේ ආහාර ගැනීමට යෙදීම නුවනට හුරු බව සිතා මෙහි මාත් රැගෙන ආ බව මට පෙනේ.''

ඈ කිසි බියක් නොමැතිව ඒ කී වචන ගැන පුදුමයට පත්වෙමින්, ඇගේ අදහස වැරදි බව පසුව පෙන්වන්ට සිත ට ගෙන, ඔහු සිනහ පහළ කරමින්, මන්ත්‍රානුභාවයකින් ඒ සියල්ල දැනගත්තාදැයි අසා, කෑම කන්ට ලෑස්තිව ඇට ත් කෑමට ආරාධනා කෙළේය. ඈ එය ප්‍රතික්ෂේපකළ කල්හි, ඔහු කාමරයක් හැර බෝතලයක් සහ විස්කෝතු පෙට්ටියක් ගෙනැවිත්, පිළිගැන්නුවේය. ඔහුගේ කරුණාව න්තකම තව දුරටත් ඉවතලන්ට නොහැකිව ඈ විස්කෝතු වක් කා වැයින් ටිකක් ගත්තාය.

'සංග්‍රහයට ගොස් බඩ ගින්නේ ඉන්ට එපාය'' කියා ඈ කී වචන පිළිගෙන ඔහු ආහාර කන්ට පටන් ගත්තේය. ඒ අතර තුර කාලය ඈ කල්පනා සහිතව වට පිට බැලුවාය. ගෙයි තිබුනේ කාමර දෙකක් බවත්, ඉන් එකක ලොකු ලී ඇඳක් ඇතිරිලා සරසා තිබුන බැවින් එය ඔහුගේ නිද ගන්නා කාමරය බවත් ඇට සිතුනේය. අනිත් කාමරය සමහර විට ඔහුගේ මිත්‍රයාට භාර බවත්, එය වසා තිබුන හෙයින් ඔහු තවමත් ගෙදරට එන්ට නැති බවත් ඇට වැඩි දුරටත් සිතුනේය.

දෙස්තර විගසින් කෑම කා ඉවරව, නැවතත් ඈ ළඟට පුටුව ගෙන වාඩිවී, ඉතින් උඹ මෙපමණ වෙලා මෙහි ඇවිත් සිටිය නමුත් උඹේ සහ මගේ විත්‍රයා ගැන වචනයක්වත් කථා නොකළා මට පුදුමයකි. ඔහු සමහර

විට මේ මොහොතෙහිදී උඹ ගැන සිහිනෙන් සිතා සිතා ඉන් නවා ඇතැයි කීය.

''හැබැහින් නොසිතන අය සිහිනෙන් සිතායයි විශ්වාස කිරීම අපහසුය''යි ඈ නිශ්චල ලෙස කීවාය.

එසේ කීමට කාරණා කවරේදැයි ඇසූවිට ලෙඩ සුවවී එපමණ දවස් ගතවූ නමුත් ඔහු ඈ බලන්ට තේම ඈ ගැන ඔහු සිහි නොකරන බවට සාක්ෂියයි කීය.

ඔහු ඈ දෙස ඉතා දුක්මුසු ලීලාවෙන් මෙන් බලා ''උඹට එහෙනම් ඔහු ගැන තවමත් ආරංචිවෙලා නැද්දැයි'' අසා ඇගේ පුදුමය ප්‍රකාශවුන මුහුන දෙස බලා මෙසේ කීය.

''මගේ මිත්‍රයාට සුවවී යමතම සක්මන් කරන්ට පුළු වන්වූ කාලයෙහිදී ඔහු අල්ලන්ට වරන්තුවක් පිටවුන බව අසා, මම ඔහුට ගෙදරින් පිට යන්ට එපාය කියා අවවාද කෙළෙමි. එහෙයින් ඔහු කිසි තැනක නොගොසින් මෙහි ම සිටියේය. නමුත් ඔහු ගැන ආර චිය දැනගත් පොලිසිය ඊයේ සවස කොස්තාපල්වරු දෙදෙනෙක් එවා ඔහු සිර භාරයට ගත්තේය. ඔහු පිට පවරා තිබෙන වරද උඹේ පියාට අඩන්තේට්ටම් කිරීම සහ බලහත්කාරයෙන් උඹ සහවාගෙන ගිය එකත්ය.

ඒ ප්‍රවෘත්තිය ඇසූ ඇගේ සිතව ඇතිවූ දුඃඛ වේදනාව දැරිය නොහැකි තරම්විය. ඒ නගා තිබූ දෝස දෙක ගැනම ඔහු වරදකාරයා නොවන බව ඈ හොඳාකාර දන්නා බවත්, ඇගේ සාක්ෂිය ඔහුගේ නිදහසට ප්‍රමාණයයි සිතූ බවත් ඇගේ වචනවලින් පෙණේ. ''මහත්මයා, මා සිටියදී ඔහුට ඒ වරද ගැන දඬුවම් ලබන්ට ඉඩ නොදෙමි. මම උසාවිය ඉදි රියට ගොස් සිදුවූ සියල්ල කීවාම ඔහු නිදහස් කරණවාට සත්තකයි.''

''නඩු මාර්ගය ගැන උඹ නොදන්න නිසා ඔහොම ලෙහෙසියෙන් බේරෙන්ට හැකියයි සිතන නමුත් දන්න අයගේ කල්පනාව ඔයිට වෙනසිය''යි ඔහු කීයේය.

''සත්තකටම, මහත්මයා මිත්‍රයා වෙනුවෙන්, කරන්ට යමක් තිබේද, ඒ කරාවියයි මම විශ්වාස කරමි''යි ඈ ඉතා මෘදු ලීලාවෙන් කීය.

ඔහුගේ කාම සහගත බැල්ම ඈ කෙරේ හෙලා මො හොතක් නිශ්ශබ්දව සිට පසුව බීම ටිකක් වක්කර බී 'හොඳයි' ඒ සියලුම බර මම කරට් ගෙන ඔහු මුදු දෙන් ට බලඟඳ උඹ මා සතුටු කරන්ට සතුටු වන්නෙහිදැ' යි ඇගේ සමීපයට එලඹ උරෙහි අත ගසමින් ඇසිය.

ඇගේ සිත ඒ වචන වලින් කම්පාවිය. ආදරවන්තයා ගැල්වීම පිණිස ඇගේ ජීවිතය පූදන්ට කියේනම් ප්‍රීතියෙන් ම ඒ කළ හැකි බව ඈ සිතීය. නමුත් ඇගේ නම්බුව පරිත්‍යාගකොට, ඔහු ගැලවීමට ඈ පසුබට විය. කලන්ක රහිතව ඔහුට භාරදීමට තිබෙන එකම වස්තුව ඇගේ යවු වන භාවය බවත් ඔහු සිරයේ සිටවත් යම් කලෙක ඇවිත් ඉල්ලුවහොත් එය භාරදීමට ඈ සූදනම්ව සිටිය යුතු බවත් කල්පනාකොට සිත ස්ථිර කරගෙන, ''මහත්මයාගේ මිත්‍රයා කෙරෙහි මා දරණ ප්‍රෙමයේ ප්‍රමාණය පරීක්ෂාකර බලන්ට හදන්නේද? එසේනම් මහත්මයා වෙහෙස දරන්නේ කුමට දැ''යි ඈ පැවසුවාය.

ඒ අසා ඔහු නැවතත් බීම වීදුරුවක් බොමින්, ඈ වෙතට කිට්ටුවී ''උඹේ ප්‍රේමය අඩුව හෝ වැඩිව හෝ ඔ හුට තිබුනා හෝ නොතිබුනා හෝ මට එයින් ඇති එලය කුමක්ද? මගේ මහන්සිය බලන්ට උඹ සතුටුද නැද්ද යන වග දනගැන්ම පමණක් දැන් මට ඕනැ කරයි. ඊට උඹේ උත්තරය කුමක්දැ''යි වේගවත්ව ඇසුවේය.

සර්පයෙකු වෙතින් භයෙන් ඉවත්වන්නේ කෙලෙසද? එලෙසම ඈ ඔහුගේ අත කිට්ටුවෙන් දුරවූවාය. ඔහුගේ ඇසෙහි තිබුන රෞද්‍රවූ, කැලඹුනාවූ ස්වභාව දැක, වැඩිවෙ ලා නිරුපද්‍රව සිටීම ඇට නොලැබෙන බව කල්පනාවී වට පිට බැලුවාය. දෙරවල් සියල්ලම වසා තිබුන බව පෙණි, උපායෙන්ම ගැලවෙන්ට සිතා යාඥවන ලීලාවෙන් කියන්නී

''මහත්මයා මෙසේ කියන්නේ මන්ද? මම අසරණ දිළිඳු ස්ත්‍රියක් වෙමි. මව් පියන්ගෙන් වෙන්ව, නෑදෑ මිත්‍රයෙක් නැතිව, යන එන මං නොදන සිටින මට ඇත්තේ මගේ ආදරවන්ත ඔහුගේ සරණ පමණක් නොවේද? ඉතින් ඔහුට අන්තරාය පැමිණෙන්ට හරිනවාය යන වචන ඇසීමෙන් මගේ ලය පැලී මැරෙන්ට හැකි නොවේද? අනේ, මහත් මයා මේ කරන්නේ කවට කමය, ඔහු මුදා මට භාරදෙන වාය කියා මගේ සිත සනසා දැම්මොත් මහත්මයාට පින් අයිති වෙනවා නොවේදැයි, ඇසුවන්ගේ ලය කම්පාවන ලෙස දුක් වේගයෙන් යුතු හඬ නගා කීය.

හඬෙන්ද ලීලාවෙන්ද, පරීක්ෂාකර බලන්නාහට ඇ දක්ෂ වූ නාටිකාවගේ ස්වභාවය ඉසිලීය. සාමාන්‍ය මනුෂ්‍ය ගුණ ය දරණ පුරුෂයෙක් හට එවේලෙහි ඇ ගැන එකහෙලා අනුකම්පා උපදනේය. නමුත් ඔහු සාමාන්‍ය නොවීය. කාලයක් වෙලේ පටන් අනුන්ගේ දුක් නොතකා කාමයෙ හි ගැලී සිටි හෙයින් කාමාසා සන්සිඳුවා ගැනීම ඔහුගේ පරමාංගයව තිබුනි. එහෙයින් කිසි උණුවීමක් නැතිව ඔහු මෙසේ කීය.

''උඹ මෙතරම් දුක් සහිත බස් කියන්නේ කුමටද? උඹේ ආදරවන්තයා සමග ප්‍රිතියෙන් සිටින්ට සියල්ල සූදා නම් කරදීමට මම පොරොන්දු වෙමි. උඹේ ස්ථානයේ සිටි න වෙන කිසි ස්ත්‍රියෙක් මෙතරම් දුක් සිතට ගන්නේ නැහැ. මගේ සතුට ඇතිවූ විට උඹෙ මුළු ජීවිතය සැප ද යක වේ. නැතහොත් උඹට පැමිණෙන කාලකණ්නිකම උඹේ මුරන්ඩුකම නිසාකයි සිතා ගනින්''

ඒ ඇසූ ඇගේ සිත ඉතා අධෛයථ්‍යවිය. ඔහු කෙරේ පහළවූ පිළිකුල් භාවය ඇගේ ඇස් වලින් ප්‍රකාශවිය. කැළ඼ ඹූනාවූ ඇගේ ලය ක්ෂණයක් පාසා උස් පහත් විය. වේග වත්වූ ශරීරය තදින් වෙව්ලන්ට විය. ඒ සියල්ල ඉතා ඕනෑ කමින් බලා සිටි ඔහුගේ ආසාව වඩ වඩා දියුණු විය. දුක් වේදනාවෙන් මැලවී තිබෙන විටද, කෝපයෙන් රෞද්‍රව තිබෙන විටද ප්‍රිතියෙන් උත්සන්නව තිබෙන විටද ඇගේ

මුහුන, එකාකාරවම දුටුවන්ගේ සිත් උමතුකරවන, අන්‍ය ස්ත්‍රීන්ට නොමැත්තාවූ, විශිෂ්ටාලංකාරයක් දැරුවේය. එහෙයින් කවර උපායෙන් නමුත් ඈ ඔහුගේ වසහයට ගන්ට සිතාගෙන ඇගේ සිත සහනය කොට තමා කෙරෙහි සතුටු කරවා ගන්ට තුමක් කිය යුතු දැයි සිතුයේය.

ඇගේ සිත වැඩිදුරටත් නවතාගත නොහැකිව ඈ ඔහු දෙස බලා, මහත්මයා කළ යෝජනාව ඉතා තුච්ජවේ. නින්දිතවේ. එබඳු යෝජනාවලට නැමීමෙන් මහත්මයා සහ මහත්මයාගේ පක්ෂයේ අය අප පක්ෂයට, අස්ථිරය, පාපයට බැඳෙන සුළුය, මන්ද බුද්ධිය, යන දෙස් පවරති. අප පක්ෂය මෘදු ගුණයෙන් යුත් බැව් සැබෑයි. එහෙසින් කිසි වෙකුගේ සිත රිදවන්ට කැමති නොවේ. ඒ යහපත් ගුණාංගය නිසා පුරුෂයන්ට ඔවුන් නමා ගැනීම දුෂ්තර නොවේ. පසුව එබඳු යහපත් ගුණාංගයක් දරණ පක්ෂය දුෂ්ටය, ඒ ගුණාංගය කපටී කමින් හා කෲර කමින් තමන්ගේ වාසියට හරවාගෙන තුච්ජ ක්‍රියාකරන පුරුෂ පක්ෂය උතුමය යන ප්‍රවෘත්තිය පහළ වේ මේකාරණා මට වැටහෙන හෙයින් මම අනිත් ස්ත්‍රීන් මෙන් ක්‍රියා කරන්ට සතුටු නොවෙමි. මගේ ආදරවන්ත ඔහු අන්‍ය ස්ත්‍රියකගේ ශෙස්වනයට එළඹියා මගේ ඇස්වලින් දුටුයෙමද, හෙවත් එය සැබෑ බවට විශ්වාස කරන්ට සුදුසු සාක්ෂි ලැබුයෙමද, එවිට මගේ සිත අන්‍ය පුරුෂයෙක් කෙරේ හරවනවා විනා, නැතිව මගේ දිවි තියෙනතුරු ඔහුට වෙනස්වූ යමක් නොකරමියි ස්ථිර හඬින් කීවාය.

එබඳු ප්‍රඥාගොචර වචනයන් ඇගේ මුඛයෙන් පිටවේ යයි කිසි කලකත් නොසිතූ ඔහු ඈ කෙරේ වඩ වඩා ඇලුම විය. රූප ලක්ෂණය හා මනා සිහි බුද්ධිය යන දෙකම සංසර්ගව තිබෙනවා දකින්ට ලැබීම දුර්ලභවේ. එහෙයින් ඈ අයිතිකර ගැනීමට ප්‍රාර්ථනාකරන්නාවූ ඔහුට මිත්‍රධර්මය සත්‍යතාවය, අවංක ගතිය, යනාදී උතුම් මනුෂ්‍ය ගුණයන් නොපෙණී ගොස්, ඇගේ අලංකාර මුහුන දෙසම බලා ''මෙහෙ දයි, උඹේ ආදරවන්තයා උඹට වෙනසක් කරන බව පෙන්නුවහොත් උඹ මා සමඟ වාසය කරන්ට කැමති වන්නෙහි දැයි'' ඇසීය

එබඳු දෙයක් විශ්වාස නොකරන බව කියමින් ඇ හිස සැලුවාය.

උඹෙම ඇස් වලින් දුටුවොත් විශ්වාස නොකරන්නෙහිද?''

''එතකොට විශ්වාස කරමි.'' ඒ දකිනතුරු මම කිසි වෙකුට පොරොන්දු නොවෙමියි'' ඇ කීය. එබස් අසා නැව තත් බිම වීදුරුවක් බී. ඔහු කාමරය තුළට ගොස් බලා ඇට එහි එන ලෙස සංඥා කළේය.

ඔහු ගැන වැඩි විශ්වාසයක් නැති ඇ ඊට කිකරු නො වූවාය. ඒ දැක ඔහු ඇ සමීපයට නැවතත් විත්, ''උඹේ ඇස්වලින්ම ඔහු සිටින සැටි දකින්ට සලස්වමි. ඇවිත් බලා පන්නැ''යි සෙමින් කීය.

ඇගේ පුදුමය වඩා ගැඹුරු විය. එතෙක් කල් සිරභාර යේ සිටින බව කියා කර, දැන් එහි සිටිනවාය කියා හැගවූ ඔහුගේ ප්‍රවෘත්තිය විශ්වාසකිරීමට ඇ මැලිවූවාය. ඇගේ ප්‍රමාදය දුටු ඔහු නැවතත් කාමරයට ඇතුල්ව, ඇතුලෙන් තිබ් දෙරක් හැරියේය. ඒ ශබ්දය අසා සැක සහිත සිතිවිල් ලෙන් කැලඹුනාවූ ඇ සොරෙකු මෙන් ඇඟිලි තුඩින් ගොස්, කාමරයට නොඇතුල්ව දෙර ළඟ සිට ඇතුලට එබුනාය ඒ කාමරයේ සිට අනිත් කාමරයට ඇතුල් දෙරක් තිබෙන බව ඇ දුටුවාය. එවේලෙහි ඒ කාමරය ආලෝකයෙන් පිරී ගිය හෙයින් එහි සියල්ල ඇට මනාසේ දැක ගන්ට පිළි වන් විය. දෙර ඉදිරියෙහි තබන ලද ඇඳක ඇගේ ආදරවන් තයාද ඔහුගේ පාර්ශවයෙන් ස්ත්‍රියෙක්ද නිදගෙන සිටියෝය.

දෙස්තරගේ අඩි ශබ්දයටවත්, දෙර හැරි ශබ්දයටවත් ඔවුන්ගේ නොපිබිදීම බීමත්කම නිසා තද නින්දෙහි සිටි බැවින් වියහැකියයි ඇ සිතුවාය. එහි පාර්ශවයක මේසයක් උඩ තුබුන බීම බෝතලයකින් සහ වීදුරු කීපයකින් ඇගේ ඒ කල්පනාව සපීර විය. ක්ෂණයකින් ඒ සියල්ල දැක, ඇ නැවතත් වාඩිගෙන කිසිත් නොදත් එකියෙක් මෙන් සිටින

විට දෙස්තර ඇතුළෙන් විත් "අද රෑ අපේ යාළුවා වැඩිපුර සූරු අරන් තිබේ. ගොහින් උඹේ ඇස් දෙකින්ම බලා-පන්නෑ" යි කීයේය.

ඇගේ පුදුමය නැවතත් පෙන්නා මහත්මයා දුන් ස්වල්ප වේලාවකට පළමු ඔහු සිරබාරේ සිටින බව කියා දුන් ඔහු මෙහි සිටින බව කීම සත්තකින්ම මට පුදුමයකි. මහත්මයාගේ ඉස්සර කියමන හෝ පසු කියමන සැබෑ විය යුතුයි. අනික බොරුවිය යුතුයි. එයින් මහත්මයාගේ වචන ඇදහීමට මම සූදානම් නොවෙමි. ඒ කෙසේ වෙතත් රාත්‍රි-යෙහි මේ වෙලාවට තරුණයන්ගේ කාමරවලට ගොස්, ඔවුන් කියන කරන දේ බලන්ට යාම, තරුණියෙකුට සැහේ යයි මට නොසිතෙන බැවින් දුන් ඒ ගැන විභාග කිරීමට මම සතුටු නොවෙමි" යි කීවාය.

ඇගේ නිශ්චල භාවය ගැන ඔහුගේ පුදුමය ඇති විය. වෙන ස්ත්‍රියෙකු නම් ඊර්ෂ්‍යා සහගත චිත්තයෙන් එබඳු දෙයක් ඇසින් දැකගන්ට ආසාවෙන් එක විටම දුවන බවත්, සියලු දෙයින්ම ඇ වෙන ස්ත්‍රීන් මෙන් නොවන බවත් ඔහුට සිතිගියේය. එබැවින් ඇ ඔහු වසමේ තබා ගැනීමට වඩ වඩා ආශාව ඇතිව එදින රාත්‍රියෙහිම, ඇට එයින් පිටවී යා නොදී ඔහුගේ ස්වාමිභාවය පිහිටුවාගන්ට තදින් සිතට ගත්තේය.

"උඹ ඔහු ගැන සිතාගෙන සිටි අන්දම වැරදි බව මම පෙන්වන්ට සූදානම් වුනෙමි. නමුත් ඒ බලන්ට උඹේ සතුටක් නැතැයි" යි ඔහු කීයේය.

"සත්තකින්ම මගේ සතුටක් නෑ මහත්මයා ඔහු මෙහි ගෙනැවිත් ඔහුගේ ලෙඩ සුව කළා සැබැයි, නමුත් ඊට වැඩි බරපතළ ලෙඩ සාද තිබෙන බවත් ඔය වචන වලින් පෙණේ. මේ මහත්මයාගේ ගේ යයි මම විශ්වාස කරමි. මෙහිදී ඔහුට බීම සපයා දුන්නේ කව්ද? බොන්ට ඉඩ දුන්නේ කව්ද? ලාමක ස්ත්‍රීන් ඔහු අතට පාවා දුන්නේ කව්ද? ඔහු බීමත් කමට, කාමුක කමට, මුලාවට දැමමේ

කවුද? මහත්මයා නොවේද? ඉතින් මහත්මයා ඔහුගේ මිත්‍ර-යෙක්ය කියා කියන්නේ කොහොමද? ඒ බැලීමෙන් මහත්මයා ගැනත්, ඔහු ගැනත් මට පිළිකුල් භාවය උපදිනවා නොවේද? මුළු පුරුෂ පක්ෂය ගැනම මගේ සිත දූෂ්‍ය වෙනවා නොවේද? එහෙයින් මම එය බැලීමට පිය නොවෙමි. මහත්මයාගේ වචන බොරුයයි විශ්වාස කිරීමට කැමැති වෙමි'' යි ඈ නොපැකිල හිඳ පැහැදිලි ශබ්දයෙන් කීය. ඇගේ දෙෂාරෝපනය සාධාරණ බව ඔහුට පෙණී ගියේය. සියල්ලටම මුල් වූයේ ඔහුය. මිත්‍රයාගේ සිත ඈ කෙරෙන් හරවන්ට ඔහු සුරාවෙහි යෙදුවේය. ස්ත්‍රී ධූර්ත යෙහි යෙදුවේය. එහෙයින් ඔහු ගැන ඇට සතුටුවන්ට කාරණා නැති බව සහ කථාකර දිනාගැනීමට ඈ වෙන ස්ත්‍රීන් මෙන් ලාමක නොවන බවත් සිතා ප්‍රියෝගයෙන් දිනන්ට සැදුවේය. ඇසිල්ලකදී ලඟ තිබුනු වීදුරුවකට ඔහු අතේ තිබී කුඩු ටිකක් හෙලා, බෝතලය ගෙන වැයින් පුරවා, අනික් වීදුරුවෙන් එසේම පුරවා ඇගේ අතට එකක් දෙමින්, අනික ලඟට ගනිමින්, මෙසේ කීය. ''හොඳයි මගේ කීම විශ්වාස කරන්ට එපා. නුමුත් මින් මතු මිත්‍රයා ගැන විශ්වාසය කඩකිරීමට කාරණා ඇති වුවහොත් මගේ බස්වලට ඇහුම්කන් දෙනවාද?''

ඈ ඊට උත්තර දෙමින් ''ඒ ගැන කථා කරන්ට තව කාලය තිබේ. ඉතින් දැන් අපි ඕනෑවටත් වැඩි වෙලා මෙහි නැවතුනා නොවේදැයි කියා හදිසියෙන්ම ඇහුන්කන් දෙමින් ''කව්දෝ දොරට ගසනවා වගේ ඇසුනා නොවේද'' යි ඇසීය.

ඔහු නැගිට වහාම දොර ලඟට ගොස් කන්දී අහගෙන සිට පසුව වැඩකරුවාට කථාකොට කිසිවෙක් එහි නා බව අසා, හැරී ඇවිත් වීදුරුව අතට ගෙන බොමින්, ඈත් එසේ කරනවා සිනා සහිත මුහුනින් යුතුව බලමින්, කියන්නේ උඹ මගේ මිත්‍රයාට අසුවුන විට උඹේ කාලය සැපදායක වේයයි මම නොකියමි. ඔහුට රක්ෂාවක් නොමැතියි. ආදායමකුත් නො-ලැබේ. ඉතින් ඔහු උඹට කෑම බීම, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම් දෙන්නේ කොහොමද? නමුත් උඹ මට ඇහුන්කන්

දෙනවා නම් ඒ සියල්ල පහසුවෙන් ලබාගත හැකි වේ'' යයි කියේය.

ඔහුගේ වචන අවසාන වෙන්ටත් පළමු ඇගේ ඇස් නිදිබර කමින් පියවෙන්නාක් මෙන් වුනා දැක, අදහස මෙන් සියල්ල සිදුවීයයි ප්‍රීතියට පත්ව, ඈට කරකැවිල්ලක් වගේ යයි කියා මේසයට හිස ගසා ගත්තාම, සතුට දරාගත නොහැකිව මෙසේ කීය. ''හ හා! දැන් මගේ වාරයත් පැමිණිච්ච. උඹේ ආඩම්බරත් දැන් ඉතින් ඉවරයි. හෙට උදයේ වෙන ගැහැණු මෙන්ම උඹත් මගේ කීකරු වැඩ-කාරියෙකි,''

මෙසේ සතුට ප්‍රකාශකර, ඔහු නැගිට ඈ වෙතට ඒමට සැදුවේය, නුමුත් ඔහුගේ හිසත් කරකැවෙන්නාක් මෙන් සහ සිහිය මුලාවෙන්නාක් මෙන් දැන ''ඕම් කුමක්ද, මම අද රෑ වෙනදට වඩා බී තිබෙනවා නොවේද? හොඳයි මේ මත මග ඇරෙනතුරු ටික වෙලාවක් ඉඳිමි'' කියා නැවතත් වාඩි වූයේය.

නමුත් ඒ ටික වෙලාවකින් ඔහු සිතූ අන්දම සිදු නොවීය. ක්‍රමයෙන් ඔහුගේ සිහිය වඩ වඩා කැලත්ව, අන්තිමයේදී කිසිවක් ගැන සංඥවක් නැතිව; ඇස් පියවී, හිස ලයෙහි සැපෙමින්, අත් පා පණ නැතිව, මල රූපයක් මෙන් පුටුවෙහි තිබුණේය.

මෙසේ නිශ්ශබ්ද භාවය ටික වෙලාවක් පැවතුන පසු ඈ ක්‍රමයෙන් හිස ඔසවා බලමින් ඒ සිදුවූ සියල්ල දැක, ඔහු ළඟට ගොස් බලා ''හා හා! මගේ වාරය දැන් පැමිණිච්ච! මමත් වෙන අය මෙන් ගොනෙක් වුනානම් සත්තකින්ම උඹේ කීකරු වැඩකාරියෙක් වෙන්ට වුනා. නුමුත් ඔන්න උඹ කපාපු වලේ උඹම! ඉතින් අපේ යාළුවා බලන්ට! කියා සෙමින් කාමරයට ඇතුල් වූවාය. ඉදිරියෙහි තිබුනු ඇඳෙහි ඇගේ පෙර ආදරවන්තයා නිද සිටියේය. ඔහුගේ අත, ඔහු පාර්ශ්වයෙන් නිද සිටි ස්ත්‍රියෙකුගේ ලය මත්තෙහි රැඳී තිබුනි. ඈ පෙණීමෙන් අවුරුදු විසි දෙහෙක තුණක

තරම්වූ, හෙලලූ පාටින් යුත්, තරබාරු අත් පා ඇති ස්ත්‍රියෙක් විය. ඒ දැක්ම ඇගේ සිතට විස්මයක් ලෙස නොවීය. ඔහුගේ මුහුණෙහිද වනයෙහිදී ඇ දුටු පෙම්බර තරුණ ගතිය නොතිබුනේය. බීමෙන් සහ වෙශ්‍යා සෙවනයෙන් සිදුවන වෙනස් ගති එහි පැහැදිලිව පෙණුනි. එබැවින් ඔහු කෙරේ හටගත්තාවූ ද්‍රෂ්‍යතාවය ඇතිව, ස්ත්‍රීන්ගේ ලාමක සවභාව ගැන අනුකම්පා කරමින් එයින් පිටවී, දෙස්තරගේ කාමරයෙහි එල්ලා තිබුන කෝට් එකක් ඇඟ ලාගෙන සාලුව ගෙන හිස වසාගෙන අතට සැරයටියක් රැගෙන එළියට විත්, ඒ වන තුරුත් දෙස්තර ඒ සවභාවයෙන්ම සිටිනවා දැක, "ඉතින්, මිත්‍රය ආයුබෝවන්, උඹෙන් අවසර නැතිව මේ ඇඳුම් ගන්ට වුනා ගැන කනගාටුයි. නමුත් මෙට උදැසන උඹට ඒවා ආපසු එවමි" යි කියා අගුල් ඇද දෙර හැරියේය. වැඩකරුවාගෙන් බලාපොරොත්තුවූ බාධා උංට නින්ද ගොස් තිබුනු හෙයින් නැති විය.

ඇ වීථියට බැස් විට රාත්‍රියෙහිවූ සීත සුළඟ මුහුනට වැද හොඳ සනීප භාවයක් එලවූයේය. සියලු ශදසින්ම නිශ්චල භාවය පැතිරිය. උඩ අහසෙහිවූ වලාවන් ශීඝ්‍රව ගමන් කරනවා ඇ දුටුවාය. ක්‍රමයෙන් ඇගේ වඤ්ලමූ සිතිවිලිද පිළිවෙලට වැටෙන්ට වී ඇගේ මතු ජීවිතය සම්බන්ධ ප්‍රශ්නය ඉදිරියට පැමිණියේය. ඒ ගැන රාත්‍රියෙහිම තීන්දු කරගෙන එසේ ක්‍රියා කරන්ට සිතට ගෙන ඇ කල්පනා කරමින් ගමන් කරන්ට පටන් ගත්තීය.

මෙසේ කල්පනාවෙහි යෙදී ගමන් කළ හෙයින් යන දිශාව වත් දෙපාර්ශ්වයෙහි ගෙවල් දෙරවල් ආදියවත් ගැන පරීක්ෂාවෙන් බලන්ට ඇට සිහි නැති විය. එහෙත් ටික වෙලාවක් යන්ට පළමු පාර අද්දර ගෙයක හැර තිබුන දෙරකින් පාරට වැටී තිබුන එළිය දැකීමද, ඒ අසල ස්ත්‍රියෙකුගේ කථා කරන ශබ්ද ඇසීමද, ඇගේ සිහිය ඉපදීමට හේතු විය, එහෙයින් ඇ ඒ සථානයෙහි නැවතී ගෙදර කව්රුදැයි අසා ඊට උත්තරයක් ලැබුනු පසු, දෙර ලඟට ගොස් එහි සිටි ස්ත්‍රියගෙන් මග තොරතුරු අසා, ඇ නුවර අතට

නොගොස් කටුගස්තොට අතට ගමන්කර තිබෙන බවත් දූන ස්ත්‍රියට ස්තූතිකොට ආපසු හැරී ගමන් කළාය. මගදී නුවර සිට එන කණ්ඩායම් කීපයක් සම්මුඛවුන නමුත් ඇ ඔවුන්ගෙන් තොරතුරු අසන්ටවත් ඔවුන් ඇගෙන් යමක් අසන්ටවත් සූදනම් නොවීය. ඔවුන්ගේ කථාවලින් පෙළහැර බල්න්ට ගොස් මග රැඳි රැඳී එන අය බව ඇට දූනගන්ට ලැබුනේය.

මෙසේ ගමන් කරන අතර ඇගේ වාසනාවට මෙන් ඉදිරියෙන් ගමන් කළ ස්ත්‍රීන් දෙදෙනෙක් සහ පිරිමින් තුන් දෙනෙකුත් සම්මුඛවී, ඔවුන්ගේ කණ්ඩායමට එකතුව කථා කරමින් ආවාය. ඔවුන් ඈතක සිට මාලිගාව වඳින්ට එන අය බවද, එක අවුරුද්දක්වත් කඩ නැතිව අට අවුරුද්දක්ම මෙසේ ඇවිත් වැඳගෙන ගිය බවද ඇට කියන ලදී. ඔවුන්ගේ ශ්‍රද්ධාවද, ඒ අවුරුද්දක් පාසා කරන වන්දනාවෙන් දිව්‍ය සම්පත් විඳින්ට ඇති බලාපොරොත්තුවද වැඩිදුර කථාවෙන් ඇට පැහැදිලි විය.

මාලිගාව අසල ඔවුන් නැවතුන විට, ඇ ඔවුන්ගෙන් අවසර ගෙන, වටපිට බලා යාමට වාහනයක් නැති බැව් දූක, කිසි බියක් නැතිව, තනිව ගෙදර දෙසට පිටත් වූවාය. ඇගේ ඇඳුම ඒ රාත්‍රියෙහි ඇ හඳිසියෙන් දූටුවන්ගේ ඇස් රැවටීමට උපකාර විය. සැරයටිය, සාලුව සහ නිර්භීත ලීලාව, ඇ දෙස ඕනෑකමින් බැලුවන්ගේ සිත්වල සැක දුරු කිරීමට හේතු විය. මෙසේ ගමන්කොට ගෙදරට සමීපවන විට, පිටිපසින් ආවාවූ මිනිසුන් දෙදෙනෙකුට යන්ට ඇ මගහැර පාර අයිනට වූවාය ඔවුන් ඇ ලඟට අවුත් මුහුනට එබී බලා කිසිවක් නොකියා ගමන් කළාහුය. නුමුත් ඔවුන් කවුරුදූයි එක විටම හඳුනාගෙන, පසුපස්සේම ගොස්, ඔවුන් ගෙයකට නැගෙනවා සමගම ඇත් නැග පිටිපසින් සිටියාය.

දොර හැර ඔවුන් ඇතුල්වූ වහාම ගෙයි ස්ත්‍රිය ගමන ගැන විභාග කළාය. ගෙයි හිමියා හිස වනමින් ඔවුන් සැම දිශාවලම ආරංචි කළ නමුත්, සැම වීථිවලම ගොස් සෝදිසි කළ නමුත් ඇ ගැන කිසිවක් දූනගන්ට නොලැබුනු බව

කියේය. ඔවුන්ගේ දුක සහ කනගාටුව මුහුනුවල හොඳාකාර පෙණෙන්ට තිබුනි.

ස්ත්‍රියගේ ඇසින් කඳුලු බින්දුද ගලන්ට විය. ඒ සියල්ල ඇසින් දුටු මීනා ඇගේ සැබෑ මිත්‍රයන්ගෙත්, බොරු මිත්‍රයන්ගෙත් වෙනස් ගති සිහි කරමින්, ගෙට ඇතුල් වූවාය. ඔවුන් ඈ දෙසට හෙලූ බැල්මෙන් නැවතත් ඈ හඳුනාගන්ට බැරිවූ බව පෙණී ගියේය. නමුත් ඈ සාලුව ඉවත්කර සිනාසෙමින් කෝට් එක ගලවන විට ඔවුන්ගේ පුදුමය සහ ප්‍රීතිය ප්‍රමාණ නොවීය.

11 වෙනි පරිච්ඡේදය

රාත්‍රියෙහි වැස්සෙන් තෙමීයාවූ ගමනින් ශ්‍රාන්තවූ මීනාට අසනීපයක් වේදෝයි භයින් සිත සිතා නිදිගත් ගෙයී ස්ත්‍රිය පසුවද වේලාපසින් නැගිට්ටාය. ඇගේ සැනසිල්ලට ප්‍රීතියටත් මීනා සනීපෙන් නැගිට වෙනද මෙන් කඩිසරව ගෙදර අතුගෑම් ආදිය කරනවා දකින්ට ලැබුනේය. දෙදෙනාම එකිනෙකාගේ දැක්මෙන් සතුටු සහිතව රාත්‍රියෙහි සිදුවූ කරුණු ගැන කථා කරන්ම පටන් ගත්තුය. මීනා ඔවුන්ගෙන් මහ ඇරුනාට පසු ඈට කරුණාවන්ත ස්ත්‍රියෙක් සම්මුඛවූ හැටිත් ඉන්පසු දෙස්තර ඈ රැගෙන ගොස් කථාකළ සැටිත් සියල්ල කීවාය. ඇගේ පාපිෂ්ඨ ආදරවන්තයා අන්‍ය ස්ත්‍රීණෙකුගේ ආශ්‍රයෙහි යෙදී සිටිය සැටි පමණක් කථාවෙන් ඉවත් කළාය. ඒ අසා සිටි ස්ත්‍රිය ඇගේ දක්ෂකම සහ නිර්භීත භාවය ගැන නැවත නැවතත් ප්‍රශංසා කරමින් අනික් ස්ත්‍රියොත් එබඳු ප්‍රස්ථාවලදී එලෙසම ක්‍රියා කරත් නම් ලෝකයේ ධර්මිතාවය දියුණු වන බවත් කියා වහ වහාම ගොස් ඇගේ ස්වාමියාට සියල්ල දැනුම් දුන්නාය. දෙස්තරගේ නීච අදහස් ගැන ඔහුගේ සිතෙහි පහළවූ පිළිකුල් භාවය වචන ස්වල්පයකින් ප්‍රකාශ විය. එබඳු නොරිසි වචන ඔහුගේ කටට නුපුරුදු වූ නමුත් අහිංසක සුපිරිසිදු කන්‍යාවියක් අතට පාවාගෙන කපටි කමින් හා කෲර කමින්

පුරුෂ භාවයට නින්ද කරවන උත්සාහයන් යෙදූ එකෙකුට, ඒවා අයිති විය යුතුයයි ඔහු භාර්‍යාවට විස්තර කරමින් ඈ සැනසූයේය.

එදින සවස් අතට මීනාගේ ආදරවන්තයා ඈ බැලීමට ආයේය. ඔහු දුටු සැටියේ පහළවූ මඳ සිනාව ඈ ඔහු කෙරේ ඇති ප්‍රිය තාවය නිසායයි තරුණයා සහ ඉදිරිපිට සිටි ගෙදර උදවියද කල්පනා කළෝය. නමුත් එකිනෙකාගේ පිළිසඳර බස් ඉවරවූ පසු ඈ සහ තරුණයා පමණක් තනිවී හිඳ කථා කරන්ට පටන්ගෙන නොබෝ වේලාවකින්, තරුණයාට ඔහුගේ කල්පනාව වෙනස් කරගන්ට විය.

මීනා ඔහුට පිළිතුරු දෙමින් ඔහුගේ ආදරය නොකඩව පැවතුනා නම් සනීපවී එපමන දවස් යනතුරුත් ඈ බැලීමට නාවේ මන්දැයි ඇසීය. ඔහුට උසස් පංක්තිවල සමාගම කාරයින් ලැබීමෙන් සහ, ඔවුන් සමග රථ යානාවල අලංකාර ලෙස ගමන් කිරීමෙන් ඈ වැනි අල්ප, දුප්පත් ස්ත්‍රියෙක් ගැන සැලකිල්ල නැතිවූ තරුණෙක් නොවේදැයි ඇසීය.

ඔහුගේ "ජුලියා" එයින් සිහිපත්ව ඔහු අදහස් කරගෙන සිටි අන්දමටම ඇට තොරතුරු සියල්ල හඟවන්ට පටන් ගත්තේය. "මීනා" මම උඹට බැඳි ආලය කවදාවත් කඩ-වෙතැයි සිතන්ට එපා. නුමුත් මා ගැන තොරතුරු උඹට හොඳින් තේරුම් ඇති. උඹ කසාද බැඳගත් සැටියේ මට පියාගෙන් අයිති විය යුතු කොටස නැති වෙයි. එවිට මට සහ උඹට වන්නේ මහත් විපතයි. වනයෙහිදී සිදුවිය හැකි අන්තරා මටවූ දෙයින් උඹට කල්පනා කරගත හැකියි. ඉතින් මින් මතු අපේ වාසය මනුෂ්‍යයන් මධ්‍යයෙහි ගමක, නුවරක විය යුතුයි. ඊට අපට මුදල් හදල් රැකීරක්ෂාවල් ඕනෑ කෙරේ. ඒ කොයිවත් ලබා ගැන්මට දූත් මාර්ගය එළඹ තිබේ. මගේ මිත්‍රයාවන දෙස්තර මට රක්ෂාවක් පල කරන්ට ලෑස්තිව සිටී. තවත් ඔහුගේ කරුණාවන්තකමින් මට මුදල් ඇති ස්ත්‍රියෙකුත් අයිතිවෙන්ට එයි.

ඒ ප්‍රවෘත්තිය ඇසීමෙන් කැළඹීමකට පත් වෙයයි සිතූ ඔහුට මීනාගේ මුහුනෙහි තිබුනු නිෂ්කලංක පැහැදිලිකම පුදුමයට කාරණා විය. එහෙත් ඇ ඔහු කී සියල්ල ඇහුන්-කන් දුන් බව සිතා ඇගේ සිහියේ නිර්මලත්වය නිසා ඔහුගේ යොජනාවලට ඇ නැමේයයි ධෛර්‍ය ගෙන නැවතත් කථා කරමින් "ඒ ස්ත්‍රිය විවාහ කරගන්ට මම සතුටු වූයේ, ඇ කෙරෙහි ඇති ආදරයකින් නොව උඹට ඇති මහත් ප්‍රේමය නිසා වෙයි. ඇගේ සමාගම මට සතුටු එලවතැයි මම නොසිතමි. ඇ සමග ගත කරන්ට වන කාලය දුක්මුසු වෙනවාට සැක නැහැ. නුමුත් ඒ දුක් වීඳීමෙන් උඹට හිහයක් නැතිව සියලු උවමනා දේ සපයා දීම මට හැකිවන හෙයින් මම ඒ ගැන නොසලකමි. නීතියේ සැටියට උඹ මගේ නියම භාර්‍යාව නොවන නුමුත් සියලු ප්‍රකාරයෙන් මගේ ආදරය උසුලන, මගේ ප්‍රෙමණීය, මගේ සුරතල් ප්‍රිය භාර්‍යාව උඹ වන්නෙහි"යි ප්‍රීතියෙන් පිණාගිය මුහුනින් යුතුව කීයේය.

මීනාගේ කට කෙළවරෙහි නැවතත් මද සිනාව පහළ විය. නැවතත් තරුණයාගේ සිත එයින් ධෛර්‍යමත් විය.

ඇ ඉතා සන්සුන් ලීලාවෙන් යුතුව ඔහු දෙස ඍජු බැල්මෙන් බලා, ඔහු කී කිසිවකින් අසතුටකට නොපැමිණි-යා සේ පැහැදිලි ශබ්දයෙන් කථා කරමින් ඔහුට වෙන්ට යන මහත් වාසනාව ගැන ඇ නැවත නැවතත් සතුටු වන බව කියා "ඉතින් උඹේ කසාදය සිදුකරන්ට ලහදීම බලා-පොරොත්තු වන්නෙහිදැයි" ඇසීය.

"උඹේ කසාදය" යන වචන කණට වැටුනු හැටියේම ඔහුගේ සිත බොහෝ පසුබට විය. නොසැලකිලි ලෙස "උඹ" යන වචනයෙන් ඇ ඔහුට ආමන්ත්‍රණය කළ පළමු වෙනි වතාව එය විය. එසේත් ඒ ගැන ඇ සමග ආරාවුල් නොකොට ඔහුගේ කසාදය නියමවී තිබෙන බවත් මාස තුණක් යන්ට පළමු සිදුවෙන බවත් දැනුම දුන්නේය.

''එතකොට උඹේ යොජනාව කොටින් බැලුවාම ඇ කසාද බැඳ නියම භාර්‍යාව ලෙසද, මා අනියම් භාර්‍යාව ලෙසද ගෙන ඇගේ මුදලින් මා පොෂ්‍ය කරගෙන සිටීමටයි.

ආ! උඹ ඔහොම කථා කරන්නේ ඇයි? කසාදයෙන් පසු මම ඇගේ ස්වාමියා වෙමි. ඇට සහ ඇගේ සියලු අයිතිවාසිකම්වලට අධිපතියා වෙමි. දනට ඇගේ වස්තුව එවිට මගේ වෙයි. තවත්, මා රක්‍ෂාවක බැඳුනු කල මා විසින් උපයන යමක් ඇද්ද ඒ මගේ වෙයි. ඒ සියල්ල උඹට පාවාදීමට මට නිදහසය තිබේ. එයින් උඹට පොෂ්‍ය විය හැකියි. ඉතින් අනික් කාරණය, ස්ත්‍රීන් දෙදෙනෙකු සිටීම අරුමයක් මෙන් උඹට පෙණෙනවාද? උඹේ පියාගේ ආගම ගැන උඹ අහලා ඇති. ඒ හැටියට ස්ත්‍රීන් කීප දෙනෙක්ම නියම භාර්‍යාවන් ලෙස තබා ගැනීම හැකි වෙයි. අනික් ආගම්වලත් ඊට විරුඩ කමක් නොපෙණේ. වැඩිදුර නොගොස් මේ උඩරට බලාපන්, මෙහි සමහර තැන්වල පුරුෂයෝ කීප දෙනෙකු එක ස්ත්‍රිය භාර්‍යාව කොටගෙන සිටිති. සමහර තැන්වල එක පුරුෂයෙක් ස්ත්‍රීන් කීප දෙනෙක් තබාගෙන සිටී. පාත රට වුවත් රහසි ලෙසින් ස්ත්‍රීන් දෙන්නෙක් තුන්දෙනෙක් නැති අය සොයාගැන්ම දුෂ්කර වැඩකැයි සිතමි''යි කීය.

ඒ කථාවෙන් ඇගේ නිශ්චල භාවය ශෙෂයක්වත් කඩ නොවිය. මැකී යන සිනාවේ අර්ධයක් මුව කෙළවරෙහි පමණක් දෘෂ්‍ය විය. ඇ ඉතා අහිංසක මෘදු ලීලාවෙන් යුතුව බිම බලාගෙන මෙසේ කීය.

''ලොකය දෙස බලනකොට උඹේ අදහස් ගැන වැඩි වරදක් කියන්ට නෑ, නුමුත් උඹ මේ සියල්ල කරන්ට යන්නේ මට ඇති ආලය නිසා නම්, ඔයිට වඩා පහසු හොඳ මාර්ගයක් පෙන්නා දීමට මට පුලුවන්කම තිබේ. ඇගේ මුදල් සහ ඇත් අත්හැර දමා, මා නියම භාර්‍යාව කර ගණින්, මම උඹට මුදල් දෙන්නෙමි''යි කීය.

ඒ ප්‍රවෘත්තිය ඔහුට පුදුමයක් විය. එහෙයින් ඉතා ආසාවූ බැල්මෙන් ඇ දෙස බලාගෙන, ''මීනා උඹ මුදල් කාරියෙක් බව මම මීට පෙර නොදන සිටීයෙමි''යි කීයේය.

නැවතත් මද සිනාව ඇගේ කටෙහි පැතිරුණේ, ඈ ඔහු දෙස නොබලාම "ඇයි, උඹ මුදල් උපයා ගත හැකි කදිම මාර්ගයක් කියාදීලත් දැන් ඒ ගැන කල්පනාවක් නැතිව සිටිනවා පුදුම නොවේද? උඹට දෙස්තර සහ තවත් වැදගත් පොහොසත් යහළුවෝ සිටිති. මා උඹේ නියම භාර්යාව වූ විට ඔවුන් අප දකින්ට එනවා ඇති. එවිට මම ඔවුන්ගේ අනියම් භාර්යාව වී මුදල ලබාගන්නෙමි. එයින් අප දෙදෙනාටම කා බී, සියලු සැප විහරණයෙන් කල් යවන්ට පුළුවන් වෙයි. ඉතින් බලාපන්, මගේ යොජනාව උඹේ එකට වඩා සඵලවන පහසු එකක් නොවේද? උඹට එයින් කිසිම හිරිහැරයක් වත්, දුකක්වත් නැති නොවේදැයි විමසුවාය.

ඔහු ඈ දෙස වඩ වඩා ඕනෑකමින් බැලුවේය. මුහුණෙන් වත්, ස්වභාවෙන්වත් ඈ කවටකම් වශයෙන් කථා කරන්නී යයි සිතන්ට ඔහුට කිසිවක් නැති විය. නුමුත් "උඹය" "උඹය" කියා කථා කරන්ට වූ එක ඔහුගේ සිතට කරදර සහිත කරුණක් විය. එසේත් ඇගේ වචනවලින් ඈ ඔහු කෙරේ ඇල්මෙන් සිටින්නී යයි ඔහුගේ අහංකාරවූ සිතට කල්පනා විය. එබැවින් ඔහුගේ මිත්‍රයා සමග කථා බස් කොට, බොරු ක්‍රමයකින් කසාද කෘත්‍ය කොට, දෙදෙනාගේම ගණනේ ඈ ටික කලක් තබාගත හොත්, පසුව ඔවුන්ට ඕනෑ අන්දමකට ඈ හසුරුවා ගන්ට හැකි වෙතැයි සිතා ඔහු මෙසේ කීය.

"මීනා, උඹට ඒ අන්දමේ ක්‍රියා කරන්ට ඉඩදීම මට යුතු නොවේ. නුමුත් උඹ කළ යෝජනාවෙන් සත්තකින්ම ස්ත්‍රීන් තුළ පවත්නා හොඳ ගුණය ප්‍රකාශවේ. පුරුෂයන්හට දුක් විඳින්ට දීමට ස්ත්‍රීහු කොහෙත්ම සතුටු නොවෙති. බලනකොට පුරුෂයන් විඳින දුක් මොනවාද? මුදල් ටික සපයාගෙන ගෙදරට ගෙනැවිත් දෙන එක පමණක් නොවෙද? දර දිය ඇදගෙන, හැලිවලත් සෝදගෙන, ආහාර පිළියෙල කර, ගෙදෙර දෙර අතුගාගෙන, ලමෝ ලපටින්ගේ කරදර උසුලාගෙන, ඔවුන් රැක බලාගෙන, පුරුෂයින්ගේ

ලෙඩෙහි දුකේදී සාත්තු සමත්තු කරගෙන, සිටින්නේ ස්ත්‍රීන් නොවේද? සමහර විට පුරුෂයින්ගෙන් ගුටි බැටත් කාගෙන ස්ත්‍රීන් ඔවුන්ට ආදරේව සිටිනවා නොවේද? සත්තකින්ම ස්ත්‍රී වර්ගය කරුණාවන්තකමට සහ දුක් ඉසිලීමට ඉතා සමර්ථය. උඹේ යොජනාව ගැන බලනකොට උඹ ස්ත්‍රීන් අතුරෙනුත් ස්ත්‍රියෙක් ලෙස සලකන්ට යුතුව තිබේ. උඹ දුටු කිසිම පුරුෂයෙක් උඹට වහල් නොවේ යයි මම නොකියමි. ඒ නිසා උඹේ යොජනාවේ අන්දමට මුදල් සපයන්ට සූදනම් වෙනවානම්, මේ නුවර සිටින සියලු ධනවත් අය මගේ ගෙදරට එනවා සත්තකයි. නුමුත් මම ඊට සතුටු නොවෙමි. මගේ යහළු දෙස්තර පමණක් ආවාම ඇති. උඹට සැප පහසු ලෙස කෑම් බීම් ඇඳුම් පැළඳුම් දෙන්ට අප දෙදෙනාට බැරි වෙතැයි නොසිතමි. එසේ බැරි වුවහොත් වෙන අය ගැන සිතන්ට පසුව පුළුවන්කම තිබේ. මම ඔහු සමග කථාබස් කොට සියල්ල තීන්දු කරගෙන හෙට ඒ ගැන උඹට දනුම් දෙන්ඥූ''

ඔහුගේ වචන අවසාන වෙනවත් සමග ගෙයි ස්ත්‍රිය නැවතත් ඔවුන් සිටි ස්ථානයට ආවාය. මීනාගේ සිනාවත්, තරුණයාගේ ප්‍රසන්න තාවයත් දුටු ඇ ඔවුන් දෙදෙනා අතර සමගි සතුටු විය යුතු කථාවක්ම පැවැත්තේ යයි සිතා ගත්තිය. එහෙයින් ඇද සිනා පහළ කරමින් සිටියාය.

මීනා ඇට කථා කරමින් ''අපේ මහත්මයාට දූන් හොඳටම සනීප වාගේ පෙණේ. උන්නැහේ මේ ඇවිත් තිබෙන්නේ උඹලාගේ කරුණාවන්තකමට ස්තුති කරන්ටය. මට උඹලා පෙන්නු දරු ප්‍රෙමය ගැන මම උන්නැහේට දනුත් දුන්නෙමැ''යි කීය.

තරුණයා ස්තුති කරන්ට උත්සාහ කරන විට, ස්ත්‍රිය ඒ වලකා ''අපට කිසිම ස්තුතියක් අයිති නැති බව මට කියන්ට පුළුවනි. අපේ ගෙදර ගැනවත්, අප ගැනවත් අන් ගතියක් නොපෙන්නා, අපේම දරුවෙකුටත් වඩා හොඳින් සියල්ලම බලාගෙන ක්‍රියා කළ ගැන, ස්තුති කරන්ට ඕනෑ අපිමයි. මෙයාකාර යහපත් ළමයෙක් භාර්‍යාව කොට ගන්නා පුරුෂයා සත්තකින්ම වාසනාවන්තයෙකැයි කීවාය.

ඇගේ කීමේ සත්‍යතාවය ගැන තරුණයා ප්‍රශ්න නොකෙළේය. නුමුත් ඔහු අත පය වෙහෙසා මොකුත් යන්තම් සම්භ කරගෙන කල්යවන්ට හදන සුළු කර්මාන්ත කාරයෙක් නොවන බවත්, මහත්මයෙක් මෙන් ක්‍රියා කරන්ට හදන තැනැත්තෙක් බවත්, ඔහුගේ උසස් සමාගම්වල ක්‍රියා කරන්ට ඇට තේරුම්කම නැති බවත් කල්පනා කෙළේය.

මීනා ඔහුගේ කල්පනාව කියෙව්වාක් මෙන්, ස්ත්‍රිය දෙසට හැරී "උඹේ කීම සැබෑ විය හැකියි. නුමුත් අපේ මහත්මයා අප සමග ආශ්‍රය කරන්ට ආවාට සුළුපට්ටු කෙනෙක්ය කියා ගණන් ගැනීම වරදයි. ගෙදර දොර වැඩ කරවාගන්ට උන්නැහේට දක්ෂ පක්ෂ වැඩකාරියෙක් ගන්ට හැකියි. භාර්‍යාකමට ඕනෑකර තිබෙන්නේ නැවුම් ගැහුම් දූනෙනා, වැදගත් සභාවල ආශ්‍රය පුරුදු උසස් පංක්තියක කෙනෙකි"

මෙහිදී තරුණයා ඇගේ කථාව නවතන්ට උත්සාහ කළ නුමුත් ඈ කියන දේ සියල්ල අසා සිටින්ටයයි ස්ථිර භඩින් නියොග කොට, කියන්නී, "ඉතින් අද මුන්නැහේ මේ ගැන විස්තර වශයෙන් කාරණා කියාදී, ඉතා කරුණා වන්ත යොජනාවක් කෙළේය, මගේ කරුණාවත් උන්-නැහේගේ කරුණාවට ශෙෂයකින්වත් අඩු නොවන නිසා, මමත් ඒ සමානව යොජනාවක් කෙළෙමි. ඒ ගැන උන්නැහේගේ තීන්දු වචනය හෙට ගෙනත් දෙන්ට පොරොන්දු වූයේයයි කියා සියලුම ප්‍රවෘත්තිය ප්‍රකාශ කළාය.

ඒ ඇසූ ස්ත්‍රිය තරුණයා දෙසට හෙලූ බැල්ම ඔහුට බොහෝ කාලයක් යනතුරු මතක නැති නොවීය. කෝපය, පිළිකුල් භාවය, ගභීරාව දුක් වේදනාව යන සියල්ලම ඒ බැල්මෙහි මිශ්‍රව තිබුනේය. ඒ දුටු ඔහු ලජ්ජාවෙන්, දුකෙන් මිරිකී මීනාගේ මුහුන බැලුයේය. ඈ නිශ්චලව කට කෙළවරෙහි සිනාව ඇතිව ඔහුගේ බැල්මට කිසිසේත් නොපැකිල සිටියාය.

ගෙයි ස්ත්‍රියගේ සිතිවිලි නවතාගන්ට බැරිව ''ඇයි මිනිහෝ උඹේ අතපය වෙහෙසා ගෑණියෙකුට කන්ට අඳින්ට දෙන්ට බැරිද? උඹේ මහත්තැන් කමත් උඩඟු කමත් පැත්තක තියා, කුලී වැඩකර පවුල රක්‍ෂා කිරීම, ගෑණිට කියා වෙසකම් කර ජීවත්වෙනවාට වඩා හොඳ නැද්ද''යි කෝපයෙන් දිලිසෙමින් ඇසීය.

මීනාගේ වචනවලින් තරුණයාහට යම් දුක් කණගාටු-වක් ලජ්ජාවක් පැමිණුනා නම්, මේ ගෙයි ස්ත්‍රියගේ නින්දා සහිත වචනවලින් එය සිය ගුණයක් වැඩිවිය. ඔහුගේ මුහුනෙහි සුදුමැලි භාවයද, ඇස්වල තෙත් ගතියද, සියලු ශරීරයෙහි ඇතිවූ සලිත භාවයද, දුටු මීනාට ඔහු සම්පූර්ණ යෙන් ලජ්ජා භය දුරුවන තරමට පාපයේ ගැලී නැති බව කල්පනා විය. ඔහුගේ සිත මදක් නලවන්ට මෙන් ඈ මැදගත් ලෙසින් මෙසේ කීය.

''හා උඹ ඔහොම අපහස වශයෙන් කථාකිරීම වරදයි. උන්නැහේ කොහොම වුවත් මහත්මයෙකි. මට බැඳුන කරුණාව නිසා උන්නැහේ අප සමග ආශ්‍රය කරන්ට ආවට අප විසින් උන්නැහේට නොසැලකිලි ලෙස කථාබස් කිරීම සෑහෙන්නේ නැහැ. ඔහොම කථා කරන විට උන්නැහේගේ භාර්‍ය්‍යාව වෙන්ට සිටින මගේ සිත කැමති වන්නේ කොහොමද? ඇරත් උන්නැහේ සහ මමත් දැනට ඉන්නේ උඹේ පියස්ස යටයි. ඉතින් තමන්ගේ නිවාසයට පැමිණි ආගන්තුකයන්හට, කොපමණ වැරදි තිබුනත් අගෞරව කිරීම චාරිත්‍ර ධර්මයක් නොවේ. කරහ අත්හැර දමා බලන කොට, උන්නැහේගේ යොජනාවෙහිවත් මගේ යොජනා-වෙහිවත් වැරැද්දක් පෙන්වන්ට උඹට පුළුවන් වේයයි මම නොසිතමි. ලෝකයාට ඒවා නුපුරුදු ඒවාවත්, පළමු වරට අප විසින් පුරුදු කරන්ට හදන ඒවාවත් නොවෙති. දහස් ගණන් මනුෂ්‍යයෝ දවස්පතා ඔය අන්දමින් ක්‍රියා කරමින් සිටිති. අප වැනි අප්‍රසිද්ධ සුළු අය එසේ කළාට අමුත්තක් වුනාද?''

ඇගේ සිනාව මුල් පටන්ම කඩ නොවීය. එය දුටු තරුණයාට මුළු ස්ත්‍රී වර්ගයම ද්වේෂ කටයුතු, ඇදහිය නොහැකි, කපටිවූ සත්ව කොට්ඨාසයකැයි සිතී ගියේය. ඒ මද සිනාව පැතුරුණු විට ඇගේ මුහුණ කොපමණ අලංකාර ලෙස මට පෙරදී පෙණුනේද? අහෝ! කෘෘර සිනාවේ සැටි! මේ සිනාවෙන් මෑ මා සතුටෙහි වෙළුවා නොවෙද? දැන් මේ සිනාවෙන් පෙන්වන්නේ මා කෙරෙහි ඇති මැගේ පිළිකුල් භාවය නොවේද? මේ සිනා සහිත මැගේ කට පොඩිකර දමන්ට මට දැන් ඇත්නම් මම කොපමණ වාසනාවන්තයෙක්ද! යක්‍ෂයෝය කියා අමුතු වර්ගයක් ඉන්න-වාද? මනුෂ්‍යයෝ ක්‍රොධ වූවාම යක්‍ෂයෝ නොවෙත්ද? ආ! මන්ත්‍රානුභාවයක්වත් ඇත්නම් මෑ මෙතනින් මම ඔසවාගෙන යනවා නොවෙත්ද? එවිට මැගේ කපටි සිනාවෙන්වත් සිත් අලවන අලංකාරයෙන්වත් ලොකයේ වෙන කිසිවෙකුට දුක් දෙන්ට ඉඩ දෙනවාද? මෑ මම මලක් මෙන් මෘදු ලෙස අතට ගෙන, සිප, පසුව කෙල ගසා බිම ලා පාගා සුණු විසුණු කර දමනවා නොවෙද?

ගෙයි ස්ත්‍රිය ඇගේ කථාවෙන් මෘදු වෙනවා වෙනුවට වඩ වඩා කෝපීව "තීත් මුගේ කීමට හැරුනාද! තිට පෙන්නු කරුණාව අර බැල්ලිට පෙන්නුවා නම් වඩා හොඳයි. තොපි දෙන්නාටම දැන් මෙතැනින් පිටවෙන්ට පුළුවනි. අපි කොපමණ දිළිඳු වුනත් වේසකම් කරන ඇයො සමග අපේ ආශ්‍රයක් නෑ" කියා සැරෙන් කථාකොට ඔවුන්ට පිටිපා යන්ට සැදූ විට, මීනා ඇගේ අත අල්වාගෙන වඩ වඩා සිනාසෙමින් "උඹ ඔය තරමට තරහ වුනාම කොහො-මද? මම මෙපමණ දවස් උඹ ලඟ හොඳින් ඉඳලා මේ ටිකට බැනුම් අහගෙන යන්නේ නැහැ. මගේ මහත්මයාට මම කියන්ට තිබෙන වචන ස්වල්පය උඹත් අසාගෙන සිටිනවා නම් මම ඉතා සතුටුයි කියා ඈ නවතාගෙන තරුණයා දෙසට හැරී, "ඉතින් අපේ රැවටීලි ඕනෑ කරන්-නේ නැහැ. මම කියන්ට යන සියල්ලටම උඹ ඇහුන්කන් දෙන්ට ඕනෑ. සමහර විට මම උඹ සමග කථා කරණ අන්තිම වතාව මෙය විය හැකියි.

මීට පළමු ඇසූ පුදුම වූ කථාවලට කණ පුරුදුවූ තරුණයා මේ වචනවල අමුතු පුදුමයක් නැති විය. ඔහුගේ යොජනාව එළිදරව් කළ තැන් පටන් ඇ ගැන ඔහුට වැඩි බලාපොරොත්තු නැති විය. එහෙයින් ඉටි රූපයක මුහුනක් සේ නිශ්චලවූ ඔහුගේ මුහුන ඇ දෙසට හරවාගෙන ඔහු සිටියේය. නුමුත් ගෙයි ස්ත්‍රියගේ පුදුමය ඔසවන ලද ඇස් දෙකින් පෙනී ගියේය. ඇ ඉතා ආසාවෙන් මීනාගේ මුහුන බලමින්, කියනා දේට ඇහුන්කන් දුන්නීය.

"උඹලාගේ පක්‍ෂයේ අය ඒ ඒ කාලවලදී ඒ ඒ අනට පෙරළෙති. ඒ ඒ අයට වතාවල කළ කී දේ මතක නැති කර දමති. නුමුත් දුවීලවූ අපේ පක්‍ෂයේ අය එසේ නොවෙති. අපේ යම් පොරොන්දුවක් ඇද්ද අපට එය නිතර සිහිවෙයි. අප යම් කළ කී කථාවක් ඇද්ද ඊට විරුඩව අපේ ක්‍රියාවක් නොමැතියි. උඹ මගේ කැමැත්ත ලබාගත් දිනයෙහිදී මට වුන ගිවිසුම් දූත් සහමුලින්ම මතක නැති කර තිබෙන බව මට පෙණේ. උඹ බීමත් කමෙහිත්, අයුතු ස්ත්‍රී සේවනයෙහිත් ගැලී සිටින බැව් මම දනිමි. උඹේම මුහුන ඊට සාක්ෂි කියයි. ඉතින් උඹේ ගිවිසුම් කඩවීමෙන්, උඹට භාය්‍ය්‍යා වන ලෙසට මම වූ ගිවිසුමක් නිෂ්ප්‍රභා වේ. ඒ ගැන උඹේ යටී සිතෙහි දූකක් නැතිවාක් මෙන්ම මගේ සිතෙහිත් දූකක් නොමැතියි.

"උඹලා තරමේ ප්‍රඥව නැතත්, උඹලා වාගේ උසස් ශාස්ත්‍ර ශාලාවල ඉගෙණුම් නොලැබුවත්, උසස්යයි පිළිගෙන තිබෙන පංක්තිවල ආශ්‍රය නැතත්, මේ අවංක දුප්පත් සහෝදරියන්ගේ කල්පනාවල් බලාපන්. එයින් උඹලාට ගන්ට තිබෙන ගුරුකම් ආදශ ගන්නවා නම් උඹලාගේ සමාගම් ඔය තරමට නින්දිතව දුඃඛිතව තිබෙන්නේ නැහැ.

"සැබෑ ආදරය ඇති අය විවාහ ජීවිතය සැප ලෙස ගත කරති. එබඳු අය එකෙක් අනිකාට උසස්ය, අනිකාට වඩා විශෙෂ කටයුතුය කියා සිතන්නේ නෑ. දෙදෙනා ක්‍රියාවෙහිත් වචනයෙහිත් සහ කල්පනාවෙහිත් එක සැලකිලි වන්තව පටිතිත්.

''උඹලා වැනි දුෂ්ටයන්ට සැබෑ ආදරයක් ඇතිවිය නොහැකියි. දුර්වලවූ නොමග ගියාවූ ස්ත්‍රීන්හට අනුකම්පා කර උන් හරි මාර්ගයේ හසුරුවන්ට උත්සාහ කරනවා වෙනුවට, උන් සතුන් ලෙස සලකා උඹලාගේ ලාමක තුච්ඡ ආශ්‍රයට යොදා, පසුව අතහැර දමා අසරණ කිරීම උඹලාගේ සිරිතක්ව තිබේ. උඹ අද මෙහි පැමිණියෙත් යහපත් අවංක අදහසකින් නොවන බවත් දෙස්තරගේ කීම ගෙන, උඹලාගේ නින්දිත යොජනාවලට මා රවටාගෙන පසුව මාත් අසරණ භාවයට හෙලන්ට බවත් මම දනිමි. නුමුත් එබඳු උගුලක මා අසුකරගන්ට ගන්න උත්සාහය නිරර්ථක වේ.

''ඔය අන්දමෙ වනචර සිරිත් පවත්වන උඹලා අතර සියලු ස්ත්‍රීහු අවිශ්වාස කටයුතුය, සියලු ස්ත්‍රීහු අස්ථිරය' පාපයට වැටෙන සුළුය. යනාදී කල්පනා සුලභ වෙත්. එහෙයින් ස්ත්‍රී පක්ෂයට පැවැත්විය යුතු සැලකිල්ල, ආදරය, ගෞරවය උඹලාගේ සිත්වල නැති වෙත්. ඒ හෙතුවෙන් ස්ත්‍රීන්හට බැනුම් වචනයෙන් කථා කිරීම, සහ අතින් පයින් ගුටි බැට දීමත් ඇති වෙත්. උඹලා සමග විවාහ වන අසරණ ස්ත්‍රීන් හට මගේ මුළු අනුකම්පාව පුදමි.''

''ඉතින් මගේ කථාව ඉවරයි. මින් පසු උඹ මා සමග කථා කරන්ට උත්සාහ නොකළ යුතුයි. මින් මතු උඹ දුටු විට අමුත්තෙක් ලෙස සලකමි. උඹට ආයුබෝවන්'' කියා ගෙයි ස්ත්‍රිය සමග එතැනින් පිට වූවාය.

12 වෙනි පරිච්ඡේදය

එදින රාත්‍රියෙහි මීනා වෙනදාට වඩා කථා කරමින් සෙල්ලම් සහිතව සිටියාය. ඇගේ ප්‍රීතියට සහභාගි වූවාක් මෙන් අහසෙහි දෘෂ්‍ය වූ චන්ද්‍රතෙම, ශ්වෙත රශ්මීන් පතුරුවා ලෝවෙහි දුක් අඳුරු දුරුකරන්ට විය. තැනින් තැන රැස්වූ තරුණාවස්ථිකයන්ගේ වීනා ගී සින්දු නාදයෙන් ගුවන පිරෙන්ට විය. සියලු දිශාවෙන් සමාදනය සහ ප්‍රීතිය ඇති විය.

පවුලස් වීජී චාරිකාවෙන් පසු ගෙදර ආ විට, මීනා ඉතා සෙල්ලම් සහිතව සිටිනවා දැක, එතෙක් වාසනාවන්ත වීමට සිදුවූ යම් කරුණක් ඇද්දැයි විමසුවේය. ඇද සිනා-සෙමින් ඔහු දෙස ප්‍රියංකර බැලුම් හෙලා, ස්ත්‍රීහු මනුෂ්‍ය යන්ගේ වාසනාවන්තකම දියුණු කරන්ට සැදී සිටින කොටසක් නොවෙත්ද''යි ඇසීය.

ඇගේ සිනාවෙහිද කථාවෙහිද, ලීලාවෙහිද අතිශය ප්‍රියකරු භාවයක් ඇති විය. ඇගේ මුළු ශරීරයෙහි පෙර ඔහු කිසි කලෙකත් නුදුටුවාවූ විශිෂ්ට තාවයක් සහ ප්‍රණීත භාවයක් විසිර තිබුනි. එහෙයින් ඈ සමීපයෙහි හිඳ, නිල් උපුල් මෙන් යහපත් ඇගේ ඇස් සහලෙහි කාන්ති ජල-යෙන් ආර්ද්‍රවූ පුල් පියුමක් වන් ශොභමාන මුහුනෙහි ශ්‍රී සෞභාග්‍යය දර්ශනය කරමින්, ඈ සමග ප්‍රිය තෙපුල් බෙණෙමින් සිටීම ඔහුගේ සර්වාංගය ප්‍රීතියෙන් උපුලවන කරුණක් විය.

ඔහු ඈට උත්තර වශයෙන් කියන්නේ, "ඔය කථාවේ හැටියට පෙණෙන්නේ පුරුෂයෝ සියලුම බලය අත්පත් කරගත් සිත්වූ පරිද්දෙන් ක්‍රියා කරන උතුම් කොට්ඨාසයක් ලෙසත් ස්ත්‍රීහු ඔවුන්ගේ සතුට දියුණු කරන, කැමැත්ත ප්‍රකාර හැසිරෙණ යටහත් දස කොට්ඨාසයක් ලෙසත්ය. එය එක අතකට ඉතා වැරදි පිළිවෙලක්යයි කීම අපහසුවේ. පුරාණ පටන් සැම රටවලම ඔය මතය පිළිගෙන සිරිත් විරිත් යොදගෙන තිබුන බව පෙනේ. නුමුත් දැන් සීලාචාර-යයි පිළිගනු ලබන රටවල ස්ත්‍රීහු උසස් කොට සලකනු ලබනවා පමණක් නොව සියලු ආකාර සැලකිලි, ගරු බුහුමන්වලට හිමිකාරියෝව සිටිති. මගේ කල්පනාවේ හැටිය ටත් ස්ත්‍රීහු මෙන්ම පුරුෂයෝත් වාසනාව දියුණු කළ යුත්තෝය. එකිනෙකා සතුටු කිරීම, දෙපක්ෂයේම යුතුකම වේ. ස්ත්‍රීහු පුරුෂයන්ගේ වැඩකාරයෝ ලෙසවත් පුරුෂයෝ ස්ත්‍රීන්ගේ වැඩකාරයෝ ලෙසවත් කල්පනා කර ගැනීම තදබල වැරැද්දකි. ස්ත්‍රී පුරුෂ දෙදෙනෙක් එක්වූ විට, ජීවිතය නමැති දුර්ග මාර්ගයෙහි ගමන් කරන්ට එකතුවූ සමාගම්කාර-යින් දෙදෙනෙක් ලෙස, නැත්නම් ඉතා හිතෛෂිවූ මිත්‍රයන්

දෙදෙනෙක් ලෙස, සලකා ගත යුතුයි. මෙසේ සිතා බලා අප සහොදර සහෝදරියෝ ක්‍රියා කරත් නම් ලෝකයේ සාමදනය දියුණුවීම, ප්‍රීතිය සහ වාසනාව ඇතිවීම ඒකාන්ත වෙය''යි කීවේය.

මෙ ඇසූ ඈට ඔහුගේ කල්පනාවෙහිත් අනිත් පුරුෂයන්ගේ කල්පනාවෙහිත් ඇති වෙනස පෙණී ගියේය. ඔහු පුරුෂයන් අතුරෙන් සොයාගත නොහැකි උසස් අදහස් ඇති උත්තමයෙක් බැව් ඈට නැවත නැවතත් සිතී, ඔහු දෙස යටැසින් බැල්මක් හෙලා මෙසේ කීය. ''සත්තකින්ම ඔබඳු නිදහස් කල්පනා අතික් අයටත් ඇත්නම් මෙය සම්පූර්ණයෙන්ම අමුතුවූ වාසනාවෙන් පිරුණාවූ ලොකයත් වෙනවා නොවෙද? ස්ත්‍රීන් පහත් කොට සලකන යම් ජාතියක් ඇද්ද ඒ ජාතිය, සීලාචාර කමින් සහ දියුණුවෙන්ද, වාසනාවෙන් සහ ප්‍රීතියෙන්ද පිරිහුනාවූ එකක් විය යුතුයි. අප රටේ දියුණුවට බාධා වූයේත්, අපරාධ වැඩිව තිබෙන්නේත් ස්ත්‍රීන් ගැන නොසැලකීමෙන් ක්‍රියා කරන කරුණෙන් යයි කිය හැකියි. බාල කාලයේම ඔවුන්ට ශිල්ප ශාස්ත්‍ර පුහුණු කරනවා නම්, අවවාදයෙහි හික්මවනවා නම්. වැඩිවිය පැමිණ මවුන් වූ අවස්ථාවෙහි ඔවුන්ගේ දරුමල්ලන් හරිහැටි හසුරුවා ගැන්මට සිහි නුවන ඇතිවේ. දැනට බලනකොට අප රට යන්තම් අකුරක් ලියන්ට කියවන්ට පුළුවන් ස්ත්‍රීහු කී දෙනෙක් සිටිත්ද? මගේ බාල කාලයෙහි වාසනාවකට මෙන් ඉගෙනගන්ට මට ලැබුනු හෙයින් අනිකුත් සහොදරියන් ගැන මට ඉතා කනගාටුයි. ඉතින් ස්ත්‍රීන්ගේ දියුණුවක් නැති හෙයින් රටේ දියුණුවත් නැතිවීම අරුමයක් නොවේ. රටට ආලය ඇති අය විසින් පළමුකොට කටයුතුව තිබෙන්නේ ගැණු පිරිමි දෙකොට්ඨාසයටම එකකාර සැලකිල්ලෙන් අකුරු ඉගැන්වීම හා ගැණුන්ට විශෙෂ වශයෙන් සකසුරුවම්කම, ගෙදර දෙර පාලනය ඉගැන්වීමත්ය. ඉතින් ස්ත්‍රීන්ගේ පහත්කමේ ප්‍රමාණයත් මට අද දවසෙහි අසන්ට ලැබුනි. මගේ ප්‍රීතියට හේතුවත් සමහර විට ඒක විය හැකියි.

ඒ ගැන අසන්ට, ඇති ආසාව තරුණයා ප්‍රකාශ කළ කල්හි ඈ එය ඔහුට දැනුම් දෙමින් එබඳු යොජනාවක් කිරීම මුළු ස්ත්‍රී වර්ගය කෙරෙහිම ඒ තැනැත්තාගේ ඇති පහත් කල්පනාව නිසා බව ඈ විශ්වාස කරන බව කියා "ඉතින් මට වෙනදට වඩා ප්‍රීතිවන්ට කාරණා නැද්ද? සර්පයෙකුගෙන් දිවියෙකුගෙන් මිදීම සතුටු වන්ට කාරණයක්ද, ඔහුගෙන් ඉවත් වීමත් එසේමයි. මම දැන් කොපමණ වාසනාවන්තද? නිදහස්ද? ඉතින් මට ප්‍රීතියට කාරණා නැද්දැයි ඇසීය.

"සත්තකින්ම මීනා මගේ ප්‍රෙම —— —— ——

ඔහුගේ පැකිලීම් භාවය දුටු ඈ සිනාසෙමින් "ඔවු, මගේ ස්වාමියා වෙන්ට ඔහු සිටියා සැබැයි. ඔහුගේ දුෂ්ටකම් කණින් ඇසුවෙමි. මගේම ඇසින් දුටුවෙමි. මින්මතු ඔහු මගේ කිසිවෙක් නොවේ ; නාඳුනන්නෙකි"යි කීය.

ඒ ඇසූ තරුණයාගේ ප්‍රීතියට සීමාවක් නැති විය. එක්ෂණයෙහි ඔහුගේ සිත අන්ධකාර කරගෙන තිබුන දුක් වලාවෝ වියකී ගියාහ. ප්‍රීති ආලොකය පැතිරෙන්නට විය, ඔහුගේ මුහුනද අමුතුවූ වාසනාවන්ත භාවයක් ඉසිළුයේය. ඒ දුටු මීනාගේ සිත වඩ වඩා ප්‍රීතියට පත්විය.

ඈ නැවතත් කථා කරමින් "පසුගිය දවස එක්තරා මිත්‍රයෙක් මා වෙතට පැමිණ කදිම කථා ප්‍රවෘත්තියක් කියා මගේ කල්පනාව ඇසුවා මට දැන් සිහි වෙයි. විවාහ ගිවිසූ මෙහි බැඳුනාට පසු තමාගේ ආදරවන්තියට වෙනස් වූ දේ කළාවූ, ද්‍රොහීවූ, පුරුෂයාට සමාවක් දීම යුතු නොවේ යයි මම ඔහුට ස්ථිර ලෙසම් කියා සිටියෙමි. මගේ කීමටම ක්‍රියාවක් ගළපන්ට මටම සිඩවුනා ගැන පුදුමයි. දැන් ඔහුට එය සිහි වෙනවා නම් සිතේ ධෛය්‍ය්‍ය පුරුෂයන්ට මෙන්ම ස්ත්‍රීන්ටත් තිබෙන්ට හැකි බව සිතෙනවා ඇතැයි"යි කීය.

තරුණයාගේ පුදුමය සහ ප්‍රෙමය මොහොතින් මොහොත දියුණුව ආහ. ඇගේ සිහියෙහි නිර්මලත්වය, කථාවෙහි අලංකාරය සහ ස්වභාවෙහි සුවිනීතවූ රම්‍ය තාවය ඔහුගේ

සිතට තදින් වැටහීය. එහෙයින් කිය නොහැකි තරම ආශාවෙන් ඈ දෙස බලා ''මීනා, මේ කරගත් එක උඹට සතුටු වන්ට නොව දුක් වන්ට කාරණා නොවේද? උඹ මව් පියන්ගෙන් වෙන්ව අන්‍යයන් මැද වාසය කරන අසරණ ස්ත්‍රියක් නොවෙහිද? යම් යම් වරද තිබුනත් උඹට ස්වාමියා වෙන්ට සිටි තැනැත්තා අත්හැර දැමීම හරිද? ලොකය ඉදිරියට යාමට උඹට භය නැද්ද? දුෂ්ට කම්හු සෑම දිශාවම පිරී තිබෙනවා නොවේද? උඹට මතු වන්නේ කුමක්දැයි සිතා නොබලා මේ අන්දමින් සෙල්ලමින් සිටීම යුතුදැ''යි ඇසුවේය.

ඈ එවෙලේම සිනා ශතිය ඉවතලා ඔහු මෙන්ම ගැඹුරු මුහුනින් යුතු වූවාය. ඇගේ තීක්ෂණ වූ ඇසට ඔහුගේ වචන නමැති පිටස්තර වැස්මෙන් මුවාවූ හරිවූ ඇතුල් අදහස්වල ස්වරූපය පෙණී ගොස්, ඈ ඔහුට මෙසේ උත්තර දුන්නීය. ''සත්තකින්ම මට බැරෑරුම් ලෙය සිතා බලන්ට කාරණා තිබේ. ලොකය අප වැනි දුර්වල ස්ත්‍රීන්ට මහත් කරදර දෙන ස්ථානයක්ය. ටිකක් පාට ඇති, හැඩහුරුකම් ඇති ස්ත්‍රීන්ට විශෙෂ වශයෙන්ම හිරිහැර ලැබෙලු. උන් තිව කිව අඩියට මිනිසුන්ගේ බැල්ම වැටෙලු. උන්ට නිදහසක් ඇතිව කිසි අතක් බලන්ට නොලැබෙලු. නිදහසක් ඇතිව කිසි තැනකට යන්ට නැතිලු. නිදහසක් ඇතිව ගෙදරවත් ඉන්ට නැතිලු. සෑම දිශාවෙන්ම උන් දෙස නෙරවාගෙන සිටින මිනිසුන්ගේ ඇස් ඇතිලු.

මෙසේ ඇගේ කවට පිරුළු මෙන් සැහැල්ලුවූ කථාවට තරුණයා සිනා පහළ කළා දුටු ඈ හදිසියෙන් කථාව වෙනස්කර ''සැබැවින්ම ස්ත්‍රීන්ට භයවෙන්ට කාරණා තිබේ. නුමුත් ඇගේ ඇස් දෙක සහ මොලයත්, පාවිච්චි කරන්ට දන්න ස්ත්‍රීන්ට ලොකය එතරම් භයානක ඉඩමක් නොවේ. ස්ත්‍රීන් ගැන සැහැල්ලුකොට ඇතැම් විට කථාකරන නුමුත් ලොකය ආණ්ඩු කරන්නේ කවුරුද? ස්ත්‍රියෙකුගේ ප්‍රිය සිනාවට නො නැමෙන් රජෙක් හෝ මන්ත්‍රීයෙක් ඇද්ද? ස්ත්‍රියෙකුගේ අර්ධ නිරීක්ෂණයට වහල් නොවන ධනවතෙක් හෝ උගතෙක් ඇද්ද? මුළු ලොකයම ස්ත්‍රියට යටහත්ව ඇගේ

සතුට දියුණු කරන්ට මෙන් සිටිනවා නොවේද? ස්ත්‍රියගේ බලය නොදන්න සමහර සහෝදරියෝ රැවටී නොයෙක් කරදරවලට වැටෙතත් දන්න උන් එසේ නොවෙති. මා ගැන යම් භයක් ඇත්නම් එය සිතින් දුරුකළ යුතුයි. මා සමීපයට පැමිණි කවරෙකුගේ නුමුත් කල්පනා සහ සියලු තොරතුරු ස්වල්ප වෙලාවකින් මට කිය හැකි වෙයි. ඒ නිසා මා මිනිසුන්ට රැවටෙයයි සිතන්ට කමක් නැහැ. මා අවට සිදුවන දේ දන්න බැවින් මට සිනාවට සෙල්ලමට දූන් කාරණා තිබේ. එහෙයින් මම දූන් ප්‍රීති වෙමි''යි කීය.

ඇගේ සෙල්ලම් ස්වභාවය බෝවෙන ලෙඩක් හා සමාන විය. තරුණයාටත් ඒ ස්වභාවය විගසින්ම ඇති විය. ''හොඳයි උඹේ දූනගැන්ම කෙතරම් දූයි මට දූන් දූනගත හැකිවේ. උඹේ ස්වමීපයට ආ මගේ අදහස් සහ වෙනත් තොරතුරු කියාපන්නැ''යි ඔහු සිනාසෙමින් කීයේය.

මීනා ඔහු දෙස පරීක්‍ෂාවෙන් බලා, ශාස්ත්‍රවන්තියෙකුගේ ලීලාව පෙන්නා, ''මේ ඇත්තාට පසුගිය දවසේ දරුණු රෝගයක් සෑදී තිබේ. එබඳු රෝගයක් සෑදීමට කිසි හෙතු වක් නොතිබුන නුමුත් ඉතා ආශ්චර්‍ය්‍යමත් අන්දමින් එය සෑදූනේය. එය රහස් වශයෙන්ම සුව කරගන්ට බොහෝ උත්සාහ දරා තිබේ. නමුත් ඒ උත්සාහය නිෂ්ඵලවී තිබේ. එය සුවකර ගැනීමට එකම ඖෂධයක් එක්තරා ප්‍රාණයක් ළඟ තිබේ. ඒ ප්‍රාණකාරයා වෙතට ගොස් රෝගය මෙයයි නොසඟවා විස්තර කොට ඖෂධය ඉල්විය යුතු''යි කීවාය.

''ඉතින් ඉල්ලූ විට එය ලැබේද නැද්ද යන වගත් කියන්ට ශාස්ත්‍රයට පෙණෙනවා ඇතැ''යි තරුණයා සිනාසෙමින් කී කල ඇ පෙර සේම සත්සුන් භාවයෙන්, ''එහ ඉල්ලන අන්දම හොඳ වුවහොත් ලැබෙන්ට ඉඩ තිබෙන බව පෙණේය''යි කීය

ඒ ඇසිල්ලෙහි ඔහු ඇගේ අත ගෙන ''මීනා, මා පෙම්බරිය, නුඹේ ප්‍රේමය නමැති අමෘතෞෂධය සත්තකින්ම මගේ මේ නිරන්තරයෙන් දවන ආලය නමැති

රෝගය සහනය කිරීමට උවමනාවී තිබේ. නුඹ මගේ නියම ප්‍රිය එකම භාර්‍ය්‍යාව වන්නෙහිද''යි ඉතා වෙගවත් ලීලාවෙන් ඇසුවේය.

මීනාගේ ශාස්ත්‍රවන්ත ලීලාව අතුරුදහන් විය. සිනා සෙල්ලම් ගතිද එසේම නැති විය. කඳුලෙන් ඇගේ ඇස් තෙත් විය. අවශෙෂ ස්ත්‍රීන්ට මෙන් දුර්වල ස්වභාවය ඇටත් ඇති විය. ඇ ඔහු දෙසට එකම ප්‍රියංකර බැල්මක් ලා, පසුව බිමට ඇස් යොමා ''මම ඊට සතුටු වෙමි''යි සෙමින් කීවාය.

13 වෙනි පරිච්ඡේදය

ලොකය සියල්ල අමුතු ආලොකයකින් උද්දීප්ත වූවාත් මෙන් විය. බටහිර ගතව සිටි සූර්‍ය්‍ය තෙම චිත්‍රකරුවෙකු සෙයින්, අහස් කුස රක්ත වර්‍ණයෙන් සරසන්ට විය. ඒ අලංකාරය දුටු පෘථුවියද, වෘක්‍ෂ ශීර්‍ෂ මස්තකයන්හි එම පැහැයම උපදවා ගත. සියලු දෙසින්ම අලංකාරය, ප්‍රීතිය, සැපත ඇති විය.

මීනා සහ පවුලස් දෙදෙන පෙර සිටි ගුහාමුඛයෙහි අසලින් තිබුන ගසක් යට සෙවනේ හාන්සිවී කථා කරමින් සිටියෝය.

''මීනා ප්‍රෙමිය, උඹ පළමුවෙන්ම දුටුවේ මේ ස්ථාන යෙහි දීය, උඹ නුවර සිටුවා ඇවිත් මාසයක් මුළුල්ලෙහි සුසුම්ලමින්, මගේ ආදරය මකාගන්ට උත්සාහ කළෙත් මේ ස්ථානයෙහි දීය. මින් මතු මෙය මගේ සිතට සැනසිලි සිතිවිලි උපදවන, මගේ ප්‍රියාදරය උසුලන මා විසින් සිහි පත් කරණු ලබන ස්ථානයක් වේ. උඹ මෙහි වාසයට ප්‍රියද?''

ඇගේ ඇස්වලින් පිළිතුර ප්‍රකාශ විය. පසුව ඇ කථා කරමින්, ''මෙබඳු ස්ථාන ස්ත්‍රීන්ට රුචි නොවෙත් යයි පසුගිය කාලයක කීවා මට දැන් සිහිවේ. ස්ත්‍රීන් ගැන නොදැන සිටි හෙයින් එසේ කීවා වෙන්ට ඇති. මමත්

සාමාන්‍ය ස්ත්‍රියෙක්යයි සිතමි. නමුත් මෙබඳු ස්ථාන නගර වලට වඩා සර්වප්‍රකාරයෙන් මා ප්‍රිය කරවති. මෙහි දිවි තියෙනතුරු කිසි කාන්සියක් නැතිව සිටීමට මට හැකිවේ. ආදරය ඇති තැන පාලුව නැති වේය''යි කීය.

ඇගේ සිතෙහි ඉපදි ප්‍රීතිය මුහුණෙන් දිලිසෙන්ට විය. එය දුටු තරුණයාද ඈ වඩ වඩා ප්‍රීතිකරනු පිණිස එතැනින් නැගිටුවාගෙන ගොස් උමගේ එක් ස්ථානයකට පැමිණ, බිමට අත ගසා කුමක්දෝ කළ විට ඔවුන් සිටි ස්ථානය එක විටම කිඳා බැස්සේය. එය ඉතා කළුවරවූ ගුහාවක් බැව් ඈට පෙණී ගියේස. ඔහු ඇගේ අත ගෙන එතැනින් ඉවත්වූ වහාම ගල නැවතත් තිබුනු ස්වභාවයට උස් විය. එහි පාර්ශ්වයකින් තිබුනු යමතම් එලිය දෙන කවුළුවක්ද ඈට දකින්ට ලැබුනි.

ඔහු ඈට කථා කරමින්, ''ප්‍රේමිය, උඹ මෙහි සිටින්ට කැමැත්ත ප්‍රකාශ කළ හෙයින් මේ උමගේ විසිතුරු පෙන්වන්ට අදහස් කෙළෙමි මේ උමග පුරාණයෙහි රජ දරුවෙකු විසින් තනන ලද ස්ථානයෙකි. මේ අප සිටින කාමරයෙහි අතිශයින් රූපවත්වූ කුමාරිකාවක් ඇගේ ජීවිතය තිබෙනතුරු සිරකරන ලදුව හඬමින් වැලපෙමින් සිටියායයි කියා, අඳුරෙහිම ඈ සමග ගොස් තවත් ගල් දෙරක් හැර ඉතා අලංකාර ශාලාවකට ඇතුල් වුණේය.

එය අතික් ස්ථාන මෙන් අඳුරු නුවූ, හොඳාකාර එළි ඇති මාලිගයක ශාලාවක් මෙන් විසිතුරු කර්මාන්තයෙන් නිමවන ලද සිත් ප්‍රිය කරවන ශාලාවක් විය. එහි සැප විහරණය පිණිස ඉතා අගනා කළුවර යහනාවක් සහ ආසනද තිබුනි. ඒ සියල්ල දැක විස්මයට පත් ඇගේ ඇස්වලින් ප්‍රකාශ කළ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ''පළමුවෙන් පෙන්වූ කාමරයෙහි සිර කළ කුමාරිකාව ප්‍රථමයෙන් සිටියේ මේ ශාලාවෙහිය. ඒ සියලු තොරතුරු සඳහන් කොට තැබූ පොතක් මෙහි තිබී මට සම්බවී තිබේ. එය අපේ විවේක කාලයේදී උඹට කියවා දෙන්නෙමි''යි ඔහු කීය. නැවතත් කථා කරමින් ''උඹ උමගේ තොරතුරු දැනගෙන සිටියේ

එක් තැනැත්තෙක් පමණකි. ඔහු ඉතා යහපත්, සත්පුරුෂ ගති ඇති උත්තමයෙකි. නුවර කොලරාව පැතිරී යන විට අප මෙහි ගෙන ආවොත්. බොහෝ කාලයක් අපට සංග්‍රහ කළෙත් ඔහුය. ඔහුගේ මරණ මඤ්චකය වනතුරු මේ ශාලාවෙ රහස කිසිවෙක් හට නොකියන ලදී. මා කෙරේ ඇතිවූ තද ප්‍රේමය නිසා අන්තිම මොහොතේදී ළහට අඬගසා අසවල් තැන දෙරවල්ය, අසවල් විදියෙන් ඇරිය යුතුය යනාදිය කණට කොඳුරා කීයේය.

මීනාට එහි පැමිණුන දවසෙම මහල්ලාගෙන් අසන්ට ලැබුන ප්‍රවෘත්තියේ සඳහන්වූ "රහස" මේ බව තේරුම ගියේය.

තරුණයා ඇත් සමග කුඩා ආසනයෙක වාඩිගත් පසු ඇ ඔහු දෙසට හැරී, ඔහුගේ ප්‍රියතාවය පැතිරී තිබුන මුහුන ඉතා ඕනෑ කමින් බලමින් "මෙබඳු ඓශ්වර්‍ය්‍ය ඇතිවීත්, ඉතා සුළු කෙනෙකු මෙන්, දුප්පත් ලෙස කා බි, දුප්පත් ලෙස කල් ගත කරමින් සිටීන්ට අදහස් කෙළේ ඇයි! අලංකාර ඇඳුම් පැළඳුමෙන් සැරසුනු උසස් පංක්තිවල ආශ්‍රය ඇති, උත්තම කාන්තාවක් සරණකොට නොගෙන මා වැනි අල්ප, අප්‍රසිඬ, දුප්පත් ස්ත්‍රියෙකු විවාහ කරගන්ට වූයේ මොනු අවසනාවකින්දැ"යි කොවුල් හඬ පරයන මියුරු හඬින් ඇසීය.

ඇගේ සිතෙහි පහලවූ ප්‍රෙමභාරය ඉසිලීමෙන් බොහෝ වෙහෙසවූ නියාව මුහුනෙහි පැතුරුනාවූ රක්ත වර්ණයෙන්ද, ඇස්හි පතලාවූ මන්දලසුතු බැල්මෙන්ද දෘශ්‍යමාන විය.

තරුණයාද ඇ දෙස ස්වල්ප වෙලාවක් බලා, ඇගේ ඝනවූ දික්වූ කෙශ කලාපයෙන් පාර්ශ්වයක් වැසුනු අර්ධ චන්ද්‍රාකාර පැහැපත් නලල් තලයෙහිද, ලා පත්‍ර මෙන් අතිශයින් මෘදුවූ රක්තවූ පැහැයෙන් දිස්නා තොල් යුවලෙහිද, පිරිසිදුවූ කලංක රහිතවූ වටවූ සිනිඳුවූ දුටුවන්ගේ සිත් බඳවන ඇගේ ග්‍රීවයෙහිද උස්වූ පූර්ණවූ පයොධර පාර්ශ්වයෙහිද රූපශ්‍රීන් ගැන සතුටු සිත් ඇත්තේ "මීනා,

උඹ කොපමණ යහපත් ස්ත්‍රියෙක්ද? උඹේ සිතෙහි මා ගැන ඔය තරමට ආලය ඇතිවූ නමුත් වචනයකින් හෝ බැල්ම කින් මට කිසිසේත් ධෛර්‍ය්‍ය නොදී, උඹ මුළු සැපය පරිත්‍යාග කොට, මුළු ජීවිතය දුකට හෙළාගෙන සිටින්ට සතුටුව සිටියා නොවෙහිද? උඹේ ගිවිසුම ස්ථිර ලෙස පවත්වා ගැන්ම ජීවිතය පවත්වා ගැන්මටත් වඩා උතුම් කොට සැලකුවා නොවේද? උඹ ඔහුට භාර්‍ය්‍යාව වූවා නම්, විශ්වාසීව කීකරුව. යහපත්ව, මා ගැන කිසි විශෙෂයක් නොකොට සිටිනවාට සැක නෑ. සත්තකින් මෙසේම සිටීමට අනික් ස්ත්‍රීන් හටත් ධෛර්‍ය්‍ය ඇත්නම් පවුල්වල කොපමණ සාමදානය ඇති වේද? ඉතින් උඹ වැනි ස්ථිර ගුණ ඇති පොරොන්දු කඩනොකරන, ඥානවන්ත, ප්‍රෙමණීය භාර්‍ය්‍යාවක් ලැබීම රාජ්‍යශ්‍රීයක් ලබනවාට වඩා දුෂ්කර හෙයින් මගේ වාසනාව ගැන මම නැවත නැවතත් සතුටු වෙමි''යි කීය.

ඈත් ඔහු දෙස ප්‍රේමයෙන් බලා, ඔපමණ ප්‍රෙමාධ්‍යාසයක් සිතේ දරාගෙන, ''මම මෙයින් මරුමුවට පත්වෙතත් මිතුරාට වෙනස්වූ කථාවක් නොකරමි. බැල්මක් නොහෙලමි. යන ස්ථිර ගුණයෙන් මිත්‍රධර්මය ප්‍රාණයටත් වඩා උතුම් කොට සැලකූ, ස්ත්‍රී වර්ගයා හට දිය යුතු සැලකිල්ල දෙන, පෑ යුතු දයාව පාන, උත්තම පුරුෂයෙකු ලැබීම ලොකයේ දුර්ලභ කාරණයක් හෙයින්, මගේ වාසනාව ශ්‍රෙෂ්ඨ කොට සිතිය හැකිය''ය කීවාය.

නිමි.